# කොන් වූ ජන සමාජ:

## ශ්‍රී ලංකාවේ කොන් වූ ජන සමාජ කිහිපයක් ආශ්‍රයෙන් සිදු කරන ලද අධ්‍යයනයකි

---

**ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශය**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

**ISBN**: 978-955-1655-78-5

**ප්‍රථම මුද්‍රණය** : ජූනි 2011

**මුද්‍රණය** : ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස් දුර. ඇමතුම්: 011-2689259

**විශේෂාංග රචන** : තිඹිරියාගම බණ්ඩාර

**විශේෂ සහය**: නිර්මලා ආරියදාස, කෞමදී රණවීර, ජේ.කේදීශ්වරන්, ප්‍රියාන් අමරසිංහ, දිලූපා අතුලවංශ, අජ්මීර

මෙම ප්‍රකාශනය මුද්‍රණය කරන ලද්දේ නෙදර්ලන්ත තානාපති කාර්යාලයේ සහයෝගය සමඟිනි.
මෙහි ප්‍රකාශිත මත සහ අදහස් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හෝ නෙදර්ලන්ත තානාපති කාර්යාලයේ මත සහ අදහස් අවශ්‍යයෙන් ම පිළිබිඹු නොකෙරේ.

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

| | | |
|---|---|---|
| ලිපිනය | : | 24/2, 28 වැනි පටුමග, පිටත මල් පාර, කොළඹ 07. |
| දුරකථන | : | +94 (11) 2565304/5/6 |
| ෆැක්ස් | : | +94 (11) 4714460 |
| වෙබ් අඩවිය | : | www.cpalanka.org |
| ඊමේල් | : | info@cpalanka.org |

# අන්තර්ගතය


| | | |
|---|---|---|
| 1. | ආදිවාසීන්ගේ සුදහ ගින්න | 7 |
| 2. | නිදහස් අධ්‍යාපනය අහිමි දකුණේ වතු පාසැල් දරුවෝ | 13 |
| 3. | රන්මසු සමඟ කඳුළු ගෙනෙන රට රැකියා | 18 |
| 4. | යාපනයේ මුස්ලිම් ජනයා දෙවැනි වරටත් අවතැන් වෙයි. | 22 |
| 5. | අහිමි වූ උරුමයට හඬන සිරම්බිඅඩියේ කැෆ්රවරු | 26 |
| 6. | කබලෙන් ළිපට වැටුණු මාතලේ වතු කම්කරුවෝ | 29 |
| 7. | කළු වලං හදන කඳුවැව කළු නොවූ ජීවිත | 33 |
| 8. | පානම්පත්තුවේ සිංහල දෙමළ නෑයෝ | 38 |
| 9. | සාම්පූර් බිමෙන් උදුරා පවුල් 20 ක පැළ කිරීම | 41 |
| 10. | තල තෙල් සුවඳ හමන සෙක්කුපිටිය | 45 |
| 11. | සංචාරය සමඟ ජීවිතය අහිමි වූ තෙලිඟු ජනයා | 49 |
| 12. | මව් බස අහිමි මුහුදු වැදි ජනයා | 53 |
| 13. | කපු මහතෙකු මුල් වූ කිරි අම්මා දානය | 56 |
| 14. | නාට්ටාම්වරුන්ගේ හඬට ඉඩක් | 59 |
| 15. | පේෂ කර්මාන්තය නූලෙන් බේරමු ද ? | 63 |
| 16. | කිරි කපන දෑතින් පණ ලබන ජීවිත | 67 |
| 17. | කලාපයේ යුවතියන්ගේ ‘රන් පවුම්’ සිහිනය | 70 |
| 18. | ආදිවාසී ඇත්තන් ගේ නොනිවෙන ගින්න | 74 |
| 19. | බෙර හදන්නන්ගේ ජීවිත නොහැඬීම | 79 |
| 20. | ලාක්ෂා ශිල්පීන්ට ජීවය පිඹීම | 82 |
| 21. | තව ම අවසන් නො වූ සුනාමි සෝ සුසුම් | 85 |
| 22. | ගබ්සාව සමාජ අපරාධයක් ද? | 89 |
| 23. | වීදියේ මිළින වන මල් කැකුළු | 92 |
| 24. | මැතිවරණවල දී කාන්තා නියෝජනය අඩු ඇයි?<br>(ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙනි) | 95 |

# ආදිවාසීන්ගේ සුදහ ගින්න

“කැලේ බැද්දේ ජීවිතය අපට අහිමි වුණා. එදා ඉඳලම අපි ඉන්නේ ප්‍රශ්න ගොඩක. අපි අපේ ප්‍රශ්න වන්නියලැත්තො මාර්ගයෙන් ජනාධිපතිතුමාට ඉදිරිපත් කළා. අක්කර 100ක බිම් ප්‍රමාණයක් රතුගල, තලාව ජනතාවට ලබා දෙන්නැයි ජනාධිපතිතුමා නියෝග කළා. ඒත් ඉඩම නියෝගයෙන් පවරාදීමක් තව ම සිදු වුණේ නෑ. ඉඩම දුන්නත් ගස්ටික කපාගන්න බවයි වනජීවි එකෙන් කියන්නේ. අපට එහෙම ඉඩමක් වැඩක් නෑ. දැන් අපට අපේ ප්‍රශ්න ගැන කියන්න කෙනෙක් නෑ.”

රතුගල ආදිවාසී නායක සුදා වන්නියලැත්තන්ගේ වේදනා බර ස්වරය නිල්ගලකන්ද පිස හමා එන වියළි පවන් රොද සමඟ මුසු වෙයි. කැලේ බැද්දේ ජීවිතය අහිමි කර එලිමහන් භූමියේ පදිංචි කළ ඔවුහු දැන් දඩයම ද ගොවිබිම ද දෙකට ම අනුගත නොහැකි සංක්‍රාන්ති සමයකට මුහුණ දී සිටිති.

2008 අප්‍රියෙල් මස 21 වැනි දින ජනාධිපති කාර්යාලයේ දී ආදිවාසීන්ගේ ගැටලු පිළිබඳ ව පවත්වන ලද සාකච්ඡාව සඳහා මේ විෂයයට අදාළ සියලු උසස් නිලධාරීන් සහභාගි වී ඇත. ඒ අනුව ආදිවාසීන්ගේ ඉල්ලීම පිළිගෙන ඔවුන් සඳහා බිබිල අඩවියේ නිල්ගල බීට්ටුවේ වේවත්ත යන ඉඩමෙන් අක්කර 100ක් ලබා දීම නිර්දේශ කරන ලද අතර අදාළ නිලධාරීන් විසින් මෙය පරීක්ෂා කර තිබේ. එහෙත් සිදුවූයේ කුමක් ද?

“ගස්ටික කපල ඉඩම දෙනව කියලා තමයි කීවේ. මම ඒකට කැමති වුණේ නෑ. අපි ඉඩම ඉල්ලුවේ දඩයමත්, මී පැණි කැඩීමත් කරගෙන අපට පුරුදු ජීවිතේ ගෙනියන්න. ජනාධිපති තුමාගේ නියෝගයටත් සිද්ධ වුණේ මේක නම් මොනව කරන්නද?

සුදා වන්නියලැත්තන්ගේ ප්‍රශ්නයට පිළිතුරක් දීමට සමතෙක් නොවේ. එහෙත් රතුගල කලාපයට අදාළ රාජ්‍ය ආයතනය වශයෙන් බිබිල නිල්ගල අඩවි වන නිලධාරී කාර්යාලයෙන් ඒ ගැන ඇසූ විට නිල්ගල බීට්ටු වන නිලධාරී ආර්.කේ. දයාරත්න දුන් පිළිතුර මෙසේ ය.

“ ඔවුන් වගාවට එච්චර කැමති නෑ. දැනට දී ඇති ඉඩම්වලත් වගා කරන්නේ නෑ. ඉඩම්වල තියෙන ගස් කොළන් පවා විකුණලා තියෙන්නේ. ඒත් ඔවුන් පැහැදිලි ව ම ඉල්ලලා තියෙන්නේ ගොවිතැන සඳහා අක්කර 100ක් ලබා දෙන ලෙයසි. ගොවිතැන සඳහා වන රක්ෂණ කාර්යාලයෙන් ඉඩම් නිදහස් කරනවා නම් එහි ඇති ගස් කපා ඉවත් කිරීම සඳහා අනිවාර්යයෙන් ම රාජ්‍ය දැව සංස්ථාවට පවරනවා. දැවත් සමඟ ඉඩමක් පුද්ගලික කරන්නේ නැහැ. එතන අක්කර 100ක් ඇත්තෙත් නැහැ. 58 යි තියෙන්නේ. බුද්ධදාස රජ සමයේ පටන් තියෙන ඔසු උයනට මෙය අයිතියි. චක්‍රලේඛ වලට අනුව සංරක්ෂණය කර ඇති වනාන්තර පුද්ගලික ව පවරා දිය නොහැකි යි.”

ජනාධිපතිවරයා දක්වා ගිය ගැටලුවක් විසඳී ගිය ආකාරය ශෝක ජනක ය. රජයේ රොගුලාසි සහ චක්‍රලේඛ ආදිවාසීන්ගේ සැබෑ අවශ්‍යතා සමඟ ගැටෙන ආකාරය මෙයින් පෙනේ.

දානිගල මහ බණ්ඩාරලාගේ පරපුරට අයත් ආදිවාසීන් ජීවත් ව ඇත්තේ ගල්ලෙන්වල ය. ගල්ඔය ව්‍යාපාරය නිසා මේ පිරිසට ගම් බිම් අහිමි විය. ඒ අනුව පිරිසක් රතුගලට ද අනෙක් පිරිස

පොල්ලෙබැද්දට ද සංක්‍රමණය වී ඇත. අද ඔවුන් මුහුණ දී සිටින්නේ අලුත් ජීවිතයට අනුවර්තනය වීමේ ගැටලුවට යි.

"සතා සීපාවා දඩයම් කරන්න දඬුවැල් කපා ගන්න අපිට අක්කර 2500ක් ඉල්ලුවා. දුන්නේ නැහැ. ඒ අය ඡන්ද කාලයට විතරයි එන්නේ. අපි කන හැටි, ඉන්න හැටි ඒ අයට වැඩක් නැහැ. මට මෙතනින් නිදහස් වෙලා සීගිරියට යන්න අවස්ථාවක් ලැබුණා. ඒත් මට මගේ පිරිවර දාලා යන්න බැරි හින්දා අද වනතුරුත් දුක්විඳිමින් ජීවත් වෙනවා."

පොල්ලෙබැද්දේ ආදිවාසික නායක ගෝබා (අවුරුදු 87) ගේ ප්‍රකාශය අනුව පෙනී යන්නේ රතුගල ආදිවාසීන්ගේ භූමිය පිළිබඳ ප්‍රශ්නය පොල්ලෙබැද්දට ද සමාන බව ය.

"ඉස්සර අල, කොළ, පැණි තිබ්බා. වෙඩික්කාරකම් කළා. දැන් එව්වා කරන්න බැහැ. පොලීසිය රාජකාරි කරනවා. අක්කර 1/4යි තියෙන්නේ. ඒකේ ගොවිතැන් කරන්න ඉඩක් තියෙනවා ද?"

රතුගල සුදා වන්නියලැත්තන්ට මෙන් ම පොල්ලබැද්දෙ ගෝබාට සිදුව ඇත්තේ තම රැහේ ප්‍රශ්න කන්දරාව ගැන හදවතින් විඳවමින් දුක්ඛිත ජීවිතයක් ගත කරන්නට ය.

1863 දී බේලිගේ වාර්තාවකට අනුව පැහැදිලි වන්නේ ආදිවාසී පරපුර නිල්ගල ප්‍රදේශයේ වන ගහනය ඇසුරේ තම ආවේණික ජීවිතය පවත්වාගෙන යන අයුරු ය. ඉන්පසු මහාචාර්ය සෙලිග්මාන් සීතල වන්නියේ ආදිවාසීන්ගේ ජීවිතය නිරීක්ෂණය කළේ ය. පොල්ලෙබැද්දේ ආදිවාසී වැඩිහිටියන්ගේ සිත්හි තවමත් නිදන්ව ඇත්තේ මහාචාර්ය සෙලිග්මාන් ගේ අවධියෙන් පසු ව දොස්තර ආර්. එල්. ස්පිටල් තම හද ගැස්මට කන්දුන් අයුරු ය. දොස්තර ස්පිටල් වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සඳහා දානිගල ප්‍රදේශයේ ආදිවාසීන් හමුවීමට ගිය විට ඔහු දැක ඇත්තේ ආදිවාසීන්ට ආවේණික ජීවිතය දෙදරා යමින් තිබෙන අයුරු ය. අවසානයේ ජනපදකරණය නිසා දානිගලින් පොල්ලෙබැද්දටත්, රතුගලටත් සීතල වන්නියේ ආදිවාසීන් ගේ ජීවිත ස්ථානගත විය.

දඹාන, රතුගල, පොල්ලෙබැද්ද, දළුකාන සහ හෙන්නානිගලට සීමා වී තිබෙන වත්මන් ආදිවාසීන්ගේ දිවිසැරිය මහා සමාජයෙන් පිටමංකර බෙලහීන කරන ලද ජන කොටසකගේ ඛේදාන්තය බවට පත් ව ඇත.

වගා කටයුතු සඳහා පාරම්පරික පුරුද්ද හරස්වීමත්, උග්‍ර ජල හිඟයත්, ලැබී ඇති ඉඩම්වලට බලපත්‍ර ලබා දීම අක්‍රමවත් වීමත්, පස නිසරු වීමත් යන කරුණු අනුව කෘෂිකාර්මික ජීවිතයෙහි දීප්තියක් නො පෙනේ.

පවුල් අටකින් ආරම්භ වූ රතුගල ආදිවාසී ජනාවාසය වත්මනෙහි පවුල් 101කින් සමන්විත ය. රණසිංහ ප්‍රේමදාස යුගයෙහි ලැබුණු නිවාස යෝජනා ක්‍රමයක් අනුව රතුගලට නිවාස 22ක් ලැබී ඇත. එහෙත් අනු පවුල් ද දැන් ජීවත්වන්නේ එම නිවාස තුළ ම ය. මේ නිසා සංකීර්ණ සමාජ ගැටලු රැසක් නිර්මාණය වී ඇත.

අධ්‍යාපනය

රතුගල කනිටු විදුහලේ ආදිවාසී දරුවන් 35 දෙනෙක් ඉගෙනුම ලබති. තවත් 20 දෙනෙක් පමණ ගල්ගමුව, නාමල්තලාව සහ පිටකුඹුර පාසැල්වලට යති. ආදිවාසී දරුවන් නිසා කොන් කරනු ලැබීමත්, බස් සේවය දුර්වල වීමත්, නිසි අහරක් නොමැති කමත් නිසා මේ බොහෝ දෙනෙක් අතරමග හැලී යති.

"ජනාධිපතිතුමාගේ මැදිහත්වීමෙන් බස් එකක් ලැබුණත් ඒක බිබිලෙ ඉඳන් කරාඬුගලට ඇවිත් ආපහු යනවා. උදේට ඇවිත් හවසට යන බස් එකක් තියෙන්නේ. ඒ නිසා ගල්ගමුවෙ ඉඳන් කිලෝ මීටර් තුනක් පයින් ම එන්න සිද්දවෙලා."

දරුවෝ චෝදනා කරති.

සිසුන් 422 ක් ඉගෙනුම ලබන පොල්ලෙබැද්දෙ විදුහලෙහි ආදිවාසී දරුවන් 150 දෙනෙක් සිටිති. දානිගල මහ බණ්ඩාරලාගේ බණ්ඩාර (අවුරුදු 57යි. ආදිවාසියෙකි) එහි විදුහල්පතිවරයා ය.

"අපට තියෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි වතුර. ප්‍රාදේශිය සභාපති බවුසරයකින් වතුර එවනවා. නමුත් ප්‍රශ්නය විසඳිලා නැහැ. 7 - 8 පන්තිවලින් පසුව ළමයි එනවා අඩුයි. නිල ඇඳුම්, දිවා ආහාරය ලබාදුන්නත් ඉගෙනීමට උනන්දුවක් නැහැ. පාසැල් නොයන ආදිවාසී දරුවන් පරිවාස ක්‍රමයට යොමුකළ යුතුයි. පිටින් එන වෙළෙන්දන් සහ විවිධ අය නිසා දරුවන් විවිධ විෂමාචාරවලට යොමුවෙලා".

විදුහල්පතිවරයා පවසයි.

රතුගල ආදිවාසී ආදර්ශ කනිෂ්ට විද්‍යාලයේ පළමු පත්වීම ලද උගුරුවරිගේ සුසන්ත ගුණසේකර පවසන පරිදි, එහි සිසු දරුවන්ට බීමට සිදුව ඇත්තේ විදුහලට යාබද ව ගලා යන ඇළේ අපිරිසිදු ජලයයි.

" අපට ප්‍රාථමික ගුරුවරයෙක් නැහැ. බීමට ඇළෙන් ගන්න වතුර ෆිල්ටර් කරගන්න විදිහක් නැහැ. ළමයි 100 ක ගෙන් පාසල් එන්නේ 33 යි. ඒකට හේතුව දුප්පත්කම. ඔවුන් දෙමාපියන් ද සමඟ අරලු, බුලු, නෙල්ලි අහුලන්න බැද්දට යනවා. පාරේ වාහනවලට අත අල්ලලා හිඟා කනවා. අධ්‍යාපන කාර්යාලය තියෙන්නේ මඬුල්ලේ. බස් පහසුකම් නැති නිසා, රැස්වීමකට යන්න වරුවක් ගතවෙනවා. රාජකාරි ලියුම් ලැබෙන්නේ දින පහුවෙලා."

සුසන්ත ගුණරත්න පවසයි.

ආදිවාසී දිවියෙහි පදනම ඉරිතලා යෑම, අධ්‍යාපනයට දක්වන අඩු නැඹුරුව, සමාජීය වශයෙන් කෙරෙන හුදෙකලා කිරීම සහ දරිද්‍රතාව යනාදී හේතු රැසක් ආදිවාසී දරුවන්ගේ අධ්‍යාපනය ඉරිතළා යෑම කෙරෙහි බල පා ඇති බව පෙනේ. රතුගල ආදිවාසී නායකයා. පවසන 'කඩදහි වැඩ' හෙවත් රාජකාරි කටයුතු සඳහා මඩුල්ලට නොයා බිබිල ප්‍රාදේශිය කාර්යාලයට යෑමට පහසු වන පරිදි රාජ්‍ය ආයතන සැකසීමේ සූදානමක් නිලධාරීන්ට තිබිය යුතු ය. රතුගල විදුහලේ සුසන්ත ගුණරත්න පවසන්නේ අධ්‍යාපන කාර්යාලය මඬුල්ලේ පිහිටා තිබීම නිසා රාජකාරී කටයුත්තකට යෑමට වරුවක් ගතවන හෙයින් එය බිබිල නගරයේ තිබිය යුතු බව ය. පොදු ප්‍රවාහන පහසුකම් අවම මට්ටමේ පැවතීම රතුගල මෙන් ම පොල්ලෙබැද්ද ආදිවාසීන් පෙළන මූලික ප්‍රශ්නයක් බව පෙනේ. පොල්ලෙබැද්ද ගම්මානයේ සංස්කෘතික හා සමාජමය ගරාවැටීම ගැන කරුණු දක්වන මහඔය ප්‍රාදේශිය ලේකම්

කාර්යාලයේ සංස්කෘතික නිළධාරී සමන් බණ්ඩාර (අවුරුදු 32) පවසන්නේ ඔවුන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම පළමුව සිදු කළ යුතු  බව යි.

“රඹකැන් ඔය ව්‍යාපෘතියෙන් අක්කර 1 1/2 බැගින් දෙන්න ප්‍රාදේශීය ලේකම් තුමා තීරණය කර තිබෙනවා. ඉඩම්වලට බලපත්‍ර සහ ඔප්පු ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා. සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් ආදිවාසී සංරක්ෂණ ව්‍යාපෘතියක් ආවා. නමුත් මුදල් ආවේ නැහැ.”

සමන් බණ්ඩාර මහතා පවසයි.

ආදිවාසී ජනතාව සම්ප්‍රදායික ජීවිතයට යොමු කිරීම දුෂ්කර වන හෙයින් ඔවුන් පොදු සමාජයේ ම කොටසක් හැටියට නවීකරණය කිරීම වඩාත් උචිත බව මාධ්‍යවේදී සඳරුවන් ලොකුහේවා මහතාගේ අදහසයි.

“වසර 10කට වත් හරියන සැලසුමක් අවශ්‍යයි. ගොවිතැන හුරු නැති අයට ඉඩම් දීලා ප්‍රගතියක් ගන්න බැහැ. හැබැයි කිසියම් වෘත්තීය පුහුණුවක් ලබා දිය හැකියි. බල කරලා හරි මේ ළමයි පාසැල් යැවිය යුතුයි. මුස්ලිම් අයට හරක් ගන්න බෝකර්කම් කරන, ලිංගික සේවය සපයන, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවුණු තත්වයෙන් ඔවුන් මුදවා ගත යුතුයි.”

සඳරුවන් ලොකුහේවා මහතා පවසයි.

ඉතා කුඩා පැල්පතක හෝ යන්තම් ගඩොල් බිත්ති පමණක් ඇති නිවසක පවුල් කිහිපයක් ජීවත්වීම රතුගල මෙන් ම පොල්ලෙබැද්ද ආදිවාසීන්ගේ පොදු ලක්ෂණයක් බවට පත් ව ඇත්තේ ය. ජනපදකරණයෙහි ප්‍රතිඵල ලෙස මහා සමාජයෙහි දක්නට ඇති අනුපවුල්වල ද සමාජ හා ආර්ථික ගැටලු වෙනස් ආකාරයකින් ආදිවාසී සමාජයට බලපා ඇති සෙයක් ද පෙනේ. අඩු වයසේ විවාහ, ලියාපදිංචි නොවූ විවාහ, පියකු නොමැති දරුවෝ, ලිංගික සේවා සපයන්නියෝ ආදිවාසී සමාජයෙහි සංකීර්ණ ගැටලු කරලියට එමකි. රතුගල ආදිවාසීන්ගේ කැපී පෙනෙන ලක්ෂණයක් වී ඇත්තේ විවාහය ඥාති පවුල් කීපයකට සීමා වීම නිසා උපදින දරුවන් බෙලහීන රෝගී දරුවන් බවට පත්වීම ය. එමෙන් ම රතුගල සහ පොල්ලෙබැද්ද ආදිවාසීන් අතර හමේ රෝග බහුල ය. පවුල් සෞඛ්‍ය සේවා ලබා ගැනීමේ නැඹුරුව මඳ බවක් ද පෙනේ. රතුගල ග්‍රාම නිලධාරිනිය රතුගල වසමේ රාජකාරි කටයුතු කරනුයේ තවත් වසම් දෙකක කටයුතු කරන අතරතුර ය. ඒ නිසා රතුගලට විශේෂ අවධානයක් යොමු කිරීමට කාලය මඳ බවත් එම අවශ්‍යතාව ඉතා ඉක්මනින් ඉටුවිය යුතු බවත් ඇය අවධාරණය කරයි.

ආදිවාසීන්ට විශේෂිත වූ ගැටලු ඇති බවට ජනාධිපතිවරයා විසින් ම පිළිගෙන ඇති හා ඊට අදාළ පියවර ගැනීමට උපදෙස් දී තිබෙන අවධියක රතුගල ප්‍රශ්නය තවමත් නොවිසඳී ඇත්තේ ඇයි?. පොල්ලෙබැද්ද ප්‍රශ්න නොවිසඳී ඇත්තේ ඇයි?.

ආදිවාසී ජනයාට ආවේණික වූ ජීවන සංස්කෘතිය විනාශ විය. ඔවුන් නූතන සමාජයට ගෙන ඒමට දරණ ප්‍රයත්නය ඵල ලබා නොමැත. ආදිවාසී දිනයෙහි අප විසින් යලි විමසා බැලිය යුත්තේ එය යි.

සුදු හූරාගෙන් පස්සෙ මේ හූරයි වැඩ කළේ

විමලවීර දිසානායක - නැගෙනහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා ප්‍රවාහන අමාත්‍ය

“රඹකැන්ඔය ව්‍යාපෘතිය යටතේ අනෙක් මිනිස්සුන්ට ලැබෙන වරප්‍රසාද ආදිවාසීන්ටත් ලැබෙන විදියටයි අපි කටයුතු කරන්නෙ'. ආදිවාසීන්ගේ ප්‍රශ්න ගැන මුලින් ම හොයලා බැලුවේ දොස්තර ස්පිටල්. ඔවුන්ගේ මූලික ප්‍රශ්නෙ ආහාර බවයි ඔහු හඳුනා ගත්තේ. සුදු හුරාගෙන් පස්සේ අපි ගැන හොයලා බැලුවෙ මේ හුරා තමයි, කියලයි ආදිවාසීන් මං ගැන කියන්නේ. පොල්ලෙබැද්දෙ කයිරාගෙ අවමඟුල තිබ්බේ විදුලි ආලෝකෙ මැද්දේ, පොල්ලෙබැද්දෙ කිරි ව්‍යාපෘතියෙන් මාසෙකට ලක්ෂ ගාණක ආදායමක් ගමට යනවා. ඔවුන්ට පාරවල් හදලා දුන්නා, බස් දාලා දුන්නා. මේ මොනවා කළත් ඔවුන් සාමාන්‍ය තත්වයට ගන්න එක එච්චර ලේසි නෑ. ඒක මුළු ලෝකෙ ම තියෙන ප්‍රශ්නයක්. පොල්ලෙබැද්දෙ ළමයින්ට තියෙන ජල ප්‍රශ්නය ඒ පළාතට ම ආවේණික ප්‍රශ්නයක්. ඒත් මම ළිඳක් හදලා දුන්නා. ඇත්තටම මගේ ගමටවත්, මම ඒ තරම් වැඩ කරලා නෑ”.

අපේ ඇත්තන්ට නිදහස අවශ්‍යයි.

වන්නියලැ ඇත්තෝ - දඹාන නිවසේ දී

“තීරණ ගන්න වෙලාවේදී හැම දෙනා එකතු වෙලා තීරණ ගැනීම තමයි සිද්ධ වෙන්නේ. මට තනියම තීරණ ගන්න බැහැ. ගම්වල නායකයන්ටත් තනියම තීරණ ගන්න බැහැ. ගන්න තීරණ මොන ආකාරයට සමාජයට සහ පරම්පාරවට බලපානවද කියල හිතල තමයි තීරණ ගන්න ඕනි. රතුගල සහ පොල්ලේබැද්ද සිරිත්, භාෂා වෙනස් වෙලා තියෙනවා. මම ආණ්ඩුව සමඟ සාකච්ඡා කරල තියෙන්නේ ගම්වල ඉස්සරම භාෂාව පුරුදු කරන්න ඕනි කියල. සිරිත් විරිත්. ඇදහුම් ආදියත්. එය මුලින්ම පොල්ලේබැද්දෙන් ආරම්භ කරල තියෙනවා. ඒ වැඩසටහන දැනට නතර වෙලා තියෙනවා. ඒ සඳහා මේ වැඩසටහන එක දිගටම පවත්වාගෙන යන්න ආණ්ඩුවෙන් සම්පත් ලැබෙන්නේ නැහැ. මගේ උනන්දුවෙන් තමයි ඒක කරගෙන ගියේ. වෙයිද නොවෙයිද කියල දන්නේ නැහැ. හැම ගමකටම පොදුවේ ඉල්ලල තියෙනවා. සංස්කෘතියට වැඩිය ආර්ථිකය නංවන්න කටයුතු කරන්න කතා කරල තියෙනවා. ඒ ඒ ගම්වල අය ඉන්නවා එදා වේල කන්නවත් නැති අය. මම මේක ගිහිල්ල බැලුවට මට මේක කරන්න බැහැ. මම මේක තවත් කෙනෙකුට කියන්න ඕනි. එයා කොයි කාලේ මේක කරන්න කතා කරනවාද කියල දන්නේ නැහැ. වැව්, අමුණු හදන ඒව ගැන මම යෝජනා කරල තියෙනවා. මේ අයට එදිනෙදා කන්න දුන්නොත් නිකන් කන්න පුරුදු වෙනවා. මේ අයට දෙන්න තියෙන්න ඕනි දීර්ඝ කාලීනව ජීවත් වෙන්න වැඩ පිළිවෙලක්. වැව් අමුණු හදල නිදහසේ ගොවිතැන් කරගෙන ජීවත් වෙන්න සකස් කරල දෙන්න ඕනි. පොල්ලේබැද්ද අය මේ ළඟදී දවසක ඇවිත් කිව්වා හේනක් කොටන්න ගියා කියල ඒ වෙලාවෙ හමුදාවෙ පොලීසියේ අය ඇවිත් ඒ තැන් වලට ගිණි තැබුවා. ඒ අයට ගොවිතැනක් වත් කරල ජීවත් වෙන්න බැරි නම් ඒ අයගේ පරම්පරාව  පවතින්නෙත් නෑ. සමාජයට යන්න ශක්තියකුත් නැහැ. නිකන්ම ඉදල හිඟන්නො බවට පත් වෙනවා.

දියමත සිටිය අයව ගොඩට දාල ජීවත් වෙන්න කියල කිව්වම ජීවත් වෙන්න පුළුවන්ද?. ඒ වගේ මේ මිනිස්සු ජීවත් වුණු තැන සම්පූර්ණයෙන් වෙනස් කරල මෙන්න කුඹුරු තියෙනවා. ඉඩම් තියෙනවා කරගෙන ජීවත් වෙන්න කියල. නමුත් ඒ අය ඉස්සර කුඹුරු කරල නෑ, වගා කරල නෑ. වැඩ කරල පුරුදු නැහැ. ඒ නිසා අමාරුයි ජීවත් වෙන්න. මෙතන ලොකු ගැටලුවක් තියෙන්නේ. මේ කතා කරනවා වගේ පහසු නෑ වැඩේ. හිතන තරම් ලේසි නෑ. ඒ ගැන හිතන්න ඕනි. ඒත් අද දවස වන විට මේ අයගේ සිරිත් අරගෙන යන්න නම් කැලෑ තියෙන්න ඕනි, කැලේ යන්න නිදහස තියෙන්න ඕනි. මේ හැම එකක්ම

සීමා කරල තියෙන්නේ. හිරකරල තියෙන්නේ. කැලෑවට යන්න තහනම්. දඩයම් කරන්න තහනම්. බෙහෙත් සොයන්න යන්න තහනම්.

මුල් තැනින් භාෂාව සහ සිරිත් විරිත් පුරුදු කරන්න ඕනි. මේ විධියට කළොත් මේ අයගෙ හිතට යනවා පරම්පරාවේ වටිනාකම. ආණ්ඩුවෙන් කතා කළත්, නායකයන් කතා කළත් වැඩක් නැහැ. මේ අයගේ හිත් ඇතුළට යන්න ඕනි. දඬුවම් දීල කිව්වත් පරම්පරාව ආරක්‍ෂා කරන්න කියලා කිව්වට කරන්න බැහැ. ලේ වලින්ම ඒක එන්න ඕනි. නීති දාලා, පහසුකම් දීලා පරම්පරාව අරගෙන යන්න කියල කිව්වට වෙන්නේ නැහැ. මම හිතනවා අක්කර 100 කියල හිතන්නේ කොටු කරපු සීමාවක්. එතැන පරම්පරාවක් ගෙනියන්න බැහැ. මම කියන්නේ 40000ක් ජීවත් වන ආදිවාසීන්ට සීමා කළ කොටසක ජීවත් වෙන්න බැහැ. ඒ අයට නිදහස දෙන්න ඕනි ජීවත් වෙන්න. එහෙම නිදහස දුන්නොත් ආණ්ඩුවට ප්‍රශ්න අඩුවෙනවා".

මඩුගල්ල ප්‍රාදේශීය ලේකම් - එම්.ජේ.ඒ. තිලකරත්න

"රතුගල ආදිවාසීන්ගේ වගා කටයුතු වෙනුවෙන් ගොවිපළක් සඳහා අක්කර 10ක භූමි ප්‍රමාණයක් රතුගලින් දීලා තියෙනවා. කෘෂිකාර්මික කටයුතු සඳහා අක්කර 100ක් ලබා දීමේ යෝජනාව ක්‍රියාත්මක වෙලා නෑ. වන සම්පත් දෙපාර්තමේන්තුව ඉඩම් නිදහස් කර නෑ".

ලක්ෂ සියයේ ව්‍යාපෘතිය

මහඔය සහකාර ප්‍රාදේශිය ලේකම් - ඩී.වී. සුදර්ශන ගුණසේන

මුදල් සම්බන්ධ ව්‍යාපෘතියට අපේ සම්බන්ධයක් නෑ. සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් තමයි දැනගන්න වෙන්නේ.

අම්පාර දිස්ත්‍රික් ලේකම් - අසංග අබේවර්ධන

මම දන්න තරමින් එහෙම දෙයක් කෙරිලා නෑ. හොයල බලන්න පුළුවන්

# නිදහස් අධ්‍යාපනය අහිමි දකුණේ වතු පාසැල් දරුවෝ

"මගේ වයස 07 යි. මගේ තාත්තා වත්තේ වැඩ කරන්නේ. අම්මා ගෙදරක වැඩ කරනවා. මගේ අම්මා මාව ඉස්කෝලේ දාන්න එනවා කිව්වා. අම්මා ආවම මටත් ඉස්කෝලේ යන්න පුළුවන්. මට අයියලා දෙන්නෙකුත් අක්ක කෙනෙකුත් ඉන්නවා. අක්කා බැඳලා. අක්කගේ ගෙදර තමයි මම ඉන්නේ. මගේ අයියා ඉස්කෝලේ යනවා. එයා 8 පන්තියේ ඉන්නේ . අද එයා ගියෙත් නැහැ. මෙහේ ඉඳලා ඉස්කෝලෙට ගොඩක් දුරයි. ගොඩක් සල්ලි ගන්නවා. අයියාට සීසන් එකට සල්ලි නැති නිසා තමයි ගියේ නැත්තේ."

දකුණු පළාතේ වතු පාසල් බිමක පහස නො ලද දරුවෙකුගේ ප්‍රකාශයයි ඒ.

"ශ්‍රී ලාංකීය සෑම දරුවෙක් ම නිදහස් අධ්‍යාපනය ලැබීමේ භාග්‍යවන්තයෝ ය. සමෘද්ධිමත් රටක් ගොඩනැඟීමේ අඩිතාලම දැමීමේ අවස්ථාව දැන් උදාවී ඇත්තේ ය."

මීට දශක හයකට පෙර මේ උදානය ප්‍රකාශ කළේ නිදහස් අධ්‍යාපනයේ පියා යන විරුදාවලිය ලත් සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා ය. මේ උදාන වැකිය අර්ථවත් වීමේ ලකුණු 50, 60 දශකවල අපි අත් දුටුවෙමු. එහෙත් අද වන විට ඒ පැතුම් ඵල දරා ඇත්තේ යැයි කෙසේ නම් සතුටු විය හැකි ද?

ජාති, කුල මල හෝ පන්ති වශයෙන් නොබෙදා හැමට සමව බුක්ති විඳීමේ මහඟු දායාදයක් ප්‍රදානය කළ නිදහස් අධ්‍යාපනයේ ම ළඟම සංකේතවත් කරන පාසල් මෙරට කොතෙක් වෙත් ද? මේ එම දුක්බර කතාවේ සජීවමත් නිදසුන් ය.

"ඕමදොල ඉඳලා කිලෝමීටර් 8ක් දුර ළමයින් පයින් ම එනවා. එහෙම ඇවිල්ලත් ඉඳගන්න පුටුවක් නැහැ. සාමාන්‍ය පෙළ සමත් වන ළමයකුට උසස් පෙළ හදාරන්න කි.මී. 70ක් විතර දුරින් තියන දෙමළ විදුහලකට යන්න වෙනවා. මුස්ලිම් පාසල තිබුණත්, හින්දු සංස්කෘතිය උගන්වන්නේ නැහැ" උඩුගම අධ්‍යාපන කලාපයට අයත් නාකියාදෙණිය තලංගහ සරස්වතී දෙමළ විදුහලෙහි වත්මන් තත්වය ගැන සඳහන් කළේ එහි සේවය කරන ගුරු පිරිසකි.

උසස් පෙළ දෙමළ මාධ්‍ය පුද්ගලික පන්ති සඳහා ගාලු නගරයට කි.මී. 50 ක් පමණ දුර යා යුතුව ඇත්තේ කි.මී. 7-8 ක් පයින් යෑමෙන් අනතුරුව ය. පසු ගිය සාමාන්‍ය පෙළ ප්‍රතිඵල අනුව විභාගයට ලියූ දරුවන් 15 දෙනාගෙන් තිදෙනෙකු උසස් පෙළ සඳහා සුදුසුකම් ලබා තිබේ. එයින් දරුවන් දෙදෙනෙක් හැටන් නගරයේ දෙමළ විදුහලකට ඇතුළත් ව සිටිති. අනෙක් සිසුවා මාතර මුස්ලිම් විදුහලකට ඇතුළත් ව සිටී. ආහාර හා නේවාසික ගාස්තු වශයෙන් රු. 5000කට අධික මුදලක් ගෙවීමේ හැකියාව ඔවුන්ගේ දෙමව්පියන්ට නොමැති හෙයින් මේ දරුවන්ගේ අනාගත ඉරණම අවිනිශ්චිත ය. ගුරු හිඟයට ප්‍රධාන හේතුවක් ව පවතිනුයේ බදුල්ල, බලංගොඩ, හැටන් හා නුවරඑළිය යනාදී ප්‍රදේශවලින් පැමිණෙන ගුරුවරුන් දුෂ්කර සේවය අවසන් වූ වහාම ස්ථාන මාරුවීම් ලබා ගෙන පිට පළාත්වලට යෑම ය.

1 සිට 5 වසර දක්වා දරුවන්ට දිවා ආහාර වේල ලබා දීම අනිවාර්ය වූව ද තලංගහ සරස්වතී විදුහලට එම අවස්ථාව ද අහිමි වී ඇත. ආහාර කොන්ත්‍රාත්තුව ලබා දෙන්නේ සමෘද්ධිලාභියකුහට ය. එහෙත් වතු කම්කරුවන්ට සමෘද්ධි ප්‍රතිලාභ නොමැති හෙයින් ආහාර කොන්ත්‍රාත්තුව පවරා දීමට කෙනෙකු නොමැත. දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට මේ දුක් ගැනවිල්ල ඉදිරිපත් කර දෙවසරක් ගත වී ඇතත් කිසිදු විසඳුමක් ලබා දී නැතැයි තලංගහ විදුහලේ ගුරුවරයෙක් පැවසී ය.

මෙලෙස දකුණු පළාතට අයත් වතු පාසැල් ගණනාවක වත්මන් තත්වය නිරීක්ෂණය කිරීමේ දී පෙනී යන කරුණක් වනුයේ ශ්‍රී ලංකාවේ අන්ත දුෂ්කර ග්‍රාමීය පාසැලක තිබෙන පහසුකම් ටිකවත් වතුපාසැල්වල නොමැති බව ය.

වත්මන් විභාග තරගය අනුව උසස් පෙළ සමත් වූවන් අතරිනුත් උසස් අධ්‍යාපන වරම් ලැබෙනුයේ සීමිත පිරිසකට ය. ඒ සීමිත පිරිස අතරින් කෙනෙකු බවට පත් වීමේ අවස්ථාව වතු පාසැල් සිසුවකුට ඇතෙකු ඉඳිකටු සිදුරකින් යෑමට සමාන කළ හැකි ය.

දෙමළ වතු පාසැල්වල උසස් පෙළ සමත් දරුවන්ගෙන් විශිෂ්ටයන් හට අවස්ථාව ලැබෙන ශ්‍රී පාද විද්‍යා පීඨයට ඇතුළත් විය හැක්කේ දෙමළ භාෂාව සහ හින්දු සංස්කෘතිය හැදෑරීමෙන් පමණි. එහෙත් උසස් පෙළ හැදෑරීමට දෙමළ පාසලක් නොමැති නිසා මුස්ලිම් විදුහලට ඇතුළත් වන දෙමළ සිසුවාට හෝ සිසුවියට සිදුවන්නේ ඉස්ලාම් ධර්මය ඉගෙන ගැනීමට ය. මේ නිසා ඉතා අවාසනාවන්ත අන්දමින් විද්‍යා පීඨයේ දොරගුළු ඔවුන්ට වැසී යයි. මෙය බලවත් අපරාධයක් නොවේ ද?

ඇල්පිටිය අධ්‍යාපන කලාපයට අයත් තල්ගස්වල දෙමළ කනිටු විදුහලෙන් පසුගිය වසරේ 12 දෙනකු සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට 4 දෙනකු සමත් ව ඇත. එහෙත් පිට පළාතකට ගොස් නේවාසික ව ඉගෙන ගැනීමේ ආර්ථික හයියක් නොමැතිකමින් ඉන් එක් සිසුවකුගේ අධ්‍යාපනය ඇනහිට තිබේ.

විදුහලේ දහසකුත් එකක් අඩුපාඩු තිබිය දී වුව ද දිවිතුර දෙමළ කනිටු විදුහලේ දරුවෙකු මෙවර ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 139 ක් ලබා ගෙන ඇත. එහෙත් ගාල්ල නගරයේ උපරිම පහසුකම් තිබෙන විදුහල්වල අවම ලකුණු මට්ටමත් වතු පාසැලේ අවම ලකුණු මට්ටමත් එකකි.

දෙනියාය ශාන්ත මැතිව් පාසැල මාතර දිස්ත්‍රික්කයට අයත් එක ම ද්විභාෂා පාසැලයි. මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වන 1300 න් 424 ක් දෙමළ ළමයින් ය. දෙමළ අංශයෙන් උසස් පෙළ පන්ති පසුගිය වසරේ ආරම්භ කර ඇත. එහෙත් ඉඩකඩ ප්‍රශ්නය හේතුවෙන් භාෂා දෙකකට අයත් පන්ති වෙන් නොකරන ලද ඉඩක් තුළ පවත්වාගෙන යෑම නිසා දරුවන්ගේ ඉගෙනුමට බාධා පැමිණ ඇත. පාසැල් ඉඩමේ අනවසර පදිංචිකරුවන් සිටීමෙන් දරුවන්ගේ ආරක්ෂාවට තර්ජන ඇති වී තිබේ. 1987 දී අදාළ ඉඩම පාසැලට පවරා දී ඇතත් නිලධාරීන් විසින් ඉඩම නිරවුල් කර දී නොමැත. දකුණු පළාතේ සියලු වතු පාසැල් මුහුණ දෙන දෙමළ මාධ්‍ය ගුරුහිඟය ශාන්ත මැතිව් ද්විභාෂා පාසැලට ද බලපා තිබේ. පාසැල් භූමියේ ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිරිපිට මහාමාර්ගයට පස් කණ්ඩියක් කඩා වැටීම ඔස්සේ නාය යෑමේ අනතුරක් මතු වී ඇති හෙයින් එය ප්‍රධාන ගොඩනැගිල්ලේ පැවැත්මට ද අනතුරක් වී ඇත.

පසුගියවර උසස් පෙළ සඳහා සුදුසුකම් ලැබූ මොරවක අනින් කන්ද දෙමළ විදුහලේ සිසුවකු ද නේවාසික ගාස්තු දැරීමේ හැකියාව නොමැතිකමින් අධ්‍යාපනය කඩාකප්පල් කරගෙන සිටී.

මේ ප්‍රදේශයේ වතු පාසැල් පහ වෙනුවෙන් දෙමළ භාෂාව දන්නා නිලධාරියෙක් අධ්‍යාපන කාර්යාලයේ නැහැ. ඒකත් ලොකු අඩු පාඩුවක්" මොරවක හැන්ෆෝඩ් දෙමළ පාසැලේ විදුහල්පති, වයි. කරුණාදාස මහතා පවසයි.

මාතර දිස්ත්‍රික්කයට අයත් බෙවර්ලි දෙමළ පාසැල 1992 වසරේ ජනප්‍රිය පාසැල් තේරීමේ තරගයෙන් 3 වැනි ස්ථානය දිනාගත් පාසැල යි. සිසුන් 500ක් ඉගෙනුම ලබන මේ පාසැලේ ගුරුවරු ඇතැම් විට රාත්‍රි 8 වනතුරු අතිරේක පන්ති ද පවත්වමින් විදුහල උසස් මට්ටමකට ගෙන ඒමට ප්‍රයත්න දරති. සීසන් ලබා ගත් දරුවන් 160 දෙනකු පාසලට රැගෙන ඒම සිදු කරන්නේ තනි දොරේ පුද්ගලික බස් රියකිනි. ලංගම බස් රියක් ඉල්ලා ඇතත් මේ වනතුරු ලැබී නොමැත. පුද්ගලික බස් රියෙහි සීසන් පත සඳහා දරුවකු රු. 400/- බැගින් මාස්පතා ගෙවිය යුතු ය. මේ හේතුව නිසා දරුවන් කිහිප දෙනකු සිටින නිවෙස්වලින් එක් දරුවකු පමණක් පාසැලට එන අවස්ථා ද ඇත. මෙතරම් දුෂ්කරතා මධ්‍යයේ වුව ද ගායනා සහ නැටුම් තරගවලින් සමස්ත ලංකා මට්ටමින් ලැබූ ජයග්‍රහන ද විද්‍යාලය සතු ය.

එන්සල්වත්ත දෙමළ කනිටු විදුහලෙහි දරුවන්ගේ දෙමාපියන්ගේ ඉල්ලීම මත සෙල්වකන්ද සහ පැටිනා ප්‍රදේශවලින් ලොරි දෙකකින් දරුවන් ප්‍රවාහනය කෙරේ. ඇතැම් දරුවෝ පාන්දර 5.00ට පමණ පටන්ගෙන කි.මී. 7-8 දුර ගෙවා විදුහලට පැමිණෙති. පාසැල් ඇරී නිවසට යනවිට ද පස්වරු 5.00 පසුවෙයි.

සිංහරාජ ප්‍රදේශයෙහි සිට පාසැලට පැමිණෙන දැරියක් වැඩිවියට පත්වුවහොත් ත්‍රීරෝද රියකින් නිවසට ඇරලවීම සඳහා රු. 1800ක් ගෙවිය යුතු ය. මෙබඳු දහසකුත් එකක් දුෂ්කරතා මධ්‍යයේ පවත්වා ගෙන යන වතු පාසැල් පිළිබඳ පළාත් සභා අධ්‍යාපන බලධාරීන් විශේෂ සැලකිල්ලකින් කටයුතු කළ යුතු ව තිබේ.

ලාංකීය ආර්ථිකයේ කොඳු නාරටිය ශක්තිමත් කිරීමේ නිහඬ දායකත්වය සපයන වතු කම්කරුවන්ගේ ජීවන චිත්තිය සෝකාන්තයකි. ඔවුන්ගේ දරුවන්ට අධ්‍යාපනයෙන් කරන නිගරුව, ඔවුන් වහලුන් හැටියට ම තබා ගත යුතු බවට කෙරෙන ඉඟියක් ද?

**මේවා රජයේ වගකීම්**

රාජේන්ද්‍ර සොයිසා - CODESEP වැඩසටහන් කළමනාකරු

වතුකරයේ දරුවන්ගේ අධ්‍යාපනය නැංවීම වෙනුවෙන් අප මැදිහත්වීමක් කරනවා. ආයතනයේ වියදමෙන් 60%ක් අධ්‍යාපනය සඳහා වෙන්කර තිබෙනවා. නමුත් අපට මූල්‍යාධාර දෙන රටවල් දැන් අදිමදි කරනවා. ඔවුන් කියන්නේ මේවා රජයේ වගකීම බවයි.

**පැය හතරට පහක් වැඩ කරනවා**

එම්. එලානි - එන්සාල්වත්ත අවිධිමත් අධ්‍යාපන ආයතන ගුරුවරියක්

මට රු.2800 ක දීමනාවක් ලැබෙනවා. දවසකට පැය 3ක් වැඩකරන්න නියමිත වුණත් මම පැය 4 ගණනේ දවස් පහම වැඩ කරනවා. උප්පැන්න නැති දෙමාපියන් නැති ළමයින් ඉන්නවා. අසරණ වුණ දරුවන් සොයාගෙන ලියන කියන හැකියාව ඇති කරලා වතු පාසලට ඇතුළත් කිරීම මගේ වගකීම.

කල්පවත්නා විසඳුමක් ගේනවා

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍ය - චන්දිම රාසපුත්‍ර මහතා

වතු පාසල්වල තිබෙන අඩුපාඩු ගැන මා සොයා බැලුවා. පිටපළාත්වල ගුරුවරුන් මේ පාසැල්වල සේවයට අනුයුක්ත කිරීම විසඳුමක් නොවෙයි. වතු පාසල්වල ඉගෙන ගන්නා දරුවන් අතරින් ම දක්ෂයන් මතුකරගෙන ඔවුන් නිසි පුහුණුවක් ඔස්සේ සේවයට අනුයුක්ත කරන තුරු ගුරු හිඟයට විසඳුමක් නැහැ. නගර ආසන්නේ සමහර විදුහල්වල ගුරුවරුන් අතිරික්තයක් සිටින බව ඇත්ත. නමුත් එන්සල් වත්තට ගිහින් උගන්නන්න කියලා ඒ අයට කීවට වැඩක් නෑ. මේ නිසා වතු පාසැල්වල තත්වය ඉහළ නැංවීම සඳහා කල්පවත්නා විසඳුමක් කෙරෙහි මගේ අවධානය යොමුවී තිබෙනවා.

## වතු පාසල් කිහිපයක අඩුපාඩු

| පාසලේ නම | අධ්‍යාපන කලාපය | ළමයින් සංඛ්‍යාව | නියමිත ගුරුවරු සංඛ්‍යාව | දැනට සිටින ගුරුවරුන් සංඛ්‍යාව | ගුරු ඌනතා |
|---|---|---|---|---|---|
| තලංගහ සරස්වතී දෙමළ විද්‍යාලය නාකියාදෙණිය | උඩුගම අධ්‍යාපන කලාප | 250-275 | 16 | 10 | ප්‍රාථමික ගුරුවරුන් 5<br>හින්දුආගම නියෝජ්‍ය විදුහල්පතිවරයෙක 'සිංහල භාෂාව,දෙමළ, භාෂාව නැටුම්, සංගීතය, ඉතිහාසය |
| තල්ගස්වල දෙමළ කනිෂ්ඨ විද්‍යාලය | ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය | 160 | 13 | 08 | ප්‍රාථමික පන්ති ගුරුවරු 4 , ඉංග්‍රීසි ගුරුවරයෙක්, දෙවන බස සිංහල ගුරුවරයෙක්, සෞන්දර්ය විෂයයන්, සංගීත, නැටුම් ගුරුවරුන්, දෙමළ භාෂාව |
| දිවිතුර දෙමළ කනිෂ්ඨ විද්‍යාලය- | ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය- | 215 | 14 | 07 | ප්‍රාථමික අංශය සඳහා ගුරුවරු ඉතිහාසය,දෙමළ භාෂාව, ගණිතයට, නැටුම්, සංගීත |
| සාන්ත මැතිව් ද්විභාෂා පාසල දෙනියාය | මොරවක කලාප අධ්‍යාපන කාර්යාලය | 1300<br>දෙමළ<br>424 | 16 | 12 | දෙමළ භාෂාව, විද්‍යාව ,නැටුම්, සංගීත |

| | | | | | |
|---|---|---|---|---|---|
| අනින්කන්ද දෙමළ විද්‍යාලය- | මොරවක අධ්‍යාපන කාර්යාලය/ | 448 | 18 | 13 | සංගීත, නැටුම්, දෙමළ භාෂාව ප්‍රාථමික ගුරුවරු |
| හැන්ෆෝඩ් දෙමළ පාසල/ | මොරවක අධ්‍යාපන කාර්යාලය/ | 318 | 15 | 11 | ඉංග්‍රීසි විෂය, නැටුම්, සංගීත දෙමළ භාෂාව, ප්‍රාථමික ගුරුවරු |
| බෙවර්ලි දෙමළ විද්‍යාලය- | දෙනියාය අධ්‍යාපන කාර්යාලය | 500 | 22 | 09 | ප්‍රාථමික ගුරුවරු සංගීත,නැටුම් ,දෙමළ භාෂාව |
| එන්සල්වත්ත දෙමළ කනිෂ්ඨ විද්‍යාලය | | 404 | 17 | 10 | සිංහල, දෙමළ,සංගීතයනැටුම්,විද්‍යාව, ශරීර සුවතා , කෘෂිකර්ම |
| හුලන්දාව දෙමළ විද්‍යාලය | අකුරැස්ස කලාපය | 375 | 18 | 15 | නැටුම්, සංගීත, හින්දු ආගම, දෙමළ භාෂාව |

# රන්මසු සමඟ කඳුළු ගෙනෙන රට රැකියා

මට තියෙන එක ම බලාපොරොත්තුව පුතා විතරයි. මම රට ගිහින් හොයාපු සල්ලි වලින් ත්‍රීවිල් එකක් ගත්තා. ඒකෙන් ජීවත් වෙන්න පුළුවනි. ඒත් මම නැති අතරේ දුව හිතුවක්කාර උනා. ඒ ගැන මම ඉන්නේ දුකෙන්."

කුරුණෑගල ගනේවත්ත පදිංචිකරුවකු වන ආර්.කේ. විල්බට් (අවු 48 යි) ගේ ප්‍රකාශය කාන්තාරයෙන් රන්මසු සොයාගෙන මව්බිමට පය ගසන ශ්‍රමිකයන්ගේ ජීවිතයේ සුබ හා අසුබ පැති පිළිබඳව පසු විපරමක් සඳහා හොඳ නිමිත්තක් සපයයි. මැදපෙරදිග රටවල රැකියා සොයා ගිය ලාංකිකයන් මුහුණ දෙන කඨෝර අත්දැකීම් පිළිබඳ කතා බහක් ඇතිවීමේ ආසන්න හේතුව වූයේ කම්බි ඇණ විශාල ප්‍රමාණයක් ශරීරගත කරන ලද කාන්තාවක් රැකියාව අතහැර මව්බිමට පැමිණීම ය. එහෙත් මෙ බඳු ආන්දෝලනාත්මක සිදුවීමකින් පසුව ඇති වන කතා බහ ටික කලකින් මැකී යයි. ශ්‍රමිකයන්ගේ චක්‍රය සුපුරුදු ලෙස ම කැරකෙයි. මේ ලිපියෙහි නිමිත්ත වූ හත්කෝරළයේ උපන් විල්බට් දුරු කතර ගෙවා, කඹුරා ත්‍රීරෝද රථයක් මිල දී ගන්නා විට පියකුගේ රැකවරණ නොමැති ව හැදී වැඩුණු දියණිය පවුලේ සම්මතයන්ට පයින් ගසා ඉගෙනුම කඩාකප්පල් කරගෙන හිතුවක්කාර විවාහයක් ද කරගෙන හමාර ය. විල්බට්ගේ බිරිය තම සැමියා රට රස්සාවට යෑමේ තීන්දුවට විරුද්ධ වූවා ය. එහෙත් විල්බට් කල්පනා කළේ විඳව විඳවා එක තැන ඉන්නවාට වඩා ගොඩ එන මඟක් ගැන ය. විල්බට්ගේ කතාව විදෙස් රැකියා සඳහා මව්බිමෙන් නික්ම යන පියවරුන්ගේ හා මව්වරුන්ගේ පවුල නමැති ඒකකය අර්බුදයට ලක්වීම පිළිබඳව සංකේතාත්මක පුවතකි. මේ හැම පවුලක ම ඇත්ත තතු අඩු වැඩි වශයෙන් එයාකාර ය.

ආර්ථිකයේ කොඳු නාරටිය ශක්තිමත් කිරීම උදෙසා මෙරට කාන්තාව කරන කැප කිරීමට සරිලන ප්‍රත්‍යෝපකාරයක් පෙරලා සමාජයෙන් ඔවුනට ලැබී තිබේ ද?

මව් රටේ ආර්ථිකය ශක්තිමක් කිරීම සඳහා ඔවුන්ගෙන් ලැබෙන මුදල් කන්දරාවෙන් සුළු කොටසක්වත් අර්බුදයට ලක්වන ඔවුන්ගේ පවුල්වල සුබ සාධනය වෙනුවෙන් වෙන්කිරීමට අපේ රටේ වගකිවයුත්තෝ සමත් වී සිටිත් ද?

කුරුණෑගල - එළුගල ප්‍රදේශයේ පදිංචි සමන්ති 1993 වසරේ විදස් ගත ව මව් රටට පැමිණියේ නොබෝදා ය. තම සැමියාට සහ නැන්දනියට දරුවන්ගේ වගකීම් බාරදුන් ඇය නැවත මව් රටට පැමිණෙන විට කිසිදු දරුවකු ඇය හඳුනා ගන්නා මට්ටමක සිටියේ නැත.

"දූලා පුතාලා අම්මා කියන්නේ නැන්දම්මට, මං ඇවිල්ලා මාස කීපයක් ගත වුණා. ඒත් දරුවන් හැමදේ ම කියන්නේ එයාට. ඇත්තට ම මං නැති අඩුව නොදැනෙන්න එයා වැඩ කළ හින්දයි එහෙම උනේ. රට ගිය අයගෙ පවුල්වල දරුවන්ට වෙලා තියෙන දේවල් පේනකොට මම ආපු එක හොඳයි කියලා හිතෙනවා"

සමන්ති පවසයි.

දිනක් සමන්තිගේ නිවසට යාබද නිවසක පදිංචි දරුවෙක් ඇගෙන් මේස් කුට්ටමක් ඉල්ලා සිටියේ ය. එම පවුලේ බාල දරුවා ඔහු ය. වැඩුමල් පිරිමි දරුවන් තිදෙනා ම පාසැල් නොයති. සමන්ති වැඩි දුරටත් ඒ ගැන මෙසේ කියයි.

“බාල දරුවා විතරයි කඩින් කඩ ඉස්කෝලේ යන්නේ. අම්මා රට ඉඳලා සල්ලි එවනවා. පිරිමි දරුවන් කාල බීලා විනෝද වෙනවා. පාරේ යන අයට කතා කියනවා. දරුවන්ගෙ තාත්තට හයියක් තිබුණා නම් මෙහෙම වෙයි ද?”

මැද පෙරදිගින් උපයාගත් මුදල් පවුල් දෙකකට දෙයාකාර ව බලපා ඇති අයුරු සමන්තිගේ කතාවෙන් පෙනේ. ඉබ්බාගමුව පදිංචි සිත්ති සමීරාගේ කතාව මැදපෙරදිග ගිය මව්වරුන්ගේ දියණිවරුන් මුහුණ දෙන දුක්ඛදායක ඉරණම කියාපායි. සිත්ති සමීරා පසුගිය අගෝස්තු මස උසස්පෙළ විභාගයට පෙනී සිටියා ය.

“තාත්තා අප දාලා ගියාම අපි අසරණ උනා. මමයි මල්ලියි ආච්චි ළඟ තියලා අම්මා රට ගියා. මාසෙකට රු. 6000ක් එවනවා. ඒත් අපේ මල්ලි මුරණ්ඩු උනා. ළමයින් එක්ක ගහගෙන ගෙදර නැවතුණා. පවුලේ කවුරුවත් අප ගැන බලන්නේ නෑ. අම්මට ඇදුම තියනවා. ඉන්න තැන කරදර යි කියලා ලියුම් එවනවා. මේනිසා, මම නිතර ම ඉන්නේ දුකින්. අපේ අනාගතයට මොනවා වෙයි ද?

කුරුණෑගල මොරතැන්න පදිංචි චන්ද්‍රවතී (අවු 19යි) ගේ අත්දැකීම ඊට වෙනස් ය. මව විදෙස්ගත වූ පසුව තම පියා මත්පැන් බීම අත්හළ බවත් 2011 වසරේ මව ආපසු ගමට එන විට පදිංචි වීම සඳහා නව නිවසක් තනා ඇති බවත් ඇය පවසයි. එහෙත් ඇය ද පසු වන්නේ කණස්සල්ලකිනි.

“අම්මා ගියාට පස්සේ අපි අපේ ආරක්ෂාව සලසා ගත්තේ හුඟක් අමාරුවෙන්. පිරිමි අය අපි දිහා වපර ඇසින් බලන්නේ. අනවශ්‍ය විහිලු කරනවා. සමහර ගෑනු ළමයි මේ නිසා ම කරදරවල පැටලෙනවා” චන්ද්‍රාවතී පවසයි.

කුරුණෑගල පදිංචිකාරියක වන කුමාරි නවරත්නගේ සැමියා ලොතරැයි අලෙවිකරුවෙකි. එයින් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවූ නිසා කුමාරි මැදපෙරදිග රැකියාවකට ගියා ය. දරුවන් සිව් දෙනාගේ අනාගතය යහපත් කිරීම ඇගේ අරමුණ විය. එහෙත් සිදු වූයේ කුමක් ද?

“මම රට ගිහින් මහත්තයට සල්ලි එව්වා. ඒවා බීලා විනාශ කරනවා කියලා නෑනා මට ලියුම් එව්වා. ඊට පස්සේ නෑනට සල්ලි එව්වා. නෑනත් එව්වා විනාශ කළා. ළමයින්ගේ පාසැල් ගමන නැවතුණා. ඊට පස්සෙ මම ලංකාවට ඇවිත් පොළේ වෙළෙඳාම් කරලා ටිකක් ඔළුව ඉස්සුවා. දැන් මහත්තයා බොන්නේ නෑ. මට උදව් කරනවා. රට ගිහින් හොයපු සල්ලි වතුරෙ ගියා. ගෙයක් හදා ගන්න බැරි උනා. රට ගිහින් මං කළේ මෝඩ කමක්.”

කුමාරි නවරත්නගේ අත්දැකීමට සමාන අත්දැකීම් සිය දහස් ගණනක් වුව ද මෙසේ ලියා සටහන් කළ හැකිය. මේ සියලු අත්දැකීම් ඔස්සේ කියාපාන්නේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන අපේ රටේ ග්‍රාමීය හා නාගරික දිළිඳු කාන්තාවන් බොහොමයකගේ කුටුම්බ ජීවිතය හා ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය අඳුරු වී ඇති ආකාරයයි.

කුරුණෑගල නගරයේ පදිංචි කමලා ප්‍රියදර්ශනි (අවු 29) ණය තුරුස්වලින් නිදහස්වීමේ අරමුණින් විදෙස් ගත වූවා ය. 20% පොලියට ගත් ණය මුදල් ගෙවීම සඳහා ඇය දුරු රට සිට තම සැමියාට මුදල් එවා ඇතත් ණය පියවා නොමැති බවට ණයකරුවෝ කියති. තමා ණය ගෙවා ඇති බව සැමියා පවසතත් එවූ මුදල්වලට සිදු වූයේ කුමක්දැයි පැහැදිලි නැති බව කමලා කියයි.

" ඒ ගෙවල්වල මිනිසුන්ගෙන් බේරෙන්න අමාරුයි. ගෑනු අපෙන් වැඩ ගන්නේ වහල්ලුන්ගෙන් වගේ. මම මාස 8 ක් පඩි නැතිව එක ගෙදරක වැඩ කළා. එතනින් පැනලා ඇවිත් එම්බසියේ නැවතිලා ඉන්න ගමන් රැකියාවක් කළා. ටිකට් එකක් අරං ගෙදර ආවා. අන්තිමට අපි කබලෙන් ළිපට වැටුණා." කමලා ප්‍රියදර්ශනී පවසයි.

මැදපෙරදිග රැකියා උල්පත පෑදුණේ 1978 නිදහස් ආර්ථිකය හඳුන්වා දීමත් සමඟ ය. එතෙක් කෘෂිකාර්මික බිම්වල පවුලේ ශ්‍රමයට එක් ව සිටි කතුන් විශාල වශයෙන් රට රැකියා වලට යෑමේ එක් ප්‍රතිඵලයක් වූයේ ශ්‍රමිකයන් හීන වීමෙන් කෘෂිකර්මය සඳහා කුලී  ශ්‍රමිකයන් අවශ්‍ය වීමයි.  එමෙන් ම 2004 වන විට මෙරට දරු උපත් අනුපාතිකය 1.8 ක් දක්වා අඩුවීම කෙරෙහි බල පෑ ප්‍රධාන සාධක අතර  එකක් වනුයේ දරුවන් වදන වයසේ කාන්තාවන් අට ලක්‍ෂයක් දෙනා රට රැකියාවල නිරත වීම ය. දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීම ද, මවගේ රැකවරණය අහිමි වූ දැරියන් ඥාතීන්, අසල්වැසියන් හෝ ඇතැම් විට පියා අතින් අපහරණයට ලක් වීම ද දුලබ නොවන අත්දැකීමකි. මෙබඳු පවුල්වල සුබ සාධනය හා පවුල් උපදේශනය කාලීන අවශ්‍යතාවකි. එමෙන්ම මැද පෙරදිග කඹුරන ශ්‍රී ලාංකිකයන් වහලුන් හැටියට නොව ඔවුන් අපේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙන ගෞරවනීය පිරිසක් හැටියට සැලකීමේ කෘතවේදීගුණය රට කරවන්නන් සිත්හි තිබිය යුතු නොවේ ද ?.

**දිගු කාලීන ව අවාසි යි**

තිලකා ගමගේ (කුරුණෑගල කාන්තා සංවර්ධන පදනම)

මැදපෙරදිග රැකියා කරන අයගෙන් කෙටි කාලීන වාසියක් රටට තිබුණත් දිගු කාලීන වශයෙන් සමාජමය හානියක් තියෙනවා. මේ සමාජ ගැටලුව පිළිබඳව සානුකම්පිකව බැලීම අවශ්‍යයි. සේවා සුරක්ෂිත බව, ප්‍රමිතියකින් යුතු ඒජන්සි හඳුන්වා දීම, තානාපති කාර්යාල මීට වඩා වගකීමකින් කටයුතු කිරීම, විදෙස් ගත දරුවන්ගේ සුබ සාධනය, අධ්‍යාපනය හා පෞරුෂ වර්ධනය පිළිබඳ වැඩ පිළිවෙළක් දියත් කිරීම වර්තමානයෙහි  අත්‍යවශ්‍යම කටයුත්තක්.

**පුහුණු ශ්‍රමිකයන්ට වැඩි අවස්ථාවක් දෙනවා.**

- කම්කරු අමාත්‍ය ගාමිණී ලොකුගේ

" මැදපෙරදිග රැකියාවලට යෑමේදී ඔවුන්ගේ රැකියා කාලය තුළත්, ආපසු පැමිණි පසුත් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ විදේශ සේවා නියුක්ති කාර්යංශයෙන් පුහුණුවක් ලබා දෙනවා.  නමුත් අපේක්ෂිත ප්‍රතිඵල ලැබෙන්නේ නෑ. නුපුහුණු සේවකයන් යැවීම පුලුවන් තරම් අවම කිරීම යි අපේ අරමුණ. මැදපෙරදිග රටවල රැකියා සඳහා ගිය අයගේ පවුල්වල සුබසාධනය වෙනුවෙන් පුහුණු නිලධාරීන් පිරිසක් පත් කර තිබෙනවා. ඔවුන් මේ වන විට මූලික වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා.  දීර්ඝ කාලයක් තිස්සේ ඇති වුණු ප්‍රශ්න පැහැදිලිව තේරුම් ගෙන එකින් එක විසඳීමට පියවර ගත යුතුයි.

අප හැඩ ගැසී තිබුණේ ගෘහ සේවය, රියදුරු වෘත්තීය වගේ සීමා සහිත ක්ෂේත්‍රයක් සඳහා ශ්‍රමිකයන් යැවීමට ය. නමුත් අදවන විට කර්මාන්ත සහ තොරතුරු තාක්‍ෂණය ආදි ක්ෂේත්‍ර ගණනාවක රැකියා මාර්ග විවෘතව තිබෙන නිසා කිසියම් අධ්‍යාපන මට්ටමක් සහිත නිසි පුහුණුවක් ලැබූ පිරිස් මැදපෙරදිග සහ තවත් බොහෝ රටවල රැකියා සඳහා යැවීමට අප සැළසුම් කර තිබෙනවා. එවැනි තත්වයක් යටතේ රට රැකියා නිසා ඇතිවන සමාජ ගැටලු අවම කර ගත හැකියි.

වර්ෂ කිහිපයක මැද පෙරදිග රටවලින් ලංකාවට ආ විදේශ විනිමය (රුපියල් මිලියන)

| | 2005 | 2006 | 2007 | 2008 | 2009 |
|---|---|---|---|---|---|
| මැදපෙරදිග | 11,179 | 128,282 | 160,502 | 189,039 | 229,298 |

| **දිස්ත්‍රික්කය** | **ගැහැණු** | **පිරිමි** | **මුළු ගණන** |
|---|---|---|---|
| කොළඹ | 12, 355 | 15, 475 | 27,830 |
| ගම්පහ | 8, 870 | 10,601 | 19,471 |
| කළුතර | 5311 | 5107 | 10,418 |
| **කුරුණෑගල** | **14,371** | **7051** | **21,422** |
| පුත්තලම් | 6820 | 4193 | 11,013 |
| නුවර | 8410 | 7593 | 16,003 |
| මාතලේ | 3743 | 2043 | 5786 |
| නුවර එළිය | 2896 | 1255 | 4151 |
| ගාල්ල | 5753 | 4402 | 10,155 |
| මාතර | 2876 | 2385 | 5261 |
| හම්බන්තොට | 2149 | 1527 | 3676 |
| යාපනය | 581 | 3391 | 3972 |
| මන්නාරම | 308 | 615 | 923 |
| වව්නියාව | 637 | 1341 | 1978 |
| මුලතිව් | 40 | 130 | 170 |
| මඩකලපුව | 3201 | 6974 | 10,175 |
| අම්පාර | 2516 | 7339 | 9855 |
| ත්‍රිකුණාමලය | 2489 | 2139 | 4628 |
| අනුරාධපුර | 8229 | 3361 | 11,590 |
| පොළොන්නරුව | 3501 | 1438 | 4939 |
| බදුල්ල | 4570 | 1954 | 6524 |
| මොණරාගල | 1079 | 607 | 1686 |
| රත්නපුර | 4069 | 1930 | 5999 |
| කෑගල්ල | 5589 | 4177 | 9766 |

# යාපනයේ මුස්ලිම් ජනයා දෙවැනි වරටත් අවතැන් වෙයි.

"මුස්ලිම් කාන්තාවන් වන අපට පාරේ වැඩ කරලා පුරුදු නෑ. ඒ උනත් ලෝක ආහාර වැඩසටහන (world food programme) එකෙන් අපට ආධාර දෙනකොට කියන්නේ පාරේ වැඩ කරන්න කියලා. යුද්ධයෙන් පස්සෙ අපට මෙහෙ එන්න පුළුවන් වුණු බව ඇත්ත. ඒත් අපට නැවත පදිංචි වීමට අවශ්‍ය යටිතල පහසුකම් දෙන්න කාටවත් බැරි වී තියෙනවා."

යාපනය නගරයෙහි පදිංචිකාරියක වන නස්රියා පවසයි. මේ කතා බහ සඳහා බාතිල්, හානා, සහ මේෂා යන අය ද එක් වූහ. නස්රියාගේ ප්‍රකාශය අනුව බැලූ බැල්මට පෙනී යන්නේ තම සංස්කෘතික අනන්‍යතාව පිළිබඳ සංවේදී බවක් පුනරුත්ථාපනය සඳහා පැමිණෙන සංවිධානවලට නොමැති බව ය. එහෙත් එහි පසුබිමෙහි ඊට වඩා විශාල කතාවක් සැඟ වී ඇත. යුද්ධයෙන් පසු ව, උතුරු ප්‍රදේශයෙහි මුස්ලිම් ජනතාව නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු මාලාව හඳුනා ගැනීමේ ප්‍රවේශයකි එය.

1990 ඔක්තෝබර් 30 දා යාපනයෙහි මුස්ලිම් ජනතාවගේ අනාගත ඉරණම තීන්දු කළ දිනය විය. පැය දෙකක් ඇතුළත යාපනයෙන් පිටමංවිය යුතු යැයි එල්.ටී.ටී.ඊ සංවිධානය ඔවුන්ට නියෝග කළේ ය.

"යාපනයේ ජින්නා ක්‍රීඩාංගනයට අපේ අයට එන්න කීවා. අපේ රත්තරන් බඩු, සල්ලි ඔවුන් ගත්තා. බස්වල පටවලා යැව්වා. ඔවුන් බලාපොරොත්තු වුණේ රජයත් සමඟ කේවල් කරන්න දෙමළ අය විතරක් හිටියම ඇති කියල යි. 60,000ක් විතර සෙනඟ පුත්තලම, පානදුර, කුරුණෑගල, මීගමුව යන ප්‍රදේශවලට ගියා. අද ඔවුන් ටික ටික ආපහු එනවා. නමුත් යුද්ධයෙන් පසු ව ගැටලු රැසකට මුහුණ දෙන්න සිදුව තිබෙනවා."

යාපනය මොහොමදියා ජුම්මා පල්ලියෙහි සභාපති එම්. යූ. එම්. තාහිර් පවස යි.

නැවත පදිංචි කිරීම සඳහා නිශ්චිත ක්‍රම වේදයක් අනුගමනය නොකිරීම, මුස්ලිම් ජනතාව පිටමං කර සිටි වසර 20 ක කාලය සඳහාත් නගර සභාවේ බදු ප්‍රතිපත්තිය ලිහිල් නොවීම, විවිධ ව්‍යාපාර කටයුතු සඳහා පැමිණෙන සිංහලයන්ට අනුග්‍රහ දැක්වීම සහ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ට බාධා කිරීම, නගර සභාවට පත් වූ මුස්ලිම් නියෝජිතයන් පස් දෙනා තම සහෝදර ජනතාව ගැන සොයා නොබැලීම සහ තමන්ට අයත් ව තිබූ දේපළ වෙනත් අය විසින් අත් පත් කරගෙන තිබීම යනාදී ගැටලු රැසක් පිළිබඳ ව මුස්ලිම්වරු ප්‍රකාශ කරති.

යාපනය කදීජා පාසැලේ මුස්ලිම් පවුල් 7ක් පදිංචි ව සිටී. එල්.ටී.ටී.ඊ සංවිධානයෙන් පළවා හරින්නට පෙර ඔවුන් පදිංචි ව සිට ඇත්තේ කුලී නිවෙස්වල ය. එකල කුලී නිවසක් නඩත්තු කිරීමේ ආර්ථික හැකියාව ඔවුන් සතු විය. පුත්තලම නිරාවි ප්‍රදේශයේ වසර 20ක කාලයක් දුෂ්කර ජීවිතයක් ගත කළ ඔවුන්ට එල්.ටී.ටී.ඊ යේ පරාජයත් සමඟ නැවත යාපනයට පැමිණීමේ භාග්‍යය උදා විය. එහෙත් දැන් ඔවුනට සිදුව ඇත්තේ යළිත්වරක් සරණාගත කඳවුරුවල ජීවත්වන්නට ය.

“1990ට පෙර මමයි සැමියයි හෝටලයක් කළා. දැන් අපට එහෙම ව්‍යාපාරයක් කිරීමේ හයියක් නෑ. මම දැන් කරන්නේ බත් පැකට් විකුණන එක. නමුත් ජීවත් වන්න අමාරුයි. ”

සිත්ති නසීරා දුකෙන් පවස යි. සර්වෝදයේ සේවිකාවක ලෙස කටයුතු කළ ෆාතිමා ෆරීනා පදිංචි ව සිටින්නේ ද පාසැල් ගොඩනැගිල්ලක ය.

1990 දී දේපළ අහිමි වීමෙන් පසු ව දුෂ්කර ජීවිතයක් ගත කර 2002 සාම ගිවිසුමෙන් පසු ව නැවත යාපනයේ පදිංචියට පැමිණි ඇගේ පවුලේ උදවිය තවමත් ගත කරනුයේ දුෂ්කර ජීවිතයකි.

තම සැමියා කුලී වැඩවලට අමතර ව පරණ යකඩ එකතු කිරීම කරන බවත් යකඩ ප්‍රවාහනය කිරීමට අවසර නොදීම නිසා එය ද අතහැර දමන්නට සිදුව ඇති බවත්, ඇය පවසයි.

“යකඩ එකතු කිරීම මහා පරිමාණයෙන් කරපු අය හිටියා. යුද්ධයත් සමඟ ඒවා නැවතුණා. යුද්ධ කාලේ තිබ්බ නීති දැන් මොකට ද?.”

ෆාතිමා අසයි. 2009 හා 2010 වසරවල පැමිණි අවතැන්වූවන් සඳහා රජය හා ස්වේච්ඡා සංවිධාන වලින් උදව් උපකාර කරන නමුත් 2001 දී පැමිණි අයට එසේ උදව් නොලැබෙන බවත් ඇගේ චෝදනාවකි.

"අපට නැති වුණු දේවලට කිසි ම වන්දියක් නැහැ. අඩු ගණනේ ඉන්න ඉඩමක් හොයලා දීලා උදව් කරන එක ඒ අයගෙ වගකීමක් නේ ද? ” ඒ චෝදනාව අසාධාරණ යැයි කිව හැක්කේ කාට ද?

යාපනයට අයත් කොට්ටඩි හන්දිය, රෝහල හන්දිය, පස්මං හන්දිය, නව යෝනක වීදිය, නාවට්තුරෙයි වීදිය, ප්‍රධාන වීදිය කොට්ටපල්ලි, එස්.කේ.එස්. පාර, චාවාකච්චේරි, පලෙයි, කිලිනොච්චි සහ පේදුරුතුඩුව යනාදී ප්‍රදේශවල මුස්ලිම්වරු ජීවත් වූහ. මේ අය තම ව්‍යාපාර පවත්වාගෙන ගිය ගොඩනැගිලි අයත් වූයේ යාපනය නගර සභාවට ය.

වසර 20කට පසු ව නැවත පදිංචියට පැමිණි තමන් ව්‍යාපාර සඳහා එම ගොඩනැගිලි පාවිච්චියට ගන්නා විට නගර සභාව පසුගිය වසර 20ට ම බදු මුදල් ඉල්ලා සිටින බව සුළු වෙළදාම් හි නිරත ව සිටින කිහිප දෙනෙක් ම පැවසූ හ.

“ මුදල් තියෙන ටික දෙනෙක් ඒ බදු මුදල් ගෙවලා කඩ අයිති කර ගත්තා. අපි කොහොම ද ගෙවන්නේ.”

ගැටලුවලට පිළිතුරු දීම බලධාරීන්ගේ යුතුකමකි.

මුස්ලිම්වරුන් යාපනයෙන් බැහැර ව වසර 20ක් ජීවත් ව ඇත්තේ සිංහල ජනතාව සමඟ ය. මේ නිසා, ඔවුන් යාපනයේ යළි පදිංචියට පැමිණෙමින් සිටිනුයේ හොඳින් සිංහල කථා කරන පිරිසක් හැටියටත් සිංහල ජනතාව සමඟ සම්බන්ධකම් පවත්වාගෙන යන පිරිසක් හැටියටත් ය. මේ තත්වය දෙස සැකයෙන් බැලීමට යාපනයේ දෙමළ ජනතාව නැඹුරු වී ඇති සෙයක් ද නිරීක්ෂණය කළ හැකි ය. දෙමළ සහ මුස්ලිම් ජනයා අතර පෙර පැවති සම්බන්ධය නැවත ගොඩ නැගීම එක්තරා අභියෝගයකි.

“පේමන්ට් එකේ බිස්නස් එක යුද්ධයක් වෙලා. සිංහල අයටත් දෙමළ අයටත් දෙන අවස්ථාව අපට දෙන්නේ නැහැ. රුපියල් දහ දාහක පහළොස්දාහක වෙළඳාමක් තියෙන බව දැනුණොත් පොලීසිය අපෙන් පගාව ගන්නවා. නමුත් එල්.ටී.ටී.ඊ ය පගාව ගත්තේ සල්ලි කාරයින්ගෙන් පමණයි. ”

පදික වෙළෙන්දෝ තමන් මුහුණ දෙන දුෂ්කරතා පවසති. 1990ට පෙර කිලිනොච්චි ප්‍රදේශයෙහි පවුල් 70කට අයත් මුස්ලිම්වරු ජීවත් වූහ. ඔවුන් සතු ව තිබූ ඉඩම් දැන් අයත් වන්නේ දෙමළ ජාතිකයන් හට ය. සමහර ඉඩම් ආපසු දීමට කැමති වී ඇතත් නිවාස ඉදිකර ඇති ඉඩම් ආපසු ලබා දීමට එහි වත්මන් පදිංචිකරුවන් සූදානම් නැත. සමහර ඉඩම් එල්.ටී.ටී.ඊ සංවිධානයට විකුණා ඇති බව කියතත්, විකිණූ පදනම පැහැදිලි නැත. කෙසේ නමුත් නැවත පදිංචියට පැමිණෙන අයට අවශ්‍ය මූළුතැන්ගෙයි උපකරණ රජයෙන් ලබා දෙන බවත් කිලිනොච්චි 55 සැතපුම් කණුව අසල දැනට පවුල් 20ක් ද කිලිනොච්චි නගරයේ පවුල් 3ක් ද පදිංචියට පැමිණ ඇති බවත් කිලිනොච්චියේ පදිංචි මුස්ලිම් තරුණයෙක් පවස යි.

යාපනයේ පදිංචි මුස්ලිම්වරුන් පිටමං කිරීමේ දී එසේ නොගිය පිරිසක් වනුයේ නයිනතිව්හි මුස්ලිම්වරුන් ය. දෙමළ පවුල් 750ක් ද මුස්ලිම් පවුල් 30ක් ද එහි ජීවත් වෙයි. එල්.ටී.ටී.ඊ තර්ජන නොතකා තමන් එහි දිගට ම රැඳී සිටියේ එවක නයිනතිව් පාලනය කළ නාවික හමුදාවේ සහය නිසා බවත්, සහෝදර දෙමළ ජනතාව තමන්ට හිරිහැර නොකළ බවත් නයිනතිව්හි පදිංචි මුස්ලිම්වරු කියති.

“පල්ලර් කුලයට අයත් දෙමළ අයයි ධීවර කර්මාන්තයේ යෙදෙන්නේ. ඒ අය අපත් සමඟ කිට්ටු සම්බන්ධයක් තියෙනවා. මුස්ලිම්වරුන් නැවත යාපනයට පැමිණීම ගැන අප සතුටු විය යුතුයි.”

ධීවර කර්මාන්තයෙහි යෙදෙන මුස්ලිම් තරුණයකු වන යූ.එම්. ඉම්රාන් කාන් පවසයි.

නයිනතිව්හි සුළු වෙළෙඳ සැලක් පවත්වාගෙන යන කමීරා දරුවන් සය දෙනෙකුගේ මවකි. කල්මුණේ ඇය උපන් ගමයි. යුද්ධයෙන් පසු ව ධීවර කර්මාන්තය සඳහා විශාල පිරිසක් පැමිණ සිටීම නිසා අනවශ්‍ය තරගකාරී තත්වයක් ඇති වී තිබෙන බවත්, නාගදීපය වන්දනාවට පැමිණෙන පිරිස්වලට ගමට ඒමේ අවසර නොමැති නිසා ව්‍යාපාර දියුණුවක් නොමැති බවත් ඇය පවසයි. එහෙත් නාගදීපයේ විහාරාධිපති හිමියන් සහ නාවික හමුදාව මුස්ලිම් පවුල්වල ගැටලු ගැන සොයා බලන බවත් ඇය වැඩි දුරටත් පවස යි.

නයිනතිව් තත්වය සමඟ සසඳන විට යාපනයේ සෙසු ප්‍රදේශවල දැනට පදිංචිව සිටින මුස්ලිම්වරුන්ගේ තත්වය ශෝක ජනක ය. තමන්ට උරුම ව තිබූ ප්‍රදේශවල සම්ප්‍රදායික ජීවිතය පවත්වාගෙන යෑමට ඔවුහු උනන්දුවෙන් පසුවෙති. අතීතයේ විඳි අමිහිරි අත්දැකීම් සමුදාය වෙනස් අයුරකින් නැවත කරලියට එනු දකින්නට ඔවුන් කැමති නැත. අපි ඔවුන්ගේ හඬට සවන් දෙමු.

**ජනාධිපති තුමාගේ අවධානයට යොමු කළා.**

**මවුලවි බී.ඒ. සුපියාන් - යාපන මහනගර සභා නියෝජිත**

නැවත පදිංචි කරවීමේ දී ඉඩම් තියෙන පවුල් 100ක් ගැන පළමුව අවධානය යොමු කළා. යටිතල පහසුකම් ලබා දෙන්නැයි අපි 2009 දි ඉල්ලීමක් කළා. හිටපු දිසාපති ගනේෂන් මහතාගෙන් 2010 දි ඇසූ විට ඔහු කීවේ රජයෙන් පිළිතුරක් නැති බව යි. පදිංචි කළ පවුල් 50කට සිමෙන්ති කොට්ට 8ක්

හා රු. 5000/= බැගින් දුන්නා. මුස්ලිම්වරුන් තවමත් කඳවුරුවල සිටීම ඛේදජනකයි. රජයේ ඉඩම් යාපනයේ නැති නිසා, පෞද්ගලික ඉඩම් මිලදී ගැනීමට සොයා බලනවා. ඔවුන්ගේ ගැටලු ගැන මිල්රෝයි ප්‍රනාන්දු ඇමතිවරයා දැනුවත් කළා. වීඩියෝ පටයක ආධාරයෙන් ඔහු ජනාධිපතිවරයා දැනුවත් කළ බව මට කීවා. ජනාධිපති තුමාගේ අවධානය ඒ ගැන යොමු වී ඇති බව යි ඔහු කියන්නේ.

**රජයේ වගකීමක්**

**හිටපු ඇමතිනී - ෆේරියල් අස්රෆ්**

ඔවුන්ගේ ප්‍රශ්න පිළිබඳ මට කීමට ඇති දෙයක් නැහැ. රජයේ නියෝජිතයන් වගකීම බාර ගත යුතුයි.

**මුස්ලිම් ජන ගහනය- යාපනය දිස්ත්‍රික්කය**

| වර්ෂය | 1981 | 2007 සිට මේ දක්වා |
|---|---|---|
| ජන සංඛ්‍යාව | 11839<br>1.4 % | 350<br>0.1% |

1981 සහ 2007 ජන හා සංඛ්‍යා ලේඛන වාර්තා වලට අනුව

# අහිමි වූ උරුමයට හඬන සිරම්බිඅඩියේ කැෆර්වරු

'අපට බොන්න වතුර නැහැ' මුස්ලිම් මුදලාලි කෙනෙකුට අයිති වතුර බුබුලක් තියෙනවා. ගැලුමක් රුපියල් හය යි. අපේ ළිංවල වතුර බොන්න බෑ. මිනිරන් වගේ කුඩක් තියෙනවා. MOH එකට දැනුම් දුන්නට වැඩක් වුණේ නෑ.'

පීටර් ලුවීගේ ප්‍රකාශය සරසර ගා වියළි කොළ අතු සොලවන සුළඟට එක් වෙයි. ඔහුගේ සිල්ලර කඩය පුරා ඇත්තේ හිඟය පිළිබඳ ලකුණු ය. පුත්තලම සිරම්බිඅඩියේ පදිංචි කැෆර්වරුන්ගේ ජන සමාජයට අයත් එක් දරු පියකු වන ඔහු පනස්තුන් හැවිරිදි ය. පීටර් ලුවීගෙන් කියැවුණේ සිරම්බිඅඩියේ ජනතාව මුහුණ දෙන ගැටලුවලින් එකකි. අප්‍රිකානු සම්භවයක් සහිත ජන කොට්ඨාසයක් වන සිලෝන් කැෆර්වරු ජීවත් වන ප්‍රදේශය  හැටියට පුත්තලම  සිරම්බිඅඩිය ගම්මානය ප්‍රකට වී ඇතත් කොළඹ, නුවර සහ මඩකලපුව යනාදී ප්‍රදේශවල ද සුළු පිරිසක් ජීවත් වෙයි.යටත් විජිත යුගයේ දී පළමුව පෘතුගීසීන් විසින් ද දෙවනුව ඉංග්‍රීසීන් විසින් ද විවිධ කටයුතු සඳහා අප්‍රිකානු ජාතිකයින් මෙරටට ගෙනෙන ලදී.

ඔවුන් සිංහලයන් සමඟ මිශ්‍ර වීමෙන් පරම්පරා ගණනාවක් තිස්සේ පැමිණි ගමනෙහි ප්‍රතිඵලය වී ඇත්තේ අප්‍රිකානු අනන්‍යතාව මැකී ගිය ජන සමූහයක් බිහිවීම ය. මව් භාෂාවෙන් ඉතිරි වූ වචන කිහිපයක් ද 'මඤ්ඤා' ගායන කිහිපයක් ද ඔවුන් සතු ය. බොකුටු කොණ්ඩ හා කාල වර්ණ උස් දේහ වෙනුවට තලෙළු පැහැති මධ්‍යම ගණයේ සිරුරු දක්නට ඇතත් අප්‍රිකානු මුහුණුවර යන්තමින් හඳුනාගත හැකි ය.

සිරම්බිඅඩියේ ජීවත් වන කැෆර්වරුන්ගේ පවුල් සංඛ්‍යාව 20 කි. හියුමෙඩිකෝ ආයතනයෙන් ඔවුන් හට නිවාස 14 ක් තනා දී ඇත. සිරම්බිඅඩියට අමතර ව පුත්තලම ගුඩ්ෂෙඩ් පාරෙහි ද කැෆර්වරුන්ගේ පවුල් කිහිපයක් හඳුනාගත හැකි ය. හෝටල් සහ කොහුමෝල් ඇතුළු විවිධ ආයතනවල  කම්කරුවන් හා සුළු සේවකයන් හැටියට කටයුතු කිරීමෙන් ඔවුහු ජීවිකාව සරිකර ගනිති.

'ඉංගිරිය පාරේ පෝරුවදණ්ඩ ගමේ රෙස්ටුරන්ට් එකකයි මම වැඩ කරන්නේ. මම විවාහ වෙලා ඉන්නේ අපේ ම කෙනෙක් එක්ක.අපිට ගමේ දී කරන්න රැකියා නැති නිසා පිට පළාත්වල රැකියා කරලා තමයි ගමට එන්නේ 'ප්‍රදීප් රංගන ( අවුරුදු 30) පවසයි.

පීටර් ලුවී ගේ බිරිඳ වන රන්මැණිකා සිංහල කාන්තාවකි. තම සැමියාගේ මව් භාෂාව ක්‍රමයෙන් අභාවයට යමින් පැවතීම ගැන ඇය සිත්හි ඇත්තේ බලවත් චෝදනාවකි.

"අපේ පරණ ම කෙනා විතරයි අපේ භාෂාව ටිකක් හරි දන්නේ. අනික් අය දන්නේ නැහැ. ඒ අය අපිත් එක්ක කාපිරි බාසාවෙන් කතා කළා නම් අපේ දරුවන්ට ඉගෙන ගන්න තිබුණා. නමුත් ඔවුන් කතා කළේ සිංහලෙන්. අපේ සමිතියක් තියෙනවා. ඒ සමිතියෙන් අපේ ළමයින්ට මේ භාෂාව උගන්නන්න අදහස් කරනවා. දකුණු අප්‍රිකාවේ මොසැම්බික් වලින් ආපු 'ලුවීගේ' මුතුන් මිත්තන් ගේ උරුමය අපට වටිනවා." රන්මැණිකා පවසයි.

තමන් හමුවීමට නිතර එන විවිධ පිරිස පිළිබඳ ව ඔවුන්ට ඇත්තේ තදබල විවේචනයකි.

" අපේ තොරතුරු අරගෙන ගිහින් ඒවා ලියලා හම්බ කරන අයත් ඉන්නවා. ඒ නිසා අපි අපේ තොරතුරු දෙන්න කැමති නෑ. සමහරු පොතුත් ගහලා විකුණනවා.අපට අවාසි වන දේවලුයි ලියන්නේ." පීටර් ලුවී පවස යි.

සිරම්බිඅඩියේ කැෆ්රර්වරුන්ගේ අනන්‍යතාව පිළිබඳ සුවිශේෂී ලකුණක් වනුයේ ඔවුන්ගේ ගායන සම්ප්‍රදාය යි. 'මඤ්ඤා' මැයෙන් එය හඳුන්වති. සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත සංගීත කණ්ඩායමක් ඔවුන් සතු ය. ගීතයට සරිලන නැටුමකින් සංගීත ප්‍රසංග ඉදිරිපත් කෙරෙයි.

" විශ්ව විද්‍යාල දෙකකින් ආරාධනා ලැබිල අපේ සංගීත ප්‍රසංගයක් පැවැත්වුවා. හෝටල්වලිනුත් ඉඳහිට ආරාධනා ලැබෙනවා. නමුත් සමහරුන් අපේ සිංදු හා නැටුම් වලින් විනෝද වෙලා කෑම ටිකක් දීලා ආපහු එවනවා. අපේ වචන අරගෙන ගායකයෙක් සිංදුත් කියලා තියනවා. නමුත් ඒ සින්දුවෙ තියන ඉකෝලියා, මිකෝලියා වාගේ වචන අපි ළඟ නැහැ. අපි නඩු කියන්න හිතාගෙන ඉද්දි එයා ඇක්සිඩන්ට් වෙලා මැරුණා."

තමන්ට ආවේණික වූ සංගීත හා නැටුම් සම්ප්‍රදායට කර ඇති නිගරුව පිළිබඳ ව කැෆ්රර්වරුන්ට ඇති වේදනාව එසේ පිටාර ගල යි.

" අපේ අනන්‍යතාව තම යි අපේ සංගීතය." සෙරීනා ඇලෙක්ස් ( අවුරුදු 33) පවස යි.

" අපේ සිංදු ඒ තරම් දිග නැහැ. අහන් ඉන්න අය නැටවෙන විදියට සින්දු කියන්න අපට පුළුවන්. අපේ භාණ්ඩ අපිම යි හදා ගෙන තියෙන්නේ. පොල් කටු , බෝතල්, හැඳි ගන්නවා. පොල්කටු දෙකකින් ලෑල්ලකට ගහනවා. ඩොලැක්කිය පාවිච්චි කරනවා." සෙරීනා ඇලෙක්ස් පැවසුවා ය.

පොදු කටයුතු සඳහා ඔවුන් විසින් කැෆ්සටෙලා නමින් සමිතියක් පිහිටුවා ගෙන ඇත. එහි සාමාජික සංඛ්‍යාව 25 කි. සාමාජික ගාස්තුව රු 20 කි. 'මඤ්ඤා' ගීත ඇතුළත් කැසට් පටයක් ද ඔවුන් විසින් නිෂ්පාදනය කර ඇත. කැසට් පටයෙන් ලැබෙන ආදායම ද සමිතියේ අරමුදලට බැර කෙරේ. සමිතියේ සාමාජිකයන් හට සුළු සුළු ණය මුදල් ලබා දීම සමිතියේ ප්‍රතිපත්තියකි.

සිරම්බිඅඩියේ දරුවන් වෙනුවෙන් පිහිටුවා ඇති කනිටු විදුහලෙහි 11 වසර දක්වා පන්ති පැවැත්වෙයි. එහෙත් ස්ථිර ගොඩනැගිල්ලක අවශ්‍යතාව එහි කැපී පෙනෙයි. ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් රටවටා පාදචාරිකාවක් සංවිධානය කර ඇත්තේ ටිකට්පත් අලෙවියෙන් ගොඩනැගිලි අරමුදලක් සම්පාදනය කර ගැනීම සඳහා ය. විදුහල්පතිවරයා දැඩි කැපවීමකින් විදුහලේ තත්වය දියුණු කිරීම සඳහා කටයුතු කරන බව ජෝසපින් ( අවුරුදු 35 ) පවස යි. එහෙත් විදුහලේ ඉංග්‍රීසි විෂය ඉගැන්වීම සඳහා ගුරුවරුන්ගේ හිඟයක් පවතී. 3 වසර පන්තියට ඉගැන්වීම සඳහා ගුරුවරයෙකු නොමැති හෙයින් මෙවර උසස් පෙළ විභාගයට පෙනී සිටි තැනැත්තියක් ස්වේච්ඡා ගුරුවරියක ලෙස සේවය කර යි.

'කාපිරි මිනිස්සු' යන වගන්තිය සිංහල ජන විඥානයෙහි තැන්පත් ව ඇත්තේ බියකරු චිත්‍රයක් සමඟ ය. එනම් ඔවුන් මිනීමස් කන ප්‍රජාවක් හැටියට ය. මේ නිසා සිරම්බිඅඩියේ කැෆ්රර්වරු ඉතිහාසය පුරා ම සමාජමය වශයෙන් හුදෙකලා කිරීමේ ගැටලුවට මුහුණ දුන්හ.

“ ඉස්සර නම් පුත්තලමට ගියත් අන්න කාපිරි කියලා අපට නින්දා කළා. දැන් එහෙම නැහැ. කොළඹ තිබුණ දැයට කිරුළ ප්‍රදර්ශනයට අපි ව ගෙන්නුවා. සුළු ජන කොටස් අතර වැදි ජනතාව පෙරමුණේ හිටිය. දෙකට හිටියේ අපි. මොසැම්බික් වලින් ආපු කෙනෙක් අපෙන් ඇහුවා ආපහු මව් රටට යන්න කැමතිද කියල. අපිත් ආසයි අපේ රට බලන්න. ඒත් කවුද අපට අවස්ථාව දෙන්නෙ.? දකුණු අප්‍රිකාවෙ ඉදල ආපු ස්වාමි කෙනෙක් මිසෝදියා කියන එක්කෙනාට  රු 40,000 ක පරිත්‍යාගයක් කරල තිබුණා. ඒක අපේ පල්ලියට දුන්න. ඒකෙන් තමයි අපි පල්ලිය දියුණු කර ගත්තෙ. මේක අයිති පුත්තලම මීසමට.”

සෙරීනා ඇලෙක්ස් පවසයි.

ඉග්නේෂියා හෙවත් ‘අන්නා පුංචි’ සිරම්බිඅඩියේ වෘද්ධතම කාන්තාව යි. ඇගේ පියා යුද සෙබලෙකි. ලෝක යුද්ධ සමයේ රටවල් කිහිපයක සේවය කර ඇත.

“සිංහල මිනිස්සු ආම්බාන් කරන්න අමාරුයි. කොණ්ඩෙ බැඳගෙන ඉඳල තියෙන්නෙ. තම්බිලා මරන්න පටන් ගත්ත. අපේ පප්පලා තමයි ඔවුන් මෙල්ල කළේ. ඒ අය හුඟක් ශක්තිමත්. කවුරුත් බයයි. අද පරම්පරාවට ඒ හයිය නෑ.”

ඉග්නේලෂියා තම පරම්පරා උරුමය ගැන අභිමානයෙන් කිය යි.

තම සහෝදර ජනතාව මුහුණ දෙන ගැටලු පිළිබඳ ව සිරම්බිඅඩියේ ග්‍රාම නිළධාරීවරයා කතා කරන්නේ චෝදනා මුඛයෙනි. විවිධ සංවිධාන විසින් රැවටීම් කර ඇති නිසා  ඔවුන් හෙම්බත් ව සිටිනා බව ඔහු පවසයි.

අප්‍රිකානු සම්භවයක් තිබුණ ද සිරම්බිඅඩියේ ජීවත් වන කැෆර්වරු පුත්තලම ප්‍රදේශයේ සිංහල දෙමළ හා මුස්ලිම් ජනතාව සමඟ සහෝදරත්වයෙන් ජීවත් වෙයි. තම අනන්‍යතාව පවත්වාගෙන යෑම සඳහා ඔවුන්ගේ සිත්වල බලාපොරොත්තු  දළුලමින් පවතී. එය සුබ ලකුණකි.

# කබලෙන් ළිපට වැටුණු මාතලේ වතු කම්කරුවෝ

විශාල තේ වත්තක් අබියස සිටගත් කුඩා මිනිසෙකි. නිසි කලට දලු නොනෙළූ නිසා මේරූ පත් සහිත මිටි තේ පඳුරුවලට වඩා ඔහු උසින් වැඩි ය. එහෙත් තේ කම්හල් මුදුන ඔහු මෙන් කිහිප ගුණයක් උස ය. ඔහුගේ හිස් බැල්ම යොමු වී ඇත්තේ තේ කම්හල් මුදුනේ දුම් බටය වෙත ය. තේ දලු කුඩු කෙරෙන උණුසුමට වඩා උණුසුමක් ඔහුගේ පසු කුහරයෙහි නලියයි. එහෙත් ඔහුගේ ඇසෙහි ඇත්තේ සීතල කඳුළකි.

"රජයේ පාලනය යටතේ තියෙන කාලයේ අපේ වත්ත අපට සියලු පහසුකම් ලබා දුන්නා. වැඩට යනකොට ළමයි බලා ගන්න පුල්ලේ මඩමක් තිබුණා. කොණ්ඩෙ කපන්න බාබර් කෙනෙක් වත්තෙන් පත් කරලා තිබුණා. අද ඒ මොකක්වත් නැහැ. අපට කරන නොසැලකිල්ල තමයි වත්තටත් කරන්නේ. වත්ත සුද්ද කරන්නේ නැහැ. පොහොර දමන්නේ නෑ. නඩත්තු කරන්නේ නෑ. ආදායම් නැති නිසා සලකන්න බැරිලු. වත්ත හරියට නඩත්තු කරන්නේ නැතිව ආදායම් ගන්නේ කොහොම ද?"

මාතලේ දිස්ත්‍රික්කයට අයත් රත්වත්ත වත්තේ කම්කරුවකු වන මානික්කම්ගේ ප්‍රකාශය විසල් තේ කම්හල අබියස කුඩා මිනිසාගේ ළයෙහි කකියන වේදනාව පිටාර ගැලීමකි.

තේ වතුවල රාජ්‍ය පරිපාලනය ශීඝ්‍රයෙන් බිඳ වැටෙමින් පවතින බවටත් ඉදිරියෙහි දී එය "තේ කෝප්පයේ කුණාටුව" දක්වා වර්ධනය වන බවටත් ඉඟියක් මාතලේ ප්‍රාදේශයේ තේ වතුවලින් ලැබෙයි.

වතුවල ඇති ගස් කපා විකුණා වැටුප් ගෙවන මට්ටමට ඇතැම් වතු පත් ව ඇත්තේ කුමක් නිසා දැයි කිසිවකුගේ අවධානයට ලක් නොවී තිබීම කණගාටුදායක කරුණකි. බඹරගල, ලුණුගල, කන්දේ නුවර සහ වේවැල්මඩ ප්‍රදේශවල තේ කම්හල් පහක් දැනටමත් වැසී ඇතැයි ද දුර්වල කළමනාකරණය හේතුවෙන් වතු පරිපාලනය වසර පහක දී මුළුමනින් ම බිඳ වැටෙනු ඇතැයි ද රත්තොට ප්‍රාදේශීය සභාවේ ටී.ඩී ජයතිස්ස මහතා අනතුරු අඟවා ඇත්තේ ප්‍රදේශයේ උපන් අයකු හැටියට ඇති වූ කැක්කුමෙන් යුතුව මේ පිළිබඳ ව කළ සොයා බැලීමකින් අනතුරුව ය.

"වත්තේ තේ පැක්ටරිය වහලා. ඒ නිසා තේ දලු වෙනත් පැක්ටරියකට ගෙනි යන්න සිදු වෙලා. කම්කරුවන් සැතපුම් ගණනක් දුර තේ දළු අරං ගිහිං බාර දීලා එනකොට පාන්දර 3 විතර වෙනවා. බාගෙට මැරිලා ඉන්නේ. ඉතින් පහුවදා වැඩට යන්නෙ කොහොම ද?"

**හුන්නස්ගිරිය වත්තෙහි සේවය කරන රෝහණ රත්තනායක පවසයි.**

තේ වතුවල කළමනාකරණය විධිමත් කිරීම, නිෂ්පාදනය ඉහළ නැංවීම, වතු සේවක වෘත්තිය මට්ටම ඉහළ නැංවීම සහ වතු ප්‍රදේශවල යටිතල පහසුකම් වර්ධනය කිරීම යනාදී සාඩම්බර වාගාලාපය ප්‍රකාශ කරමින් වතු කම්කරුවන්ගේ උර මතින් ව්‍යවස්ථාදායකය නියෝජනය කිරීමේ වාසනාව උදාකරගත් කිසිදු මහජන නියෝජිතයකු මාතලේ දිස්ත්‍රික්කයේ තේ වතුවල වත්මන් අර්බුදය පිළිබඳ තම අවධානය යොමුකර ඇති බවට සාක්ෂියක් නොමැත.

හුන්නස්ගිරිවත්ත උඩ කොටසෙහි කම්කරුවකු වන රාජ්ලිංගම් ප්‍රකාශ කරන පරිදි වත්තේ ඩිස්පැන්සරියට වෛද්‍යවරයකු අහිමි වී ඇත. ත්‍රී රෝද රථයක්වත් ධාවනය කළ නොහැකි පරිදි මාර්ග අබලන් වී ඇති නිසා අසාධ්‍ය රෝගියකු වුව ද රෝහලක් කරා ගෙන යෑමේ කටයුත්තට විශාල කාලයක් ගතවන හෙයින් නිසි ප්‍රතිකාර නොලැබ රෝගීන් මිය ගිය අවස්ථා පවතී. හුන්නස්ගිරි වත්ත උඩ කොටසෙහි දරුවන්ට පයින් ම පාසල් යෑමට සිදු වී තිබීම නිසා පෙ.ව. 5.00 ට පමණ ගමනාරම්භ කිරීමට සිදුව තිබේ. ඇතැම් දරුවන්ට පාසැල් ඇරී නිවසට පැමිණීමට සිදුව ඇත්තේ ඉර බසින යාමයේ ය. පසු ගිය දා පාසැල ඇරී නිවසට එමින් සිටි දැරියක් ඝාතනයට ලක් වී සිටි බවත්, දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම ප්‍රදේශයේ මහජන නියෝජිතයන්ගේ වගකීම බවත් රෝහණ රත්නායක ප්‍රකාශ කරයි.

"වතු කම්කරුවන් වන අපට අපේ ප්‍රශ්න ගැන කියන්න අපේ නියෝජිතයෙක් නැහැ. වතුකරයේ ඡන්දවලින් පත්වුණු ශ්‍රී රංගා මන්ත්‍රීතුමා අය වැයෙන් වෙන් කෙරෙන මුදල එයාගෙ ගමේ දියුණුවට පමණයි යොදා ගන්නේ. වතු ජනතාව ආණ්ඩුවට පාවා දෙනවා කියලා තොණ්ඩමන්ලට චෝදනා කරපු මේ අය දැන් වැඩ කරන්නේ කා වෙනුවෙන්ද ? කම්කරුවන්ගේ ETF, EPF එකවත් ලබා ගන්න සහෝගයක් දෙන කෙනෙක් අපට නැහැ."

රත්තොට මිඩ්ලන්ඩ් වත්ත පදිංචි තරුණයකු වන ගජේන්ද්‍රන්ගේ විරෝධය එල්ලවනුයේ වතු කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටීමට අසමත් වූ මහජන නියෝජිතයන් වෙත ය.

කළමනාකරණය බිඳ වැටීමේ චෝදනාව රාජ්‍ය අංශයේ වතුවලට මෙන් ම වතු සමාගම් යටතේ පවතින වතුවලට ද එල්ල වීමේ හේතුව කුමක් ද? පෞද්ගලික හෝ දේශපාලන වුවමනාකම් මත කළමනාකරණය පත් වීම් ලබා දීමේ අශිෂ්ට සම්ප්‍රදාය තවමත් වෙනස් වී නොමැත. මේ නිසා, නිෂ්පාදනය යටි මඩි ගැසීම් සහ කම්හල්වල භෞතික සම්පත් යකඩ හැටියට හොරට විකිණීම යනාදී චෝදනා අධ්‍යක්ෂ මණ්ඩලවල ප්‍රබලයන්ට එල්ල වී ඇත.

ලංකා කම්කරු කොංග්‍රස් නායකයන් වතුවල ගැටලු පිළිබඳ සොයා බැලූ අවධියක් තිබූ බවත් අද වන විට ඔවුන් ගැන තිබූ විශ්වාසය පළුදු වී ඇති බවත් පවසන්නේ රත්තොට මිඩ්ලන්ඩ් වත්ත දෙමළ විදුහලෙහි ගුරුවරයෙකි.

CWC එක උත්සාහ කළොත් පළාත් සභාවට හා පාර්ලිමේන්තුවට අපේ නියෝජනයක් ලබා ගත හැකියි. "

මිඩ්ලන්ඩ්වත්ත දෙමළ විදුහලෙහි ගුරුවරයා ගේ උක්ත ප්‍රකාශය නොසලකා හැරිය නොහැක්කකි.

එහෙත් මාතලේ දිස්ත්‍රික්කයෙහි දෙමළ ජන සංයුතිය පාර්ලිමේන්තු නියෝජනයක් සඳහා ප්‍රමාණවත් නොවේය යන්න ඒ සමඟම නැගී ඇති තර්කයකි. තිබෙන සුළු ඡන්ද ප්‍රමාණය පාර්ලිමේන්තු නියෝජනය සඳහා ප්‍රමාණවත් නොවන බවත් CWC නියෝජිතයකු පසුගිය මැතිවරණයේ දී තම පක්ෂය සමග තරගයට ඉදිරිපත් වූ නිසා තමා ඉදිරිපත් නොවූ බවත් ශ්‍රීලනිප වතු අංශයේ දිස්ත්‍රික් සංවිධායක ශසිධරන් ප්‍රකාශ කරයි.

වැටුප් ගෙවීමේ ප්‍රශ්න, අනියම් සේවක ප්‍රශ්න සහ යටිතල පහසුකම් සංවර්ධනය නොකිරීමේ ප්‍රශ්න මත මාතලේ වතු ජනතාව අතරමංවී සිටින බව ග්‍රාමීය මට්ටමෙන් බෙදා හැරෙන කුරුන්ජිකලම් සඟරාවෙහි සංස්කාරකවරයා පෙන්වා දෙයි.

" මම අවුරුදු දෙකක් අනියම් සේවකයෙකු හැටියට වැඩ කළා. මාස 2ක් වැඩ කළොත් තුනක් ගෙදර ඉන්නවා. හේතුව දළු නැතිකමලු. ස්ථිර සේවකයන්ටත් වැඩ නැති නිසා අනියම් සේවකයන් නතර කරන බව කියනවා. අපේ වත්තේ අනියම් සේවකයන් 25 දෙනෙක් ඉන්නවා. අපිට පිට පළාත්වලට ගිහින් වැඩ කිරීමේ හැකියාවක් නැහැ. වෘත්තීය සමිති නායකයනුත් මේ ප්‍රශ්නය බේරුමක් කර දුන්නේ නැහැ". ඇල්කඩුව වැවිලි සමාගමට අයත් රත්වත්ත වත්තේ අනියම්කරුවකු ජී.රාමක්‍රිෂ්ණන් පවසයි. රත්වත්ත වත්ත CWC වෘත්තීය සමිති නායක පී.සෙල්වරාජා අනියම් සේවකයන්ගේ ගැටලුව පිළිබඳව වතු කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කළේ ය. අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය වත්තෙහි සිටිනා බැවින් ඔවුන් විශ්‍රාම යෑමෙන් පසු ව අනියම් සේවකයන් ස්ථිර කළ හැකි බව කළමනාකාරිත්වයේ මතය වී ඇත.

" වතු කළමනාකාරිත්වය, ප්‍රශ්න මඟ හරිනවා. දවස් 23 ට අඩුවෙන් වැඩ කළොත් 405/- වැටුප ලබා දෙන්නේ නැහැ. අත්තෙන් ම සිදු වන්නේ වුවමනාකමින් ම දවස් 23 ට අඩුවෙන් වැඩ ලබා දීමයි. මෙය වැටුප් අඩු කිරීමේ ක්‍රමයක් මුරකරුවා දවස් 30 ම පඩි ගන්නවා. කම්කරුවාට වැඩ තිබ්ලත් වැඩ දෙන්නේ නෑ. වැටුප් ගිවිසුම ගැන කියලා කම්කරු ප්‍රශ්න යට කරනවා. මේක අපරාධයක් "

පී. සෙල්වරාජා කම්කරුවන්ගේ ප්‍රශ්නවල සුලමුල පවසයි.

තේ දල්ලේ උරුමය විසින් වතුකරයට ඉතිරි කර ඇත්තේ ක්‍රමයෙන් බෙලහීන කරන ලද පරම්පරාවකි. ලැයිමකට සීමා වූ වයෝවෘද්ධ අබලි පරම්පරාවක් ද අධ්‍යාපනය ලැබීමේ හා සුදුසු වෘත්තියක යෙදීමේ අයිතිවාසිකම් උදුරා ගනු ලැබූ බාල පරම්පරාවක් ද දකින්නට අපි අවාසනාවන්ත වී සිටිමු. එහෙත් හෙට දවස එසේ විය යුතු නැත.

<u>ජනාධිපතිතුමා මැදිහත් වී තිබෙනවා</u>

**ටී. ශසිධරන් - ශ්‍රීලනිප වතු දිස්ත්‍රික් සංවිධායක**

මාතලේ දිස්ත්‍රික්කයේ වතු ජනතා අවශ්‍යතා ඉටු කිරීමට ජනාධිපතිතුමා මා පත් කර තිබෙනවා. වතු ජනතාවට විශාල නිවාස ව්‍යාපෘතියක් ලබා දීම සඳහා එතුමා කටයුතු කරමින් සිටිනවා. එමෙන් ම යටිතල පහසුකම් ලබා දීම ආරම්භ කර තිබෙනවා. අපි ටිකෙන් ටික මේ ප්‍රශ්න සියල්ල විසඳනවා.

<u>ප්‍රතිපාදන මදි</u>

**සී.සුගමාරන්- රත්තොට ප්‍රාදේශීය සභා උප සභාපති**

සුළුජන කොටස සීමිත නිසා පළාත් සභාවට අපේ කෙනෙක් යැවීමත් දුෂ්කරයි. ඒ නිසා වතු ජනතාව වෙනත් අයට රැවටෙනවා. වතුකරයේ සියලු ප්‍රශ්න විසඳන්න පළාත් පාලන අයතනවල ප්‍රතිපාදන මදි. හාම්පුතුන් නැති පුද්ගලික වතුවල තත්වය ඉතාම නරකයි. ඇල්කඩුව හා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතු දුවන්නේ පාඩු පිට. බංකොලොත් වතු විධිමත් පාලනයක් සහිත සමාගම්වලට දිය යුතුයි.

<u>සියළු වතු කම්කරුවන් අතර බෙදා දිය යුතුයි.</u>

**සෙන්දිල් සිවඥානම්**

**ලංකා කම්කරු කොන්ග්‍රසය**

**2010 මහ මැතිවරණයේ නිදහස් සන්ධාන අපේක්ෂක**

ලාභ ලබන වතු තමයි රාජ්‍ය අංශය විසින් පෞද්ගලික අංශයට ලබාදීලා තියෙන්නේ. පාඩු ලබන ඒවා රාජ්‍ය අංශය තබාගෙන තිබෙනවා. දැන් මේ සියල්ලම පාඩු ලබන තත්ත්වයට පත්වෙලා වැවිලි අංශය ශක්තිමත් කිරීමට කිසිදු පාර්ශවයක් මුදල් ආයෝජනය කරලා නැහැ.

මේ නිසා ලංකා කම්කරු කොන්ග්‍රසය යෝජනා කරන්නේ මේ සියළුම වතු ඉතා සාධාරණ ක්‍රමයකට වතුකම්කරුවන් අතර බෙදා දීලා, වතු කළමනාකාරීත්වය සේවකයින්ගේ ඊටීඑෆ්, ඊපිඑෆ් වත් නොගෙවන තත්ත්වයට පත්වෙලා.

**<u>පෞද්ගලික වතුවල තත්ත්වය 100% ක් හොඳයි.</u>**

**රාජා ප්‍රේමලාල් අධ්‍යක්ෂ වැවිලි අංශය**

**වැවිලි කර්මාන්ත අමාත්‍යශය**

මාතලේ දිස්ත්‍රික්කයේ තේ වතුවල කළමනාකාරණයේ බිඳවැටීමක් තිබෙන බව ඇත්ත. නමුත්, පෞද්ගලික අංශයට පවරාගත් වතුවල වැඩි දියුණුවක් තිබෙනවා. වතු වැඩි ප්‍රමාණයක් පවතින්නේ රාජ්‍ය ව්‍යවසාය හා වැවිලි සංවර්ධන අමාත්‍යංශය යටතෙයි. වතු කළමනාකරණයේ දුර්වල මට්ටම නිසා මේවා බිඳ වුටුනා. ඒ නිසා ඇල්කඩුව වැනි සමාගම් මේවා පවරා ගන්න මැලි වුනා. පුද්ගලික අංශයෙන් පාලනය වන්නේ වතු කිහිපයි.

**<u>ශක්තිමත් දේශීය ආයෝජකයන්ට පැවරිය යුතුයි.</u>**

**අමාත්‍ය පී.දයාරත්න**

**රාජ්‍ය සම්පත් හා කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය**

රජයන් විසින් වරින්වර සිදුකරන ලද පරිපාලනමය වැරදි නිසා තමා ජනවසම කඩා වැටිලා තියෙන්නේ. ගරු ජනාධිපතිතුමාගේ අදහස අතීතයට දොස් දෙවොල් තැබීම නොවෙයි. ඉක්මන් පියවරක් ගැනීමයි. වතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා කම්කරු අයිතින් සුරකින, සේවකයින් නඩත්තු කළ හැකි ශක්තිමත් දේශීය ආයෝජකයන්ට පවරන්න සූදානම්. මෙය හුදෙක් පුද්ගලීකරණය කිරීමක් නොවෙයි. මිලියන ගණනක් ඊටිඑෆ්/ඊපීඑෆ් ගෙවීමට තිබෙනවා ජනවසම විසින්. වතු සම්බන්ධයෙන් ඉක්මන් පියවර ගනිමින් සිටිනවා.

# කළු වලං හදන කඳුවැව කළු නොවූ ජීවිත

"අපි නොච්චියාගම නගරයේ ඉද්දි අපේ වළං අලෙවි කිරීම පහසු වුණා. දැන් ඒක දුෂ්කර වැඩක්. අපට ම කියලා ෂෝ රූම් එකක් නගරයේ තියෙනවා නම් දැනට වඩා ගැනුම් කරුවෝ ගෙන්නගන්න පුළුවන්."

නොච්චියාගමට නුදුරු කඳුවැව ගම්මානයේ පදිංචිකරුවකු වන පී. රාජේන්ද්‍රන් (අවු 28) පවසයි. ශ්‍රී ලංකාවේ කළු වලං නිෂ්පාදනය කරන එක ම ගම්මානය ලෙස ප්‍රකට කඳුවැව ජීවත් වන වලං නිෂ්පාදකයන් වත්මනෙහි මුහුණ දී සිටින ගැටලුවලින් එකක් රාජේන්ද්‍රගේ ප්‍රකාශයෙන් පැහැදිලි වේ.

සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනවර්ගවලට අයත් පවුල් 600ක් පමණ ජීවත්වන මෙම ගම්මානයෙහි කොටසක වලං නිෂ්පාදනය කරන පවුල් 26කට අයත් ජනතාව ජීවත් වෙයි.

"අපි මුලින් පදිංචිවෙලා හිටියෙ නොච්චියාගම ටවුන් එකේ. 1984 දී ප්‍රේමදාස මහත්තයා මහවැලි ඉඩම්වලින් පර්චස් 20 ගානේ දීලා අපි මෙහාට එව්වා. ඒකෙන් අපට හොඳක් උනා. නමුත් අපට ගැනුම්කරුවොත් එක්ක සම්බන්දෙ තියාගැනීම තරමක් දුෂ්කර වුණා."

ටී. කේතීෂ්වරන් (අවු:42) පවසයි. ශ්‍රී ලංකාවේ කළු වලං නිෂ්පාදනය කරන එක ම ගම හැටියට ද උසස් ම ප්‍රමිතියෙන් යුක්ත රතු වලං සහ කළුවලං නිෂ්පාදය කරන ගම හැටියට ද කඳුවැව කීර්තිනාමයක් දිනා සිටී.

**කළුවලංවල විශේෂත්වය**

ජුලි සහ අගෝස්තු මාසවල හලාවත සිට මීගමුව දක්වා වෙරළ තීරයෙහි කිතුණු පල්ලි ආශ්‍රිත ව සාන්ත ආනා උත්තම මෑණියන් වෙනුවෙන් පැවැත්වෙන ආගමික උත්සවවලදී වතාවත් සඳහා භාවිතයට ගනු ලබන්නේ කළු වළං ය. එමෙන් ම ඉස්ලාමිකයන්ගේ 'නෝම්බි ඇල්ලීමට' සමාන වූ යාපනය වැසියන්ගේ 'සයිවම්' උත්සවයෙන් පසු ව නිර්මාංශ ආහාර පිසීම සඳහා ඔවුන් විසින් භාවිතයට ගනු ලබන්නේ ද කළු වලං ය. තමිල්නාඩුව නිජබිම කරගත් කුඹල්කරුවන්ගෙන් පැවත එන පරම්පරාවක් කඳුවැව ජීවත් වෙයි. තමිල්නාඩුවෙහි පැවති අමුද්‍රව්‍ය හිඟයත් ආර්ථික දුෂ්කරතාත් හේතුවෙන් තම කර්මාන්තයට වඩාත් සුදුසු ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකාවේ උතුරු මැද ප්‍රදේශය තෝරා ගත් ඔවුහු 19 සියවස මුල් භාගයේ දී මෙ රටට සංක්‍රමණය වූහ.

"1940 ගණන්වල මල්වතු ඔය පාලම ළඟත් නල්ලචේනි පාලම ළඟත් පවුල් 50ක් විතර ඉඳලා තියෙනවා. 77 ඉඳලා 84 වන තුරු ගැටුම් නිසා සමහරු ආපසු ඉන්දියාවට ගියා. නමුත් අපි තව ම කර්මාන්තෙ කරගෙන යනවා. 1980 දී අපි යාපනේට කළුවලං යැව්වා. දැන් පානදුර, රත්නපුර, කළුතර, මිනුවන්ගොඩ, යාපනය සහ කිලිනොච්චිය ප්‍රදේශවලටත් වලං අරං යනවා."

පී. සුබ්‍රමනියම් (අවු 52) පවසයි. දේශීය කුඹල් ගම්මානවල ඉතිහාසය පිරික්සා බැලීමෙහි දී පසක් වනුයේ රතුවලං නිෂ්පාදනය මිස කළු වලං නිෂ්පාදනය කිරීමේ සම්ප්‍රදායක් එහි නොතිබූ බව ය. වැලි, මැටි සහ දර කුඹල් කර්මාන්තයේ දී අවශ්‍ය වන අමුද්‍රව්‍ය වෙති.

තමිල්නාඩුවෙහි පලනි සහ ආයකුඩි යනාදී කුඹල් ගම්මානවල අමුද්‍රව්‍ය හිඟය පැවති නමුත් ශ්‍රී ලංකාවේ රජරට අමුද්‍රව්‍ය වලින් පොහොසත් ප්‍රදේශයක් බවට ඔවුන් කළ නිගමනය නිවැරදි එකක් විය. නියං සමයෙහි වැව් සිඳී යයි. නිකිණි මස වන විට වැව් පතුල් පුපුරා යෑම සුලබ දසුනකි.

වැව් පතුලෙහි ඇති කිරිමැටි කපා ගැනීම පහසු අවධියකි එය. මැටි පදං කිරීම සඳහා අවශ්‍ය වැලි සහ මැටි සංයුතිය 10ට 03කි.

**අමු ද්‍රව්‍යවල ගැටලු**

වැසි සමයෙහි ද ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි අවශ්‍ය වැලි, මැටි සහ දර ගෙන්වා ගැනීම කුඹල් කරුවන්ගේ සිරිතයි. කඳු වැව කුඹල්කරුවන් දැනට මැටි ලබා ගැනීම සිදු කරන්නේ සැතපුම් 05ක් පමණ දුරින් පිහිටි කිඹුල්මැටියාවෙනි. වැලි ලබා ගන්නේ රාජාංගනයෙනි.

"මැටි කැපීම තහනම් කර ඇති නිසා, භූ විද්‍යා හා පතල් කාර්යංශයෙන් පර්මිට් ගත යුතු වෙනවා. ට්‍රැක්ටරයෙන් වැලි ලෝඩ් එකක් ගෙන්න ගන්න කොට රු. 3550/=ක් ගන්නවා. අවුරුද්දකට වලං හදන්න අපි ගොඩක් මැටි නාස්ති කරන්නේ නෑ. මැටි ලෝඩ් 10 යි අවශ්‍ය වෙන්නේ."

ටී. කේතීශ්වරන් පවසයි.

**අමුද්‍රව්‍ය ලබා ගැනීමේ දී කුඹල්කරුවන් මුහුණ දී ඇති ප්‍රශ්න පිළිබඳ ව නොච්චියාගම ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් විමසන ලදුව ඔහු දුන් පිළිතුර මෙසේ ය.**

**"ඔවුන් මැටි ලබා ගන්නේ ඉතා සුළුවෙන්. මැෂින් දාන්නේ නැහැ. අතින් හාරලා ගන්නේ. කොහොම උනත් නීතිමය තත්යන් පිළිබඳ ව ඔවුන් දැනුවත් කරලයි තිබෙන්නේ."**

භූ විද්‍යා හා පතල් කාර්යාංශය මේ සම්බන්ධ ව තීන්දු ගන්නා රාජ්‍ය ආයතන යි.

**"1992 අංක 33 දරණ පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතින් බැහැර ව කිසිදු බලපත්‍රයක් නිකුත් කරන්නේ නැහැ. මැෂින් දමලා පස් හරි මැටි හරි ගන්නවා නම් බලපත්‍රය සඳහා වාර්ෂික ව රු. 140,000ක් යනවා. මැෂින් භාවිත නොකර කියුබ් 210කට මසකට රු. 6980/= ක් වෙනවා. අඩුම බලපත්‍ර ගාස්තුව රු.3000/= යි. වලං කර්මාන්තයේ යෙදෙන අය අපෙන් බලපත්‍ර ඉල්ලලා නැහැ."**

**භූ විද්‍යා හා පතල් කැණීම් අංශයෙහි නිලධාරියෙක් පවසයි.**

**අත්යන්ත්‍රයෙන් විදුලි යන්ත්‍රය**

වලං නිෂ්පාදනයට විශේෂ කාලයක් නොමැති වුව ද කළු වලං සඳහා දැඩි අවු රශ්මිය අවශ්‍ය වන හෙයින් ජුනි, ජුලි හා අගෝස්තු මාසවල කළු වලං නිෂ්පාදනය සිදු වේ. සිරිත් පරිදි කඳු වැව

ගම්මානයෙහි කුඹල් කරුවන් විසින් ද කලත් තිස්සේ භාවිතයට ගනු ලැබුවේ අතින් ක්‍රියාත්මක කෙරෙන සකපෝරුවයි.

"අපි උදේ හයට විතර වැඩ පටන් ගන්නේ. දවල් කෑම වෙලාව වෙනකොට එක් කෙනෙකුට වලං 50ක් 60ක් හදන්න පුළුවනි. නමුත් අලුත් පරම්පරාව මේ වැඩේට එච්චර කැමති නැහැ. ඒ නිසා තමයි අපි කාලයක් තිස්සේ විදුලි මෝටර් ඉල්ලා හිටියේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා විදුලි මොටර 5ක් ලැබුණා. නමුත් ඒවාගේ ස්පීඩ් එක වැඩියි. 1500ක ස්පීඩ් එක ප්‍රමාණවත්. නමුත් මේ වගෙ ස්පීඩ් එක 2500යි. ඒ නිසා මොටර 5ම පැත්තක දාලා තියෙන්නේ. ඒවා මාරු කරගන්න උත්සාහ කළත් හරි ගියෙ නෑ. මැටි පදම් කරන්නත් අද කාලේ මැෂින් තියෙනවා"

කේතීශ්වරන්ගේ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ නවීන තාක්ෂණය තම කර්මාන්තයට සම්බන්ධ කර ගැනීමේ වුවමනාවක් ඔවුන් සතු ව පවතින බව ය. රු.55,000.00ක වටිනා කමකින් යුත් මැෂින් ප්‍රයෝජනයක් ගත නොහැකිව දිරාපත්වන්නට හැර තිබීම අපරාධයකි.

තම වලං පෝරනුව අතපසුවීමකින් මුළුමනින් ම දැවී ගිය බවත් එයින් රු. ලක්ෂ ගණනක පාඩු සිදු වූ බවත් වලං කර්මාන්තය සඳහා රක්ෂණ ආවරණයක් ලබා දීමට රක්ෂණ ආයතන අකමැති බවත් පවසා සිටිනුයේ පී. රාජේන්ද්‍රන් (අවු 28යි) ය.

කඳුවැව වලං කර්මාන්තය ආර්ථික වශයෙන් තවමත් ලාබදායක වුව ද තරුණ පිරිස් ක්‍රමයෙන් එම කර්මාන්තයෙන් ඉවත්වන සෙයක් දිස් වේ. කඳු වැව ගම්මානයෙහි විදෙස් රැකියා සඳහා යොමු වී ඇති සංඛ්‍යාව 5කි. අධ්‍යාපන නැඹුරුව හේතුවෙන් තරුණ පිරිස් බොහෝ විට වලං කර්මාන්තයෙහි නියැලෙනුයේ බොහෝ විට අර්ධකාලීනව ය. 'බඩහැල' නාමය පටබැඳිම නිසා සමාජීය වශයෙන් කොන් කිරීම ද කටුක අත්දැකීමකි.

"අලෙවි කර ගැනීම කොහොම හරි කර ගන්න පුලුවන්. නිෂ්පාදනය තමයි දුෂ්කරවෙමින් පවතින්නේ. කුලියකට අඬගහගන්නවත් දැන් කවුරුත් නැහැ."

ආර්. එම්. නඩරාජා(අවු: 44) පවසයි.

පානීය ජල ප්‍රශ්නය කඳුවැව ගම්මුන් පීඩාවට පත් කරන ප්‍රධාන ගැටලුවකි. බොහෝ නිවෙස්වලට ළිඳක් බැගින් ඇතත් කිවුල් ජලය නිසා බීමට නුසුදුසු තත්වයේ පවතී. කුඹල් කර්මාන්තයෙහි යෙදෙන්නන් සඳහා බීමට සුදුසු ජලය ඇත්තේ එක ම ළිඳක පමණි.

"ටැප් ලයින් එකක් පාරට ඇවිත් තියෙනවා. නමුත් වතුර තියෙන්නේ උදේට විතරයි." මන්නාරම ප්‍රදේශයෙහි සිට පැමිණි කඳුවැව පදිංචිකාරියක බවට පත් වූ තේවානි (අවු 60) පවසයි.

**ප්‍රදර්ශනාගාරය**

සාම්ප්‍රදායික ක්‍රමයට කුඹල් කර්මාන්තයෙහි නියැළුණු ඒ. පෙරුමාල් (අවු:72යි) මේ වන විට සකපෝරුව කරකැවීම කරනු ලබන්නේ කුඩා විදුලි මෝටරයක ආධාරයෙනි. ආදි මුතුන් මිත්තන්ගෙන් පැවත එන කුඹල් කර්මාන්තය නොනැසී පවත්වාගෙන යෑමට ලැබීමේ අභිමානයකින් ඔහු ජීවත් වෙයි. එ පමණක් නොවේ. කඳුවැව මුළු ගම්මානයට ම බීමට සුදුසු වතුර ඇති එක ම ළිඳ තම ඉඩමේ පිහිටා තිබීම

පිලිබඳ ව ද ඔහු තුළ ඇත්තේ නොමඳ උද්දාමයකි. කඳුවැව වලං සඳහා දැනට ඇති ඉල්ලුම අනුව නගරයෙහි වලං ප්‍රදර්ශන කුටියක් (Show Room) සකස් කර දීමට මැදිහත් කරුවකු සිටීනම් එය කාලෝචිත කටයුත්තක් බව පෙරුමාල්ගේ අදහසයි.

අපොස උසස්පෙළ දක්වා අධ්‍යාපනය ලබා ඇති පී. රාජේන්ද්‍රන් වරක් යාපනයේ ගිය අවස්ථාවක දුටුවේ, එහි කුඹල්කරුවන් විදුලි මෝටරයක ආධාරයෙන් සකපෝරුව කරකවනායුරු ය.

කඳුවැව 'මිනිස් බල සකපෝරුව ' ප්‍රථමවරට 'විදුලි බල සකපෝරුව' බවට පත් කිරීමේ විදුලි බොත්තම ක්‍රියාත්මක කරනු ලැබුයේ පී. රාජේන්ද්‍රන් නැමැති නවීන මිනිසා විසිනි.

"මුලින් ගණන් ගත්තේ නැහැ. දැන් හැමෝම වාගේ මෝටර් පාවිච්චි කරනවා. ඊට පස්සේ රු. ලක්ෂ දෙකක් විතර වියදම් කරලා මැටි පදම් කරන මැෂින් එකකුත් ගෙනාවා. අපට ණය පහසුකම් දෙනවා නම් මීට වඩා වැඩ කරන්න පුලුවනි. නමුත් වලං කර්මාන්තය බාල වැඩක් හැටියටයි පිළිගන්නේ. ලොකු කර්මාන්තවලට ණය දෙන අය අපට සලකන්නේ නැහැ. "

රාජේන්ද්‍රන්ගේ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ කුඹල් කර්මාන්තය පිළිබඳව පවතින සමාජ ආකල්ප වෙනස් වීමේ කාලීන අවශ්‍යතාව පිළිබඳ ඔවුන්ගේ හද පතුලෙන් මතු ව එන බලගතු හඬයි.

**"මේ අයගේ කර්මාන්තය දියුණු කරන්න සමෘද්ධියෙන් දෙන්න පුළුවන් උදව් මම දෙනවා. සමෘද්ධි ලබන පවුල් 25න් 15ක් ම වලං හදන පවුල්. මැටි අඹරන උපකරණවලට ණය දුන්නා. ජීවනෝපාය සඳහා වන රු. 10,000 දුන්නා. රු.10,000 ණය වැඩසටහන යටතේ රු.5000/= යි ආපසු ගන්නේ. අනුරාධපුර පොළ ඉදිරිපිට කෘෂ්ණමූර්ති ශාලාවේ ප්‍රදර්ශනයට අපි කඳුවැව වලං ඉදිරිපත් කළා. මේ අයගේ වලංවලට හොඳ මාර්කට් එකක් හදා දීම කාලීන අවශ්‍යතාවක්." කඳුවැව සමෘද්ධි නියාමකවරයා පවසයි.**

කඳුවැව ගම්මානයෙහි ජන සංයුතිය විචිත්‍රය."

**අපූරු සංහිඳියාව**

සිංහල, දෙමළ සහ මුස්ලිම් ජන වර්ග තුනට ම අයත් ජනයා එහි ජීවත් වෙයි. දෙමළ සම්භවයකින් යුත් ජනයාගේ කථික භාෂාව තෙලිඟු මිශ්‍ර එකකි. ලිඛිත භාෂාව දෙමළ ය. බොහෝ අයට සිංහල භාෂාව ද හුරු ය.

නොච්චියාගම මුස්ලිම් විද්‍යාලයෙහි 5 වසරේ ඉගෙනුම ලබන විග්නේෂ්වරන් (අවු 10) දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබුව ද ඔහු සිංහල හොඳින් වහරයි. පාසැලේ දී ඉස්ලාම් ආගම ඉගෙන ගන්නා ඔහු දහම් පාසැලේ දී හින්දු ආගම ඉගෙන ගනී.

"අපේ තාත්තා වලං හදනවා. මාත් ආසයි වලං හදන්න ඉගෙන ගන්න"

විග්නේෂ්වරන්ගේ අනාගත ප්‍රාර්ථනාවලින් එකක් අප හමුවේ ප්‍රකාශයට පත් වෙයි.

“අපි පත්තිනි කෝවිල හැදුවේ 1987 දී. විෂ්ණු, පුල්ලෙයාර් දෙවිවරුන් අදහනවා. කෝවිලේ පූජාවට සිංහල අයත් එනවා.”

කඳුවැව මුත්තුමාරියම් කෝවිලේ කුරුක්කල් හැටියට කටයුතු කරන පී. සුබ්‍රමනියම් පවසයි. ඔහු පූජකවරයාගේ මෙහෙවර ඉටු කරන්නේ කුඹල් කර්මාන්තයෙහි යෙදෙන අතරතුර ය. සමාජීය වශයෙන් යම් යම් පසුබෑම්වලට ලක් වුව ද කඳුවැව වැසියෝ වාර්ගික සංහිඳියාව පිළිබඳ ව කදිම පාඩමක් කියා දෙති. තම පාරම්පරික ජීවන කර්මාන්තය කෙරෙහි ඔවුන් සිත්හි පවතින අචල විශ්වාසය හා අභිමානය ඔවුන්ගේ ජීව ශක්තිය දල්වන ‘ඉන්ධන’ බවට පත් ව තිබේ.

සිරිලක ඉස්තරම් ම වලං හැටියට ප්‍රචලිත කඳුවැව කළු වලං ඔවුන් සතු ජීව ශක්තිය පිළිබිඹු කරන අසිරිමත් නිර්මාණය යි.

# පානම්පත්තුවේ සිංහල දෙමළ නෑයෝ

"අපේ මිනිස්සු බඩ ඉරිඟු, රටකජු, මුංඇට, මිරිස් වගා කළා. නමුත් හේන් වගාවට තහංචි වැටුණා. බලපත්‍ර තියන අයට විතරයි අවස්ථාව ලැබුණේ. ඒ නිසා බලපත්‍ර නැති අය වෙනුවෙන් සහනයක් අවශ්‍ය වෙනවා"

පානම්පත්තුවේ පදිංචිකරුවකු වන විමලසේනගේ උක්ත ප්‍රකාශය එහි පදිංචි ගොවීන් මුහුණ දෙන ගැටලුවලින් එකක් හඳුනා ගැනීම සඳහා ප්‍රවේශයක් සපයයි. අතිශයින් ම සාම්ප්‍රදායික වූ ද ආගමික වූ ද ජීවන රිද්මයකට හිමිකම් කියන පානම් පත්තුව වැසියන්ගේ වත්මන් දිවිසැරිය විමසා බැලීම මේ ලිපියේ අරමුණයි.

1818 ඌව වෙල්ලස්ස කැරැල්ලට නායකත්වය දුන් අයවලුන් මර්දනය කිරීමට අධිරාජ්‍ය පාලකයන් කැසකවද්දී ජීවිතාරක්ෂාව පතා නැගෙනහිරට පලා ගිය සටන්කාමී උඩරට සිංහල ජනයාගෙන් නැවත එන පරම්පරාවක් මෙහි ජීවත්වන බව නිරීක්ෂණය කළ හැකි ය.

නැගෙනහිර ජන සමාජය ගැන මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්නයන් කළ නිරීක්ෂණයක දී පවසා ඇති පරිදි ම සිංහල සහ දෙමළ ජනවර්ග සම්මිශ්‍රිත වීමෙන් හටගත් අපූරු සංහිඳියාවක් පිළිබඳ තෝතැන්නක් වනුයේ 'පානම' යි. බක්මිටියාව, පන්නලල්ගම්, පොතුවිල්, කෝමාරි, පානම සහ කුමන යනාදී ප්‍රදේශ ස්ථානගත වන කලාපය 'පානම' හැටියට හැඳින්විය හැකියැයි වෙල්ලස්ස දිගාමඬුල්ල දෙද්දිසාවේ ප්‍රධාන සංඝනායක පානම චන්ද්‍රරතන හිමියෝ පවසති. "මමත් සිංහල දෙමළ මිශ්‍රනයක්. ඒ වුණාට මට දෙමළ බැහැ." උන්වහන්සේ පවසති.

හේන් ගොවිතැන ප්‍රමුඛ කරගත් කෘෂිකාර්මික ජීවිතය පරිවර්තනයට ලක් වෙමින් කුඹුරු වගාව, ධීවර කර්මාන්තය සහ කුලී වැඩ සඳහා සංක්‍රමනය වීම යනාදී වශයෙන් නූතනයෙහි එම ජන දිවියෙහි ආර්ථික පදනම සකස් වී පවතී. කැරැල්ලෙන් පැරදී ජීවිතාරක්ෂාව පතා පැමිණි පිරිස් තම අතීතය අකාමකා දමා පානමට ආවේණික වූ ජීවන රිද්මයකට අනුගත වූහ. සිංහල තරුණයන් දෙමළ තරුණියන් සමඟ විවාහ වීම නිසා, සිංහල සහ දෙමළ මිශ්‍ර වගවාසගම් සහිත පරම්පරාවක් වර්ධනය විය. රෙදි සේදීමේ කටයුතු රෙදි නැන්දාවරුන්ට හේනෙ මාමාවරුන්ට පවරා දීම උඩරට සිරිත වූ හෙයින් පානම පදිංචිවූවෝ එම කාරිය සඳහා නැගෙනහිර ප්‍රදේශයේ දෙමළ ගම්මානවල පිරිස් ද ගෙන්වා ගත්හ. මේ නිසා, පානම්පත්තුවේ 'ඩෝබිවරුන්ගේ පරම්පරාවක්" ද වර්ධනය විය.

"අපි පන්සලට යනවා. කෝවිලට යනවා. දේවාලයට යනවා. සිංහල දෙමළ කියලා වෙනසක් නැහැ"

එස්. සෙල්වරාසාගේ ප්‍රකාශයෙන් පැහැදිලි වනුයේ පානම වැසියන්ගේ ආගමික හා ජනවාර්ගික සංහිඳියාවේ මහිමය යි.

වසර 30ක් දිග්ගැසුණු ජනවාර්ගික යුද්ධයෙහි දී රජයේ හමුදා සහ එල්ටීටීඊ සංවිධානය යන දෙපාර්ශ්වයේ ම මර්දනයෙන් නිදහස් වූ කලාපයක් හැටියට 'පානම' හැඳින්වීම සහේතුක ය. එහෙත් පානම වැසියන් ප්‍රදේශයෙන් බැහැර ගිය අවස්ථා කිහිපයක භීෂණයට ගොදුරු වූ බවට වාර්තාගත ය. එමෙන් ම එහි දෙමළ සිංහල සංහිඳියාව කෙතරම් බලවත් ද යත් බැහැරින් එන බලවේගවලට එහි පැලපදියම් වීම ද අතිශය දුෂ්කර ය.

"පානම දෙමළ, සිංහල අය හිටියට මුස්ලිම් අය නැහැ. 1940 ගණන්වල දී මුස්ලිම් අය පදිංචි වෙන්න ආවා. අසාර්ථක වුණා. අපේ ඉඩම් අපි පිට අයට දෙන්නේ නැහැ. විකුණන්නෙත් නැහැ. හෝටල් හදන්න ආවත් අපි ඉඩ දුන්නේ නැහැ'

ධීවර වෘත්තිකයකු වන වර්ණකුල සිරිපාල (අවු 30) පවසයි. පානම පදිංචි එච්.ඒ. අබේසිංහ වෙදමහතා (අවු 63 යි) පවසන පරිදි එල්ටීටීඊ කෲරකම්, සුනාමිය සහ වසංගත රෝග යනාදී සියලු උපද්‍රව වලින් බේරී යහතින් ජීවත්වීමේ හැකියාව පානම වැසියන්ට ලැබුණේ පත්තිනි දේවාලයේ සහ ඔකඳ දේවාලයේ අනුහසිනි. දෙමළ, සිංහල, මුස්ලිම් සහ බර්ගර් යනාදී සියලු ජනවර්ගවලට අයත් ජනයාට 'සංහිඳක්' වූ මේ දේවාල දෙක නැගෙනහිර ජන දිවියෙහි සංස්කෘතික මර්මස්ථාන දෙකක් බඳු ය.

"අඩා, උඹ, තා, කොහා ගියේ?, මෙහෙවර ඩී, උඹ එනවා" වගේ භාෂාවක් තමයි පානම තිබුණේ, මෙය පාරම්පරික ගමක්. ඒ සංස්කෘතිය වෙනස් වෙමින් තිබීම ගැන කණගාටු යි." අබේසිංහ වෙද මහතා සෝකයෙන් පවසයි. වල්ලි අම්මා සහ කතරගම දෙවියන් ඔරුවකින් පැමිණ ගොඩ බට ස්ථානය දේවාලයට නුදුරින් පිහිටි බව පානම වැසියන්ගේ අදහසයි. උතුරුකරයෙහි සිට පා ගමනින් කතරගම යන පිරිස් දෙවොලට පැමිණ පුද පූජා පවත්වා 'කුමන' වනගහනය මැදින් කතරගම දේවාලය කරා යති. සන්නස් ඔප්පු සහිත දෙවොල් බිම අක්කර 25 ක වපසරියකින් යුක්ත ය.

"රජයත් දෙමළ මහජන නියෝජිතයනුත් දේවාලයේ නඩත්තුව සඳහා උදව් කරනවා. පානම පමණක් නොවෙයි ලංකාවේ හැම පළාතකින් ම මේ දේවාලයට එනවා."

ඔකඳ දේවාලයේ බස්නායක නිලමේවරයා වන පුංචි මහත්තයා මුතුබණ්ඩා (අවු 47) පවසයි.

කෙමෙන් වැඩි වන ජනගහනයත් අධ්‍යාපන හා රැකී රක්ෂා අවශ්‍යතාත් අනුව පානම ජන දිවියෙහි නිහඬ රිද්මය චංචල භාවයට පත් වෙමින් පවතී.

"ආරුගම්බේ හෝටලයක රෙදි හේදීමෙන් අපි ජීවත් වන්නේ. රෙදි ගේන්නේ ත්‍රීවිල් එකකින්. රු 4000ක් වියදම යනවා. රු.10000 ක් මාසෙකට ලැබෙනවා. මේ හැමදේම කරන්න පහසුකම් අවශ්‍යයි. මගේ පර්චස් 20 ඉඩමට බලපත්‍රයක් තිබුණාට, වතුර ප්‍රශ්නය උග්‍රයි. ළිං තිබුණට වතුර නැහැ"

ඩෝබි රැකියාවෙහි නියුතු වූවකු වන අත්තෝනි පිල්ලෙයි (අවු 53) පවසයි. රෙදි සේදීම පරම්පරාවෙන් උරුමකරගත් නල්ලාන් තේවානි (අවු 58) ගේ දෙමව්පියන්ගේ නිජබිම පොතුවිල් ය. පානම, ඥාති සම්බන්ධතා ඇති වීමෙන් පසුව මාගලිංගම්, සෙල්වරාසා, සන්දිරන් සහ කන්දසාමි ඇතුළු පවුල් කිහිපයක උදවිය තවමත් ඩෝබි රැකියාව කරන බවත් තම දරුවන් ධීවර කර්මාන්තයෙහි යෙදෙන බවත් නල්ලාන් තේවානි පවසයි.

පානම තරුණයන්ගෙන් අඩකටත් වඩා ජීවන වියදම උපයා ගන්නේ ධීවර වෘත්තියෙනි. පොකිරිස්සන් ඇල්ලීම එයින් ප්‍රධාන වෙයි. එහෙත් 'පැටව් අහින' මෝරන තුරු ඉස්සන් ඇල්ලීම තහනම් වන හෙයින් 'කෝස් යෑම' මේ දිනවල ඔවුන්ගේ ආදායම් මාර්ගයයි. හිමිදිරියෙහි බෝට්ටුවෙන් මුහුදු ගොස් දවල් වන විට ආපසු පැමිණීම එම පිළිවෙත ය.

"දැන් අලගොඩුවෝ කිලෝ එකක් රු 300 යි. අල්ලන අයට රු 200 යි. මාළු අහුවෙන්නේ අඩුවෙන් නිසා ජීවත්වීම දුෂ්කරයි" සුදු බණ්ඩා අබේරත්න පවසයි.

පානම ධීවරයන්ගෙන් බහුතරයක් රැකියාව කරන්නේ ව්‍යාපාරිකයන් යටතේ ය. එ මෙන් ම බෝට්ටුවල ඉන්ධන වියදම් අධික ය. බොහෝ ධීවරයන් හට ණය බරින් මිරිකී ජීවත්වීමට සිදු ව ඇත.

පළු සහ වීර පල හට ගන්නා සමයෙහි ඒවා කඩා විකිණීම පානම වැසියන්ගේ අමතර ආදායමකි. ඒවා මිල දී ගැනීම සඳහා අක්කරෙපත්තු, කල්මුණේ සහ පොතුවිල් ප්‍රදේශවලින් වෙළෙන්දෝ පැමිණෙති.

දර කැඩීම ද ආදායම් මාර්ගයකි. එහෙත් වන ජීවී සහ වනසංරක්ෂණ දෙපාර්තමේන්තු රෙගුලාසි හරස්වීම නිසා එය දුෂ්කර ව පවතී.

"ගමේ මිනිස්සු දර කැඩුවේ කැලේට හානියක් නොවෙන්න යි. ඒත් අපට තහංචි. වටිනා ගස් කපලා හොරෙන් පටවන අයට කිසි ප්‍රශ්නයක් නැහැ" පානම පදිංචි තරුණයෙක් පවසයි.

පාරම්පරික ගම්මානය වෙනස්වීමේ ප්‍රතිඵලය හැටියට තරුණ තරුණියෝ විවිධ රැකියා සොයා පිට පළාත්වලට යති. සංචාරකයෝ ද ගමට පැමිණෙති. මේ හේතුව නිසා බාහිර සමාජයට විවෘත වීම ඔස්සේ මත්ද්‍රව්‍ය උවදුර වැනි උවදුරු ඇතිවී තිබෙන බවත් වැඩිහිටියෝ පවසති. කෙසේ වුව ද 'පානම' පාරම්පරික උරුමය හා අනන්‍යතාව පිළිබඳ දැඩි හැඟීමක් තවමත් ඔවුන් සතුව පවතින බව පෙනේ.

<u>ඔවුන් රැක ගත යුතුයි</u>

- පානම ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජන්ත විමලසේන

පානම මිනිස්සු ආර්ථික ප්‍රශ්නවලින් දැඩි ව පීඩා විඳිනවා. හුඟක් දෙනකුට ස්ථිර නිවාස නැහැ. අහිංසක මිනිහෙක් බෙහෙත් පැළෑටියක් දර ටිකක් හොයාගන්න කැලේට ගියාම අල්ල ගන්නවා. ගමේ ආර්ථිකය තහවුරු කරන ගමන් සංස්කෘතිය රැකගැනීමේ වැඩ පිළිවෙළක් අවශ්‍යයි.

<u>නීතිය ප්‍රායෝගික නැහැ</u>

- මධ්‍යම පරිසර අධිකාරයේ සභාපති චරිත හේරත්

ජීවත්වීම සඳහා පරිසරයට හානි නොකර දර කඩන පුද්ගලයා නීතියේ රැහැනට හසුවීමත් දැව ජාවාරම් කරන්නාට හිරිහැරයක් නොවීමත් ඔස්සේ පෙනෙන්නේ නීතියේ පරමාර්ථය ඉෂ්ට නොවීම යි. පානම ප්‍රදේශයේ දර කැඩීමෙන් ජීවත්වන අහිංසකයා මුහුණ දෙන්නේ එම ගැටලුවටයි. නීතිය ක්‍රියාත්මක කිරීමේ දී නෛතික සීමාව, ප්‍රායෝගික ජන ජීවිතයේ සීමාවට ඇතුළු වීමෙන් ඇති වන මේ නරක තත්වය අනුමත කළ නොහැකියි.

# සාම්පූර් බිමෙන් උදුරා පර්චස් 20 ක පැළ කිරීම

මගේ දරුවා 2006 අප්‍රේල් 24 දා මුතූර් ඉස්පිරිතාලෙ දී ඉපදුණා. අප්‍රේල් 25 දා යුද්දෙ පටන් ගත්තා. අපි අනාථ උනා. බෝට්ටුවල නැගලා හොරෙං ඉන්දියාවට ගියා. යුද්දෙ ඉවර උනාට පස්සෙ ආපහු ආවා. අපේ හැඳුනුම්පත්, උප්පැන්න සහතික නැතිවෙලා. ජංගම සේවයකින් හර ඒවා නැවත ලබා දෙනවා නම් හොඳයි"

නාවල් අඩි ප්‍රදේශයේ සිල්ලර කඩයක් පවත්වාගෙන යන විජිතා සත්‍යමූර්ති පවසයි. විජිතාගේ පවුල ඇතුළු ව පවුල් 92 ක් නාවල්අඩි ගන්ගෙයි ප්‍රදේශයෙහි නැවත පදිංචි කරවීමේ වැඩසටහනට ඇතුළත් ව සිටිති.

මුතූර් ප්‍රාදේශීය සභාවට අයත් නාවල් අඩි ප්‍රදේශයෙහි නැවත පදිංචි කිරීමෙහි දී එක් පවුලකට පර්චස් 20 බැගින් රජයෙන් ලබා දී ඇත. මේවාට බලපත්‍ර ලබාදීම තවම සිදු කර නොමැත. මාස 6 ක කාලයක් ලෝක ආහාර වැඩසටහන යටතේ ඔවුන්ට ආහාර ලබා දී තිබේ. එමෙන් ම EHED සහ කරිටාස් යන සංවිධානවලින් සිල්ලර කඩ ආරම්භ කිරීම සඳහා 6 දෙනකුට රු 25,000 ක වටිනාකමකින් යුත් භාණ්ඩ කට්ටල බැගින් ලබා දී ඇත.

විජිතා සත්‍යමූර්ති පවසන පරිදි තමන් අවතැන් ව සිටි සමයේ ජීවත් වූ ඉන්දියාවේ ඉන්වම්පල්ලි කඳවුරේ තවමත් එක් ලක්ෂ පනස් දහසකට වැඩි ශ්‍රී ලාංකිකයන් පිරිසක් ජීවත්වෙයි. මව්බිමේ ඔවුන්ට අයත් ඉඩම් ඇත්තේ අධි ආරක්ෂිත කලාපයේ ය. 1990,91, 92 කාලයෙහි අවතැන් වූවන් වශයෙන් ඉන්දියාවට සංක්‍රමණය වූවන් නැවත උපන් බිම කරා පැමිණීමට අකමැතිවීමේ හේතුවක් වී ඇත්තේ ද අධි ආරක්ෂිත කලාපයේ ඉඩම් නිදහස් නොකිරීම සහ නැවත යුද්ධයක් ඇති වේය යන බියයි. යුද බිය තුරන් වුව ද නාවල් අඩි පදිංචිකරුවන් වත්මනෙහි මුහුණ දෙන ප්‍රශ්නයක් ව ඇත්තේ වල් අලින් ගම්වැදීම ය.

වනගහනය හෙළි පෙහෙළි කර නව නිවාස තැනීමෙහි ප්‍රතිඵලය ලෙස වල් අලි උවදුර ඇතිවී තිබෙන බව එහි පදිංචිකරුවන්ගේ අදහස යි.

"විදුලි වැටක් ඉදිකර දෙන්නැයි වනජීවී නිලධාරීන්ට කීවා. ඒත් ඔවුන් තවම කිසි පියවරක් ගත්තේ නැහැ" මේ ඔවුන්ගේ චෝදනාව යි.

නාවල් අඩි සිට මුතූර් දක්වා යා යුතුව ඇත්තේ පාලම් පාරුවෙනි. දුර කිලෝ මීටර් තුනකි. එහෙත් රාත්‍රී 8.00 න් පසු පාරු ගමන නවතී. මේ නිසා හදිසි රෝගියකු රැගෙන යෑමට වුව ද පසු ව දා වන තුරු බලා සිටීමට සිදු වේ.

එහෙත් මේ වන විට එහි පාලමක් ඉදිකෙරෙමින් පවතී.

ජෝශප් ක්‍රිශාන්තන් (අවු 26) කිලිවෙඩ්ඩි ප්‍රදේශයෙහි පදිංචි ව සිටි අයෙකි. ඔහු එකල ධීවර වෘත්තියෙහි නියැළුණේ ය. එහෙත් නාවල් අඩි යනු වෙරළට දුරින් පිහිටි ප්‍රදේශයකි. එනිසා ඔහු ධීවර වෘත්තිය අතහැර පෙදරේරුවෙකු ලෙස කටයුතු කරයි. සත්‍යමූර්ති (අවු 29) ද ධීවර වෘත්තිය වෙනුවට කුලී වැඩ තෝරාගත් අයෙකි.

"අපට උදව් කරන්න විවිධ සංවිධාන එනවා. නමුත් ප්‍රාදේශීය ලේකම් සහ ග්‍රාම නිලධාරීගේ අනුමැතිය අවශ්‍ය යි. දැනට එම සංවිධානවල ආධාරයෙන් 43 දෙනෙක් ස්වයං රැකියා කරනවා"

සත්‍යමූර්ති පවසයි.

නාවල් අඩි පදිංචි කරුවකු වන තිරුලෝගනාදන් රජීවන් (අවු 20 යි) යුද්ධය පැවති සමයෙහි තම පවුලේ අය සමග ජීවත් වුණේ මඩකලපුවේ කඳවුරක ය. කඳවුරේ ජීවත්වෙමින් ඉගෙනගත් ඔහු උසස් පෙළ ඉහළින් සමත් ව නැගෙනහිර විශ්ව විද්‍යාලයෙහි අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබී ය.

එහෙත් පවුලේ ආර්ථික තත්වය අයහපත් වූ නිසා විවිධ ගැටලුවලට මුහුණ දෙන්නට ඔහුට සිදු ව ඇත.

"සාම්පූර්වල අක්කර 3 1/2 ක, පොල් ඉඩමක් අපට තිබුණා. ඒ ඉඩම රජයෙන් පවරාගෙන විදුලි බලාගාරයක් හදනවා. අපට පර්චස් 20 ක් ලැබුණා. අපේ පවුලේ 5 දෙනෙක් ඉගෙන ගන්නවා.

ඉස්සර අපට අඩුපාඩු තිබුණේ නැහැ. දැන් ගොඩක් කරදර යි. තාත්තා ධීවර රැකියාව කරනවා. ගේ හදන්න අත්තිවාරමක් දාලා තියනවා."

තිරුලෝගනාදන් රජීවන්ගේ ජීවන චිත්තිය ඔහුගේ පවුලේ ඛේදවාචකයෙන් ඔබ්බට විහිද ගිය සමාජ චිත්තියකි. සාම්පූර්හි පදිංචි ව සිටි ටී. නාගරාජා ( අවු 62යි) බේකරි හිමියෙකි. නැවත පදිංචි කරවීමෙන් පසු ව ද ඔහු නාවල් අඩි ප්‍රදේශයෙහි බේකරි ව්‍යාපාරය පවත්වා ගෙන යෑමට උත්සාහ කරයි. එහෙත් පාරිභෝගිකයන්ගේ ආර්ථික මට්ටමේ තිබෙන අස්ථාවරභාවය අනුව තම ව්‍යාපාරය පිළිබඳව තවමත් විශ්වාසයක් තැබිය නොහැකි බව ඔහුගේ හැඟීම යි.

ධීවර වෘත්තියෙහි නැයැලෙන උදවිය දැල් ආම්පන්න ඉල්ලා ඇතත් ඔවුන්ට ඒවා නොලැබී තිබීම ඔවුන්ගේ ආදායම් පහළ වැටීමට බලපෑ ඇති බව නාගරාජාගේ අදහසයි.

නාවල් අඩි ප්‍රදේශයෙහි නැවත පදිංචි කිරීම්වල දී අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම සඳහා රජය සහ රජයේ අනුමැතිය ලත් විවිධ සංවිධානවලින් සැලකිය යුතු වැඩ කොටසක් ඉටු කර ඇති බව පෙනෙන්නට ඇතත්, නාවල් අඩි පදිංචිකරුවන් නගන මැසිවිලි අනුව පෙනී යන්නේ අවම මට්ටමේ අවශ්‍යතා සපුරා ගැනීමේ ගැටලුවලට ඔවුන් තවමත් මුහුණ දෙන බව ය.

උදාහරණයක් හැටියට ගතහොත් පවුල් 92 ක් සඳහා ළිං අටක් ඉදිකර දී ඇතත් බීමට ගත හැකි ජලය පවතින්නේ ළිං තුනක පමණි. වැසිකිළි 6 ක් ඉදිකර දී ඇතත් එය ප්‍රමාණවත් නොවේ.

'නැගෙනහිර නවෝදය' ඉතා හොඳ වැඩසටහනක් බවත්, එය නගරයට සීමා නොවී ගම් දනව් කරා ද විහිද ගිය එකක් විය යුතු බවත් පවසන්නේ යුද්ධය සහ සුනාමිය යන දෙකට මැදි වී කිසිදු රැකියාවක් කරකියාගත නොහැකි මට්ටමට පත් වූ එච්. රූස්වෙල් (අවු. 30යි) ය.

“මම මුලින් පදිංචි ව සිටියේ නාවල්අඩි වෙරළේ. බෝට්ටුව සුනාමියට ගියා. ඇඳුමක්වත් ඉතුරු උනේ නැහැ. ත්‍රිකුණාමලයේ, මඩකලපුවේ කඳවුරුවල හිටියා. ඊට පස්සේ මෙහෙ ඉඩම් ලැබිලා පදිංචි උනේ. දැන් මුහුදු යන්න අවසර තිබුණත් හුඟක් ධීවරයන්ට ආම්පන්න නැහැ”

එච්. රූස්වේල් පවසන්නේ කළකිරීමෙනි. නාවල් අඩි නැවත පදිංචි කරවන ලද අය සමඟ කතා බහ කිරීමේ දී පොදුවේ ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද, ගැටලු කිහිපයකි. පාසැල්වල ගුරු හිඟය, අතුරු මාර්ගවල විදුලිය නොතිබීම, අලුතින් ඉදිකරන ලද නිවාසවලට විදුලිය නැතිවීම, ප්‍රධාන මාර්ගවල විදුලි ලාම්පු නැතිකම සහ රෝහලක් ඉදිකර ඇතත් එය විවෘත කිරීමේ ප්‍රමාදය සහ වල් අලි උවදුර යනු එම ගැටලු ය.

මේ ගැටලු සියල්ල සම්බන්ධයෙන් රාල් කුලී ග්‍රාම නිලධාරී (අවු. 58 යි) කළ පැහැදිලි කිරීම මෙසේ ය.

“රාල් කුලී, ගන්ගෙයි සහ නාවල් අඩි වසම් තුනේ පවුල් 307ක රාජකාරි කරන්නේ මමයි. UNDP එකෙන් ගෙවල් 50 ක් දුන්නා. රජයෙන් පවුලකට රු 25,000 බැගින් දුන්නා. පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයෙන් නැවත රු. 250,000 ක් දුන්නා. ආධාර මදි නිසා, ගෙවල් බාගෙට හදලා නැවතිලා තියෙන්නේ. දැඩි ආර්ථික අහේනියක් මේ අයට තියෙනවා. දෙමළ බහුතරයකුත් මුස්ලිම් සුළුතරයකුත් සිංහල පවුල් කිහිපයකුත් සිටින මේ පළාතේ මුස්ලිම් සුළුතරය සිටින ප්‍රදේශ පමණක් සංවර්ධනය කෙරෙන බවට චෝදනාවකුත් තිබෙනවා. ඒකට හේතුව දෙමළ මන්ත්‍රීවරයකුට ඉන්නේ සම්බන්දන් විතරයි. අනිත් ඔක්කොම මුස්ලිම් අය”

ග්‍රාම නිලධාරියා පවසා සිටියේ සියලු කටයුතුවල සම්බන්ධීකාරකයා හැටියට තමා වටහාගත් දේ ය.

නැවත පදිංචිකරවන ලද අයගේ තත්වය එසේ තිබිය දී කඳවුරුවල තවමත් ජීවත්වන අයගේ ජීවන විත්තිය හද පාරවන සුළුය.

කිලිවෙඩ්ඩි කඳවුරේ ජීවත් වන රවී සාම්පූර්වල පදිංචි ව සිටි අයකි. සාම්පූර්වල තමන්ට අයිති ව තිබූ ඉඩම් නැවත ලබා දිය යුතු බව ඔහුගේ අදහසයි. ඉත්තිකුලම්, පාටලීපුරම් සහ වේලම්බුඅඩි තෝට්ටම්හි ලඳු කැලෑවලින් පර්චස් 20 බැගින් ලබා දීමට යෑම බලවත් අපරාධයක් බව ඔහුගේ චෝදනාව යි.

“අඩි 80 ක් යටට කැපුවත් වතුර නැහැ. අපට වතුරත් නැති වෙන්න ද යන්නේ? අපි අනුන්ගේ සහනාධාරවලින් තවමත් ජීවත් වෙනවා. මට දරුවන් 4 දෙනෙක් ඉන්නවා. යුද්ධ කාලෙත් අනාතයි. දැනුත් අනාතයි. පර්චස් 20 ක් අරන් මොනවා කරන්න ද?

රවිගේ චෝදනා පත්‍රයට සාධාරණ පිළිතුරක් දිය හැකි සමතෙක් සිටී ද?

“මගේ අම්මා දෙමළ. තාත්තා සිංහල. තාත්තාගේ මුල් නම දසනායක. පසුව තම්බිරාසා යනුවෙන් නම වෙනස් කර ගත්තා. අම්මා සරස්වතී. මම කව්ද කියලා මමවත් දන්නේ නෑ. ඒත් එක දෙයක් දන්නවා. ඒ තමයි අපි අනාත වුණු බව.”

ටී නාගරාජාගේ ප්‍රකාශය සාම්පූර් අවතැන්වූවන්ගේ ශෝකලාපය කියාපානා වාග් චිත්‍රයක් වැන්න.

**හැම කෙනෙක් ගැන ම සොයා බලනවා.**

- කේ.එම්. තවුෆික් මුතූර් - ප්‍රාදේශීය සභාපති

"අවතැන් වූවන් සඳහා අපි දවසකට වතුර ලීටර් 38,000 ක් බවුසර්වලින් දෙනවා. ප්‍රාදේශීය සභාවෙන් පාරවල්වලට ලාම්පු සපයන්න පුලුවන් කමක් නැහැ. ඒ සඳහා කැබිනට් අනුමැතිය ලැබිය යුතුයි. මුස්ලිම් ප්‍රදේශවලට පමණක් වැඩ කරන කතාව සම්පූර්ණයෙන් ම වැරදියි. මම හැම කෙනෙක් ගැන ම බලනවා. අපේ රාජකාරිය ජලය සහ සනීපාරක්ෂක කටයුතු පමණයි. අනෙක් සියලු කටයුතු DS කාර්යාලය හරහා රජය කළ යුතුයි. ප්‍රාදේශීය සභාව ජයිකා එකට පානීය ජල ව්‍යාපෘති යෝජනාවක් දී තිබෙනවා. ඒත් රජය NGO වලට අකමැති නිසා උදව් උපකාර ගැනීමේ අවස්ථා අහිමි වෙලා. ග්‍රාම සේවා වසම් 6ක අක්කර 10,000 ක් අධි ආරක්ෂිත කලාපයට ගෙන ඇති නිසා පර්චස් 20 කට වඩා ඉඩම් දෙන්න බැහැ"

**සුදුසු පියවර ගන්නවා.**

**-පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ ඇමති මිල්රෝයි ප්‍රනාන්දු**

නැවත පදිංචි කිරීම කඩිනම් කිරීමටත්, ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීමටත් රජයේ පාර්ශ්වයෙන් සෑම පියවරක් ම අරගෙන තියෙනවා. නමුත් සාම්පූර්වල යම් යම් ගැටලු පැන නැගී තිබෙනවා නම් ඒ පිළිබඳ හැකි ඉක්මනින් සුදුසු පියවර ගන්නවා. මේ පිළිබඳව අපගේ අවධානය යොමු කරවීම ගැන ලංකාදීප පුවත්පතට මා ස්තුති කරනවා.

# තල තෙල් සුවඳ හමන සෙක්කුපිටිය

"සෙක්කුවෙ බැන්ද ගොනාවගේ". මෙය ප්‍රකට ජන කියමනකි. සෙක්කුව ගොනාට සම්බන්ධ වන්නේ විය ගසෙනි. සෙක්කුව වටා කවාකාරව ගොනා කැරකෙන විට මෝල් ගස ද කැරකීම නිසා, සෙක්කු කුහරයෙහි ඇඹරෙන තල ඇටවලින් තෙල් ශ්‍රාවය වෙයි. සෙක්කුවෙහි බැඳි ගොනාගේ දුක්බර ගමනෙහි අවසානයක් නැත. තෙල් නිෂ්පාදනයෙන් ලාබය ගන්නේ සෙක්කු හිමියා ය. අපේ රටේ හොඳම තල තෙල්, මී තෙල් සහ කොහොඹ තෙල් නිෂ්පාදනය කරන වැදගත් මධ්‍යස්ථානය හැටියට සෙක්කුපිටියට හිමි අනන්‍යතාව තවමත් පළුදු වී නැතැයි එහි ජන දිවිය නිරීක්ෂණය කරන්නකු හට හැඟේ. කැකිරාව නගරය මධ්‍යයෙන් සෙක්කුපිටිය ග්‍රාමයට පිවිසිය හැකි ය. නගරය පෙනෙන තෙක් මානයේ එය පිහිටියේ ය. මීට දශක දෙකකට පමණ පෙර එහි තිබූ තත්වය වෙනස් වී ගොනුන් වෙනුවට අත් ට්‍රැක්ටරය ආදේශ වී තිබේ. සෙක්කුව ක්‍රියාත්මක කරවීමේ දී ගොන් බාන් තුනක් දිනකට අවශ්‍ය වේ. ඔවුන් නඩත්තු කිරීමට යන වියදමෙන් 1/3ක් අත්ට්‍රැක්ටරය නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ය. එහෙත් සෙක්කුපිටිය වැසියන්ට තිබෙන ප්‍රධාන අභියෝගය එය නොවේ.

"මහවැලි එච් කලාපයටයි සෙක්කුපිටිය අයත්වන්නේ. මහවැලි ව්‍යාපාරය ආවයින් පස්සේ තලහේන් වගාව නැවතුණා. සෙක්කු හදන්න අවශ්‍ය ලී සපයා ගැනීම අමාරු වුණා. නීති රීති වැඩියි. මේ නිසා තල තෙල් නිෂ්පාදනය කිරීම දුෂ්කර කටයුත්තක් වෙලා."

සුසිලා කුගනේෂ්වරන් (අවු 36) පවසයි. ඇය සෙක්කුපිටිය තල තෙල් නිෂ්පාදනය කරන පවුලක සාමාජිකාවකි.

මහවැලිය ශාපයක් වීම

මහවැලි ජනපදකරණයත් සමඟ රාජ්‍ය මට්ටමින් දෙන ලද උපදෙසක් වූයේ තල වගාව සඳහා හේන් කෙටීම පරිසරයට හානි පමුණුවන්නක් හෙයින් ගොවීන් වී වගාව නොකරන කන්නවල කුඹුරු තල වගාව සඳහා යොදා ගැනීම උචිත බව ය. එහෙත් හේන් ගොවීන් කුඹුරුවල තල වගාව කෙරෙහි දැක්වූයේ අඩු නැඹුරුවකි. මේ නිසා තල තෙල් නිෂ්පාදනය සඳහා තල සපයා ගැනීම වියදම් අධික කටයුත්තක් බවට පත් ව ඇත. සෙක්කුවක් නිර්මාණය කර ගැනීමේ දී දැව සපයා ගැනීම දුෂ්කර කටයුත්තකි. වනගහණයෙන් විශාල ප්‍රමාණයක් මහවැලි ජනපද ඉදිකිරීම සඳහා හෙළි පෙහෙළි කිරීම ඊට හේතුවකි. සෙක්කුබඳ ඇතුළුව සෙක්කුවෙහි විවිධාංග නිර්මාණය කිරීම සඳහා විශාල වියදමක් දැරීමට සෙක්කු හිමියන්ට සිදුවෙයි.

සෙක්කුව නිෂ්පාදනය කිරීම සඳහා, පළු, කෝන්, සියඹලා, දඹ, මයිල සහ බුරුත යනාදී ශාකවල දැව අවශ්‍ය වෙයි.

දැව සපයා ගැනීම දුෂ්කර නොවූ එකල සෙක්කු නිර්මාණකරුවා එම කාර්යට බැස්සේ වතාවත් අනුව පෙව්මෙනි. සෙක්කු වංගෙඩිය, මොල්ගහ, කොත්තාලිය (වහලය) කොක්කි ගැටය, තෙරී කොටය, අඩුපලය සහ කදන් කාල් යනාදී අංග සහිත සෙක්කුව අසිරිමත් නිර්මාණයකි. සෙක්කුව නිර්මාණය කිරීමෙන් පසුව තෙල් සිඳීම ආරම්භ කරන්නේ පොල්, සාම්බ්‍රානි සහ බුලත් තබා කෙරෙන පූජාවකින් පසුව එළඹෙන සුබ නැකතිනි. පළමු තෙල් සිඳීමෙන් පසුව කුකුළු බිල්ලකින් ලේ තැවරීම සිදු කරති.

“මහවැලි ව්‍යාපාරය පටන්ගත්තට පස්සෙ අපි දැව ලබා ගන්නෙ දැව සංස්ථාවෙන්. සෙක්කුවක වැඩ ඉවර කරන්න රුපියල් ලක්ෂ තුනක් විතර අවශ්‍ය වෙනවා. සෙක්කුවෙ මෝල් ගහ මාසයකට වරක් ඉවත් කරන්න වෙනවා. මේ නිසා සෙක්කුවෙන් තෙල් හිඳින එක වියදම් අධික දුෂ්කර කටයුත්තක් බවට පත් වෙමින් තිබෙනවා.” සෙක්කුපිටියෙහි ප්‍රධාන තෙල් නිෂ්පාදකවරයකු වන කේ. සුබ්‍රමනියම් (අවු 49) පවසයි.

තල වැස්සේ සුවඳ

ඌව බින්තැන්න, මාගම් පත්තුව, හත් කෝරළය සහ රජරට ප්‍රදේශවල ගොවි ජනතාවගේ බව බෝග සම්ප්‍රදායෙහි තල වගාවට හිමි ව තිබුණේ සුවිශේෂී ස්ථානයකි. ‘තල වැස්ස’ යනු එම ගොවීන් ගේ වාක්කෝෂයට අයත් අපූර්ව යෙදුමකි. තල බීජ වැපිරීම සිදුකරනු ලබන්නේ වැස්ස තුනී වන සමයෙහි ය. තල වැස්ස යනු තුනී වූ වැස්ස ය.

ගැමි ගෙදර මුළුතැන්ගෙයි රාක්කයෙහි පොල් තෙල්, මීතෙල් සහ එලගි තෙල් හිඟ නොවීය. එකල තෙල් හිඳීම සුලබ වශයෙන් සිදු කෙරුණේ ගෘහ කර්මාන්තයක් වශයෙන් පැසක ආධාරයෙනි.

ගැමි ගෙවල ආහාර සංස්කෘතිය පරිවර්තනයට ලක් වීමේ දී තල තෙල්, මී තෙල් සහ එලගි තෙල් බෝතල් රාක්කයෙන් සමු ගත්තේ ය. වත්මනෙහි එහි ඇත්තේ පොල් තෙල් හෝ ෆාම් ඔයිල් පමණි.

“තල තෙල්වලට යාපනේ තිබෙන්නේ ඉහළ ඉල්ලුමක්. ඒ නිසා අපි තල තෙල් අරං යාපනයට යනවා. යාපනේ ගෙවල්වල තවමත් ආහාර පිසීමේ දී තල තෙල් පාවිච්චියට ගන්නවා. සිංහල ගම්වලින් ඒ පුරුද්ද ඈත්වෙමින් තිබෙනවා.”

නීලවානන් (අවු 32) පවසන්නේ සමාජ පරිවර්තනයක එක් පැතිකඩක් පිළිබඳව ය.

ව්‍යාපාරික බලය

සෙක්කු භාවිත කරන ගම සෙක්කුපිටිය හැටියට භාවිත වුව ද තෙල් සිඳීමට අමතර ව විවිධ වෘත්තීන්හි යෙදෙන මිශ්‍රිත ජන සංයුතියක් එහි ඇත. යාපනයේ වංශවත් දෙමළ ප්‍රජාව මෙන් ම කුලහීන ගැමි සම්මත ප්‍රජාවක් ද මෙහි ජීවත් විය. එමෙන් ම මුස්ලිම් හා සිංහල පවුල් ද මෙහි වෙති. 1977ට පෙර කැකිරාව නගරයෙහි වානිජ බලය තිබුණේ යාපනය ජන්ම භූමිය කරගත් වංශවත් දෙමළ පවුල් කීපයකට ය. තල තෙල් කර්මාන්තය පැවතුණේ ද ඔවුන් සතු ව ය. සෙක්කුපිටියෙහි ජීවත්වූයේ ඔවුන්ගෙන් අමුද්‍රව්‍ය ලබා ගෙන සෙක්කුවලින් තෙල් සිඳින කුලී කරුවන් පිරිසකි. 1977 දී ඇවිළගිය ජාතිවාදී ගැටුමෙහි දී කැකිරාව නගරයෙහි දෙමළ ව්‍යාපාරිකයන් සතු දේපල කොල්ලකා ඔවුන්ගේ කඩ සාප්පු ගිනි තබන ලදි.. දෙමළ ව්‍යාපාරිකයෝ යාපනයට ගිය හ. ඉන්පසු ඔවුනට ආපසු පැමිණීමේ වාතාවරණයක් රට තුළ නොවූයෙන් ඔවුහු තම දේපළ සිංහලයන්ට විකුණූහ. පසුව මුස්ලිම් ව්‍යාපාරිකයන් විසින් එම ඉඩම් සහ කඩසාප්පු මිලදී ගන්නා ලදි. අමුද්‍රව්‍ය සපයන ව්‍යාපාරික පිරිස නගරය හැරයෑම ඔස්සේ ඒවා සපයා ගැනීමේ දුෂ්කරතාව මතුව ඇතත්, වත්මනෙහි සෙක්කුපිටියෙහි කරකැවෙන සෙක්කුවල හිමිකරුවන් සිටින්නේ එම ගමෙහි ම ය.

ග්‍රාමීය රෝහලේ මෙන් ම නගර සභාවේ කසළ ශෝධක කම්කරුවන් ලෙස කටයුතු කරන පිරිසක් ද සුළු වෙළෙඳාම සහ විවිධ කම්කරු වෘත්තින්හි නියැලෙන පිරිස් ද මෙහි හඳුනාගත හැකි ය. එමෙන් ම මැද පෙරදිගට සහ කොරියාවට ශ්‍රමිකයන් ලෙස රැකියාව සොයාගෙන ගිය පිරිස් ද වෙත්.

සෙක්කුපිටිය ග්‍රාමයෙහි සෙක්කුවෙන් තෙල් සිඳීම ඇරඹුණේ 1930 දශකයේ දී පමණ ය. දකුණු ඉන්දියාවෙන් සංක්‍රමණය වූ චන්ද්‍රවරුන් ගෙන් පැමිණි ශිල්පයකි එය.

තල තෙල් සහ මී තෙල් ගැමි ගෙවල ආහාර සංස්කෘතියෙන් වියෝවෙමින් පැවතිය ද ඖෂධ නිෂ්පාදනය සඳහා එම තෙල් වර්ග අවශ්‍ය වන හෙයින් සෙක්කු පිටියට ගැනුම් කරුවන්ගෙන් හිඟයක් නැත. සෙක්කුවෙන් සිඳින ලද තෙල් නිසි ප්‍රමිතියකින් යුක්ත නිසා ඖෂධ නිෂ්පාදනයේ දී ඒවා වැදගත් වන බවට විශ්වාසයක් පවතී. මේ නිසා යන්ත්‍රානුසාරයෙන් සිඳින තෙල්වලට වඩා සෙක්කුවෙන් සිඳින තෙල් මිලදී ගැනීමට ඖෂධ නිෂ්පාදකයෝ වැඩි කැමැත්තක් දක්වති.

එහෙත් මේ තත්වය වෙනස් වන ලකුණු සෙක්කුපිටියෙහි ද පෙනෙන්නට තිබේ.

"සෙක්කු අලුත්වැඩියා කරන්න දන්න අය තව එක්කෙනයි ඉතුරු වෙලා ඉන්නේ. සෙක්කු පණහක් තිබුණු ගමේ දැන් සෙක්කු හතයි තියෙන්නේ. තව ටික කාලයක් යනකොට ඔක්කොම මැෂින්වලින් තෙල් හිඳියි. නඩත්තුව දුෂ්කර නිසා සෙක්කුව අයින්කරපු අයත් ඉන්නවා. ඒ අය දැන් සෙක්කු තියෙන අය ළඟ කුලියට වැඩ කරනවා."

අල්ලිරාණි ජෝර්ජ් (අවු 55) පවසයි. යන්ත්‍රානුසාරයෙන් සිඳින තල තෙල් සෙක්කුවෙන් සිඳිනු ලබන ඒවා හැටියට හඳුන්වා ඖෂධ නිෂ්පාදකයන්ට අලෙවි කිරීමට ඇතැමෙක් පෙළඹී තිබීම කණගාටුවට කරුණක් බව පවසා සිටියේ සෙක්කු කර්මාන්තයෙන් සමුගෙන සිටින අයෙකි.

අත්ට්‍රැක්ටරයෙන් ක්‍රියාත්මක වන සෙක්කුව නුදුරු අනාගතයෙහි දී විදුලියෙන් ක්‍රියාකරන යන්ත්‍රයට මාරු වූ විට ඖෂධ නිෂ්පාදනය සඳහා හොඳම ප්‍රමිතියෙන් යුක්ත තෙල් නිෂ්පාදනය කරන ගමක් හැටියට සෙක්කුපිටියට තිබෙන කීර්තිනාමයට කුමක් වේදැයි සිතා ගත නොහැක.

රජරට එක ම දෙමළ විදුහල

සෙක්කුපිටියෙහි දෙමළ දරුවන්ට දෙමළ මාධ්‍ය අධ්‍යාපනය සඳහා ඇති එක ම පාසැල වන්නේ බැප්ටිස්ට් මිෂන් දෙමළ විදුහලයි. පාසැලේ අඩුපාඩු රැසක් ඇති බවත් අනුරාධපුරයේ පිහිටි එකම දෙමළ විද්‍යාලය වන විවේකානන්ද විදුහලට තම දරුවන් යැවීම දුෂ්කර වී ඇති බවත් සෙක්කුපිටිය පදිංචි සුසිලා කුගනේෂ්වරන් පවසයි.

එස්. කේතීෂ්වරන් (අවු:17) බැස්ටියන් සිල්වා සිංහල පාසැලේ 11 වසරේ ඉගෙනුම ලබයි. ඔහුගේ සොහොයුරන් වන ප්‍රතාප් සහ ප්‍රකාශ් ඉගෙනුම ලැබුවේ දෙමළ පාසැලෙනි.

"දෙමළ පාසැලේ සාමාන්‍ය පෙළ දක්වා පමණයි පන්ති තියෙන්නේ. ඊට පස්සේ මුස්ලිම් පාසැලට හරි අනුරාධපුරේ විවේකානන්ද පාසැලට හරි යන්න වෙනවා. නමුත් අපේ පාසැලේ උසස්පෙළ තියෙනවා. හින්දු ආගම සහ දෙමළ උගන්වන ගුරුවරු නැතත් අනෙක් විෂයන්වලට ඉන්නවා. මගේ අයියලා සෙක්කුවෙ වැඩවලට තාත්තට උදව් කරනවා. මම කැමති අධ්‍යාපනයෙන් ඉදිරියට යන්න."

තම දෙමළ අනන්‍යතාව ගැටලුවක් කරගනු වෙනුවට මහා සමාජයට අනුවර්තනය වී සිටින කේතීශ්වරන්ගේ අනාගතය කුමක් වේද? බැප්ටිස් මිෂන් දෙමළ විදුහලේ 7 වසර ඉගෙනුම එස්. පවිත්‍රාගේ පියා කටාර්වල සේවය කරයි. ඔහු සෙක්කුවක වැඩ කළ අයෙකි. ඇගේ සොයුරා සිංහල පාසැලේ ඉගෙනුම ලබයි.

"මම පන්තියේ දෙවැනියා. ශිෂ්‍යත්වෙ පාස්වෙලා ලොකු ඉස්කෝලෙකට යනවා." සෙක්කුපිටියෙහි අනාගත දිශානතිය රැඳී ඇත්තේ පවිත්‍රා දැරියගේ දිදුලන දෑස්මත ය.

දෙමළ පාසැලෙහි පරිපාලනය බිඳවැටී ඇති නිසා බොහෝ දෙනෙකු තම දරුවන් එහි නොයවන බව නීලවානන් ( අවු: 32) පවසයි.

"අපට කරන ලොකුම උදව්ව තමයි අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැරණි ම දෙමළ විද්‍යාලය වන මේ පාසැලේ අඩු පාඩුවලට පිළියම් යොදලා අපේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන එක." නීලවානන්ගේ වේදනාබර ඉල්ලීම සෙක්කුපිටියේ සියලු දරුවන් වෙනුවෙනි.

බැප්ටිස් මිෂන් දෙමළ විදුහලේ වැඩ බලන විදුහල්පතිවරයා පවසන්නේ උසස්පෙළ පන්ති ආරම්භ කිරීම සඳහා පහසුකම් ඉල්ලා ඇතත් නොලැබී ඇති බව ය. උසස්පෙළ සඳහා ළමුන් 15 දෙනෙකුවත් සුදුසුකම් ලබනවා නම් පහසුකම් ලබාදෙන බවට බලධාරීන් පවසා ඇතත් එම සංඛ්‍යාව 05 නොයික්මවා ඇති බව ද ඔහු පවසයි.

"දුප්පත් පවුල්වල ළමයි නිසා අපි පහසුකම් ගාස්තු අය කරන්නේ නැහැ. ගුරුවරු හවස පන්ති තියලා උගන්වනවා. නමුත් ළමයින්ගෙ පැමිණීමත් උනන්දුවත් අඩුයි." විදුහල්පතිවරයා එහි අභ්‍යන්තර තතු පැහැදිලි කළේ ය.

1940-1950 දශකවල උසස් මට්ටමකට තිබූ මේ විදුහල පිරිහීමට ලක් වීමේ ප්‍රධාන හේතුව වූයේ 1977-1983 වාර්ගික ගැටුම් හේතුවෙන් දෙමළ ගුරුවරුන් ඉවත්ව යෑම බව සෙක්කුපිටිය වැසියන්ගේ අදහසයි. අනුරාධපුර විවේකානන්ද දෙමළ විදුහලෙහි ඇත්තේ මුස්ලිම් පරිපාලනයකි. හින්දු සංස්කෘතියට අයත් අනුරාධපුරයේ එකම දෙමළ පාසැල වන කැකිරාවේ දෙමළ විදුහල ප්‍රදේශයේ අවශ්‍යතා අනුව දියුණු කළ යුතු බවට නැගෙන මැසිවිලි සාධාරණ බව පෙනේ.

සෙක්කු නිර්මාණය දන්නා එකම ශිල්පියා වන කේ. සුදාකරන්ගේ පුත් එස්. කුමාර තම පියාගෙන් එම ශිල්පය උගත්තේ ය. එහෙත් දැව සපයා ගැනීමේ දුෂ්කරතාවත් අධික වියදම් දරන්නට වීමත් නිසා ඔහු එම වෘත්තියට පිවිසියේ නැත. කොළඹ ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයෙන් කැටයම් ශිල්පය සහ වඩුවැඩ උගත් ඔහු සෙක්කුපිටියෙහි තමන්ගේ ම ආයතනයක් පවත්වාගෙන යයි. "සෙක්කු හදන වැඩෙන් උපයනවාට වඩා ලාබයක් මට තියෙනවා."

කුමාර පවසයි.

කැකිරාව නගරයෙහි වෙල්ලයියා පාර නම්කර ඇත්තේ කලකට පෙර එහි සුළු නගරාධිපති ලෙස කටයුතු කළ ඒ.ඕ. වෙල්ලයියා සිහිවීම පිණිස ය.

"මෙය නාගරික සංවර්ධන බල  ප්‍රදේශයක්. දීර්ඝකාලීන බදු පදනමක් යටතේ ඉඩම් ලබා දෙන්නේ. නමුත් බහුතරයක් දිළිඳු නිසා බදු ලැබෙන්නේ අඩුවෙන්. මේ නිසා බලපත්‍ර නිකුත් කිරීම දුෂ්කරයි. ඉඩම් සංවර්ධන ආඥා පණත යටතේ දෙන්නත් බැහැ. හැමෝටම වගේ වාර්ෂික බලපත්‍ර තියෙනවා. නමුත් බදු ගෙවලා අලුත් කර ගැනීමේ උනන්දුවක් ඔවුන්ට නැහැ."

තම ඉඩම්වල අයිතිය පිළිබඳ සෙක්කුපිටියේ බොහෝ අය නගන මැසිවිලිවලට පිළිතුරක් දෙමින් කැකිරාව ප්‍රාදේශීය ලේකම්වරයා පවසයි. කුඩා දරුවන් නිවෙස්වල තබා මව්වරුන් කුලීවැඩට යන බවත් මේ නිසා දරුවන්ගේ පෝෂණ මට්ටම පහළ ගොස් ඇති බවත් පවුල් සෞඛ්‍ය සේවිකාව පවසයි. එහි ජීවත්වන සමෘද්ධි ලාභී පවුල් සංඛ්‍යාව 40කි.

සෙක්කුපිටයෙහි 'තෙල් මුද්‍රාව' ජනපදකරණය හා නවීකරණය අනුව අහෝසි නොවී ය. එය සිංහල දෙමළ සංස්කෘතීන්හි අන්‍යොන්‍ය පෝෂණය හා සංහිඳියාව සංකේතවත් කළ විශිෂ්ට මුද්‍රාවකි. ඒ බැවින් එය ලාංකීය මුද්‍රාවකි.

# සංචාරය සමඟ ජීවිතය අහිමි වූ තෙලිඟු ජනයා

"අපේ පරම්පරාවෙ අය නයි, රිලව් නැටෙව්වා. සාස්තර කීවා. ඒත් අපේ ළමයි ඒ රස්සාවලට කැමති නැහැ. අපේ ළමයි පිට පළාත්වලට ගිහින් පොත් විකුණනවා. එහෙ ගියාම ගෑනු ළමයි යාළු වෙනවා. ඒත් තෙළිඟු කියලා දැන ගත්තම ඒවා කැඩෙනවා. අනුරාධපුරේ උදවිය අපි ගැන දන්න හින්දා විවාහ වෙන්නෙ නෑ. අපව කොන් කරනවා."

ශ්‍රී ලංකාවේ තෙලිඟු ජනයා ජීවත් වන විශාලතම ජනපදය වන කුඩාගම පදිංචි පෙර පාසැල් ගුරුවරියක් වන අගටන්නාගේ දේවිකා (අවු:29) කරන මේ ප්‍රකාශය තෙලිඟු සමාජ තීරුව වත්මනෙහි මුහුණ දෙන සමාජමය නොසලකා හැරීම් පිළිබඳ ව අවබෝධ කර ගැනීමේ ප්‍රවේශයක් වැන්න.

මහවැලි ජනපදය ඇති කිරීමට පෙර කුඩා කුඹුක් වැව ගම්මානයෙහි ජීවත් වූ තෙළිඟු ජනයා ඉන් පසු ව තඹුත්තේගම බැඳිවැවට නුදුරු කුඩාගම පදිංචි කරවන ලද්දේ කෘෂිකර්මාන්තයට සරිලන ලෙස ඉඩම් ලබා දීම ඔස්සේ ය. මේ අනුව වත්මනෙහි තෙලිඟු පවුල් 350ක් පමණ කුඩාගම පදිංචිව සිටිති. ජනපදකරණයට පෙර තිබූ සාම්ප්‍රදායික ජන ජීවිතය ඒ අයුරින් ම පවත්වාගෙන යෑමට අසීරු වීම, කෘෂිකර්මාන්තයට අනුවර්තනය වීම මන්දගාමී වීම, අඩු අධ්‍යාපන නැඹුරුව, සමාජමය වශයෙන් කොන් කරනු ලැබීම නිසා පසුගාමී චින්තනයකින් කටයුතු කරනු ලැබීම, දරිද්‍රතාවට ආවේණික වූ අඩු වයස් විවාහ, මත්පැන් සහ සූදුව ව්‍යාප්ත වීම යනාදී සමාජ ගැටලු රැසක් කුඩාගම ජනපදය ආශ්‍රිත ව හට ගෙන තිබේ.

"අපට බොන්න වතුර නැහැ. නල ළිඳේ තියෙන වතුර බොන්න සුදුසු නැහැ කියලා ආණ්ඩුවෙ මහත්තුරු කියනවා. ටැප්වලින් වතුර දෙනවා කීවට ලැබුණෙ නැහැ. ඒ නිසා වතුර ගේන්න ගොඩක් දුර යන්න සිද්ද වෙලා."

රැහේ නායකයාව සිටි මුත්තුසාමි ආරච්චිලගේ මිණිබිරියක වන එම් වනරක්කා (අවු: 65) පවසයි. කුඩාගම ජනපදයෙහි පානීය ජල ප්‍රශ්නය විසඳීම සඳහා නල ළිං තුනක් ඉදිකර ඇතත් ක්‍රියාත්මක වන්නේ එකකි. එම ජලය ද බීමට නුසුදුසු ය යන නිර්දේශය ලැබී ඇති හෙයින් ඔවුන් මුහුණ දී තිබෙන්නේ බරපතළ ගැටලුවකට ය.

"අපට ගොවිතැන් කරන්න කියලා තියෙන නිසා ගොවිතැන් කාලෙට ගොවිතැන් කරනවා. අනෙක් කාලෙට පරම්පරා රස්සාව කරනවා. සමහර පළාත්වලට යද්දී හොරකමක් වුණහම අල්ලගන්නෙ අපි. සමහරු හිතන්නෙ අපි හොරු කියලයි. තඹුත්තේගම පොලීසියෙන් කිහිප වතාවක් මැසේජ් ගහල දවස් දෙක තුනකට පස්සෙයි එළියට දාන්නෙ. අපි හොරු නොවන විත්තිය තඹුත්තේගම පොලීසිය දන්නවා."

අගටන්නාගේ පියරත්න (අවු 33) පවසන්නේ තම ජීවිකා වෘත්තියට එල්ල වී ඇති එක් බාධාවක් පිළිබඳ ව ය.

වාර්ගික යුද්ධය ඇවිළී ගිය සමයෙහි තමන් නිතර පරීක්ෂා කිරීම්වලට ලක් වූ බවත් දෙමළ සහ තෙළිඟු වෙනස නොදන්නා පොලිස් නිළධාරීන්ගේ විවිධ අඩන්තේට්ටම්වලට ලක්වූ බවත් අගටන්නාගේ පියරත්න පවසයි.

දරුවන්ගේ ලෝකය

කුඩාගම තෙළිඟු දරුවන් සිංහල පාසැල්වලට ඇතුළත් කිරීමේ දී ඇතිවිය හැකි ගැටලු සමනය කිරීම පිණිස කුඩාගම විදුහල පිහිටුවනු ලැබී ය. එහි 11 වසර දක්වා පංති පැවැත්වෙයි. උසස්පෙළ හැදෑරීම සඳහා තඹුත්තේගම හෝ අනුරාධපුර විදුහල්වලට යා යුතු වේ. එවිට තෙලිඟු සම්භවය සඟවාගෙන පාසැලෙහි අධ්‍යාපනය ලැබීමේ අභියෝගයට මුහුණ දීමට සිදු වේ.

එමෙන් ම 7,8 පන්තිවලින් ඉදිරියට යෑමට දරුවන් අඩු උනන්දුවක් දක්වන බවට ගුරුවරු මැසිවිලි නගති. විශේෂයෙන් ම ගැහැනු දරුවන් විදුහලෙන් ඉක්මනින් හැළී යන බවට චෝදනාවක් නැගේ. පහවසර දක්වා දරුවන්ට ආහාර වේලක් ලබාදීමට ද විදුහලෙහි කටයුතු යොදවා ඇත. තෙලිඟු දරුවන් වෙනුවෙන් වෙන්කොට ඇති එක ම පාසැල මෙය වුව ද පත්වීම් ලබා එන ගුරුවරු ඉක්මනින් ස්ථාන මාරුවක් ලබාගෙන විදුහල හැරයාම විදුහලේ කටයුතු පවත්වාගෙන යෑමට මරු පහරකි.

එමෙන් ම ගැහැනු දරුවන් ඉක්මනින් විදුහල හැර යෑමේ හේතුව ඔවුන් විවාහ දිවියට ඇතුළත් වීම බවට සිංහල විෂයභාර ගුරුවරයා චෝදනා කරයි.

අඩු වයසින් ගැබ් ගැනීමේ ප්‍රවනතාවක් කුඩාගම පවුල් අතරින් හඳුනා ගත හැකි ය. එමෙන් ම පවුල් සෞඛ්‍ය සායනවලට සහභාගි වීමේ උනන්දුව මඳ බව ද පෙනේ. ඒ පිළිබඳ ව කුඩාගම පවුල් සෞඛ්‍ය සේවිකාව දක්වන අදහස් මෙසේ ය.

“මම බොහොම අමාරුවෙන් ගැබිනි මවුවරුන් සායනයට ගෙන්වා ගන්නේ. ඒ අයත් රැකියාවට යනවා. ගැබිනි අයටත් කුඩා දරුවන් වඩාගෙන යන අයටත් වැඩි සැලකිල්ලක් ලැබෙන බවයි ඔවුන් හිතන්නේ. දින 25ක පමණ කාලයක් වැඩිහිටියන් නිවෙස්වලින් බැහැර ව සිටින නිසා අඩු වයසින් ගැහැණු ළමයි පැනලා යනවා. අනික වැඩිහිටි කාන්තාවන් ඒවට අනුබල දෙනවා. දරුවන් සාත්තර කියන්න අරගෙන ගියාම වැඩි සැලකිලි හම්බුවෙන නිසා, ඉක්මනින් දරුවන් හදාගන්න බල කරනවා. අනවශ්‍ය ගැබ් ගැනීම් වලක්වන්න අප දෙන උපදෙස්වලින් නිසි ප්‍රතිපල නො ලැබෙන්නෙ ඒ නිසයි.”

මේ ප්‍රශ්නයෙහි තවත් පැත්තක් තිබේ. රැකියාව සඳහා වැඩිහිටියන් නිවෙස්වලින් බැහැරට ගිය පසු කුඩා දරුවන්ට හා අරෝබලන් වූ වැඩිහිටියන්ට අහර පිසීමාදී කටයුතු කරදෙනු ලබන්නේ යොවුන් දරුවන් විසිනි.

“අම්මලා රස්සාවට ගියාම නංගිලා මල්ලිලාට කන්න දෙන්නේ මම යි.” නඩරාජාගේ නාමල් මහේෂ් පවසයි. ඔහු සා. පෙළ. සිසුවෙකි.

කුඩාගම සිට තඹුත්තේ ගම නගරයට දුර සැතපුම් 4ක් පමණ වන බවත් දිනකට 100කට වැඩි ප්‍රමාණයකින් විවිධ අවශ්‍යතාවලට නගරය කරා යන නමුත් කුඩාගම සඳහා බස් සේවාවක් තවමත් නොමැති බවත් බොහෝ අය චෝදනා කරති. කුඩාගම පමණක් නොව රාජාංගන වැව් ඉහත්තාවේ ධීවර කර්මාන්තයෙහි නියැළි පවුල් ගණනාවකට ද මේ ගැටලුව බලපා ඇත. කුඩාගම ජනපදිකයන් මුහුණ දෙන ගැටලු පිළිබඳ ව ඉකිරි වැව ග්‍රාම නිලධාරීගෙන් කරුණු විමසූ විට ඔහු මෙසේ පැවසී ය.

“මහවැලියෙන් ගොඩ ඉඩම් අක්කර 1/2කුයි මඩ ඉඩම් 2 1/2කුත් ලබා දුන්නා. ඒත් දැන් තුන්වැනි පරම්පරාවත් ජීවත් වන නිසා ඉඩම් ප්‍රශ්නය ඇවිත් ඔවුන් ඉඩම් ඉල්ලනවා. මහවැලි ව්‍යාපාරයෙන් දෙන්න ඉඩම් නැහැ. අනික ඔවුන්ට තැන් තැන්වල ඉඩම් දීලා හරියන්නේ නැහැ. අප මීට විසදුම් සොයනවා. මේ වන විට බොහෝ පවුල්වලට සමෘද්ධි ආධාර දෙනවා.  උප්පැන්න නැති අයට අනුමාන

වයස් සහතික දෙනවා. මේ අය කොච්චර හම්බකළත් වැඩක් නැහැ. එක දවසෙන් කාලා බීලා ඉවර කරලා දානවා."

අලිගම්බේ වැසියෝ

රැහේ නායකයාගේ මූලිකත්වයෙන් වරිග සභාව රැස්වීමෙන් අනතුරු ව සංචාරය සඳහා පිටත් ව යන අය දරුවන් ද කැටුව යන හෙයින් එම දිනවල පෙර පාසැල පවත්වාගෙන යෑම දුෂ්කර ව ඇති බවත් කුඩාගම පෙර පාසැල් පාලිකා අගටන්නාගේ දේවිකා (අවු:29) පවසයි.

කුඩාගම තෙලිඟු ජනතාව පොදුවේ මුහුණ දෙන ප්‍රශ්න එසේ තිබිය දී ඒ ඒ ප්‍රදේශ අනුව විශේෂිත වූ ගැටලු රැසක් ද හඳුනාගත හැකි ය. අම්පාර දිස්ත්‍රික්කයට අයත් අලිගම්බේ තෙලිඟු ජනාවාසය ඊට නිදසුනකි. 1947 දී පමණ තඹුත්තේගම කුඩා කුඹුක්වැව ගම්මානයෙන් පැමිණි තෙලිඟු ජාතිකයන් පිරිසක් මෙහි ආදිතමයන් ලෙස සැලකුණ ද 1942 දී පමණ තන්හි තන්හී සංචාරය කරමින් සිටි තෙලිඟු ජන කොටස් ගල්ඔය සංවර්ධන ව්‍යාපාරයෙහි ප්‍රතිපලයක් වශයෙන් අලිගම්බේ ප්‍රදේශයෙහි පදිංචි වූ බවට වාර්තාගත ය.

වත්මනෙහි එහි පවුල් 263ක් පදිංචි ව සිටී. සම්භවය තෙලිඟු වුව ද ඔවුහු දෙමළ බස වහරති. එහෙත් එය දෙමළ, සිංහල, තෙලිඟු, හින්දි මිශ්‍ර බසකි. එමෙන් ම හින්දු ආගම අදහන පිරිසක් සිටින නමුත් ක්‍රිස්තියානු ආගමික මධ්‍යස්ථානයෙහි සුබසාධන වැඩ පිළිවෙළ අනුව ක්‍රමයෙන් කිතුනු ලබ්ධිකයන්ගේ සංඛ්‍යාව වැඩි වන සෙයක් පෙනේ.

කුලී වැඩ හිඟයි

කුඩා ගමට සාපේක්ෂ ව ගත් විට සාම්ප්‍රදායික රැකියාවන්හි යෙදෙන පිරිස් මෙහි විරළ ය. ගොවි තැන සහ කුලීවැඩ ප්‍රධාන වෘත්තීන් ය. කුඩාගම රැහේ ප්‍රධානියා ආරච්චිල වුව ද, අලිගම්බේ රැහේ ප්‍රධානියා තලේවර් ය.

"මුල් කාලයේ සාස්තර කියන්න ගියා. ඒත් ෆාදර් ඒකට කැමති නැහැ. අපේ ළමයි කැමති ම නැහැ. කුලී වැඩ නැත්නම් දැන් ජීවත් වෙන්න මඟකුත් නෑ" වනරන්කා පවසයි .(අවු: 65)

කතෝලික පියතුමා දැඩි අධිකාරී බලයක් පවත්වාගෙන යන බවත්, සාම්ප්‍රදායික රැකියාවලට යෑම ගැන දැඩි විරෝධයක් ඇති බවත්, ඇතැම් අවස්ථාවල නයි පෙට්ටි සහ මලු ගිනි තබා ඇති බවත් අලිගම්බේ වැසියන් කීප දෙනෙක් ම පැවසූහ.

සම්ප්‍රදායික රැකියාවල යෙදීමට ඇති බාධා නිසා වෙනත් රැකියාවල නිරත වීමට සිදු ව ඇතත් අලිගම්බේ වැසියන්ගෙන් බහුල ව ඉදිරිපත් වන්නේ ජීවත්වීමේ දුෂ්කරතාව පිළිබඳ චෝදනා ය.

"අපේ ශ්‍රමය වැදගත් වුණු කාලෙ කුලී වැඩ කළා. දැන් මුදලාලිලා ට්‍රැක්ටර්වලින්, මැෂින්වලින් ගොවිතැන කර ගෙන යන නිසා අපට තැනක් නැහැ. ඉඩම්වලට ඔප්පු නැහැ. ඉඩම් ප්‍රශ්නවලට ත්‍රිකුණාමලයට යන එකත් අමාරු වැඩක්." අලිගම්බේ රැහේ නායක (තලේවර්) රාජ් කුමාර් (අවු 36) පවසයි.

භීෂණ සමය

යුද්ධය ඇවිළී ගිය සමයෙහි අවස්ථා කිහිපයක දීම අලිගම්බේ වැසියන් රැසක් ඝාතනයට ලක් ව තිබේ. 1986 පෙබරවාරි 19 දින කුලී වැඩ (ගොයම් කැපීම) සඳහා උඩුම්බන්කුලම් ප්‍රදේශයට ගොස් සිටි අටදෙනෙකු කුඹුරේ දී ඝාතනය කොට පුළුස්සා දමා තිබිණ. එදින ම කෝමාරි, කාන්ඩියඩ්, තිරුක්කෝවිල්, තම්බිලිවාල්, අක්කරපත්තුව හා කාරතිව් යනාදී ප්‍රදේශවලට කුලී වැඩ සඳහා ගොස් සිටි 131 දෙනෙකු

මරා දමා ඇත. 1990 වසරේ දී අලිගම්බේ වැසියන්ට පහර දී ගෙවල් ගිනි තබා 6 දෙනකු ඝාතනය කර ඇත.

භීෂණ සමය නිමාවුව ද ජීවිකා වෘත්තීන් පිළිබඳ ඔවුන්ගේ ගැටලු නිමාවට පත් ව නොමැත. 1960 වසරේදී කුක් නමැති පියනම විසින් එහි දෙමළ මාධ්‍ය පාසැලක් ආරම්භ කරන ලදී. එහෙත් පාසලට පැමිණීමේ ප්‍රතිශතය පහළ මට්ටමක පවතී. එමෙන් ම කුඩා දරුවන් අතර බෝවන රෝග පැතිරීමේ අවදානම ද වැඩි ය.

පානීය ජල ප්‍රශ්නය උග්‍ර ව ඇති අලිගම්බේ වාසීහු ජලය රැගෙන ඒම සඳහා සැතපුම් ගණනක් පයින් ම යති. එමෙන් ම බස් පහසුකම් නොමැති නිසා ගැබිනි මවක් වුව ද රෝහලට ගෙන යෑමට සිදුව ඇත්තේ යතුරු පැදියකින් බව ඔවුහු කියති.

අලිගම්බේ වැසියන්ගේ පොදු පහසුකම් ගැටලු පිළිබඳ ව ග්‍රාම නිලධාරී විසින් දක්වන අදහස් මෙසේ ය.

"ගම් උදා ව්‍යාපාරයෙන් ගෙවල් 95ක් දුන්නා. 83 දෙනෙකුට ඉඩම්වල නීතිමය අයිතිය තියෙනවා. පිංපඩි සමෘද්ධි ආධාර දෙනවා. කරිටාස් ආයතනයෙන් ටොයිලට් හදලා දුන්නා පල්ලියේ ආධාර, මහජනාධාර දෙනවා. මේ මොනවා තිබ්බත් ඉන්නේ අපිරිසිදුවට. ගෑනු පිරිමි දෙගොල්ලොම මත්පැන් බොනවා"

අලිගම්බේ ග්‍රාම නිලධාරීවරයා පවසයි.

අභියෝග

කුඩාගම ජනයාට මෙන් ම අලිගම්බේ තෙලිඟු ජනයාට ද තම සම්ප්‍රදායික ජීවිතය අහිමි වී ඇත. නවීන සමාජයට උචිත ලෙස සකස් වීමේ අභියෝගය ඔවුන් හමුවේ පවතී.

කුඩාගම පාසැල ජාතික මට්ටමේ කබඩි ශූරයන් බිහිකර ඇත. එමෙන් ම නැගෙනහිර සරසවියෙන් උපාධිය ලැබූ තරුණයෙක් ද අලිගම්බේ ගමෙහි සිටී. මැද පෙරදිග රැකියා සොයා යෑම සහ රියදුරු වෘත්තියෙහි නියැලීම යනාදී ක්ෂේත්‍ර කරා යොමු වූවෝ ද සිටිති. එහෙත් අභියෝග ජය ගැනීමේ එබඳු උදාහරන විරළ ය. පුළුල් සමාජ ප්‍රතිසංවිධානයක අවශ්‍යතාව කුඩාගම හා අලිගම්බේ වැසියන්ගේ වත්මන් ජන දිවිය නිහඬ හඬින් කියා සිටී.

ඔවුන් විශේෂ ජන පිරිසක් ලෙස සලකනවා.
අම්පාර මහ දිසාපති සුනිල් කන්නංගර

අලිගම්බේ කියන්නේ අලියාඩිවෙම්බු කොට්ඨාසයේ තියෙන විශේෂ ගම්මානයක්. ඊට හේතුව කාලයක් තිස්සේ, එහි තෙලිඟු ජනතාව ජීවත්වන නිසයි. අපි වගකීමක් හැටියට ඔවුන් විශේෂ ජන පිරිසක් හැටියට සලකලා ඔවුන්ට ලැබිය යුතු යටිතල පහසුකම් සහ සුබසාධන ලබා දෙනවා. බොහෝ සංවිධානත් ඔවුන්ට යම් යම් දේවල් ලබා දෙනවා. මොවුන් එදිනෙදා මුහුණ දෙන පොදු පහසුකම් පිළිබඳ ප්‍රශ්න ඔයිටත් වඩා බලපෑ ගම්මාන තියෙනවා. විශේෂයෙන් ම ජුලි, අගෝස්තු කාලයේ පානීය ජල ප්‍රශ්නය මේ පළාතට අමුත්තක් නොවේ. බක්මිටියාව කියන ගම ගත්තොත් අලිගම්බේටත් වඩා දුෂ්කරයි. අනෙක් වැදගත් කරුණ තමයි, ඔවුන්ට නිරන්තරයෙන් විවිධ සංවිධානවලින් උදව් ලැබෙන නිසා, ඔවුන් නිතරම මොනව හරි ලබා ගන්නමයි බලන්නේ. ඒක නරක ගතියක්.

# මව් බස අහිමි මුහුදු වැදි ජනයා

"අපට අපේ කිසි ම කටයුත්තක් කර ගන්න ප්‍රවාහන පහසුකම් නෑ. හැතැප්ම හයක් පයින් ගියාම තමයි බස් පාර හම්බුවෙන්නේ. අපේ කිසිම දියුණුවක් ඇති නොවෙන්න හේතුව ඒකයි."

කන්නමුත්තු සෙල්ලතම්බි සෝකයෙන් තෙත්වූ දෙනෙතින් යුතුව පවසයි. ඔහු කුඤ්ඤදන්කුලම් ගම ආදිවාසී නායකයා ය. දෙමළ වැද්දන් ලෙස ප්‍රකට ව සිටින මේ ජන කොට්ඨාසය ජීවත්වන්නේ මඩකලපුව වාකරේ ප්‍රදේශයේ ය. එහි ජීවත්වන ආදිවාසී පවුල් සංඛ්‍යාව 67කි. මොවුන්ගේ විශේෂත්වය වන්නේ ආදිවාසී භාෂාව වෙනුවට දෙමළ භාෂාව කතා කිරීමත් ඇතැම් පිරිස් කිතුනු ලබ්ධිකයන් වීමත් ය. කුඤ්ඤදකුලම්හි කොළනි ඉඩම්වල පදිංචි වීමට පෙර ඔවුන් ජීවත් ව ඇත්තේ කාරමුණේ වනගහනය මැද ය. මානිකේනි ප්‍රදේශයෙන් කුඹුරු අක්කර තුනක් හා ගොඩ ඉඩම් අක්කරයක් බැගින් ලබා දීමෙන් ඔවුන් එහි පදිංචි කරවන ලදි. පසුව 80 දශකයෙහි ඇවිල ගිය යුදමය තත්වය හේතුවෙන් එයින් පිරිසක් කූඤ්ඤදංකුලම් ගම්මානයට පැමිණ පදිංචි විය.

"දැනට මී කඩන්න යන්නෙ කලාතුරකින්. එහෙම යනවා නම් ආමි එකෙන් පර්මිට් ගන්න ඕනෑ. වැඩි දෙනෙක් කරන්නෙ කුඹුරු වැඩ. කුඹුරුවල කුලී වැඩට මහියංගනයට යනවා. වැවේ මාළු අල්ලනවා. කරවල වේලලා විකුනනවා". ආදි වාසී නායකයා තම රැහේ ඇත්තන්ගේ ජීවන කර්මාන්ත ගැන පවසයි. වාකරේ මහුදු වැද්දන්ගේ නායකයා පසුගියදා ආදිවාසී සමුළුවට ද සහභාගි වූයේ ය. එහි දී ඉල්ලීම් වූයේ මේවා ය.

01. මාර්ග පිළිසකර කර දීම

02. ගමට බස් රථයක් ලබා දීම

03. රෝහල් පහසුකම් ලබා දීම

04. ගමට විදුලිය ලබා දීම

05. කුඹුරු ගොවිතැන සහ පානය සඳහා ජල පහසුකම් ලබා දීම

සමුළුවට සහභාගි වීමෙන් පසු ව මේ ඉල්ලීම් එකක් හෝ ඉටුවනු ඇතැයි ආදිවාසී නියකයා බලාපොරොත්තු තබා ගෙන සිටී.

මෝට්ටුකාට්ටු යනු ආදිවාසීන්ගේ දෙවියන් බවත් වත්මනෙහි තමන් විසින් අදහනු ලබන්නේ මාරිසුම්මාන් දෙවියන් බවත් ආදිවාසීහු කිහිපදෙනෙක් පැවැසූ හ.

"ගමට ම තියෙන්නේ බොන ළිං දෙකයි. වතුර ගේන්න හැතපුමක් විතර පයින් යනවා. වැව හිඳෙන නිසා නාන්න තැනක් නැහැ. අපේ දුක ජනාධිපති තුමාටවත් කියන්න කෙනෙක් නැහැ. නාන්න යෑමත් දුෂ්කර වෙලා. අනේ අපේ දුක්ගැනවිලි ජනාධිපතිතුමාටවත් කියන්න. කුඤ්ඤදකුලම් ගමේ නායකයාගේ බිරිය

වන කනපතී රාසම්මා පවසයි. තමන් පදිංචිව සිටින නිවස තනා දුන්නේ හමුදා කඳවුරෙන් බවත් විවිධ සංවිධානවලින් යම් යම් උදව් උපකාර ලැබී ඇති බවත් ඇය පවසයි.

මාන්කේනි ධීවර ගම්මානයේ සභාපති විජය කුමාර් විවාහ වී සිටින්නේ ආදිවාසී නායකයාගේ වැඩුමල් දියණිය සමඟ ය. ඇගේ නම දයාබිදී ය. ඔවුන්ගේ වැඩුමහල් පුතා නෝබට් ය. දෙවැනියා ජෙම්සන් රාජ් ය. එයින් පෙනෙන්නේ ඔවුන්ගේ නම් වල ස්වභාවයයි.

දැන් ගොඩාක් අය දෙමළ අය එක්ක මිශ්‍ර වෙලා ඉන්නේ. ඒ නිසා මව් භාෂාව දන්නේ නැහැ. කථා කරන්නෙ දෙමළ. මුස්ලිම් අය  සමහර වෙලාවට අපට වැද්දො කියලා බනිනවා. මාළු බිස්නස්වලදී ආරවුල් ඇති වීම ඊට හේතුවයි. "මාන්කේනි ධීවර සංගමයේ සභාපති විජය කුමාර් පවසයි. "අපේ ආදිවාසීන්ගේ දේපළ සුනාමියට අහුවුනා. රජයේ සහ වෙනත් ආයතනවල සහයෝගයෙන් අඩුපාඩු හදාගත්තා බෝට්ටු 12ක් ලැබුණා. සමිතිය මගින් බෝට්ටු 120ක් ලැබිලා තියෙනවා". විජයකුමාර් පවසයි.

පාක්‍යරාසා සිරි නන්දනී එක්දරු මවකි.

ඇගේ සැමියා කුලී වැඩවලින් ජීවිකාව සපයා ගනී. කුඩා කල සිට දෙමළ භාෂාව කථා කරන සමාජයක හැදුණු නිසා තමන් දන්නේ දෙමළ භාෂාව වුවත් තම පියා මව් භාෂාව හොඳින් දන්නා බවත් ඇය පවසයි.

"යුද්ධ කාලේ බොහෝ දෙනෙකුගේ හැඳුනුම්පත් නැති වුණා. හැඳුනුම්පත් හදලා දුන්නා. විවාහ නොවී සිටින බොහෝ පවුල් රෙජිස්ටාර්වරයෙකු ලවා විවාහ කරවීමට ආමි එකේ මහත්වරු මැදිහත් වුණා. අපේ ගමේ පවුල් 67 න් පවුල් 33 ක් නියම ආදිවාසීන් හැටියට ජීවත් වනවා. එහෙත් මේ තත්වය ඉක්මණින් වෙනස්වීම කනගාටුවට කරුණක්."

පාක්‍යරාසා සිරිනන්දනි පවසයි.

මේ ආදිවාසීන්ගේ දරුවන් ඉගෙනුම ලබන්නේ දෙමළ මාධ්‍ය පාසැල්වල ය. ඒ නිසා ඔවුන් හින්දු සංස්කෘතියට අයත් ප්‍රජාවක් ලෙස සමාජගත වන ආකාරයක් හදුනාගත හැකි ය. මදුරන්කේලිකුලම් අරසිනල් දෙමළ මාධ්‍ය පාසලේ ඉගෙනුම ලබන රංජනි ජයන්ති මාලා මෙවර (2010) සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමට සූදානම් වෙයි. එහෙත් විදුහලේ ඇති අඩුපාඩුකම් නිසා අනාගතය පිළිබඳ ව ඇගේ සිත්හි පවතිනුයේ අවිනිශ්චිත බවකි. "මාත් එක්ක හතර දෙනෙක් විභාගයට ලියනවා. ඒත් ගණිතය හා සිංහලවලට ගුරුවරු නෑ. ක්‍රිස්තියානි පල්ලියයි කොවිලයි දෙක ම තියෙනවා. මේ නිසා පාසලේ ආගම අදහන වෙලාවට  දෙගොල්ලෝ වෙන වෙනම චාරිත්‍රවල යෙදෙනවා."

මදුරන් කේනිකුලම් වසමේ ග්‍රාම නිළධාරීවරයා පවසන පරිදි කුඤ්ඤංකුලම ගමෙහි කොටසක වගකීම් ඔහුට පැවරී ඇත. උප්පැන්න සහතික නොමැති හෙයින් ඇතැම් අය සඳහා හැඳුනුම් පත් සැකසීම දුෂ්කර ව ඇතැයි ඔහු පවස යි.

"තුන් හතර වතාවක් ම බස් එකක් ඉල්ලලා ඩිපෝවලට දැනුම් දුන්නා අදවන තුරු උත්තරයක් නැහැ. දෙන්න බස් එකක් නැතිලු. හැමදේම එහේම තමයි. එහෙත් අපි මේ අයට සහනයක් දෙන්න හැමවිටම උත්සාහ කරනවා."

ලබන අවුරුද්ද වෙනකොට විදුලිය දෙන බව මණ්ඩලය කියනව. රතු කුරුසෙන් ස්වයං රැකියා කරන්න ආධාර දීල තියෙනව. කොහොම උනත් මේ ආදිවාසීන්ගෙ ජීවිත ආරක්ෂාව සහතික කරන එක අපේ වගකීමක්. ග්‍රාම නිළධාරීවරයා පවසයි.

ලංකාවෙ ආදිවාසි ජනතාව ප්‍රදේශ ගණනාවක ජීවත්වනු පෙනුණත් ස්වකීය භාෂාමය හා සංස්කෘතිමය අනන්‍යතාව සහමුලින්ම මැකී යන පිරිසක් බවට පත්ව ඇත්තේ වාකරේ ආදිවාසීන්ය. විශේෂත්වය වන්නේ දෙමළ හා මුස්ලිම් ජන වර්ග දෙකම සමඟ සංහිඳියාවෙන් යුතුව ජීවත් වන්නට ඔවුන් යත්න දැරීමය. එහෙත් ආර්ථික වශයෙන් ශක්තිමත් වීමේදී ඔවුන් තවමත් සිටිනුයේ මෙකී ජන වර්ග දෙකට වඩා පසුපසිනි.

**තොරතුරු දෙන්න කැමති නෑ**

**වාකරේ සංස්කෘතික නිළධාරී**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යුද්දෙන් පස්සෙ 2006 දී වැඩ පටන් ගත්ත. මුහුදු වැද්දන් පිළිබඳ තොරතුරු ගන්න උත්සාහ කළත් ඒ අය තොරතුරු දෙන්නෙ නෑ. නමුත් විධිමත්ව තොරතුරු ගන්න අප උත්සාහ කරනවා. එවිට ඔවුන් වෙනුවෙන් කටයුතු කරන්න පුළුවන්.

# කපු මහතෙකු මුල් වූ කිරි අම්මා දානය

| | |
|---|---|
| පිරිසුදු පිරුවට ඇඳ පේ | වෙන්නේ |
| දානෙට සත් දෙන එන බව | දන්නේ |
| පත්තිනි දෙවියොත් සමඟ | වඩින්නේ |
| කඩුල්ල ගාවට ඇවිත් | සිටින්නේ |

සිත් පහන් කරවන ගුණයෙන් යුත් මේ කවි ගායනය ඇසෙන්නේ කපු මහතෙකුගේ හඬිනි. කිරි අම්මාවරුන්ගේ දානයට අදාල චාරිත්‍රයේ දී ගායනා කෙරෙන මේ කවි කපු මහතෙකු විසින් ගයනු ලැබීම විශේෂත්වයකි. ඒ මන්ද යත් සිංහල සහ දෙමළ භේදයකින් තොරව ලක්දිව පුරා සියලු සමාජ තීරු අතර පැතිර ඇති කිරි අම්මාවරුන්ගේ දානයේ දී කවි ගායනය කරනු ලබන්නේ කිරිඅම්මාවරුන් විසින් ම වන බැවිනි.

අපගේ මේ කතාවට නිමිත්ත සැපයුණේ කොත්මලේ නියන්ගම්දොර පත්තිනි දේවාලයේ කපු මහතා වන ආර්.ජේ පොඩි අප්පුහාමි මහතාගෙනි.

කොත්මලේ කිරි අම්මාවරුන්ගේ දානයෙහි විශේෂත්වය වන්නේ කපු මහතාගේ ප්‍රධානත්වයෙන් චාරිත්‍ර ඉටු කිරීම ය.

කිරි අම්මා දානයට නිමිත්ත වනුයේ පත්තිනි ඇදහිල්ල යි. මේ පිළිබඳ අධ්‍යයනයක යෙදුණු එම්.ඩී.රාඝවන් පවසන්නේ 'බෝ වන රෝග අපල උපද්‍රව වලින් වැළකීම, ගැබිනි මව්වරුන්ට හා දරුවන්ට යහපත ආරක්ෂාව ප්‍රාර්ථනා කිරීම සහ සශ්‍රීකත්වය ලබා ගැනීම' මෙහි අරමුණ බව ය. මධුර වූ කවි ගායනා රැසකින් සමන්විත වීම මෙම චාරිත්‍රයෙහි ඇති විශේෂත්වයකි.

සිංහල ජනවේදයට අයත්  ස්ත්‍රී දේව සංකල්ප අතුරින් පත්තිනි ඇදහීම ප්‍රමුඛස්ථානය ගෙන ඇතත් කිරි අම්මාවරුන් ඇදහීම ඊට වඩා දිගු අතීතයක ට උරුම කම් කියන බව සී. ද එස්. කුලතිලක පවසයි.

කපු මහතා ප්‍රමුඛත්වය ගන්නා නියන්ගම්දොර දේවාලයෙහි පත්තිනි ඇදහීමේ චාරිත්‍ර ඉටු කරනු ලබන්නේ කෙම්මුර දින වන බදාදා සහ සෙනසුරා දා පමණි. පත්තිනි දේවිය වෙනුවෙන් පඬුරක් ගැට ගසා බාර වීම පළමු අවස්ථාව යි. තම ඉල්ලීම ඉෂ්ට වූ පසු ව මාස තුනක් ඇතුළත කිරි අම්මාවරුන් උදෙසා දානයක් පිළිගන්වන බවට පොරොන්දු වීම සිරිතකි. මේ බාරය තම නිවසේ දී හෝ පත්තිනි දේවාලයට පැමිණ ඔප්පු කරනු ලැබේ. තේවාව පටන් ගන්නේ අදාල දිනට කලින් දින රාත්‍රී 7.30 ට පමණ ය. දින 3 කට පමණ පෙර සිට පේවෙන කපු මහතා දානයට පෙර දින සවස අදාල නිවසට පැමිණෙයි. කිරි අම්මාවරුන් සත් දෙනා තෝරා ගනු ලබන්නේ කපු මහතාගේ කැමැත්ත පරිදි ය. පාන්දර 3.00 ට කිරි අම්මාවරුන් පැමිණෙන විට කපු මහතා කවි ගායනා කර ඔවුන් පිළිගනී. හොඳින් පිරිසිදු කළ පොල්කටු හතකට එළකිරි දමා සියලු කිරි අම්මාවරුන්ට පිළිගන්වනු ලැබේ. කිරි අම්මාවරු නිවස ඉදිරිපිට ඇති ළිපෙහි තබා තිබෙන මුට්ටියට මේ කිරි වත් කරති. කිරි ඉතිරෙන තුරු කපු මහතා සහ කිරි අම්මාවරුන් විසින් කවි ගායනා කරනු ලැබේ. උදෑසන 5.00 ට පමණ  දානයේ චාරිත්‍ර අවසන්

වෙයි. කිරි අම්මාවරුන්ට දානය පිළිගන්වනු ලබන්නේ ඉන්පසුව ය. කිරිබත්, අතිරස,හැඳි කැවුම්, කිරියා, මුං කැවුම්, දැහැත් විට, හකුරු, පළතුරු වර්ග 7 ක් 'මේ දානයට' ඇතුළත් ය.

කොත්මලේ ප්‍රදේශයෙහි දාන වර්ග 3 ක් හඳුනා ගත හැකි ය. කන්‍යා දානය, කිරිමව් දානය සහ අම්මා දානය යනු එම තුන් වර්ගය යි. දානයෙන් පසු ව මව්වරුන් උදෙසා පිරිකර පිරිනැමේ.

" කිරි අම්මා දානයේ චාරිත්‍රවලට සම්බන්ධ වන කොට මට අවුරුදු දොළහ යි. ගුරුන්නාන්සේ කෙනෙකුගෙන් තමයි මම ඉගෙන ගත්තේ. ගම්පොළ මාවතුර පත්තිනි දේවාලයේ කපුමහතාත් මේ චාරිත්‍ර කරනවා." පොඩි අප්පුහාමි කපු මහතා පවස යි.

කිරි අම්මාවරුන්ගේ දාන පහළොවකට පමණ සහභාගි වී සිටින පූඩළුඔය රේණුකා ගාල්ලගේ මාතාව පවසන්නේ උනන්දුවකින් කොත්මලේ ප්‍රදේශයෙහි මේ චාරිත්‍රය ඉටු කරන බව යි. කොත්මලේ ආර්.ඒ රණවීර මාතාව පවසන පරිදි කොත්මලේ ප්‍රදේශයේ පත්තිනි දේවාල වල සෑම කෙම්මුර දිනයක ම කිරි අම්මා දානයේ චාරිත්‍ර සිදු කෙරෙ යි.

"පත්තිනි දෙවියන්ට බාරයක් උනොත් එය අනිවාර්යෙන් ම ඉෂ්ට වන බවට මේ ප්‍රදේශයේ විශ්වාසයක් තියෙනවා" ඇය පවස යි.

කොත්මලේ උපන් එම්. මල්ලිකා මාතාව මේ වන විට කොළඹ පදිංචි කාරියකි. කොත්මලේ පත්තිනි දේවාලයේ කපු මහතා කොළඹට කැඳවාගෙනවිත් කිරි අම්මා දානයේ චාරිත්‍ර ඉටු කරන  බවත් කොළඹ නගරයේ බොහෝ නිවාස වල ද කිරි අම්මා දානය දෙන බවට තමා දන්නා බවත් මල්ලිකා මාතාව පවස යි.

කිරි අම්මාවරුන් සත් දෙනෙකු පිළිබඳ ප්‍රවාද  සිංහල ජන සමාජය සතු ය. තම දරුවන් කුඩා කල කටුක මරණයකට මුහුණ දුන් කුවේණියගේ ශෝකාන්තය 'කුකුළාපොළ කිරි අම්මිලැත්තො' ප්‍රවාදයට නිමිත්ත විය.  වැදි ජනයාගේ කිරි අම්මා ඇදහීමට මුල් වුණේ එම පුවතයි. කුකුළාපොළ, වෙල්ලස්ස, උනාපාන, මීරියබැද්ද, කොස්ගම, බෝවලගෙදර, ගෝනතලාව, ඉඳිගස්ඇල්ල ,බිළිඳු සහ කපුයායේ 'කිරි අම්මාවරුන් ' පිළිබඳ කවි ගායනාවල  සඳහන් වෙයි.

කිරි අම්මාවරුන්ගේ කවි ගායනාවලින් කියැවෙන්නේ පත්තිනි දෙවියන්ගේ කරුණා ගුණය යි. දරුවන් වදා ඇති නමුත් දැන් දරුවන් නොවදන අම්මාවරුන් සත් දෙනෙකු දානය සඳහා කැඳවනු ලැබේ.

මව් සෙනෙහස, දයා කරුණා ගුණය,කළගුණ සැලකීම යනාදී වශයෙන් අධ්‍යාත්මික පෝෂණයට ඉවහල් වූ ගුණ සමුදායක් කිරි අම්මාවරුන්ගේ දානය ඔස්සේ වහනය වේ. පොදු ජනයාගේ සංස්කෘතික ලක්ෂණ හැදෑරීමේ  දී දිවයින පුරා පැතිරුණු චාරිත්‍ර විධියක් වශයෙන් මෙහි විශේෂත්වයක් පවතී. එමෙන් ම භූගෝලීය වශයෙන් වෙනස් වූ ප්‍රදේශවල කිරි අම්මා ඇදහීමේ විශේෂතා තිබෙන බව කොත්මලේ පත්තිනි දේවාල ආශ්‍රිත චාරිත්‍ර අධ්‍යයනයේ දී පැහැදිලි වෙයි.

**දරුවන්ට සම්බන්ධ වීම විශේෂත්වයක්**

මහාචාර්ය මුදියන්සේ දිසානායක

මාතලේ ප්‍රදේශයේ මාරි අම්මාන් කෝවිලේ චාරිත්‍ර වලට සහභාගි වන දරුවන් නැති කාන්තාවන්ගේ විශ්වාසය මාරි අම්මාට පූජාවක් තිබ්බ ම  දරුවන් ලැබෙන බව යි. මාරි අම්මා කියන්නේ පත්තිනි මෑණියන් ට. මෙහි දී කපු මහතෙකු සම්බන්ධ වීම විශේෂත්වයක්. දෙවියන්ට කන්නලව් කිරීමේ දී කපු මහතාට ඇති ශක්තිය හා බලය පිළිබඳව ඇති විශ්වාසය යි මෙහි දී කැපී පෙනෙන්නේ. හත් කෝරළයේ සමහර ප්‍රදේශ වල මේ කාර්ය ඉටු කරන්නේ ' අනුමැති රාළ'  විසින් . මේ විදියට පළාතෙන් පළාතට සුළු සුළු වෙනසකම් තිබෙනවා. මේක ගෘහස්ථ ශාන්ති කර්මයක්. කේවල චාරිත්‍රයක්. දරුවන්ට සම්බන්ධ නිසා වැඩි දෙනෙකුගේ විශ්වාසය හා ශක්තිය දිනාගෙන තිබෙනවා. සමාජය නවීකරණය වීමේදීත් මෙය නොනැසී පවතින්නේ ඒ නිස යි.

**කාටත් පොදු වී තිබීම වැදගත්**

ජනශ්‍රැති පර්යේෂක මහින්ද කුමාර දළුපොත

සිංහල දෙමළ ජන වර්ග දෙකට ම පොදු  ඇදහිල්ලක් වීමත්, දරුගැබ පිහිටීමේ සිට සත් අවුරුද්දක් දක්වා පත්තිනි මෑණියන්ගේ ආරක්ෂාව ලැබෙන බවට ඇති විශ්වාසයන් අතින් කිරි අම්මා දානය ජන ජීවිතයට බෙහෙවින් සමීප යි. දරුවන් වැදූ මව්වරුන් පමණක් මීට සම්බන්ධ කර ගන්නේ කිල්ලට අසු වීමෙන් වැළකීමට යි.

කොත්මලේ කලාපය මෙහිදී කැපී පෙනෙන්නේ සම්මතයන් සහ ජන සම්ප්‍රදායන් දීර්ඝ කාලයක් තිස්සේ එහි ආරක්ෂා වී තිබීම යි. විශේෂයෙන් ම ජොතිර්වේදියට  විශාල දායකත්වයක් දුන් අය, බරණ ගණිතයා වගේ අය ප්‍රාදේශීය දෙවිවරුන් එම ප්‍රාදේශයේ සම්භාවනාවට පත් වෙනවා.

# නාට්ටාම්වරුන්ගේ හඬට ඉඩක්

“නාට්ටාම් කීවම අපට සලකන්නේ පහත් විදියට. අපි වැඩ කරන්නේ මිනිස්සු එහා මෙහා යන තැන්වල. උහුලන්න බැරි බරක් කරේ තියාගෙන යන හින්දයි කෑගහල ඉඩ ඉල්ලන්නේ. ඒක වැරදියට තේරුම් ගන්නේ ඇයි ?

කොටුව කුමාර වීදියේ සේවය කරන නාට්ටාම්වරයකු වන රාජ් ( අවු 22 ) ගේ උක්ත ප්‍රකාශයේ නාට්ටාම්වරුන්ගේ ජීවිතයෙහි හරස් කඩක් පිළිබිඹු කිරීමක් වැන්න.

තම කායික ශ්‍රමය ඉවහල් කර ගනිමින් භාණ්ඩ ප්‍රවාහනයෙහි සුවිශේෂී මෙහෙවරක් ඉටු කරන නාට්ටාම්වරුන්ගේ රූපකාය, නාගරයෙහි වීදි දිගේ ගමන් බිමන් යන මගී ජනයාට එතරම් ප්‍රිය උපදවන දර්ශනයක් නොවේ. නාට්ටාම් වෘත්තිය සඳහා බෙහෝවිට අවතීර්ණ වූයේ අඩු ආදායම්ලාභී දෙමළ ජනයා ය. එහෙත් ක්‍රමයෙන් එම තත්වය වෙනස් වෙමින් අනෙකුත් ජනවර්ගවල නියෝජනයක් ද දක්නට ලැබේ.

රාජ්ගේ උපන්ගම හැටන් ය. නිසි අධ්‍යාපනයක් ලැබීමේ පහසුකම් අහිමිවීමේ ප්‍රතිපල ලෙස රැකියා සොයා ඉබාගාතේ ගිය ඔහු අවසානයේ දී තෝරා ගත්තේ නාට්ටාම් වෘත්තිය යි. ඔහුගේ බලාපොරොත්තුව වනුයේ දෛනික ව ඉතිරි කරගන්නා සුළු මුදලෙන් ව්‍යාපාරයක් පටන් ගැනීම ය.

“ මේ වැඩේට එන හුඟක් අය, ගංජා මත් කුඩු වගේ දේවල්වලට හුරු වෙනවා. ඇඟේ අමාරුවට බීමට පුරුදු උනාම අත් අරින්න බැරිව හැම සතයක් ම ඒකට වියදම් කරලා පාරේ මැරෙන අයත් ඉන්නවා.” රාජ් පවසයි. දුක්පීඩා මැදින් සහන් එලියක් දැකීමේ අධිෂ්ඨානයක් රාජ් සතු ය.

නාට්ටාම්වරුන්ගේ ජීවිතය සමාජයේ නිසි අවධානයට ලක් නොවුණ ද ඔවුන්ගේ අදාළත්වය රටට දැනෙනුයේ ඔවුන් වැඩ වැරූදාට ය. තම වෘත්තිය අයිතිවාසිකම් වෙනුවෙන් සටන් වැද ඔවුන් වැඩ වැරූ එක් අවස්ථාවක කොළඹ නගරයෙහි වානිජ කටයුතු සියල්ල ඇණ හිටියේ ය.

නාට්ටාම්වරුන් අතර දෙමළ නියෝජනය ඉහළ ය. යුද තත්වයත් සමඟ කොළඹ නගරය අනාරක්ෂිත වීමේ හේතුව නිසා නාට්ටාම්වරු ද නිතර පරීක්ෂාවට ලක් වූහ. ආරක්ෂක කටයුතු පහසු කිරීමත් නාට්ටාම්වරුන් මුහුණ දෙන ගැටලු අවම කිරීමත්, අරමුණු කර ගනිමින් නාට්ටාම්වරුන්ගේ සංගමය බිහි විය. කුමාර වීදිය කෙයිසර් වීදිය, දෙවැනි හරස් වීදිය සහ මැලිබන් වීදිය යන වීදිවල නාට්ටාම්වරුන්ගේ සංගමය ක්‍රියාත්මක වේ. ඒ සංගමයේ සභාපති ‘ඩීන් මහතා’ ප්‍රකාශ කරන පරිදි 700 දෙනෙක් සංගමයෙහි ලියාපදිංචි වී සිටිති. හතරවන හරස්වීදියෙහි නාට්ටාම්වරුන් එම සංගමයට බැඳීම ප්‍රතික්ෂේප කර ඇත. ආරක්ෂක හේතූන් මත පාරවල් වසන්නට සිදු වීමේදී පොලීසිය සහ නාට්ටාම්වරුන් අතර නිතර ගැටුම් හට ගෙන තිබේ. යුදමය තත්වය නාට්ටාම්වරුන්ගේ බත්පතට ද තදින් ම බලපෑවේ ය. නාට්ටාම්වරුන් හඳුනා ගැනීම් පහසුව පිණිස ඔවුන්ට නිල ඇඳුමක් ලබාදීමට සංගමය කටයුතු කළේ ය. එහි මිල රු 500/- කි. හැඳුනුම්පත් ද නිකුත් කෙරින. කණ්ඩායම් නායකයකු යටතේ නාට්ටාම්වරු කටයුතු කරති. එමෙන්ම ඔවුන්ගේ දුරකතන අංක සියල්ල සංගමය විසින් ලබා

ගෙන තිබේ. එම කණ්ඩායමේ නාට්ටාම්වරුන් සම්බන්ධයෙන් කණ්ඩායම් නායකයා වග කිව යුතු ය. එමෙන් ම ගෙවීම් සිදු කරනු ලබන්නේ ද කණ්ඩායම් නායකයා මාර්ගයෙනි.

කෙයිසර් වීදියෙහි රැකියාව කරන උවෙයිස් නාට්ටාම් සංගමයේ සාමාජිකයෙකි.

"මගේ බොස් ලඟ තව දහ දෙනෙක් වැඩ කරනවා. අපට කඩය අඳුන්නල දුන්නම අපි කරන්නේ බඩු ගෙනිහින් දාන එක. හවසට හම්බුවෙන ගාණ සියලු දෙනා අතරේ බෙදෙනවා. සමහර දවස්වල රුපියල් 3000 ක් විතර ලැබෙනවා. සමහර දවස්වල 300 ක්වත් නැහැ. සංගමයෙන් සුබසාධන වැඩ කරන්නේ නෑ. මුදලාලිගෙන් තමයි හදිසියටවත් කීයක් හරි ඉල්ල ගන්නේ " උවෙයිස් පවසන්නේ චෝදනාවක ස්වරයෙනි.

බඩු කර ගසන විට නිල ඇඳුම ඉරී යන බවත් මේ නිසා එක ම ඇඳුම දිගට ම පාවිච්චි කළ නොහැකි බවත් රු 500/- ක් දිගින් දිගට ම වියදම් කිරීම අපහසු නිසා දැන් බොහෝ අය නිල ඇඳුම නොහඳින බවත් පැවසුයේ කුමාර වීදියේ සේවය කරන ෆාරුක් ය.

එහෙත් නාටාම්වරුන්ගේ සංගමයේ ප්‍රයෝජනය දැනෙන්නේ නාටාම්වරයකු පොලීසිය විසින් අත් අඩංගුවට ගත් මොහොතක ය. සංගමය මැදිහත් නොවන අවස්ථාවල අත් අඩංගුවට පත් පුද්ගලයාට යුක්තිය ඉෂ්ට වීම ප්‍රමාද වේ.

නාට්ටාම්වරුන් සතුව කරත්ත නොමැති හෙයින් ඔවුන් ඒවා ලබා ගන්නේ රු 50 ගණනේ කුලියට ය. නාට්ටාම්වරුන්ගේ කරත්තය ගොනුන් බැඳි කරත්තයක් නොව දෑතේ වීරියෙන් ගෙන යනු ලබන විශේෂ වූ කරත්තයකි. බඩු ඇදීමෙන් පසු ව හිස් වූ කරත්ත එක පේලියට වීදි අයිනේ ගාල් කර තැබීම සුලබ දසුනකි.

කෙයිසර් වීදියේ රැකියාව කරන වීරසිංහ (අවු 28) රාගම පදිංචි කරුවෙකි. නාට්ටාම් වෘත්තියෙන් උපයා ගන්නා මුදල් ඉතුරු කර ත්‍රිරෝද රියක් මිල දී ගැනීම ඔහුගේ සිහිනය යි.

" වැරදි අඩුපාඩු කවුරු ලඟත් තියෙනවා. මගේ අතිනුත් ඉස්සර යම් යම් වැරදි සිද්ධ වුණා. ඒත් මම දැන් දරුවෙකුගේ අනාගතය වෙනුවෙන් කැපවී වැඩ කරන කෙනෙක්. මම වැඩ කරන කඩේ මුදලාලි මට කාරුණික ව සලකනවා. ඇගේ හයිය තියෙනකම් විතරයි මේ රස්සාව කරන්න පුළුවන්. ඒ නිසා තමයි පුළුවන් තරම් ඉකමනින් මේකෙන් වෙනස් වෙන්න මම කල්පනා කරන්නේ "

අඹු දරුවන් පෝෂණය කිරීම සඳහා අපමණ වෙහෙසක් දරන වීරසිංහ නාට්ටාම් වෘත්තියෙන් තම දිවි මග ක්ෂය වනු දකින්නට කැමති නැත. වැරදිවලින් ඉගෙන ගත් ඔහු බින්දුවෙන් පටන් ගෙන ඉදිරියට යාමේ හැකියාව ඇත්තෙකි.

කෙයිසර් වීදියේ රැකියාව කරන කුමාරසිංහ දෙමටගොඩ පදිංචිකරුවෙකි. ඔහුගේ වෘත්තිය අත්දැකීම් වසර 20 කට වැඩි ය. වෙනත් වෘත්තියක යෙදුණාට වඩා සිරුරෙහි ශක්තිය ක්ෂය වී ඇති බවත් රැකියාවෙන් සමු ගැනීමට සිදු ව ඇති බවත් ඔහු පවසන්නේ අනාගතය පිළිබඳ ව අවිනිශ්චිත හැඟීමකිනි.

" ඉඩ- ඉඩ- ඉඩ......"

දවස උදාවීමෙන් පසු ව නගරය කෙමෙන් ජනාකීර්ණ වන විට රථ වාහනවල හඬ අතරින් එම හඬ සවණ වැකෙන්නේ ඒ තරම් ප්‍රිය ජනක ස්වරයකින් නොවේ. එහෙත් එම ගොරෝසු ආවේගකාරී හඬ නිකුත් වන්නේ තම දුබල සිරුරට ඔරොත්තු නොදෙන බරක් ඔසවා සිටින මිනිසකුගේ කකියන හදවතිනි. එහි ශෝකී ස්වරය ස්පර්ශ කිරීම වනාහී පීඩිත බවෙහි පතුලෙහි සිටින ශ්‍රමිකයන් පිරිසකගේ ආත්මය හඳුනා ගැනීමකි.

**අපේ මැදිහත්වීම ප්‍රතිපලදායක යි.**
**මිස්ටර් ඩීන්- නාට්ටාම්වරුන්ගේ සංගමයේ සභාපති**

“ මේ අය උගත්කමින් පහළ නිසා හම්බු කරන දේවල් එදිනෙදාට වියදම් කර ගන්නවා. ඉතිරියක් නැහැ. නමුත් මේ ලක්‍ෂණ ටිකෙන් ටික වෙනස් කළ හැකි යි. පළමුවෙන් ම කළ යුත්තේ ආත්ම ගෞරවයක් ඇති ව තම රැකියාව කර ගෙන යෑමේ අවස්ථාව ඔවුනට ලබා දීමයි. මේ අය තමන්ගේ ප්‍රශ්න අපට ඉදිරිපත් නොකර කෙළින් ම පොලීසියට යනවා. නමුත් අපි පොලීසියට ගිහින් ප්‍රශ්නෙට මැදිහත් වෙනවා. නාට්ටාම් සංගමය මගින් නිල ඇඳුම් දෙකක් ලබා දුන්නා. ඒක ප්‍රමාණවත් නැති නම් ඒ ගැන සලකා බලන්න පුළුවනි. මේ අය කඩෙන් කුලියක් ගන්න ගමන් ලොරියෙනුත් ගන්නවා. ඩ්‍රයිවර්ලගෙන් සන්තෝෂම් ලැබෙනවා. මේක එච්චර හොඳ වැඩක් නොවුණත් පාලනය කරන්නත් අමාරුයි. හැබැයි සංගමය හැදුවට පසුව ඒ අය ගැන වෙනදාට වඩා කටයුතු කිරීමේ අවස්ථාව ලැබිලා තියෙනවා.”

**ඔවුන්ට මානුෂික අයුරින් සැලකිය යුතුයි.**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ හා මානව විද්‍යාංශයේ අංශ ප්‍රධාන ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර**

ජනාකීර්ණ වීදි මැදින් අධික බරක් උසුලා ගෙන යන ඔවුන්ගේ ගමනේ වේගය තීන්දු වන්නේ ඉක්මනින් බර බිම තැබීම සහ වැඩිපුර ගෝනි ප්‍රමාණයක් ඔසවා ගෙන ගොස් දෛනික ආදායම වැඩිකර ගැනීම යන කාරණා මත යි. ඒ නිසා නිරායාසයෙන් ම ඔවුන් කෙරෙන් විද්‍යාමාන වන රළු ගතිය අනුව ඔවුන්ගේ ඇතුළාන්තය තීන්දු කිරීම මානුෂික නැහැ. ඉන්දියාවේ මේ වෘත්තියෙහි යෙදෙන අය හඳුන්වන්නේ ‘කුලී’ යනුවෙන්. ඔවුන්ට නිල ඇඳුමක් තිබෙනවා. එය රතු කමිසයක්. ඔවුන්ගේ ආහාර වේල චපාති, අල, පරිප්පු ආදියෙන් සමන්විත යි. පෝෂණ තත්වය හොඳයි. පදික වේදිකාවේ හා දුම්රිය ස්ථානයේ ඔවුන්ට නවාතැන් ගැනීමේ පහසුකමකුත් තියෙනවා. ඊට සාපේක්‍ෂව කොළඹ නාට්ටාම්වරුන්ගේ තත්වය එතරම් සතුටුදායක නැහැ. අධිකතර වෙහෙස නිසා ම ඔවුන් මත් පැන් සහ ගංජා යනාදියට ආසක්ත වන්නට පුළුවන්. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වන අයත් ඉන්නවා. නමුත් මේ සියලු හිරිහැර මැද්දේ මුදලක් ඉතිරි කරගෙන සුළු ව්‍යාපාර ඔස්සේ නාට්ටාම් ජීවිතයට සමුදුන් අයත් ඉන්නවා.

වීදි දරුවන්, ලිංගික සේවා සපයන්නියන් සහ එළවළු වෙළෙඳ පොළේ වෙළෙන්දන් යන සමාජ තීරුවල වාගේම නාට්ටාම්වරුන්ගේත් උප සංස්කෘතියක් තියෙනවා. ඔවුන්ගේ උප සංස්කෘතින් අධ්‍යනය කිරීමත් මානුෂික ව සිතා බලා කටයුතු කිරීමත් ජීවන තත්ත්වය උසස් කිරීමට පියවර ගැනීමත් ඉතා වැදගත්.

අපේ සරසවියේ සිසුවෙක් තම උපාධි නිබන්ධයට තෝරා ගත්තේ නාට්ටාම්වරුන්ගේ ජීවිතයයි. 'කිරි හොඳා' නමින් ප්‍රකට වූ මේ විද්‍යාර්ථියාගේ අධ්‍යයනය ඉතා වැදගත් එකක් වුණා. නාට්ටාම්වරුන් පිළිබඳ කර ඇති අධ්‍යයන දුලබ නිසා මෙය විශේෂිතයි.

# පේෂ කර්මාන්තය නූලෙන් බේරමු ද ?

"ඉන්දියාවෙන් ගෙන්වන කපු රෙදිවල මිළ ගණන් අඩු වුණාට තත්වයෙන් බාලයි. අපේ පිරිවැය ටිකක් වැඩියි. ඒත් නිෂ්පාදනවල තත්වය හොඳයි. මීට හේතුව නූල් ගෙන් වන්නේ  ඉන්දියාවෙන්. නූල් ගෙන්වීමේ ඒකාධිකාරියක් තියෙනවා. රජය මැදිහත්වෙලා අපි වගේ සුළු ව්‍යාපාරිකයන්ට නූල් අඩු මිලට ලබා දෙනවා නම් තත්වයෙන් හොඳ, මිලෙන් අඩු කපු රෙදි දෙන්න අපිට පුළුවන්."

මඩම්පැල්ල "හෙළ සළු" පෙහෙකම්හලෙහි හිමිකාරිනිය වන ගීතානි රේණුකා කරන උක්ත ප්‍රකාශය කපු රෙදිපිළි කර්මාන්තයෙහි යෙදී සිටින වෘත්තිකයන් මුහුණ දෙන ගැටලුත් ඔවුන් කරන අගනා කැපකිරීමත් පිළිබඳව සාකච්ඡා කිරීමේ ප්‍රවේශයක් සපයයි.

මීට දශක කිහිපයට පෙර රෙදි වියන අත් යන්ත්‍රයෙන් නැගෙන හඬ ගම්මුන්ට අරුමයක් නොවී ය. එයින් ජීවිකාව සලසා ගත්තෝ බොහෝ වෙත්.

විවෘත ආර්ථිකයත් සමග ඇඟලුම් කර්මාන්තය ව්‍යාප්තවීම සහ රෙදි පිළි ආයතනය පුළුල්වීමත් සිදු වුව ද කපු රෙදි පිළි නිෂ්පාදනය මුළුමනින්ම ඇණ හිටියේ නැත. ඊට හේතුව කපු රෙදි අවශ්‍යතාව තිබෙන පාරිභෝගිකයන් සිටීම සහ කපු රෙදි නිෂ්පාදන කර්මාන්තයෙහි කලක් තිස්සේ නියැලී සිටින පරම්පරාවක ශේෂයක් බඳු අපූර්ව ගණයේ වෘත්තිකයන් සහ සුළු ව්‍යාපාරිකයන් වෙනත් ක්ෂේත්‍රවලට මාරුවීමේ අකමැත්තෙන් පසුවීමයි. එමෙන්ම දේශීය කර්මාන්තයක් හැටියට කපුරෙදි නිෂ්පාදනය පිළිබඳ ඔවුන් සිත්හි තිබෙන බැඳීම සහ ගෞරවය යි.

දේශීය පේෂකර්මාන්තය නංවාලීම අරමුණු කරගත් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ දැක්ම වනුයේ දේශීය හා විදේශීය වෙළඳපළ අරමුණු කරගත් නිර්මාණශීලී සහ තරගකාරී රෙදිපිළි නිෂ්පාදනය වර්ධනය කිරීම ය. 1980 දශකය තෙක් පේෂකර්ම විෂයෙහි රාජ්‍ය අංශයෙහි තිබූ දායකත්වය අති විශාල විය. එහෙත් දැන් එය සීමා වී පවති.

විවෘත ආර්ථිකය හඳුන්වාදීමට පෙර මෙරට සැලකිය යුතු මට්ටමකින් කපු නිෂ්පාදනය සිදුවිය. පෙහෙකම්හල් වැසීයෑමේ ප්‍රවණතාව අනුව නූල් නිෂ්පාදනය ද ඇණ හිටියේ ය. කපු නූල් ආනයනය කරන්නට සිදුවී ඇත්තේ ඒ නිසා ය. එහෙත් දැනට ද වෙළෙඳ පොළේ නූල් හිඟයක් පවතී. රෙදි පිළි නිෂ්පාදකයන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවකි එය.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පාලන සමයෙහි ආරම්භ කරන ලද සීමාසහිත මරඳගහමුල පේෂ කාර්මිකයන්ගේ සමිතිය අභියෝග මාධ්‍යයේ වුව ද තවමත් ඉතිරිව පවත්නා නිෂ්පාදන ආයතනයකි. පරිපාලන දුර්වලතා හේතුවෙන් වරක් එය වසා දමන්නට සිදුවිය. එහෙත් තවමත් එය පවත්වා ගෙන යන්නේ දිරිය සම්පන්න කුඩා කණ්ඩායමකගේ අවංක කැපවීම හේතුවෙනි.

"අපි නූල් ගේන්නේ පිටකොටුවෙන්. නූල්වල ඒකාධිකාරිය නිසා විටින් විට මිල වැඩිකරනවා. 2010 මුලදී රු. 825/- ට තිබුණු නූල් නොවැම්බර් වෙනකොට රු. 1500/- ක් වුණා. ඉතින් මාස කිහිපයකින් නිමැවුම් මිල දෙගුණ කරන්නට අපිට බැහැ. අලෙවිය වැටෙනවා. වෙළෙඳ පොළේ නූල් නැහැ. සමහරු හංගනවා. මෙහේ රෙදි ව්‍යාපාර ගොඩාක් වැහිලා ගියා. කොළඹ වෙළෙඳ පොළට අපිට යන්න බැහැ.

ක්‍රිස්තියානි හා බෞද්ධ දහම් පාසල්වල සාරිත් ශිල්ප ශිල්පකර්ම සඳහා අවශ්‍ය ගෝස් රෙදි අපි නිෂ්පාදනය කරනවා. නමුත් රජයේ රෝහල් වලින් දැන් අපේ නිෂ්පාදන මිලදී ගන්නේ නැහැ."

සීමාසහිත මරඳගහමුල පේෂ කාර්මිකයන්ගේ සමිතියෙහි අධ්‍යක්ෂ එම්. ඇක්මන්ගේ එම ප්‍රකාශය අනුසාරීන් මරඳගහමුල පේෂකර්මාන්තයෙහි නූතන පැතිකඩක් හඳුනාගත හැක ිය. මරඳගහමුල පේෂකර්මාන්ත සමිතියෙහි අත්යන්ත්‍ර 300 ක් තිබූ අවධියක් විය. දැන් ඔවුන් සතුව ඇත්තේ අත්යන්ත්‍ර 20 කි. බලවේග යන්ත්‍ර 96 න් 46 ක් ඉතිරිව පවතී. 43 ක් බදු දී ඇත. දැනට එහි සිටින සේවක සංඛ්‍යාව 55 කි. මොරගස්මුල්ල, මාරවිල, කිතුල්විල, වෑකඩ සහ කුලී ගෙදර, යනාදී ප්‍රදේශවල මේ සමිතියට අයත් පේෂ කාර්මිකයෝ කටයුතු කරති.

ඉහළ මඩම්පැල්ල පිහිටි "හෙළ සළු" පුද්ගලික ආයතනය දැනට ක්‍රියාත්මක වන ආයතන අතුරින් ප්‍රගතිගාමී එකකි.

මරඳගහමුල පේෂකාර්මිකයන්ගේ සමිතියේ සභාපති හැටියට කටයුතු කරන එම්.එම්.එම්. කුරන්න එම තනතුරට පත්වූයේ 2001 දී ය. ඒ වන විට එහි සේවක සංඛ්‍යාව 13 කි. රු ලක්ෂ 150 ක ණය බරක් ද රු ලක්ෂ 62 ක අර්ථ සාධක මුදල් ප්‍රශ්නයක් ද තිබිණ.

" ගම්පහ කොමසාරිස් මේ සමිතිය වහන්න කියලා තුන්පාරක් ලියුම් එවලා තිබුනා. ප්‍රදේශයේ දේශපාලනඥයින් කැඳවලා අපි සාකච්ඡා කළා. නැවත පටන් ගන්න කොට බැංකු ගිණුමේ රු13000/- යි තිබුණේ. නමුත් අපි මේ වෙන කොට අර්ථ සාධක සෑහෙන ප්‍රමාණයක් ගෙවලා ඉවරයි. දැනට ලංකාවේ පේෂකර්ම සමිතිවලින් අංක එකට ඇවිත් ඉන්නේ. දැන් සළුසල අපිට එක්ලක්ෂ හතලිස් පන් දහසක් ණයයි. ප්‍රාදේශීය අත්යන්ත්‍ර සමඟ දැන් සේවකයන් 85 ක් ඉන්නවා. අපි ඒ අයගේ නිෂ්පාදන ගන්නවා."

සභාපතිවරයාගේ එම ප්‍රකාශය සමාජහිතකාමී ව්‍යාපාරයක යෙදෙන නියමුවකුගේ උදානයක් වැන්න.

විවෘත ආර්ථිකයෙහි කණ කොකා හැඬීමෙන් පසු ව පූගොඩ සහ තුල්හිරිය කම්හල්වල යන්ත්‍රෝපකරණ ඉන්දියාවට යවන ලදි. එකල ඇඟලුම් කර්මාන්ත ශාලාවලින් ඉතිරිවන නූල් තමන්ට ලැබුන බවත් මේ වන විට ඒවා ඉන්දියාවට අපනයනය කරන බවත් මරඳගහමුල පේෂකාර්මික සමිතියෙන් නැගෙන චෝදනාව අතිශය සාධාරණ ය.

මරඳගහමුල පේෂකාර්මික සංගමයේ සභාපතිවරයා තම පාසල් සමයෙහි විෂයක් හැටියට හස්ත කර්මාන්ත උගත්තේ ය. මේ ව්‍යාපාරය සඳහා ඔහුට එයින් පදනම වැටිණ. එමෙන් ම කැපවීමක් ඔස්සේ මෙම ව්‍යාපාරයෙහි යෙදී සිටින අයගේ අභිමානය සුරැකෙන පරිදි ඔවුන්ට ඇගයීමක් ලැබිය යුතු බව සභාපතිවරයාගේ අදහස යි.

ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයට අනුව අත්යන්ත්‍ර පේෂකර්මාන්ත සම්බන්ධ විෂය පළාත් සභාවලට පැවරී ඇත. ඒ අනුව ශීර්ෂ 10 ක් යටතේ දක්වා ඇත්තේ පේෂකර්ම දෙපාර්තමේන්තුවේ වගකීම් ය. අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීමද එයින් එකකි. එහෙත් පළාත් සභාවලින් මේ සඳහා සහයෝගයක් නොලැබෙන බවට මරඳගහමුල පේෂකාර්මික සමිතිය විසින් නගන චෝදනාව නොසලකා හැරිය හැකිද?

“අඩු තරමින් සුළු නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන මිලදී ගැනීමේ ක්‍රමවේදයක් රජයෙන් හදනවා නම් සමුපකාර සමිතියේ මීට වඩා ප්‍රගතියක් පෙන්නන්න පුළුවනි.” මේ ඔවුන්ගේ යෝජනාවකි.

1978 වසරෙහි පටන් බලවේග යන්ත්‍රයක සේවය කරන සීතා කහවල (අවු 52) පවසන්නේ තමන් කරන සේවයෙන් තෘප්තිමත් වන බව ය. “ගෙදරටත් ළඟ යි. ගාමන්ට් එකක වැඩකරනවාට වඩා හොඳයි. ආයතනය ආරක්ෂා වුණොත් තමයි අපත් ආරක්ෂා වන්නේ ” ඒ ඇයගේ අව්‍යාජ හැඟීම යි.

දිනකට පැය 8-12 ක් අතර කාලයක් සේවය කරන චිත්‍රා පද්මිණී (අවු 59) පවසන්නේ ද ඉහළ වැටුප නැතත් ආත්ම තෘප්තියෙන් සේවය කරන බව ය.

“ ඒ කාලෙ ගමේ හැමෝ ම ඇන්දේ අත් යන්ත්‍ර රෙදි. අඩු මුදලට රට රෙදි ගෙනා නිසා කර්මාන්තය විනාශ වුණා. අවුරුදු 27 ක් වැඩ කරලත් අපි තවම මේක දාලා නොයන්නේ අපේ කම අපිට වටින නිසයි.” චිත්‍රා පද්මිණී පවසයි.

මඩම්පැල්ල හෙළ සළු කම්හලේ සේවය කරන විමලානිගේ උපන් ගම බදුල්ල ය. දිනකට පැය දොළහක් පමණ සේවය කරන ඇය පවසන්නේ “ ගාමන්ට් රස්සාවට” වඩා මෙය හොඳ බව ය.

“ මට මල්ලිලා තුන්දෙනයි. අම්මා තාත්තා වත්තේ වැඩට යනවා. මට රු 9000 ක් පමණ ලැබෙනවා. ඒ හොඳටම ඇති” ඇය පවසයි.

පේෂකර්මාන්තය නගා සිටුවීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව යටතේ ආයතන 5ක් ක්‍රියාත්මක වේ. එමෙන්ම පේෂකර්මාන්ත පාසල් හා මෝස්තර ආයතන 14 කි. එසේ වුවත් වෙළෙඳ පොළ තරගකාරීත්වයට මුහුණදිය හැකි තත්වයකට පැමිණීමට දේශීය පේෂකර්මාන්තය අසමත් ව ඇත. පෞද්ගලික අංශයෙන් ක්‍රියාත්මක වන පේෂකර්ම සමිති යටතේ සේවය කරන පිරිස කරන කැපවීම ද ඉමහත් ය.

දහසක් අභියෝග හමුවේ ඔවුන් ඉටු කරනුයේ සමාජ අවශ්‍යතාවයකි. මේ සමාජ මෙහෙවර පිළිබඳ සවිඥානික වෙමින් ඔවුන් පෙළන ගැටලු විසඳීමට පියවර ගැනීම කාලීන අවශ්‍යතාවකි.

**රජය මැදිහත් වන බව පොරොන්දු වුණා**

**අධ්‍යක්ෂ- ඩබ්.ඒ. විජිත ප්‍රේමප්‍රිය- පේෂකර්ම දෙපාර්තමේන්තුව- කොළඹ**

“පේෂකර්ම පාසල් 14 ක් දැනට ලංකාවේ ක්‍රියාත්මක වෙනවා. මහින්ද චින්තනය යටතේ දේශීය කර්මාන්ත නගා සිටුවීමට අදාළව පේෂකර්මාන්තය දියුණු කිරීමේ ව්‍යාපෘතියක් දියත් කර තිබෙනවා. පස් අවුරුදු සැලැස්මක් ගිය වසරේ සිට ක්‍රියාත්මක කරනවා. පේෂකර්මාන්ත ප්‍රදර්ශනය ගිය වසරේ දෙසැම්බර් වල පැවැත්වුවා. එහිදී බැසිල් රාජපක්ෂ මහතා පොරොන්දු වුණා. නූල් ඒකාධිකාරය වෙනුවට සහන මිලට නූල් ගෙන්වීම සම්බන්ධයෙන් සොයා කටයුතු කරන බවට. මේ නිසා අප හිතනවා යම් ප්‍රමාණයක රජයේ මැදිහත් වීම මේ සඳහා තිබෙන බව.

අප ආයතනය මගින් ප්‍රතිපත්ති සම්පාදනය සහ ප්‍රවර්ධන ( පුහුණු) කටයුතු සිදු කරන අතරම වෙළඳ පොළක් සපයා දෙන්න උත්සාහ කරනවා. ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා පේෂ කර්මාන්තය නගා සිටුවීමට කටයුතු කරනවා. ඒ අතරම පසුගිය වසරේ ළමුන් 29 ක් පමණයි සිටියේ පේෂකර්මාන්ත පාසල් වල. මේ වසරේ ළමුන් 200 ක් සිටිනවා. මසකට රු. 2000 ක දීමනාවක් සමඟ නේවාසික

පුහුණුවක් ලබා දෙනවා. මාස 3ට සැරයක් Motivate කරනවා. යුනිෆෝම් 2ක් ලබාදී තිබෙනවා. පරිගණක සහ ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දෙනවා.

**දේශීය ක්‍රමවේද අවශ්‍ය යි**

**එම්.ජේ.එල්. මුතුනායක- තාක්ෂණ විද්‍යාලය- පේෂකර්ම දෙපාර්තමේන්තුව**

ලංකාවේ කාල කළමනාකරණය නැති නිසා කම්කරු වියදම වැඩියි. ඒ නිසා මිල අධික වෙනවා. මේ නිසා මිල අඩු නිෂ්පාදන සමඟ දේශීය නිෂ්පාදන වලට තරග කරන්න බැහැ. ලංකාව වැනි රටවල එක් කර්මාන්තයක් තෝරා ගෙන ඒ සඳහා දැඩි වෙහෙසක් දරා දියුණු කිරීම කළ යුතු යි. හැම එකක්ම බදා ගෙන කරනවාට වඩා වැඩි අවධානයක් එකකට යොමු කිරීමෙන් යම් දියුණුවක් ලබා ගත හැකියි. උදාහරණයක් ලෙස ජපානය වාහන නිෂ්පාදනය සඳහා වැඩි අවධානයක් යොමු කරනවා වගේ. අපි මේ වන විට අත් යන්ත්‍ර නිෂ්පාදනය සඳහා යොදා ගන්නා වර්ණ සඳහා ස්වභාවික වර්ණ යොදා ගන්නා ආකාරය සම්බන්ධව පර්යේෂණයක නියැලෙනවා. ඒ සඳහා අරළු, බුළු, නෙල්ලි වැනි දේ වලින් වර්ණ නිෂ්පාදනය කළ හැකිද යන්න ගැන සොයා බලනවා. ඒ අතරම අත් යන්ත්‍ර රෙදි පිළි නිෂ්පාදනය සඳහා දේශීය කර්මාන්තකරුවන්ගේ අවධානය යොමු කර ගැනීමේ සහ ඒ සඳහා උනන්දුවක් ඇති කරලීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරනවා.

**ළඟදීම වැහිලා යයි**

**නිමල් රංජිත් ප්‍රේමසිරි- කළමනාකරු- බලවේග පෙහෙ කම්හල- මරඳගහමුල**

දේශීය අත් යන්ත්‍ර රෙදි පිළි වලට හොඳ මාර්කට් එකක් කොළඹ තියෙනවා. නමුත් ප්‍රශ්නය තියෙන්නේ අපිට කොළඹ ප්‍රදේශයෙන් SHOW ROOM එකක් නැතිකම. මම හිතන්නේ තව ටික කලකින් මේ අත් යන්ත්‍ර රෙදි පිළි නිෂ්පාදනය නැති වෙලා යයි. මොකද දැනට අපි ළඟ වැඩ කරන්නේ මැදිවිය පහු කළ අය. මේ අයත් වසර 25-30 ක් මේ ක්ෂේත්‍රයේ නියැළුණු අය. තරුණ පරම්පරාව මේ සඳහා නැඹුරු වීමක් නැහැ. ඔවුන් කැමති ගාර්මන්ට් වගේ දේකට යන්න. අනෙක දැන් අත් යන්ත්‍ර වලට වඩා බලවේග මැෂින් තමයි ක්‍රියාත්මක වන්නේ. ඒවා ඉතා අධික මිලක් වෙනවා වගේම නඩත්තුවටත් මිලක් වැය වෙනවා. දැන් අඩු මිලට ඉන්දියාවෙන් , චීනෙන් රෙදි ගෙනෙන නිසා වෙළඳ පළ සමග තරග කරන්න අමාරුයි.

# කිරි කපන දෑතින් පණ ලබන ජීවිත

“අපේ පඩියෙන් රුපියල් 145 ගණනේ අඩු  කරගෙන යි කෝවිල හදා ගත්තේ. ඒත් වහල හදා ගන්න බැරි උනා. පාලකයන්ට කීවට වැඩක් උනේ නෑ. අපිට අපේ ආගම ඇදහීමේ අයිතියක් නැහැ.”

දර්ගා නගරය පල්ලේගොඩවත්ත වතු යායේ රබර් කිරි කපන කම්කරුවන්ගේ උක්ත ප්‍රකාශය ඔවුන්ගේ දිවිසැරිය පිළිබඳ අවධානය යොමු කළ හැකි හොඳ ප්‍රවේශයකි. දෙමළ වතුකරුවන්ගේ ජන දිවියෙහි සුවිශේෂී ස්ථානයක් හින්දු ආගමික වත් පිළිවෙත්වලට හිමි වේ. පල්ලේගොඩැල්ල වතු යාය අයත් කීරන්ම්ඩිය ඇබොයින් කොටස, කීරන්තිඩිය වත්ත, කොලැහේකඩ සහ අන්නාසිවත්ත ලැයිම්වල ජීවත් වන ජනතාව මුහුණ දී සිටින ගැටලු සමුදායෙන් එකකි එය.

අතීතයෙහි ක්‍රමවත්ව පවත්වාගෙන ගිය පල්ලේගොඩැල්ල වතු රෝහල අද වන විට රෝහලක් ලෙස හැඳින්වීමට ද අනුචිත බව පෙනේ. එහි වෛද්‍යවරයකු නොමැත. කිසිදු නඩත්තු කිරීමක් සිදු නොකෙරේ.

“ අපේ නිවාසවලට ඔප්පු නැහැ. ඒ දවස්වල ලැයිම් කාමර එකට තිබුණෙ. අලුත් වැඩියා කිරීමක් සිදු උනේ නෑ. මේ නිසා ලැයිම්වල උදවිය තමන්ට පුළුවන් විදියට තමන්ගේ කාමර හදාගෙන තියෙනවා. සමහරුන්ට එහෙමවත් පුළුවන් කමක් නැහැ. 1950 ගණන්වල ඉඳල ම මේ ප්‍රශ්නෙ තියෙනවා. ”

පල්ලේගොඩැල්ල වත්තෙ පදිංචි එස්. මාධවන් සෙල්ලප්පම් (52) ප්‍රකාශ කරන්නේ තවමත් ස්ථිරසාර විසඳුමක් ලැබී නැති වතු නිවාස ප්‍රශ්නය පිළිබඳව ය. විනාශ වී ඇති ලැයිම් කාමර පිළිසකර කිරීම සඳහා ඉල්ලීම් ගණනාවක් කර ඇතත් කිසිවෙකු ඒ පිළිබඳ ව සොයා බලා නොමැති බව එහි පදිංචිකරුවන්ගේ චෝදනාව යි. එහෙත් කුමාර වෙල්ගම ඇමතිවරයා විසින් තම ලැයිම් කාමරවලට විදුලිය ලබා දීම පිළිබඳ ව ඔවුහු ඇමතිවරයාට කෘතඥතාව පළ කරති.

පෙ.ව. 6.00 ට පටන් ගන්නා කිරි කැපීම පස්වරු 2.00 ට අවසන් වෙයි. කිරි බහුල සමයෙහි දෙවරක් කිරි කැපීම සිදු කෙරෙන නමුත් එසේ කිරීමෙන් රබර් ගස්වල තත්වය බාල වන බව කීරන්තිඩිය ග්‍රාම නිලධාරී එම්.එච්.වීරසිංහ පවසයි.

දවසේ වැටුපට හිමිකම් කීම සඳහා කිලෝග්‍රෑම් 6 ක බරින් යුත් රබර් ලබා ගැනීම සඳහා කිරි කැපිය යුතු වෙයි. කිලෝ එකක් සඳහා ගෙවන මිල රු. 45 කි. අර්ථ සාධක අරමුදලට දායක වීම අනුව ලැබෙන මාසික වැටුප බොහෝවිට රු. 6000- 8000 අතර වේ.

කොළ හැලීමට ආසන්න වන සමයෙහි කිරි පලදාව වැඩි වෙයි .කොළ හැළුණු පසු අඩු වෙයි. මේ අනුව පෙබරවාරි මස කිරි සිනහව මැයි මස වන විට හැකිළෙයි. “ වැහි පාළුව” පැමිණි දාට වත්තේ ‘ සිල්ලර වැඩ ’ ලැබෙයි.

දවස් කුලිය රු. 280 කි. සිංහල, දෙමළ, අලුත් අවුරුද්ද සහ මැයි දිනය වෙනුවෙන් නිවාඩු දින දෙකක් කම්කරුවන්ට ලැබෙයි. වසරකට වරක් දින 14 ක වැටුපක් ප්‍රසාද දීමනා වශයෙන් ලැබේ.

“ අපි නිතරම ලෙඩ දුක්වලට ගොදුරු වෙනවා පඩියෙන් වැඩි හරියක් වියදම් වෙනවා. මේ නිසා කන බොන වියදම් සීමා වෙනවා. හදිසියකට උදව් දෙන්න කෙනෙක් නැහැ. ” රබර් කිරි කපන කාන්තාවක වන පී. ලලිතා (40) පවසයි.

මතුගම තැපැල්කරුවකු හැටියට සේවය කරන පෙරුමාල් ප්‍රභාහරන් ලැයිම් ජීවිතයට සමු නොදුන්න ද රබර් කිරි කැපීමේ වෘත්තියට සමුදුන්නේ එහි ඇති අමිහිර නිසා ම ය. පල්ලේගොඩැල්ල වත්තේ , අන්නාසිගල කුඩා ලැයිමක ඔහු ජීවත් වෙයි. දෙමව්පියන්ගේ දුෂ්කර ජීවිතය නිසා ඇති වූ කළකිරීම නිසා අමාරුවෙන් ඉගෙන ගත් බවත් හොඳ රැකියාවක් කිරීම තම අරමුණ වූ බවත් ප්‍රභාහරන් පවසයි.

මේ ලැයිම්වල දරුවන් සමඟ කතාබහ කිරීමේදී පෙනී යන්නේ ඔවුන්ගේ අධිෂ්ඨානය ලැයිම් ජීවිතයෙන් සහ කම්කරු වෘත්තියෙන් සමුගැනීම බව ය.

“ යාලුවොත් එක්ක කතා කරලා තමයි මම සිංහල ඉගෙන ගත්තෙ. අපේ තාත්තා මැරුණා. අම්මා කිරි කපලා තමයි මට වියදම් කරන්නේ. මම ඒ රස්සාවට කැමති නැහැ. මම කැමති විදුලි කාර්මික අංශයට යි. ”

මතුගම කන්නන්ගර විද්‍යාලයේ දෙමළ අංශයෙහි ඉගෙනුම ලබන එම්. ජීවරාම් (11) පවසයි.

අන්නාසිගල දෙමළ විද්‍යාලයෙහි සිසුන් 29 දෙනෙක් ඉගෙනුම ලබති. එහෙත් එහි ඇති එක ම ගොඩනැගිල්ල අබලන් ව පවතී. ගුරු නිවාසය භාවිතයට ගත නොහැකි අයුරින් ජරාවාසව පවතී. එය අලුත් වැඩියා කර දුන හොත් ගුරුවරුන්ට නවාතැන් පහසුකම් ලැබීම ඔස්සේ දැනට වඩා කැපවීමෙන් වැඩ කිරීමේ අවස්ථාව ලැබෙන බව එහි විදුහල්පති ඒ.ඩී.එම්. රිෆ්කාන් පවසයි.

පාසැලේ වැඩ කටයුතු වලට දෙමව්පියන්ගෙන් ලැබෙන සහයෝගය මඳ බවත් ඔවුන් රැස්වීම් වලට නොපැමිණෙන බවත් ළමයිනගේ සෞඛ්‍ය තත්වය පිරිහීමට හේතුව දෙමාපියන්ගේ නොසැලකිල්ල බවත් ඔහු වැඩි දුරටත් පවසයි.

“ ළමයින්ගේ අධ්‍යාපනය ගැන දෙමාපියන්ට කිසි අවබෝධයක් නැහැ. දරුවන් පාසැල් එවන්නේ නැතුව රබර් කිරි කපන්න එක්ක යන අයත් ඉන්නවා. මේ විදුහලේ ඉන්නේ මුස්ලිම් ගුරුවරු. ඒ නිසා දරුවන්ට හින්දු ආගම උගන්වන්න විදියක් තිබුණේ නැහැ. ඒ නිසා ස්වේච්ඡා ගුරුවරු දෙදෙනෙක් ගෙන්වා ගෙන හින්දු ආගම උගන්වනවා. ගුරු නිවාසය හදල දෙනවා නම් ගුරුවරුන් නැවතිලා මීට වඩා කැපවීමෙන් වැඩ කරන්න කැමතියි. ”

විදුහල්පතිවරයාගේ චෝදනාව සහේතුක ය. දෙමාපියන්ගේ උනන්දුව මඳ උනත් විදුහල්පතිවරයා දරුවන් වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කරන බව ග්‍රාම නිලධාරීවරයාගේ අදහසයි.

පල්ලේගොඩැල්ල වතුයායේ කීරන්තිඩිය ඇමොයින් කොටසෙහි ලැයිම් දෙකකි. කීරන්තිඩියවත්ත ලැයිම් දෙකකි. අන්නාසිගලවත්ත හා කොලුන්හේකඩ ලැයිම් එක බැගින් ඇත. මේ ලැයිම්වල තත්වය ඒවා ආරම්භක අවධියෙහි පැවති අව ම මට්ටමෙන් අඟලක්වත් ඉදිරියට ගොස් නැත. වැසි වතුරට නිතර ලක්වීමත්, මැසි මදුරු උවදුරත් නිසා ඒවා දරුවන්ගේ සෞඛ්‍යාරක්ෂාවට තර්ජනයකි. ලැයිම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති කිසිවක් පල්ලේගොඩැල්ල වතු යායට පැමිණ නොමැත.

වතු රෝහල අක්‍රීය වී ඇති හෙයින් කිසිවකු රෝගී වූ විට දර්ගා නගරයේ රෝහලට යා යුතුය. ඒ සඳහා විශාල වියදමක් දැරීමට සිදු වේ.

" අප කෙතරම් දැනුවත් කිරීම් කළත් මේ අයගේ සෞඛ්‍ය පුරුදු ගැන සතුටු වෙන්න බැහැ. එන්නත් කිරීම් වුණත් නිසි පරිදි කරන්නට නොලැබෙන්නේ ඔවුන් ඒ පිළිබඳව එතරම් උනන්දුවක් නොදක්වන නිසයි. දෙමාපියන් සායන වලට පැමිණෙන්නේ නැහැ. මේ නිසා ඔවුන්ගේ පෝෂණ මට්ටම නරක තැනක තියෙන්නේ." පවුල් සෞඛ්‍ය නිලධාරිනි නන්දා ලියනගේ මහත්මිය එසේ පවසන්නේ රාජකාරි කටයුතු වලදී තමන් මුහුණ දෙන දුෂ්කරතා ද සැලකිල්ලට ගනිමිනි.

ශ්‍රී ලාංකීය පුරවැසිභාවය ලැබී තිබීම ඔවුන් ලබා ඇති ජයග්‍රහණයක් වුවද එනිසා ඔවුන්ගේ ජීවන තත්වයෙහි වෙනසක් දකින්නට නොමැත. වතු ආර්ථිකයට අවශ්‍ය ශ්‍රමිකයන් සපයා ගැනීමේ දී උඩරට සිංහලයන් කුලීකරුවන් හැටියට වැඩ කිරීමට දැක් වූ අකමැත්ත දකුණු ඉන්දීය දෙමළ ශ්‍රමිකයන් කැඳවීමට හේතු විය. එහෙත් සමකාලීන යටත් විජිත රාජ්‍යයක් හැටියට ෆීජි දූපත්වල වතු ශ්‍රමිකයන්ට ලබා දුන් වැටුපට සාපේක්ෂව ලක් රජය දෙමළ කම්කරුවන්ට ලබා දුන්නේ සොච්චම් වැටුපකි. වහල් ශ්‍රමයට පමණක් දෙවැනි වූ ශ්‍රම වටිනාකමකි ඔවුනට තිබුණේ. වතු ආර්ථිකයේ උන්නතිය වෙනුවෙන් පරම්පරා ගණනාවක් ඔවුන් කළ කැපවීම සුළුපටු නොවේ. එහෙත් එහි ප්‍රතිඵලය අකල් හී රෝගී වූ අබලි පරම්පරාවක් නම් එය කිසිසේත් ම සතුටු විය හැක්කක් නොවේ.

**වෛද්‍යවරයෙක් නැති රෝහලක්**

ටී.ඩී කුමුදුනී(වෛද්‍ය සහායිකා පල්ලේගොඩැල්ල වතු රෝහල)

" දැනට මේ රෝහලේ රාජකාරි කටයුතු හොඳට ම අඩාල වෙලා. වතු වල ඉන්න හැම රෝගියෙකුටම නේවාසික වෛද්‍ය පහසුකම් මේ රෝහලේ තිබුණා. දැන් වෛද්‍යවරයෙක්වත් නැහැ. ඒ නිසා ජනතාව රෝහලෙන් ඈත් වෙලා. රජයෙන් කිසිම නඩත්තුවක් කෙරෙන්නේ නැහැ. සායන පහසුකම් නැහැ. මේක හරිම අවාසනාවන්ත තත්වයක්."

**විශේෂ අවශ්‍යතාවක්**

සෙල්ලසාමි ක්‍රිෂ්ණසාමි- ( සභාපති- ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු සමිතිය)

" විශේෂ අවශ්‍යතාවක් ලෙස සලකා බලා ඔවුන්ගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා කෙටි කාලීන සහ දිගු කාලීන වැඩ පිළිවෙළක් දියත් කළ යුතුයි. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමක් සෞඛ්‍යාරක්ෂාවක් ඒ අතරින් ප්‍රධානයි."

# කලාපයේ යුවතියන්ගේ 'රන් පවුම්' සිහිනය

වතුර පයිප්පයක් අසල බිම හිඳගෙන රෙදි සෝදන යුවතියකි. රෙදි කන්දේ තරම අනුව පෙනෙනුයේ දින ගණනාවක කටයුතු පැයකට කෙටි කර ඇති බව ය. බෝඩිං කාමර පේලිය හිස් ය. යුවතියන් වැඩට ගොසිනි. සිහින් කැස්සක් දුරින් ඇසේ.

" අද මගේ නිවාඩු දවස නිසා රෙදි ටික හෝදලා ගෙදර වැඩ කරගන්නවා. අපට අවුරුද්දට නිවාඩු 14 ක් තියෙනවා. ඒකෙන් ඉතිරිවන දින 7ට ගෙවීමක් කරනවා. රු 1000 ක ඇටෙන්ඩන් බෝනස් එකක් දෙනවා. දවස් 29 ක් ගිහින් 30 වැනි දවසේ යන්න බැරි උනොත් ඒක කපනවා. පැය බාගයක් පරක්කු වුණොත් ඒ හීනෙ ඉවර වෙනවා."

කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ ක්‍රිස්ටල් ආයතනයෙහි සේවය කරන යුවතියක වන ඇය රෙදි සෝදන අතරතුර කළ එම ප්‍රකාශය ඔවුන් ගත කරන ජීවිතයේ ශෝචනීය පැත්ත පිළිබඳ විමසා බැලීම සඳහා හොඳ ප්‍රවේශයක් සපයයි.

"අපට පාටියක් තිබුණා හෝටලේක. ඒකට පඩියෙන් රුපියල් 250ක් කපලා තිබුණා. නොගිය අයගෙනුත් කපලා තිබුනා."

ආයතන ප්‍රධානීන් තම සේවිකාවන්ගේ සන්තුෂ්ටිය වෙනුවෙන් කරන කටයුතුවල තත්ත්වය එබඳු ය.

ඇගේ වේදනාබර ප්‍රකාශය ඔස්සේ කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ ශ්‍රමිකයන්ගේ වත්මන් දිවිසැරිය පිළිබඳ කතිකාවතකට ප්‍රවේශ වෙමු.

ස්මාර්ට් ෂර්ට් ආයතනයේ සේවිකාවක් ප්‍රකාශ කරන පරිදි ඇගේ මූලික වැටුප රු 9250/-කි. අතිකාල දීමනාව පැයකට රුපියල් 46/-කි. අතිකාල පැය 4 කි. රාත්‍රී සේවය ද සමග ඉපයිය හැකි උපරිම ගණන  රු 15000/-ට අඩු බව ඇය පවසයි. බෝඩිං ගාස්තුව රුපියල් 2500/-කි. ළිං ජලය දූෂණය වී ඇති නිසා කරාමයෙන් ගන්නා වතුර උණුකර බීමට සිදුවේ. ලයිට් බිල වෙනම ගෙවිය යුතුය. "බෝඩිං වියදම් වෙන් කළා ම රුපියල් හය හත් දාහකින් කෑම වියදම් සමඟ අනෙකුත් වියදම් දරා ගන්න වෙනවා. පොල් ගෙඩියක් රුපියල් හැට යි. ගෑනු ළමයි ලස්සනට අඳින්න ආසයි. ඒත් මාස ගණනකින් ඇඳුමක් ගත්තේ නෑ. ගමේ ගියේ නෑ. ජීවත්වීම එන්න එන්නම අමාරු යි."

ඇගේ ප්‍රකාශය අව්‍යාජ ය. ඇයට සඟවන්නට දෙයක් නැත. ජීවත්වීමේ අමාරුව වසන් කිරීමේ තේරුමක් ද නැත.

මාස් ඇක්ටිව් ලෙෂර ලයින් ආයතනයෙහි සේවය කරන විවාපත් තරුණ යුවලක් සමඟ කතා බහ කිරීමේ දී වැටහී ගියේ එක් ව ජීවත්වීමේ සතුට මිස වෙනත් සතුටක් ඔවුන්ට ඉතිරි වී නොමැති බව ය.

මේ යුවතියගේ කතාවයි.

"දුප්පත්කම නිසා සාමාන්‍ය පෙළින් ඔබ්බට ඉගෙන ගත්තේ නැහැ. ඉගෙන ගත්තු අයටත් රැකියා නැති නිසා ගාමන්ට් එන්න හිත හදා ගත්තේ. මාසේ අන්තිමට කාපු දේකුත් නෑ. ඉතිරියකුත් නෑ. මේ පාර බෝනස් දෙන්නෙත් නැති ලු. දෙමව්පියන්ට ඇඳුමක් අරන් දෙන්න හිතාගන හිටියට ඒකත් මේ පාර කර ගන්න නොලැබෙයි වගේ."

මේ ඇගේ සැමියගේ කතාවයි.

" මාස තුනකට සැරයක් තමයි දෙමාපියන් බලන්න යන්නේ. අම්මට සලකන්න ඕනේ. ඒත් ඒ යුතුකම් කිරීමත් මග හැරෙන්න පටන් අරං. ඉස්සර නම් ඉඳලා හිටලා ෆිල්ම් එකක් බලන්න යනවා. ඇවිදින්න යනවා. ඒ ඔක්කොම නැවතිලා. අපි පුංචි කාමරේකට කොටු වෙලා දුක් විඳිනවා. ගමට ගියත් කරන්න දෙයක් නෑ. ඒ නිසා කොහෙ හරි රටකට යන්නයි අපි දෙන්නගේ බලාපොරොත්තුව"

සිහින කන්දරාවක ජීවත්වීම ඔවුන්ගේ ජීවන යථාර්ථය බවට පත්වෙමින් තිබේ.

හයිලන්ඩ් ජයිස් ආයතනයේ  සේවය කරන යුවතියක් සමඟ කතා බහ කිරීමේ දී වැටහී ගියේ තමන්ගේ ම නිවසෙයි සිට සේවයට පැමිණිය ද පවතින අර්බුදයෙන් ගොඩ ඒමට එය ප්‍රමාණවත් නොවන බව ය.

"මගේ අම්මා රට රස්සාවකට ගිහින් අනතුරකට ලක්වෙලා ගෙන්නා ගත්තා. තාත්තා පැක්ටරියක ක්ලීනර් කෙනෙක්. උදේ 5.30 ඉඳලා රෑ 8.00 වනතුරු වැඩ කරනවා. එයාගේ පඩිය 8700/-යි. ඕටීත් එක්ක මට ලැබෙන්නේ 12000 ට අඩුවෙන්. කෑමට 400/- ක් කපනවා. ටාගට් එක වැඩි නිසා දිනේ ටාගට් කරන්න බැහැ. අවුරුදු 5 ක් හිටියොත් පවුමක් දෙනවලු. ඒ නිසා මම තව අවුරුද්දක් ඉඳලා පවුමත් අරගෙන වෙන වැඩක් හොයා ගන්නවා. ඇගේ ප්‍රාර්ථනය ඉටුවීම අවිනිශ්චිත ය.

මාක් ඇක්ටිව් ලෙෂර් ලයින් ආයතනයේ වැඩ පරීක්ෂකවරියක ලෙස සේවය කරන යුවතියක සමඟ කතා බහ කිරීමේ දී ඇය ප්‍රකාශ කළේ සීට්ටු ක්‍රමයට ගන්නා මුදලින් බඩු මුට්ටු ගැනීම බොහෝ සේවිකාවන් අතර පවතින සිරිතක් බව ය.

"අවුරුදු 5 ක් හිටිය ම ඉස්සර නම් පවුමක් දුන්නා. ඊට පස්සේ ඒක පවුම් භාගයක් වුනා. ඒකත් නැති වෙන්න යන කොට අපි මැනෙජ්මන්ට් එකත් එක්ක කතා කරලා ඒක හරි ගස්සා ගත්තා. ඒකත් අරගෙන ගමේ යන්න හිතාගන ඉන්නේ."

ඇගේ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ 'රත්තරන් පවුම' ඔවුන්ගේ දුෂ්කර ජීවිතයේ සරතැස නිවාලන සන්ධිස්ථානයක් බවට පත් ව තිබීම ය.

වෙළෙඳ කලාපයෙහි සේවය කරන ශ්‍රමිකයන්ගේ පොදු ලක්ෂණ විමසීමේ දී අපගේ නිරීක්ෂණ මෙසේ ය.

ඔවුන්ගෙන් බහුතරයක් දුෂ්කර ග්‍රාමීය පෙදෙස් නියෝජනය කරයි. අවුරුදු 18-25 අතර වයස් කාණ්ඩයට අයත් ය. විශාල පිරිසක් කුඩා ප්‍රදේශයක කැටිවී සිටී. වසර 5 ක් වැනි කෙටි කාලයකින් රැකියාවෙන් ඉවත්වීම බහුතරයගේ  අපේක්ෂාව වී ඇත. රැකියාවෙන් ඉවත්වීමෙන් පසු ව ගමට යෑම

හෝ විවාහ වීම හැර වෙනත් විකල්පයක් බොහෝ යුවතියන්ට නොමැත. රෝ පීඩාදියට ගොදුරුවන අවස්ථාවන් හී ප්‍රතිකාර කිරීමේ ක්‍රමයක් ආයතනවල නොමැත. සේවිකාවන් තම වියදමෙන් ප්‍රතිකාර ගත යුතුය. ආරක්ෂිත නවාතැන් බොහෝ සේවිකාවන්ට නොමැත. අතරමග දී චේන් කඩා ගැනීම්වලට, සල්ලාල බැල්මට ලක්වන අවස්ථා සුලබ ය. ඇතැම් ආයතන මගින් රාත්‍රී සේවයේ යෙදෙන සේවිකාවන්ට ප්‍රවාහන පහසුකම් ලබා දී ඇත.

කලාපයේ යුවතියන්ගේ සුබසාධනය වෙනුවෙන් උනන්දු වන STANDUP සංවිධානය විසින් කර ඇති සමීක්ෂණයකට අනුව ඇඟලුම් කම්හලවල සේවය කරන යුවතියන්ගෙන් 64% ක් දෙනා යකඩ ඌනතාවෙන් පෙළෙති. මේ නිසා ඔවුන්ට අවශ්‍ය යකඩ පෙති බෙදා දීමට එම සංවිධානය පියවර ගෙන තිබේ. එහෙත් මේ වන විට එය අඩාල වී ඇති නිසා අනාගතයෙහි උපදින දරුවන්ට ද මෙය අහිතකර අයුරින් බලපෑ හැකි බව ˜ඕහෘඹෂ සංවිධානයෙහි ක්‍රියාකාරිනියක් පවස යි. ඇතැම් ආයතනවල සේවිකාවන්ට රක්ෂණ ආවරණද අහිමි ය. සේවා කාලය තුළ දී යුවතියන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ද ගැටලු පැන නැගී ඇත. වරක් ආයතන ප්‍රධානියකුගේ ලිංගික අපචාරයට ලක් වු යුවතියක් කටුනායක පොලීසියට පැමිණිල්ලක් කිරීමට ගියා ය. එහි ළමා හා කාන්තා කාර්යංශයක් නොමැති හෙයින් පැමිණිල්ල ලියා ගැනීමට පැමිණ ඇත්තේ TRAFIC පොලිස් කාන්තාවකි.

“ ඔය ළමයා කළු ගලේ ඔලුව ගහ ගන් නැතුව ආපහු යන්න”

මේ ඇයට ලැබී ඇති උපදේශය යි.

මෙහිදී STANDUP සංවිධානය යුවතිය වෙනුවෙන් පෙනී සිටියේ ය. එහෙත් අවසානයේදී සිදු වුයේ අපහරණයට ලක් වු දැරියට රැකියාව අහිමි වීම ය.

2004 වර්ෂය වන විට කටුනායක වෙළෙඳ කලාපය අවට නීති විරෝධි ගබ්සා මධ්‍යස්ථාන 16 ක් තිබී ඇත. මේ වන විට එය මධ්‍යස්ථාන 3 කට සීමා වී ඇති බව නිරීක්ෂනය කළ හැකිය. ලිංගික ඇසුර සම්බන්ධයෙන් අවබෝධයෙන් කටයුතු කිරීම මෙම යහපත් ප්‍රවණතාවට හේතු වී ඇත.

රටෙහි ආර්ථික කොඳු නාරටිය ශක්තිමත් කිරීම සඳහා මැද පෙරදිග ශ්‍රමිකයන් මෙන් ම ඇඟලුම් සේවිකාවන් ලබා දෙන දායකත්වය සුළුපටු නොවේ. එහෙත් එම දායකත්වයට සරිලන කෘතවේදි බවත් ඔවුන්ට ලැබී තිබේද? යන්න සැක සිහිත ය.

**ගැටලු වලින් මිදෙන්න කැමති නැහැ.**

කුරුසියේ සොහොයුරියෝ පැවදි වැඩිහිටි නිවාසයේ කන්‍යා සොහොයුරියක්

වෙළෙඳ කලාපය පටන් ගත්තු කාලයේ සිට ම අපි ගැහැණු දරුවන් වෙනුවෙන් මැදිහත්වීම් කළා. ඔවුන්ට කියවීම් සඳහා පුස්තකාල පහසුකම් ලබා දුන්නා. ගැටලු සාකච්ඡා කරලා, උපදේශන ලබා දුන්නා. දැන් ගොඩක් දෙනෙක් සෙල් පෝන්වලට ඇබ්බැහි වෙලා. ෆෝන් එක කනේ ගහගන මෙලෝ සිහියක් නැතිව පාරේ යනවා. පුස්තකාලෙට එන්නේ නැහැ. ඉස්සර සියලු පුවත් පත් මිලදී ගත්තා. කවුරුත් බලන්නේ නැති නිසා දැන් ගන්නේ නැහැ. තමන්ගේ ප්‍රශ්න කියාගෙන ආවත් අපට උදව් කරන්න

අමාරුයි. ඊට හේතුව ගැටලු වලින් මිදෙන්න ඕනෑකමක් ඒ අයට නැති වීම යි. ඔවුන් හැඟීම්වලට වහල් වෙලා ඉන්නේ.

**ළමයි බඩුමුට්ටු ගන්නේ අඩුවෙන්**

හැමිල්ටන් (ඇවරිවත්ත වෙළෙඳ සැල් හිමියෙක් )

මගෙන් බඩු ගන්නේ ගාමන්ට් ළමයි. පොතට බඩු අරන් මාසේ අන්තිමට ගෙවනවා. ඒත් දැන් දැන් ගොඩක් බඩු ගන්නේ නෑ. කන්නේ බොන්නේ අර පරෙස්සමෙන්. වෙළෙඳාම අඩු යි. මාසේ අන්තිමට ණය පියවන්නත් ඒ අයට අමාරුයි. ඒ නිසා මටත් බඩු ගේන්න අමාරු වෙලා තියෙන්නේ.

**ළමුන්ගේ ආරක්ෂාවට වග කියනවා.**

පෙරේරා මහත්මිය. (ඇවරිවත්ත- බෝඩින් හිමිකාරියක්)

මම අපේ ගෙදර ගැහැණු ළමුන් 6 ක් නවතා ගෙන සිටිනවා. ඔවුන් දෙන්නට එක ගානේ කාමර 3 ක් දීලා තියෙනවා. එක කාමරයක් රු 2500 ක් දෙන්නේ. ඔවුන්ගේ ලයිට් බිල් ඔවුන්ට වෙනම ලැබෙන්න සලස්වනවා. වතුර ගන්න නළ ළිඳ තියෙනවා. කෑම ඔවුන්ම උයා ගන්නවා. අද කාලේ මේ ගානට කාමරයක් දෙන්න බැහැ. ඒත් ඔවුන්ගේ පඩිය ගැන බලලා ඔවුන්ගෙන් සාධාරණ මුදලක් අය කරනවා. අපිත් ඉතින් ජීවත් වෙන්නේ අමාරුවෙන්. ඉස්සර වගේ නැහැ දැන්. අපේ බෝඩිමේ ළමුන්ගේ ආරක්ෂාව ගැන මම වගකියනවා. පිටස්තර පිරිමි අයට මම මෙහෙට ඇතුල් වෙන්න දෙන්නේ නැහැ. පිටතදී ඉතින් ඒ අයගේ ආරක්ෂාව ගැන ඔවුන් බලා ගන්න ඕනී. මෙහෙ නැවතිලා ඉන්න ළමුන්ගේ පවුලේ තොරතුරු පවා මම අරගෙන තියෙන්නේ මොකද හදිසියක් වුනොත් දෙමව්පියන්ට හරි දන්වන්න ඕනේ නිසා. මටත් දූලා ඉන්න නිසා මම මේ දරුවන් ගැන අවධානෙන් ඉන්නේ. ඔවුන්ට කරන්න පුළුවන් උදව් මම කරනවා.

**අශීලා - STANDUP සංවිධානය**

අපේ සංවිධානයට අවුරුදු තුනයි. අපි ඔවුන් සමඟ සාකච්ඡා කරලා 'සහන' නමින් සමිතියක් හැදුවා. දැනට සාමාජිකාවන් 265 ක් ඉන්නවා. දැනට සමිති තුනක් තියෙනවා. හදිසි අවස්ථාවක දී මූල්‍යමය උදව් ලබා දෙනවා. මරණයකට රු 20,000/- යි. මාසික සාමාජික මුදල රු.50/- යි. අරමුදලේ උපදේශකයන් හැටියට යි අප කටයුතු කරන්නේ.

ඔවුන්ගේ සංස්කෘතික කටයුතුවලට උදව් කරනවා. වෘත්තිය ගැටලුවලට මැදිහත්වීම සඳහාත් ඉදිරියේදී කටයුතු කරනවා.

# ආදිවාසී ඇත්තන්ගේ නොනිවෙන ගින්න

පසුගිය දා ලෝක ආදිවාසී දිනය සමරනු ලැබුවේ අපේ ආදීවාසීන්ගේ දුග්ගැනවිලි වලට සාධාරණයක් ඉෂ්ට නොවූ වාතාවරණයක ය. රතුගල සහ පොල්ලෙබැද්ද ආදිවාසී ජනතාවගේ වත්මන් දිවිසැරිය පරපුරක ශෝකාන්තය කියාපානා සංකේතයක් වැන්න.

"අපේ පාසැලේ දරුවන්ට බීමට වතුර ගන්න තැනක් නැහැ. පහළ තියෙන ඇළෙන් තමයි වතුර බොන්නේ. ඒ වතුර ටිකවත් ෆිල්ටර් කරගන්න පහසුවක් නැති එක ලොකු අඩුවක්."

ගිනිමද්දහනේ ඉහින් කනින් බේරෙන ඩා බිඳු පිස දමමින් එසේ පැවසුවේ රතුගල ආදීවාසී කනිෂ්ට විදුහලෙහි සේවය කරන සුසන්ත ගුණරත්න මහතා ය. ආදිවාසී දරුවන් සඳහා 2007 සැප්තැම්බර් මස 04 වැනි දා ආරම්භ කරන ලද මෙහි දරුවන් 33 දෙනෙක් ඉගෙනුම ලබති. ප්‍රාථමික පන්ති පමණක් පැවැත්වෙන මේ විදුහලේ ප්‍රාථමික ගුරුවරයකු නොමැත. මඩුල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් රාජකාරි ලිපි බොහෝ විට පසු වී ලැබෙන හෙයින් විදුහලේ පරිපාලනය අවුල් වීම කෙරෙහි එය බලපා ඇත. එමෙන් ම දරිද්‍රතාව නිසා ම බොහෝ දරුවෝ අරලු, බුලු, නෙල්ලි, ගල් සියඹලා සහ කුඩුම්බේරිය කොළ සපයා ගැනීමට යති. මේ නිසා පැමිණීමේ ලේඛනය සතුටුදායක නැත.

මහදානිගල බණ්ඩාරලාගේ පරම්පරාවෙන් පැවත එන රතුගල ආදිවාසීන්ගේ මුල් පරම්පරා ජීවත් ව ඇත්තේ ගල්ලෙන්වල ය. ගල්ඔය ව්‍යාපාරය ආරම්භ කිරීමෙන් පසු ව මෙයින් පිරිසක් පොල්ලෙබැද්දට ද අනෙක් පිරිස රතුගලට ද සංක්‍රමණය වී ඇත. වත්මනෙහි රතුගල ජීවත් වන ආදිවාසී පවුල් සංඛ්‍යාව 101කි. රණසිංහ ප්‍රේමදාස යුගයෙහි ඔවුන් සඳහා නිවාස 20ක් තනා දී ඇත.

මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඇතැම් අයට ජයභූමි ඔප්පු ප්‍රදානය කර ඇති අතර ඇතැම් අය සඳහා ඉඩම් සංවර්ධන ආඥා පණත යටතේ බලපත්‍ර ලබා දී ඇත. ගොවිතැන් කිරීම සඳහා ඔවුන් පොළඹවනු ලැබුව ද වසරේ වැඩි කාලයක් නියඟයෙන් පීඩා විඳීම ජල සම්පාදන වැඩපිළිවෙළක් නොතිබීම හා ගොවිතැන කෙරෙහි ඔවුන් දක්වන මඳ උනන්දුව යනාදී හේතු මත ඔවුහු කෘෂිකාර්මික කටයුතුවලින් දුරස් වී සිටිති.

දීර්ඝකාලයක් තිස්සේ ඉදිරිපත් ව ඇති ආදිවාසීන්ගේ දුග්ගැනවිලි සලකා බලමින් 2008 අප්‍රේල් මස 12 වැනි දින ජනාධිපති ලේකම් කාර්යාලයේ දී පවත්වන ලද සාකච්ඡාව සඳහා ජනාධිපතිතුමාගේ ප්‍රමුඛත්වයෙන් උසස් නිලධාරීන් රැසක් සහභාගි වී ඇත.

එහිදී දඹානේ වන්නිල ඇත්තන් විසින් ආදී වාසීන් වෙනුවෙන් ප්‍රධාන ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කර තිබේ. ආදිවාසී ජනතාවගේ පාරම්පරික අනන්‍යතාව හා උරුමය සුරැකීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය, ආදිවාසී ගම්මාන ආශ්‍රිත ව පානීය හා වාරි ජලය සම්බන්ධ කටයුතු කිරීම, කෘෂිකාර්මික ජීවන රටාවට මුල්තැන දෙමින් ජීවන තත්වය නගා සිටුවීමේ නිශ්චිත වැඩපිළිවෙළක් ආරම්භ කිරීම, නිවාස අවශ්‍යතාව සපුරාලීම, ඉඩම් අහිමි වැදි ජනතාව සඳහා ඉඩම් ලබා දීම, ජාතික අනන්‍යතාව තහවුරු කිරීම, රක්ෂිත වනාන්තරවල ඇති පාරම්පරික පූජනීය ස්ථානවලට පුද පූජා කටයුතු සඳහා යාමට නිදහස ලබාදීම සහ ජාතික හැඳුනුම්පතේ ආදීවාසීන් බවට හඳුනා ගැනීමේ සලකුණක් භාවිතා කිරීම ඇතුළු ඉල්ලීම් 20ක් ඊට ඇතුළත් ය.

ඒ අනුව එහි දී බිබිල නිල්ගල අඩවියේ නිල්ගල බීට්ටුවේ වේවත්ත භූමියෙන් අක්කර 100ක් ලබා දීම ඇතුළු ව වැදගත් තීන්දු ගණනාවක් ගනු ලැබී ය.

"ගස් ටික කපලා ඉඩම දෙනවට අපි විරුද්ධයි. අපිට හුරු පුරුදු ජීවිතේ ගෙනියන්ඩ හිස් ඉඩමක පුළුවන් ද?"

රතුගල ආදිවාසී නායක සුදා වන්නියාලැත්තන්ගේ චෝදනාව බිබිල නිල්ගල වන අඩවි නිලධාරී ආර්.කේ. දයාරත්න මහතාට යොමු කළ විට ලැබුණු පිළිතුර මෙසේ ය.

"ඔවුන් මුලින් ඉල්ලා ඇත්තේ ගොවිතැන සඳහා අක්කර 100ක්. ඔය කියන ඉඩමේ අක්කර 100ක් නැහැ. 58යි තියෙන්නේ. බුද්ධදාස රජ්ජුරුවන්ගේ කාලයේ සිට පැවත එන සංරක්ෂිත වනාන්තරයක් පුද්ගලික ව පවරා දීම චකුලේඛවලට පටහැනියි. ගොවිතැන සඳහා වන සංරක්ෂණ කාර්යාලයෙන් ඉඩමක් නිදහස් කරනවා නම් එහි ගස් කපා ඉවත් කිරීමේ වගකීම රාජ්‍ය දැව සංස්ථාවට පැවරෙනවා. "

කෙසේ නමුත් ආදිවාසීන්ගේ ඉල්ලීම චකුලේඛවල හිර වූ ආකාරයක් පෙනේ. ආදිවාසීන් වගාවලට කැමැත්තක් නැති බවත්, ඔවුන් තම ඉඩම්වල ගස් කපා විකුණා දමා ඇති බවත් වන නිලධාරීහු චෝදනා කරති. මී සහ බමර කැඩීමත්, දඩයමත් පාරම්පරික ජීවන කර්මාන්තය කර ගත් පිරිසක් ගොවිතැන සඳහා අඩු උනන්දුවක් දැක්වීම අරුමයක් නොවේ.

දානිගල මහ බණ්ඩාරලාගේ පරම්පරාවට අයත් අනෙක් පිරිස ජීවත් වන පොල්ලෙබැද්දෙන් නැගෙන චෝදනා ද රතුගලට නොදෙවෙනි ය. දඩයම, මී කැඩීම සහ දඬුවැල් කපා ගැනීම සඳහා අක්කර 2500ක භූමියක් ඉල්ලා ඇතත් මේ වන විට එය ඉෂ්ට වී නොමැති බවට පොල්ලෙබැද්දේ ආදිවාසී නායක ගෝබා (අවු: 87) පවසයි. තමන්ට පාරම්පරික ජීවිතය අහිමි වී ඇති බවත්, ගොවිතැන සඳහා සුදුසු බිම් කඩක් හා ජල පහසුකම් නොමැති බවත් පොල්ලෙබැද්ද වැසියෝ කියති.

පොල්ලෙබැද්ද විදුහලෙහි ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 422කි. මෙයින් ආදිවාසී දරුවන්ගේ සංඛ්‍යාව 150ක් පමණ වේ. නිළ ඇඳුම්, පොත් පත් සහ දිවා ආහාර (5 පන්තිය දක්වා) ලබා දීමට කටයුතු කර ඇතත් 7, 8, පන්තිවලින් පසු ව බොහෝ දෙනෙකු පාසැලෙන් සමුගන්නා බව පොල්ලෙබැද්ද විදුහලේ විදුහල්පතිවරයා පවසයි.

විදුහලේ දරුවන්ට පමණක් නොව මුළු ගමට ම ජල ප්‍රශ්නය තදින් බලපා ඇති බවත් ප්‍රාදේශීය සභාවේ බවුසරයෙන් ලබා දෙන ජලය ප්‍රමාණවත් නොමැති බවත් බොහෝ දෙනා කියති.

රතුගල මෙන් ම පොල්ලෙබැද්ද ආදිවාසීන් මුහුණ දෙන එක ගැටලුවක් වන්නේ අනුපවුල් ද සමඟ පවුල් කීපයකට එක ම නිවසක පදිංචි වීමට සිදුව තිබීමයි. රතුගල ක්‍රියාත්මක වූ නිවාස වැඩසටහන මෙන් ම පොල්ලෙබැද්ද නිවාස වැඩ සටහන ද බරපතළ අඩුපාඩු සහිත ය.

ෆේරියල් අෂ්රෆ් ඇමතිවරියගේ මැදිහත්වීමෙන් නිවාස 20ක් ලබා දී ඇතත් ඉදිකිරීම්වල දී ඇති වූ විෂමතා නිසා ඇතැම් නිවාසවල ජනෙල් දොරවල් පවා නොමැති බවත් නිවාසලාභියෝ මැසිවිලි කියති.

"රඹකැන් ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනකොට අක්කර 1 1/2 බැගින් ඉඩම් ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම්තුමා කටයුතු යොදා තිබෙනවා. ඉඩම්වලට බලපත්‍ර සහ ඔප්පු ලබාදීම දැනටමත් ක්‍රියාත්මක

වෙනවා. මේ නිසා අනාගතයේ මීට වඩා යහපත් ප්‍රතිඵල ලැබේවි." මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරී සමන් බණ්ඩාර (අවු 32) මහතා පවසයි.

පොල්ලෙබැද්ද ආදිවාසී ජනතාව පිළිබඳ අත්දැකීම් රාශියක් ඇති මාධ්‍යවේදියකු වන සඳරුවන් ලොකුහේවා මහතා ප්‍රකාශ කරන්නේ ආදිවාසීන්ගේ ජීවන තත්වය නැංවීම සඳහා දීර්ඝකාලීන සැළසුමක් අවශ්‍ය වන බව ය. ගොවිතැනට දක්වන අඩු නැඹුරුව නිසා ඉඩම් ලබාදීමට වඩා වැදගත් වන්නේ වෘත්තීය පුහුණුවක් ලබා දීම බව ඔහුගේ අදහසයි.

"මත් ද්‍රව්‍යවලට, ලිංගික සේවා සැපයීමට, මුස්ලිම් අයට හරක් බ්‍රෝකර්කම් කිරීමට ඇතැම් තරුණ අය පෙළඹී සිටීම කණගාටුවට කරුණක්. සමාජීය වශයෙන් ඔවුන් හුදෙකලා කරනු ලැබීම මීට එක් හේතුවක්." සඳරුවන් ලොකුහේවා මහතා පවසන්නේ ඔවුන් පිළිබඳ උපන් වේදනාවෙන් යුක්ත ව ය.

අම්පාර සහ මොණරාගල දිස්ත්‍රික්කවලත් මහියංගනයත්, පොලොන්නරු දිස්ත්‍රික්කයෙහි දකුණු පෙදෙසත් අයත් වන 'වැදිරට' යනු ආර්යයන් මෙහි පැමිණීමට පෙර සිට ම ආදිවාසීන් ජීවත් වූ ප්‍රදේශය බවට පිළිගැනේ. නිල්ගල දකුණ සහ සීතල වන්නියේ ආදිවාසීන් ලක්දිව පුරාණ වැසියන්ගේ ශේෂ මාත්‍රයක් දක්වන බව මහාචාර්ය විල්හෙල්ම් ගයිගර් සිංහල භාෂා ව්‍යාකරණය පොතෙහි දක්වයි. ආදිවාසී පරපුර නිල්ගල වනගහනය ඇසුරේ තම ආවේණික ජීවිතය පවත්වා ගෙන ගිය ආකාරය 1863 බේලිගේ වාර්තාවක දැක්වේ. ඉන්පසුව ආදිවාසීන් පිළිබඳ අධ්‍යයනය කර ඇත්තේ මහාචාර්ය සෙලිග්මාන් ය. සෙලිග්මාන්ගේ සංචාරයෙන් වසර 10කට පසු ව දොස්තර ආර්. එල්. ස්පිටල් සීතල වන්නියේ ආදිවාසීන්ට ප්‍රතිකාර කිරීම සඳහා ගිය ගමන කෙළවර වූයේ ඔහු ඔවුන්ගේ දුග්ගන්නාරාළ කෙනෙකු බවට පත්වීමෙනි.

"ස්පිටල් හුරා තමයි පවුල් 6ක් විතර මෙහෙට ගෙනාවේ. උන්නැහෙගෙං පස්සෙ කවුරුවත් ඒ තරමට අපි ගැන බැලුවේ නෑ."

තලා බණ්ඩාරලාගේ ගුණවර්ධන පවසනුයේ ගෞරවයෙනි.

"ස්පිටල් හුරාට අපි මුණ ගැහෙන කොට අපේ තුන්දෙනෙකුට පරංගි ලෙඩේ හැදිලා හිටියෙ. ඒ කාලේ ඉස්පිරිතාල නැහැනෙ. අපේ දෙන්නෙක් මැරුණා. ස්පිටල් හුරා අපි ගමට එක්කගෙන ආවා. මගෙ කටේ දත් වැටෙන කාලේ ආවේ. මගෙ මාමා පොරමල් සකා. එයා මැරුණට පස්සෙ මට නායකකම ලැබුණා. මට දැන් ඇස් පේන්නේ නෑ. මං ඉන්න තත්වෙ අනුව මට උදව් කරන්න, මාව එක්ක යන්න ලොකු ලොකු අය ආවා. එත් මගෙ මිනිස්සු දාලා යන්ඩ මට බෑ."

පොල්ලෙබැද්දෙ ආදිවාසී නායක ගෝබා එසේ පවසනුයේ තම අතීත උරුමයත්, රැහේ උන්ගේ වේදනාවත් නිසා පරිපීඩිත වූ හදින් යුතු ව ය.

රතුගල ආදිවාසී නායකයා ව සිටි රන්දුනු වන්නියා මීට වසර කීපයකට පෙර මියගියේ පිළිකා රෝගයෙනි. එහෙත් බොහෝ විට රාත්‍රියට පමණක් අහර ටිකක් බුක්ති විඳීමේ අවස්ථාව ලැබුණු ඔහු මෙන් ම රැහේ බොහෝ දෙනෙකු සිටියේ කුසගින්නේ ය. පොරමල් සකා මියගියේ ද කුසගින්නේ ය. ඒ කුසගින්න තවමත් අභිමන් සිඳී නොගිය ගෝබාගේ සිරුර ද දවාලයි. රැහේ ඇත්තන්ගේ කුසගින්න ඔහුගේ හදවත දවාලයි. දඩමස්, මී පැණි සහ අලවර්ග යනු ගල්ලෙන්වල සිටිය දී ඔවුන්ගේ ප්‍රධාන ආහාරය යි. වත්මනෙහි බඩ ඉරිඟු තලප, කුරක්කන් තලප සහ බත්වලට එම ස්ථානය හිමි ව ඇත.

පැණි මාලු (මී පැණි සහ මස්) ඔවුන්ගේ ආහාර සංස්කෘතියෙන් සමුගෙන සිටී. එහෙත් අවාසනාව වී ඇත්තේ අල්ලපු වත්තත් පයගහපු වත්තත් යන දෙක ම නැති වන තැනට කරුණු යෙදී තිබීම ය. නිල්ගල වනයෙහි මී කැඩීමට යන ආදිවාසීන්ට නීතිය හරස් වේ. දුනු ඊතල විශ්‍රාම ලබා ඇත. බීඩි නිෂ්පාදනය සඳහා කුඩුම්බේරිය කොළ කඩා විකිණීමත්, ගල් සියඹලා කඩා විකිණීමත් සුලබ ය. දුනු ඊතල පැල්පත්වල විශ්‍රාම ගෙන සිටින අතරතුර බූරු සපත්තු ඇඳගත් ඊ පනස් හය දැරූ අය අතින් නිල්ගල වනගහනයෙහි දඩයම් සිදු කෙරෙන බවත් ආදිවාසීන්ට බලපාන නීති ඔවුන්ට බල නොපා ඇති බවත් පෙනේ.

ජෛව විවිධත්වයෙන් පොහොසත් වනගහනය සංරක්ෂණය කිරීමත් භූමියේ උරුමක්කාරයන් වූ ආදිවාසීන්ගේ චිර ජීවනය සහතික කිරීමත් කළ හැකි මාවතක් තනා ගැනීම අද දවසේ අභියෝගය යි. කුසගින්න සහ ආත්මීය වේදනාව පරාජය කළ යුතු වුව ද පරපුරක අභිමානය නිගරුවට ලක් කිරීම අමානුෂික ය.

අපේ ඇත්තන්ට නිදහස ඕනෑ

ආදිවාසී නායක වන්නියලැත්තෝ - (දඹාන නිවසේ දී)

දිය මත සිටි අය ගොඩට දාලා ජීවත් වෙන්න කියලා කිව්වම ජීවත් වෙන්න පුළුවන් ද? ඒ අය ඉස්සර කුඹුරු කරලා නෑ. වගා කරලා නෑ. ඒ නිසා අමාරුයි ජීවත් වෙන්න. මේ අයගේ සිරිත් අරගෙන යන්න නම් කැලෑ තියෙන්න ඕනි. කැලේ යන්න නිදහස තියෙන්න ඕනි. කැලෑවට යන්න තහනම්. දඩයම් කරන්න තහනම්. බෙහෙත් සොයන්න යන්න තහනම්. නීති දාලා, පහසුකම් දීලා පරම්පරාව අරගෙන යන්න කියලා කිව්වට වෙන්නෙ නැහැ. මම හිතනවා අක්කර 100 කියල හිතන්නේ කොටු කරපු සීමාවක්. එතැන පරම්පරාවක් ගෙනියන්න බැහැ. ආදිවාසීන්ට සීමා කළ කොටසක ජීවත් වෙන්න බැහැ. ඒ අයට නිදහස දෙන්න ඕනි ජීවත් වෙන්න. එහෙම නිදහස දුන්නොත් ආණ්ඩුවටත් ප්‍රශ්න අඩුවෙනවා."

ඉඩම් නිදහස් කර නෑ.

මඩුගල්ල ප්‍රාදේශිය ලේකම් - එම්.ජේ.ඒ. තිලකරත්න

"රතුගල ආදිවාසීන්ගේ වගා කටයුතු වෙනුවෙන් ගොවිපළක් සඳහා අක්කර 10ක භූමි ප්‍රමාණයක් රතුගලින් දීලා තියෙනවා. කෘෂිකාර්මික කටයුතු සඳහා අක්කර 100ක් ලබා දීමේ යෝජනාව ක්‍රියාත්මක වෙලා නෑ. වන සම්පත් දෙපාර්තමේන්තුව ඉඩම් නිදහස් කර නෑ."

සුදුහූරාගෙන් පස්සේ මේ හූරායි වැඩ කළේ.

විමලවීර දිසානායක නැගෙනහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා ඉඩම් අමාත්‍ය

"රඹකැන් ඔය ව්‍යාපෘතිය යටතේ අනෙක් මිනිසුන්ට ලැබෙන වරප්‍රසාද ආදිවාසීන්ටත් ලැබෙන විදියටයි අපි කටයුතු කරන්නේ. ආදිවාසීන්ගේ ප්‍රශ්න ගැන මුලින් ම හොයලා බැලුවේ දොස්තර ස්පිටල්. ඔවුන්ගේ මූලික ප්‍රශ්නේ ආහාර බවයි ඔහු හඳුනා ගත්තේ. සුදු හූරාගෙන් පස්සේ අපි ගැන හොයලා බැලුවේ මේ හූරා තමයි කියලයි ආදිවාසීන් මං ගැන කියන්නේ. පොල්ලෙබැද්දෙ කයිරාගේ අවමඟුල තිබ්බෙ විදුලි ආලෝකය මැද්දේ. පොල්ලෙබැද්දෙ කිරි ව්‍යාපෘතියෙන් මාසෙකට ලක්ෂ ගාණක ආදායමක් ගමට යනවා.

ඔවුන්ට පාරවල් හදලා දුන්නා, බස් දාලා දුන්නා. මේ මොනවා කළත් ඔවුන් සාමාන්‍ය තත්වයට ගන්න එක එච්චර ලේසි නෑ. ඒක මුළු ලෝකෙම තියෙන ප්‍රශ්නයක්. පොල්ලෙබැද්දෙ ළමයින්ට තියෙන ජල ප්‍රශ්නය ඒ පළාතට ම ආවේණික ප්‍රශ්නයක්. ඒත් මම ළිං හදලා දුන්නා. ඇත්තටම මගේ ගමටවත් මම ඒ තරම් වැඩ කරලා නෑ."

# බෙර හදන්නන්ගේ ජීවිත නොහැදීම

"අපේ මුළු ගම ම ජීවත් වුණේ බෙර කර්මාන්තයෙන්. ඒත් එදා අපි කොච්චර කැප වෙලා මේක කළත් අද අලෙවි කර ගැනීමේ ප්‍රශ්න මතු වෙලා. අධ්‍යාපන දෙපාර්තමේන්තුවට මිල දී ගන්නෙත් අතරමැදියන් හරහා. අපට ලැබෙන්නේ සුළු මුදලක්. මේක හරිම අපරාධයක් "

ශ්‍රී ලංකාවේ පාරම්පරික බෙර නිෂ්පාදන ගම්මානයක් වන කූරගම (හඟුරන්කෙත කෙට්ඨාසයට අයත්) පදිංචිකරුවෙකු වන එස්. ජයසිංහ (අවු 32) ගේ උක්ත ප්‍රකාශය පාරම්පරික කලාවන් අභාවයට යෑමට බලපා ඇති එක් ප්‍රධාන හේතුවක් පිළිබඳ ප්‍රබල සංඥාවක් සපය යි.

කූරගල ගම්මානයේ පවුල් 22 කට අයත් සාමාජිකයෝ බෙර නිෂ්පාදනයෙහි නියැලී සිටිති. නිමැවුම අවසානය දක්වා සෑම අයෙකුගේ ම දායකත්වය ලැබී තිබීම එහි විශේෂත්වයකි.

මුල්ම අවධියේ දී අඬ බෙරය ඔවුන් අතින් නිර්මාණය කෙරිණ. පසු කාලයේ ඔවුන් තම ශිල්පීය කුසලතා ප්‍රගුණ කර ගැනීම අනුව දවුල, තම්මැට්ටම, ගැටබෙරය, යක් බෙරය, තබ්ලා සහ ඩොලැක්කි යනාදී සියලු භාණ්ඩ නිෂ්පාදනය කරන ගම්මානයක් හැටියට කූරගල සිරිලක පරසිදු විය. මුල් කාලයෙහි දී බෙර කඳ පිත්තලෙන් නිමවා දෙපැත්තට පස්ලෝ භාවිත කර ඇත. පසුව ඇසල සහ කොහොඹ කඳන්වලින් බෙර කඳ සකස් කර ඇත. එහෙත් දැව සපයා ගැනීමේ දුෂ්කරතාව මත කොස්, පොල් සහ ගිනිසපු යනාදී දැව වර්ග භාවිතයට ඔවුන් පෙළඹී ඇත. නීතිමය හා වෙනත් ගැටලු නිසා ඊට ද බාධා පැමිණ ඇත. බෙර කඳ කපා මසක් පමණ වේළා ගත යුතුය. බෙර කඳෙහි කුහර හාරා මට්ටම්කර වම් පැත්තට හරක් සමක් ද දකුණ පැත්තට වඳුරු සමක් ද සවි කිරීම එවක සම්ප්‍රදාය විය. එහෙත් මේ වන විට වම් පැත්තට බොහෝ විට භාවිත කරනු ලබන්නේ එළු සමකි.

අධ්‍යාපන අමාත්‍යංශයට අවශ්‍ය ඇණවුම් ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම්වරයාට දැනුම් දී අවසරය ලැබීමෙන් පසු දැව සපයා ගැනීම සිදුවේ. 'හන්කඩ' සැපයීමේ පිරිස් වෙනම සිටිති.

" ඉස්සර නම් අවුරුද්දකට වතාවක් අපට ඕඩර් එක ලැබෙනවා. දැන් අවුරුදු දෙකකින් විතර අපේ බඩු අරගෙන නැහැ. අපිත් ටෙන්ඩර් දානවා. අපි ඉදිරිපත් කරන්නේ හොඳම තත්ත්වයේ භාණ්ඩ. කොස් ලීයෙන් කරන බෙරයක් රු 7000/ ක් විතර වෙනවා. නමුත් මේ ගැන නොසිතා අඩුම්ලට ටෙන්ඩර් දාන අය අපට ඇවිත් කියනවා අඩු ගාණට හදලා දෙන්න. ඉතින් කල් පැවැත්ම නොසිතා අඩු මිලට හදලා දෙනවා. අපි වග නොකියන බවත් කියනවා. ටික කලකින් මේවා දිරලා යනවා."

බෙර නිෂ්පාදනයෙහි ප්‍රමිතිය හා ආර්ථික වටිනාකම් තීන්දුවන ආකාරය පිළිබඳව කූරගල වැඩිහිටියකු කළ එම ප්‍රකාශය බරපතළය.

ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව බෙර නිෂ්පාදනය සඳහා දායක වනු පෙනේ. පිරිමියා බෙර කොටය රහිත විට ගැහැණිය අතින් බෙර කොටය හෑරීම සිදුවේ. එක් බෙර කොටසක් හෑරීමේ කුලිය රු 100/- ත් 200/- ත් අතර වේ. සමහර ආයතන වලට බෙර සැපයීමෙන් පසුව ඊට අදාළ ගෙවීම් ලබා ගැනීම ද දුෂ්කර ය. බොහෝ විට මුදල් ලබාදීම සිදුවනුයේ චෙක්පත් මගිනි. චෙක් පතක් ලබා ගැනීම සඳහා කිහිපවරක් අදාළ ආයතනවලට යන්නට සිදුවීම නිසා කාලයත්, ශ්‍රමයත්, මුදලුත් අපතේ යවන්නට සිදු වී ඇති බව ද ඔවුන් ගෙන් එල්ලවන චෝදනාවකි.

" ලක්සල වාගේ ආයතනවලින් මුදල් ලැබෙන්නේ දෙතුන් සැරයකට. මගටයි, අතරමැදියන්ටයි, කුලියයි ගියා ම ලාබයක් ඉතිරි වන්නේ නැහැ." කූරගල ප්‍රේමරත්න පවසයි.

කූරගල පදිංචි රීටා රත්නායක (අවු 50) දවසේ අනෙකුත් කටයුතු අතරතුර ලැබෙන කාලයේ දී බෙර කඳන් හෑරීම සිදු කරයි. "මේක හරිම දුෂ්කර වැඩක්. ලීයෙන් ලීය වෙනස්. හාරන්න යන වේලාව වෙනස්. දැන් දැන් ලී සපයා ගැනීමත් දුෂ්කර යි. දවසකට තුනක් විතර හාරපු අයට දැන් වැඩ ලැබෙන්නේ අඩුවෙන්." ඈය පවසයි.

කූරගල පදිංචි කේ. ජයපාල (අවු 55) බෙර නිෂ්පාදනයෙන් ජාතික මට්ටමේ සම්මාන දිනූ අති දක්ෂ ශිල්පියෙකි. එහෙත් ශිල්පයට දක්වන අගෞරවයත් ජීවත්වීමට ප්‍රමාණවත් ආදායමක් උපදවා ගැනීමේ දුෂ්කරතාවත් මත තම දරුවන්ද බෙර නිෂ්පාදනයෙන් ඉවත් වෙමින් සිටින බව ඔහු පවසයි.

" කර්මාන්තය කරන්නේ අපි. ටෙන්ඩර් ගන්නේ බිස්නස් කාරයෝ. අපි යෝජනා කරන්නේ කෙළින් ම අපෙන් භාණ්ඩ මිළ දී ගැනීමේ ක්‍රමයක් තිබිය යුතු බවට යි. එහෙම උනොත් කූරගල ගමේ අයට ආත්ම ගෞරවයක් ඇතිව ජීවත්වන්න පුළුවනි. මගේ තාත්තා අවු 45 ක් බෙර නිෂ්පාදනය කළා. අන්තිමේට කලකිරීම විතරයි ඉතුරු වුණේ." කූරගල එස් ජයසිංහ (අවු 32 ) ගේ ප්‍රකාශය සාම්ප්‍රදායික බෙර නිෂ්පාදනකරුවන්ගේ ආත්ම විලාපයක් වැන්න.

"සුගතා විධානං ත්‍රෛලෝක්‍ය ශ්‍රේෂ්ඨං

රජ රාජ රජ්ජිත්

දෘඩවීඩ තොන්නං

තත් ජිත් කිනම් තකට ජෙංතරිම තක්කිනම්

දේවාති දේවං වන්දාමි බුද්ධං"

විශ්ව කර්මයා බුදුහිමියන්ට කළගුණ ගායනයෙන් බෙරවාදනය පටන් ගැනීම පෙර සිරිත විය. අදටද ඒ සිරිත ඒ ලෙසම පවත්වාගෙන යෑමට බෙරවාද්‍ය ශිල්පියෝ උත්සාහ දරති.

" අපේ පරම්පරාවල අය බෙරය දෙවියකු විදියට සැලකුවේ. ඒ නිසාම බෙර වයන අයටත් ගෞරවයක් තිබුණා. බෙර හදන අයත් මේක කළේ ගෞරවයක් හැටියට. ඒත් අද පවතින ජීවන ගැටලුත් එක්ක බෙරවාදන ශිල්පීන් සහ බෙර හදන අයත් බොහොම අතෘප්තියෙන් ජීවත්වන්නේ. අපේ ගුරු පරම්පරාවල් නැති වෙනවා. ශාස්ත්‍රයත් ශිල්පීනුත් නැතිවීම වළක්වා ගත යුතුයි."

විශිෂ්ටතම ගැට බෙර වාදකයා හැටියට කිහිපවිටක් ම සම්මාන ලබා ඇති, දළදා පෙරහැරේ බෙරවාද්‍ය ශිල්පියෙකු වන රන්නාඩිගෙදර(ආර්.ජී.) ප්‍රේමදාස ගේ මේ ප්‍රකාශය වගකිව යුත්තන්ගේ ඇස් ඇරවන බලගතු එකකි.

උසස් සාම්ප්‍රදායික කලාවක් හැටියට සිරිලක නාමය ලොව පුරා ගෙන යෑමට සමත් වූ බෙර වාද්‍ය මේ තිරෙන් පිටුපස සිටින බෙර නිෂ්පාදකයන්ගේ කැපවීමට නිසි ගෞරවයක් හා ඇගයීමක් සමඟ ආර්ථික ස්ථාවරභාවයකුත් ලැබිය යුතු බවට අපි අවධාරණය කරමු.

## සාම්ප්‍රදායික ශිල්පීන්  බෙර නිෂ්පාදනයෙන් ඉවත් වීම කණගාටුදායකයි

**මහාචාර්ය තිස්ස කාරියවසම්**

දේශීය කලාකරුවන් බෙර නිෂ්පාදනය කළේ සාම්ප්‍රදායික මිමි එනම්, ක්‍රමවේදයකට අනුවයි. ඒ දැනුම දැනට තිබෙන්නේ ස්වල්ප දෙනෙකු අතරයි.

සාම්ප්‍රදායික බෙර ගම්මානවල වුණත් දැන් ඒවා නිෂ්පාදනය කරන්නේ වානිජ වටිනාකම සිතීමෙන්. නමුත්, සාම්ප්‍රදායික බෙරය' අඬ ඉර' තැබීමෙන්  නිෂ්පාදනය කළේ එහි නිශ්චිත සියුම් නාද මතුවන පරිද්දෙන්. ශිෂ්‍යයන්ට සරඹ පුරුදු කරන විට බෙරයේ ඇත්ත හඬ ඇහෙන්න සලස්වන්නේ නැහැ.දෙපැත්ත සුදු රෙදිවලින් වහනවා. සරඹ කරන්නේ ඇඟිලි හුරු කරන්න. බෙරයේ සැබෑ නාද මුලින්ම ඇහුණොත් ශිෂ්‍යයන්ගේ කන ඊට හුරුවීම නිසා ඇඟිලි හුරු වීම වැළකෙනවා. මෙයින් පෙනෙනවා බෙර නිෂ්පාදනය සහ එහි නාද මතු කිරීම කොතරම් සියුම් කාලවක්ද කියන එක. ටෙන්ඩර් පටිපාටි අනුව තෝරාගත් අඩු මිලට නිෂ්පාදනය කළ බාල ගණයේ බෙර අධ්‍යාන ආයතනවලට ලැබීමෙන් සිදු වන්නේ දරුවන්ට බෙර වාදනය නම් වූ සියුම් කලාව ප්‍රගුණ කිරීමේ අවස්ථාව අහිමි වී යෑමයි. මේ තත්වය අනුව බෙර නිෂ්පාදනයේ යෙදෙන සාම්ප්‍රදායික ශිල්පීන් වානිජ ප්‍රවාහයට එක් නොවී බෙර නිෂ්පාදනය අතහැර දැමීමේ ප්‍රවණතාවක් දක්නට ලැබීම කණගාටුවට කරුණක්.

# ලාක්ෂා ශිල්පීන්ට ජීවය පිඹීම

"මේ වෙන කොට ලාක්ෂා කර්මාන්තයෙහි යෙදුණු බොහෝ දෙනෙක් ඒක අත ඇරලා කුලී වැඩ වලට ගිහින්. නිෂ්පාදන අලෙවිය අඩු වීම නිසා ආදායම අඩුයි."

ලාක්ෂා .කර්මාන්තයට ප්‍රසිද්ධ ව තිබූ මාතලේ ලෑලි අඹේ පදිංචි ජගත් විජේරත්න එසේ පවසයි. ඔහු හස්ත කාර්මාන්ත පුහුණු මධ්‍යස්ථානයේ ලාක්ෂා පුහුණුකරු හැටියට කටයුතු කරයි. ලෑලි අඹේ ගම්මානයෙහි ජීවත්වන පවුල් 320 න් 250 ක් ම ලාක්ෂා කර්මාත්තයෙහි යෙදුණු පාරම්පරික පවුල් වලින් පැවති එයි. ලාක්ෂා සඳහා යොදා ගන්නා ගස් කැපීමේ සිට නිෂ්පාදන වෙළෙඳ පොළට යැවීම දක්වා සියලු කටයුතු සිදු කෙරුණේ ඔවුන් අතිනි.

එහෙත් ලෑලි අඹේ ගමෙහි ලාක්ෂා නිෂ්පාදන සඳහා වෙනදා තරම් ඇණවුම් නොලැබෙන බවත් රජයේ මැදිහත්වීමෙන් යැපෙන්නට සිදු ව ඇති බවත් එහි පදිංචි ලාක්ෂාකරුවෝ චෝදනා කරති.

"ඉස්සර ටුවරිස්ට්ලා ආවා. පාරවල් අබලන් නිසා දැන් ඔවුන් පැමිණෙන්නේ නැහැ. ඒවා හැදීමේ වැඩ පිළිවෙළක් නැහැ. හෝටල්වලින් ඇණවුම් ඉඳහිට ලැබෙනවා. ඒකත් ප්‍රමාණවත් නැහැ. ජගත් විජේරත්න වැඩි දුරටත් පවසයි.

#### අමුද්‍රව්‍ය සපයා ගැනීම

මේ සඳහා භාවිතයට ගනු ලබන්නේ ගංසූරිය සහ සපු ශාකයයි. ලීයේ පොතු ඉවත් කර පවනේ වේළෙන්නට හරිනු ලැබේ. ඉන්පසු නිෂ්පාදන භාණ්ඩයට අනුව ලියවන පට්ටලයෙන් ලියවා වැලි කඩදාසියෙන් කපා පදම් කර ගනිති. වර්ණ ගැන්වීම සඳහා පත්‍ර යුෂ සහ ලාම්පු දැලි යනාදිය භාවිතයට ගනු ලැබූවත් වත්මනයෙහි ඉන්දියාවෙන් ආනයනය කෙරුණු ඩයි වර්ග භාවිතයට ගනිති. ලාකඩ ලබා ගෙන ඇත්තේ ලාක්ෂා කෘමියාගෙනි. ලාක්ෂා උචිත ගස්වල බෝ කිරීමෙන් ලාකඩ ලබා ගෙන ඇත. එහෙත් වර්තමානයේදී සැලැක් (ලාකඩ) ඉන්දියාවෙන් ගෙන්වීමේදී කිලෝවකට රු. 2600 ක් වැය කිරීමට සිදු තිබේ. ඩයිවල මිල රු. 6000 ක් 8000 ක් අතර වෙයි. ලාකඩ සහ ඩයි මිල අඩු වන්නේ නම් වෙළඳ පොළේ ඇති ලාකඩ නිර්මාණ වල මිල මීට වඩා අඩු වන බව ලෑලි අඹේ ලාක්ෂා නිර්මාණකරුවන්ගේ අදහසයි. සියවස් දෙකකට පමණ ඉහත ලාක්ෂා කර්මාන්තයට අවශ්‍ය සියලු අමුද්‍රව්‍ය දේශීය වශයෙන් සපයාගෙන ඇත. ඒ නිසා වැය පාර්ශ්වය අවම විය.

දැව සපයා ගැනීමේ දුෂ්කරතාව එන්න එන්න ම උග්‍ර වන තත්වයක් ද දිස් වේ.

" පහසුවෙන් දැව සපයා ගැනීම සඳහා තිබෙන බාධා ඉවත්කරන්නැයි ප්‍රාදේශීය ලේකම්වරයා හරහා ආයෝජනය මණ්ඩලයෙන් අප ඉල්ලීමක් කර තිබෙනවා. ඔවුන් අපට බල පත්‍ර ලබා දී තිබෙන්නේ මාස හයකට වරක් ගස් කපා ගත හැකි වන පරිදිය. එකවර එහෙම ගස් කැපුවම දීරලා යනවා. අවශ්‍ය වන ගස් ප්‍රමාණය, වට ප්‍රමාණය සහ උස තීන්දු වන්නේ ලැබෙන ඇණවුම අනුව යි. එනිසා ගස් කැපීම ගැන කල් තියා තීන්දු ගන්න බැහැ. මේ විදියට පවතින නීති රීති කර්මාන්තයට බාධාවයක් වෙලා."

ලෑලි අඹේ පදිංචි නිමල් කරුණාරත්න පවත්නා ප්‍රායෝගික ගැටලු ගැන ද එසේ පවසයි.

ලෑලි අඹේ පදිංචි ඩී.බී.ජී දේවේන්ද්‍ර ( අවු. 57යි) සමෘද්ධිලාභියෙකි. සමෘද්ධි බැංකුවෙන් ලබා ගත් ණය මුදලක ආධාරයෙන් ඔහු තම කර්මාන්තය පවත්වාගෙන යෑමට උත්සාහ කරයි.

"පෞද්ගලික ගැණුම්කරුවන් හරහා ඉතා සුළුවෙන් මේ ව්‍යාපාරය පවත්වාගෙන යනවා. උණ වේරුව ගමේ සේසත් හදන පවුල් කිහිපයකට මම සේසත් මිට් හදලා දෙනවා. ඊට අමතරව මහනුවර වෙළෙඳසැල් කිහිපයකටත් සපයනවා. අවශ්‍ය පහසුකම් සැපයෙනවා නම් පවුලේ අයත් සමඟ මේ ව්‍යාපාරය දියුණු කරන්න මට පුළුවනි."

දේවේන්ද්‍ර අධිෂ්ඨානශීලීව පවසයි.

ලාක්ෂා කර්මාන්තය, හස්ත කර්මාන්ත යටතේ සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශය යටතට පැවරේ. මෙහිදී හස්ත කර්මාන්ත සුරැකීම, සංවර්ධනය කිරීම, එහි ගුණාත්මකභාවය සංවර්ධනය කිරීම සහ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ සුබසාධනය යනාදි කටයුතු සඳහා ජාතික ශිල්ප සභාව ස්ථාපිත කර තිබේ. හස්ත කර්මාන්ත සම්බන්ධ අධ්‍යාපනය විශ්ව විද්‍යාල මට්ටමට ගෙන ඒම යුගයේ අවශ්‍යතාවයක් බව ජාතික ශිල්ප සභාවේ අධ්‍යක්ෂ දේශබන්ධු බුද්ධි කීර්තිසේන පවසයි. විධිමත් අධ්‍යාපන ක්‍රමයක් ඔස්සේ එහි ඇති වෘත්තිය මට්ටම නැංවිය හැකි බව ඔහුගේ අදහසයි.

ලාක්ෂා ශිල්පීන් පුහුණුව සඳහා පුහුණු මධ්‍යස්ථානයක් හැටියට මා උස්සාගොල්ල පොදු සමිති ශාලාව නවීකරණයට පියවර ගෙන ඇති බවත් ඇණවුම්කරණය සහ මිලකරණය සම්බන්ධයෙන් ලාක්ෂා ශිල්පීන්ට පුහුණුවක් ලබා දෙන බවත් මධ්‍යම පළාත් සභාවේ හස්ත කර්මාන්ත අංශයේ තක්ෂිලා මිය පවසයි.

සේසත් සහ අබරණ පෙට්ටි යනාදී වශයෙන් විවිධ කැටයම් වලින් සහ නෙක වර්ණවලින් අලංකෘතව ජන දිවිය සුවපත් කරවන අගනා නිර්මාණ සම්භාරයක් ලාක්ෂා ශිල්පීන් විසින් ප්‍රදානය කරනු ලබයි. පැරණි කලා සම්ප්‍රදායන් රැසක් සුරක්ෂිත ව පවතින මහනුවර සහ මාතලේ ප්‍රදේශ ආශ්‍රිතව ලාක්ෂා කර්මාන්තය විවිධ හැලහැප්පීම්වලට ලක් වෙමින් ආරක්ෂිත ව පවතී. එහෙත් එම ශිල්පීන් සහ අගනා නිර්මාණ සම්ප්‍රදාය නොනසා අනාගතය සඳහා ආරක්ෂා කර ගත හැක්කේ පැන නැගී ඇති ගැටලු පැලවන්නනට ඉඩ නොහැර පිළියම් යෙදුව හොත් පමණි.

**ශිල්පීන් 20000 ක් ලියාපදිංචියි**

**ජාතික ශිල්ප සභාවේ අධ්‍යක්ෂ**
**බුද්ධි කීර්තිසේන**

දැව කපන එක පරිසර හානියක්. ඒත් දැව නැතිව කර්මාන්තය කරන්න බැහැ. අප ළඟ ලියාපදිංචි අයට දැව සංස්ථාව හරහා දැව ලබා ගැනීමට අවස්ථාව දෙනවා. දැනට 20000 ක් ලියාපදිංචි වෙනවා.

අපි ඔවුන්ට හැදුනුම්පත් ලබා දෙනවා. අලෙවිය සඳහා ප්‍රදර්ශන පොළවල් සංවිධානය කරනවා. අපේ වෙළෙඳ කුටි වලත් අවස්ථාව තියෙනවා. කෙලින්ම පාරිභෝගිකයයි නිෂ්පාදකයයි අතර සම්බන්ධතාවක් ඇති කිරීමයි අපේ උත්සාසය. ශිල්ප ගම්මානයේ වෙළෙඳ කුටි වලදී ශිල්පීන්ගෙන් පොඩි මුදලක් අය කරන්නේ එහි සේවකයන් නඩත්තු කිරීම සඳහා. ජාත්‍යන්තර වෙළෙඳපොලවල් සඳහා ශිල්පීන් යොමු කිරීමටත් අපි උත්සාහ කරනවා.

**අතරමැදියන් නවත්වමු.**

**ජාතික ශිල්ප සභාවේ මධ්‍ය පළාත් භාර නිලධාරී**
**නිශාන්ත විජේරත්න**

අතරමැදියන්ගෙන් මිදී කෙලින්ම ශිල්පියාගෙන් භාණ්ඩ මිලදී ගැනීමයි අපේ අරමුණ. ගුරු ශිල්පී පුහුණු ව්‍යාපෘතිය , වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම සහ පුහුණු පාඨමාලා පැවැත්වීම ඔස්සේ ලාක්ෂා කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා පියවර ගෙන තිබෙනවා. මේ කර්මාන්තය සඳහා සමාජයේ පිළිගැනීමක් ලැබෙන විට අලුතින් අයත් ක්ෂේත්‍රයට පැමිණේවි. සංචාරක කර්මාන්තයේ දියුණුවත් සමඟ අනාගතයේ හොඳ වෙළෙඳ පොළක් බලාපොරොත්තු විය හැකිය.

# තවම අවසන් නොවූ සුනාමි සෝ සුසුම්

"සුනාමියට කලින් මහජන පොළේ එළවළු කඩයක් තිබුණා. ගෙදර තිබුණෙත් එතනමයි. සුනාමියට ඔක්කොම විනාශ උනා. ගෙවල් හම්බ උනේ කිලෝමීටර හයක් ඈතුළෙන්. දැන් කරත්තෙකින් එළවළු විකුණනවා. පොලීසියන් අල්ලගත්තොත් රු.2500 ක් දඩ ගහනවා. දැන් අපට ජීවත් වෙන්න විදියක් නෑ."

සුනාමියෙන් රටට එල්ල වූ අභියෝගයට සාර්ථකව ජය ගෙන ඇතැයි පුරසාරම් දොඩන්නවුන් බහුල අවධියක මේ අභියෝගය එල්ල කරන්නේ ගාල්ල කොටුව අසල එළවළු වෙළඳාමෙහි නියුක්ත ව සිටින ජී.කේ. ප්‍රේමසිරි ය. සුනාමිය ඔහුට අහිමි කළේ උන්හිටි තැන් සහ ජීවනෝපාය පමණක් නොවේ. තම බිරිය හා එක ම දරුවා ද රළ පහර විසින් බිළිගත් අයුරු තවමත් ඔහු සිහි කරන්නේ ශෝකයෙනි. මහජන පොළේ වෙළඳාමෙන් ජීවත් වූ ප්‍රේමසිරි ඇතුළු බොහෝ දෙනෙකුට නිවාස හිමි වූයේ වලහන්දූව ප්‍රදේශයෙනි. එහෙත් ජීවිකාව සපයා ගැනීමට සිදු ව ඇත්තේ නගරයට පැමිණීමෙනි. නගරය නවීකරණය කිරීමෙහි දී ප්‍රේමසිරි ඇතුළු බොහෝ දෙනකුට තම ජීවිකාව අහිමි විය. රු. 10000 ක් වැය කොට එළවළු විකිණීම සඳහා අත් කරත්තයක් මිලදී ගැනීමට ප්‍රේමසිරි පෙළඹුණේ එහෙයිනි.

" මාර්කට් එක ඇතුළට අරන් ගියාට පස්සේ කඩ කාමර ඉල්ලුවාට අපට ලැබුණේ නෑ. වෙළෙන්දන් 14 දෙනෙක් එකතුවෙලා හිටපු ආපදා කළමනාකරණ ඇමතිතුමාට දැනුම් දුන්නා. පාර්ලිමේන්තු කාරක සභාවට ඒක ඉදිරිපත් කරලා අපට කඩ කාමර ලබා දෙන්න කියලා ඇමතිතුමා දිසාපතිට දැනුම් දුන්නා. වැඩක් උනේ නැහැ."

කඩ කාමර ලබා දීමේදී සිදු වී ඇති විෂමතාවය ප්‍රේමසිරිගේ ප්‍රකාශයෙන් හඳුනාගත හැකි ය.

ගාල්ල බාලදක්ෂ මාවතෙහි පදිංචි ජී.ඒ. මයිකල් මාළු වෙළෙන්දකු හැටියට දශක හතරක් පමණ කටයුතු කර ඇත. සුනාමියට ව්‍යාපාරික ස්ථානය සහ නිවස විනාශ වූ පසුව නව නිවසක් ලැබී ඇත්තේ නගරයට කි.මී. 10 ක් දුරින් පිහිටි කුරුඳු වත්තෙනි. මාළු මිලදී ගැනීම සඳහා පාරිභෝගිකයන් පැමිණීමට පුරුදුව ඇත්තේ තම ව්‍යාපාරික ස්ථානයට බව ඔහු පවසයි. එහෙත් නගර සභාව ඊට හරස් වී ඇත.

" මාකට් එකේ කඩ වලට අපිත් ටෙන්ඩර් දැම්මා. අපට ලැබුණේ නැහැ. ඒත් සමහරුන්ට කඩ දෙක තුන ලැබුණා. එදා ඉඳලා බිස්නස් කරපු අපට තැනක් නැහැ. ඒ මදිවට දඩත් ගහනවා."

මයිකල් පවසන්නේ වේදනාවෙනි.

ගාල්ල නගරයෙහි බත් පැකට් වෙළඳාමෙන් ජීවත් වන බී.එල්. චන්ද්‍රලතා පවසන්නේ ද තම කටයුතු වලට නගර සභාවෙන් හිරිහැර පැමිණෙන බවයි. වරක් නගර සභා නියෝජිතයන් ඇගේ කඩය කඩා බිඳ දැමීමට ද පැමිණ ඇත.

"කඩ කුලිය අපෙන් අරගෙන කඩ කෑල්ලක් අපි වාගේ දුප්පත් වෙළෙන්දන්ට හදල දෙන්ඩ බැරිද? සුපර් මාර්කට් එකේ කඩ කාමර ගන්ඩ අපට හයියක් නැහැ. "

චන්ද්‍රලතා මාතාව පවසයි.

සුනාමි රළ පතරට හසුව ගාල්ල දිස්ත්‍රික්කයෙහි 4178 දෙනා මිය ගියහ. පූර්ණ හානි වූ නිවාස 5128 කි. අර්ධ හානි 4270 කි. අධිපති මාධ්‍ය මගින් කුමන සංඛ්‍යා ලේඛන ප්‍රකාශයට පත් වුව ද ජීවනෝපායන් අහිමි වීම නැවත පදිංචි කරවන ලද ස්ථානයෙහි සිට රැකියාව කරන ස්ථානයට දුර වැඩි වීම, ඉදි කරන ලද නිවාස වල ප්‍රමිතිය බාල වීම, සුදුස්සන් සිටියදී නුසුදුස්සන්ට නිවාස ලැබීම යනාදී වශයෙන් ගැටලු රැසක් පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ පිළිබඳ අධ්‍යයනයක යෙදෙන්නකු හට හඳුනාගත හැකි ය.

සිරිකඳුර වත්ත සුනාමි නිවාස ව්‍යාපෘතිය යටතේ NEST ආයතනයෙන් නිවාස 146 ක් ද HELPAGE ආයතනයෙන් නිවාස 25 ක් ද තනා දී ඇත. එහෙත් NEST ආයතනයෙන් තැනූ නිවාස ප්‍රමිතියෙන් බාල වීම නිසා සමහර නිවාස නැවත ඉදි කළ යුතුව තිබේ. මේ නිවාසවල ගැටලු පිළිබඳ නිවාස අමාත්‍යංශයට දැනුම් දීමෙන් අනතුරුව නිලධාරීන් පැමිණ සමීක්ෂණයක් කර ඇති බව සිරිකඳුර වත්ත ග්‍රාම නිලධාරී නිමල් ජයන්ත කාහිංගල පවසයි. මේ නිවාස සඳහා තවම ඔප්පු ලැබී නැති අතර පැවරුම් පත්‍රයක් පමණක් ලැබී තිබේ. පදිංචිකරුවන්ගෙන් බහුතරයක් ධීවරයන් ය. මුහුදට යෑම සඳහා කි.මී. 6 ක් දුර යෑම සඳහා ප්‍රවාහන පහසුකම් නොමැත. ත්‍රී රෝද රියකින් ගමන් කිරීම සඳහා රු. 300 ක් වැය කළ යුතු ය. එමෙන්ම දැල් ආම්පන්න කුලී කඩ කාමරයක ආරක්ෂිතව තැබීම සඳහා මාසිකව රු. 1500 ක කුලියක් ගෙවීමට සිදුව ඇතැයි සිරිකඳුර වත්ත ප්‍රජා මූල සමිතියේ ලේකම් එච්.ඩී.ඩී. බණ්ඩාර පවසයි.

" මගේ කඩේ සුනාමියට ගියා. බැංකු ණයක් අරගෙන කඩයක් දමා ගත්තා. ඒත් මේ ගෙවල් ඇතුලේ ඉන්න බයයි. බිත්තිවල කෑලි කඩා වැටෙනවා. සිමෙන්තිවල විෂ ගතියක් තියෙනවා. ළමයින් ලෙඩ වෙනවා. වෛද්‍යවරු අනතුරු අඟවලා තියෙන්නේ."

රුවන් බණ්ඩාර පවසයි.

දඩැල්ල සුනාමි නිවාස සංකීර්ණය නිවාස 73 කින් යුක්ත ය. එක් නිවෙසක් තට්ටු දෙකකට ඉදිකර ඇත. එහෙත් ශ්‍රී ලංකාවේ දේශගුණික තත්වයන්ට නොගැලපෙන අයුරින් ඉදිකර ඇති නිසා අනාරක්ෂිත තත්වයක් මතුව ඇත.

වහලය හැඩ නෑ. බිත්ති මට්ටමට විතරයි තියෙන්නේ. බිත්ති වලට වතුර එනවා. මේ ඔවුන් නගන චෝදනාව යි. වෙරළාසන්නයෙහි ජීවත් වූ අවධියෙහි ලුණු ඇඹරීමෙන් සහ බත් පාර්සල් විකිණීමෙන් ජීවත් වූ ඩබ්. කරුණාවතී පවසන්නේ නිවාස ලැබුණ මුත් ජීවත් වීම දුෂ්කරව ඇති බව ය.

මහ මෝදරට ධීවර වෘත්තිය සඳහා යන අයට බස් වියදම රු. 40 කි. එහෙත් මගට කාලය ගත වන නිසා පෙර පරිදි ධීවර වෘත්තියෙහි යෙදීම දුෂ්කරව ඇති බව ධීවරයන්ගේ අදහස යි. ඉන්ද්‍රානි හෙට්ටිආරච්චි ගේ සැමියා මේ දුෂ්කරතා නිසා ධීවර වෘත්තිය අතහැර රෙදි වෙළඳාමෙහි නිරත වෙයි. එහෙත් එය ආර්ථික වශයෙන් පාඩු බව ඉන්ද්‍රානි පවස යි. මුදු යෑමට අමතරව රෑ කඩයෙන' රු. 500 කට වඩා ලාබයක් තිබූ බවත් අද වන විට ඒ කිසිවක් නොමැති බවත් කැඩුණු බෝට්ටුව වෙනුවට බෝට්ටුවක් පවා නොලැබුණු බවත් ඉන්ද්‍රානි පවසන්නේ චෝදනාත්මක ස්වරෙය නි.

දඩැල්ල සුනාමි නිවාසලාභීන්ගේ මුහුණ දෙන ගැටලු එසේ ය. තෙල්වත්ත ප්‍රදේශයෙහි සුනාමියෙන් අවතැන් වූවන් පදිංචි කරවන ලද්දේ මනුජයපුර නිවාස යෝජනා ක්‍රමය යටතේ ය. එහි පදංචිකාරියක වන ප්‍රියන්තිකා ඇතුළු කිහිපදෙනෙක් ලණු ඇඹරීමෙන් ජීවිකාව සරි කර ගනිති. ප්‍රියන්තිකාගේ සැමියා ධීවරයෙකි. එහෙත් සුනාමියෙන් පසුව ඔහු ත්‍රී රෝද රථ රියැදුරකු හැටියට කටයුතු කරයි. වෙරළාසන්නයේ පදිංචිව ලණු ඇඹරීම කළ අවධියෙහි කොහු ප්‍රවාහනය සඳහා වියදමක් නොගිය හෙයින් ලාභයක් තිබූ නමුත් මේ වන විට ත්‍රී රෝද රථයක් මගින් කුලී ගෙවා කොහු ප්‍රවාහනය කිරීමට සිදුව ඇති බව ලණු ඇඹරීමෙහි යෙදී සිටින්නෝ කියා සිටිති.

පොල් ගස් හෙවනේ ලණු ඇඹරීම කළ තමන්ට දැන් අවුකාස්ටකේ ලණු අඹරන්නට සිදුව ඇතැයි ප්‍රියන්තිකා පවසයි.

තෙල් වත්තේ සුනාමි ඡායාරූප කෞතුකාගාරය පවත්වාගෙන යන කමනි ද සිල්වා හට ද මනුජයපුර නිවාස ව්‍යාපෘතියෙන් නිවසක් ලැබී ඇත." එහෙ ගිහින් අපට කරන්න දෙයක් නැහැ." මේ ඇගේ අදහසයි. " මගේ මල්ලිලා හමුදාවට ගිහින් ගෙවල් දොරවල් හදාගෙන ජීවත්වෙන්න පටන් ගත්තා විතරයි . සුනාමියට ගෙවල් කැඩුණා. එක මල්ලියෙක් යුද්දෙන් මරුණා. මෙතැන දාලා ගිහින් වෙන කරන්න දෙයක් නැහැ" කමනි පවසයි. ඇගේ උත්සාහය සුනාමි ඡායාරූප කෞතුකාගාරය වැඩි දියුණු කර පවත්වාගෙන යෑම ය.

සුනාමි ව්‍යසනයෙන් විපතට පත්වූවන්ගේ ජීවිත නගාසිටුවීම සඳහා දේශීය හා විදේශීය ආධාර ඇතිව පියවර කිහිපයක් ඔස්සේ වැඩ සටහන් ගණනාවක් ක්‍රියාත්මක විය. වෙරළාසන්නයේ ජීවත්වීම ඔස්සේ නැවත එබඳු ඛේදවාචකයක් ඇතිවීම වැළැක්වීමේ අරමුණ අනුව නිවාස ඉදිකිරීම වෙරළ කලාපයෙන් දුරට ගෙන යන ලදී. එහෙත් ස්වකීය පාරම්පරික ජීවනෝපායන් පවත්වාගෙන යෑමේ අර්බුදයකට මුහුණ දීමට නිවාස ලාභීන්ට සිදුව තිබේ. නිවාස වල ප්‍රමිතිය පිළිබඳ ගැටලුව බරපතල ය. එහෙත් සර්වෝදය ව්‍යාපාරය, ඇතැම් ස්වේච්ඡා සංවිධානත්, ජිනසේන සමාගම ඇතුළු පෞද්ගලික ආයතන කිහිපයකුත් මැදිහත් වීමෙන් ඉදිකළ නිවාස ව්‍යාපෘති ප්‍රශස්ත මට්ටමක පවතිද්දී ඇතැම් නිවාස ව්‍යාපෘති වල ගැටලු පවතින බව පෙනේ. මේ පිළිබඳව පූර්ණ පසු විපරමක යෙදීමත්, ගැටලු අවම කිරීමේ පිළියම් යෙදීමත් කාලීන අවශ්‍යතාවයකි.

**අපි පැය විසිහතරම ක්‍රියාත්මකයි**

සුජීව මෙන්ඩිස්- මාණ්ඩලික සැරයන් ගාල්ල ආපාදා කළමනාකරණ සහකාර සම්බන්ධීකරණ නිලධාරී

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හයකට අයත් ග්‍රාම නිලධාරී වසම් 146 ක් සුනාමියට අසුවුණා. අපේ වගකීම නැවත මෙවැනි තත්වයකට මුහුණ දීම සඳහා ජනතාව දැනුවත් කරවීම හමුදා අංශ වල සහයෝගයෙන් පැය විසිහතර පුරා අප ක්‍රියාත්මක වෙනවා. කොළඹ මධ්‍යස්ථානය සමඟ අප නිරන්තරයෙන් සම්බන්ධයි. ආපදා අවම කිරීම අපේ වගකීමයි.

**වීදි වෙළදාම තහනම් කළේ නීත්‍යානුකූලවයි.**

ගාලු නගරාධිපති - මෙත්සිරි දි සිල්වා

මම නගරාධිපති හැටියට පත් වෙලා ආවේ 2009 ජනවාරිවල. ඒ වන විට දිස්ත්‍රික් ලේකම්තුමා සහ දේශපාලන අධිකාරිය විසින් වෙළෙන්දන්ට කඩ කාමර ලබා දී අවසන්. හැබැයි නගර සභාවට ඒ කඩ

කාමරවලින් බදු ආදායමක් ලැබුණේ නැහැ. මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කළා ම පසුව දිස්ත්‍රික් ලේකම්තුමා කඩ කාමරවල නීත්‍යානුකූල අයිතිය නගර සභාවට ලබා දුන්නා. කඩ කාමර වෙළෙන්ඳන්ට ලබා දීමේදී යම් යම් විෂමතා සිදු වී ඇති බව පේනවා. සමහරු තමන්ට ලැබුණු කඩ කාමර පිට අයට විකුණලා. එකම පවුලේ සාමාජිකයන් වෙන වෙනම කඩ කාමර ලබා ගැනීමට උත්සාහ කිරීමත් ගැටලුවක්. අම්මා දිසාපතිට දුක් ගැනවිලි කියනවා. පුතා දේශපාලඥයන් ට දුක් ගැනවිලි කියනවා. නමුත් කඩ කාමර ලැබී ඇත්තේ නීත්‍යානුකූලව යි. සමහරු ලියකියවිලි සුනාමියට හසුවුනා කියලා අයිතිය ඔප්පු කරන්න හදනවා. වීදි වෙළෙඳාම තහනම් කිරීම ගාල්ලට පමණක් නොවේ රටට ම අදාළ දෙයක්. අනෙක් පුද්ලයන්ට සාපේක්ෂව ගාලු නගරයේ වීදි 19 ක වීදි වෙළෙඳාම තහනම් කළා. ගැසට් නිවේදනයකින් නීත්‍යානුකූලවයි ඒක කළේ. තහනම් වීදිවල වෙළෙඳාම් කරලා නීති කඩ කරන අය සම්බන්ධයෙන් පියවර ගැනීම අපේ වගකීමක්. එහෙම නැතිව නගරයක් පාලනය කරන්න බැහැ.

# ගබ්සාව සමාජ අපරාධයක් ද?

'මට අවුරුදු 3 ක දරුවෙක් ඉන්නවා. දරුවා ලැබිලා අවුරුද්දක් යන්න කලින් අත්වැරදීමක් නිසා නෝනට තව දරුවක් ලැබෙන්න ආවා. දෙන්න ම රැකියාව කළත් අපට තවමත් ස්ථිර නිවසක් නැහැ. දැනටත් දරුවා බලා ගන්නේ අම්මා. ඒ නිසා අප තීන්දු කළා දරුවා ගබ්සා කරන්න"

පෞද්ගලික ආයතනයක රැකියාව කරන නම හෙළි කිරීමට අකමැති නිලධාරියෙකු අප සමඟ පැවසුවේ නීති විරෝධී ගබ්සා මධ්‍යස්ථාන පිළිබඳ සමීක්ෂණයක යෙදෙමින් සිටි අතරතුර ය.

ඔහු තම බිරිය ද සමඟ කොල්ලුපිටිය ප්‍රදේශයේ ගබ්සා මධ්‍යස්ථානයකට පැමිණ සිටියේ ත්‍රීරෝද රථ රියැදුරෙකුගේ මඟ පෙන්වීම ඔස්සේය.

"දරුවට මාස 1 1/2 යි. දොස්තර රු 15000/- ක් ඉල්ලුවා. අවදානම අපට බාර ගන්න කීවා. අප එකඟ වුණා."

දරුගැබ ඉවත් කිරීමේ ක්‍රියාවලිය එසේ විය. ලෝකය ගැන හයක් හතරක නොදත් බිළිඳෙකුට තම ජීවිත ඉරණම ගැන තීන්දු කිරීමේ වගකීම දෙමාපියන්ටම පැවරුණේ ඔවුන්ගේ 'අත්වැරැද්ද' හේතුවෙනි. මේ අත්වැරැද්ද වනාහී  නිවැරදි පවුල් උපදේශනයක් නොලැබීම ය.  නොඑසේ නම් උපදේශනයට කන් නොදී හැඟීම්වලට වහල් වීම ය. මෙය සාපරාධී ක්‍රියාවක් නොවේද ? ශ්‍රී ලංකාවේ නීතිය අනුව ගබ්සාවක් නීති විරෝධී කටයුත්කත් හැටියට අර්ථ දක්වා ඇතත්, ගැබ කරදරයක් වීම හා නීති විරෝධී ගබ්සා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑම නතර වී නොමැත. කොල්ලුපිටියේ එක්තරා ස්ථානයක වසර 20 ක පමණ කාලයක් ගබ්සා කටයුතු කරන වෛද්‍යවරයෙකු අපට හමුවිය. ඒ මොහොතෙහි පොලිස් නිල ඇඳුමෙන් සැරසුණු අයෙක් එතැනට පැමිණියේ තරුණ යුවලක් ද සමඟය.

"නීතිය රකින අය ම නීතිය කඩන හැටි පේනවා නේද ?"  වෛද්‍යවරයා පැවසීය .

"මේක නීති විරෝධී උනත් හොඳ නරක දෙකම තියෙනවා. දවසකට 15 කගේ විතර ගබ්සා අපි කරනවා. අය කිරීම රු. 25000/-යි. මේකෙ ලොකු ජීවිත අවදානමකුත් තියෙනවා. මුලින් ම කරන්නේ ස්කෑන් පරීක්ෂණයකට යොමු කරන එක. හොඳම පෞද්ගිලික රෝහලකටයි යවන්නේ. ඒ අයගේ තීරණය අපි දුරකතනයෙන් තහවුරු කර ගන්නවා. ආපු අයත් එක්ක සාකච්ඡා කරලා ගබ්සා නොකර ආපහු යවන්න තමයි මා හුඟාක් දුරට උත්සාහ කරන්නේ. ලංකාවේ ඉතාම ප්‍රසිද්ධ ප්‍රසව හා නාරිරෝග විශේෂඥයන් කිහිප දෙනෙකුත් මේ වැඩේ ඉන්නවා. ඇත්තටම මාස 3 ක දරු කළලයක් වුණත් ඉවත් කරන්න පුළුවන් මට්ටමට අද මේක දියුණුයි. ටැබ්ලට් එකකිනුත් පුළුවන්. MIFEPRS TONE ටැබ්ලට් එක වෛද්‍යවරයෙක් ලියලා දුන්නම ෆාමසියකින් ගන්න පුළුවන් "

මේ එම වෛද්‍යවරයාගේ ප්‍රකාශයයි. ගබ්සාව නීතියෙන් අනුමත කරනු ලබන්නේ ගැබිණි මව මානසික රෝගයකින් පෙළීම සහ ඇය රුබෙල්ලා තත්වයෙන් පෙළීම යන අවස්ථාවල දී පමණි. එවැනි තත්වයකදී වුවද ප්‍රසව හා නාරි වෛද්‍ය විශේෂඥවරුන් දෙදෙනකුගේ අනුමැතිය ලැබිය යුතුය.

දූෂණයට ලක්වීම සහ මැද පෙරදිග රැකියාවක් සඳහා යෑම බලාපොරොත්තුව සිටිය දී ගැබ් ගැනීම යනාදී කරුණු මත ගබ්සා සිදු කර ගැනීමට පැමිණෙන කාන්තාවන්ගේ සංඛ්‍යාව විශාල බව ගබ්සා

මධ්‍යස්ථාන ආශ්‍රිත නිරීක්ෂණයෙහි දී පැහැදිලි වෙයි. එමෙන්ම පසුගිය යුද සමයෙහි අනවශ්‍ය ගැබ් ගැනීම් නිසා දෙමළ තරුණියන් ද ගබ්සා මධ්‍යස්ථාන කරා පැමිණි බවට සාධක තිබේ.

නීති විරෝධී ගබ්සා ග්‍රාමීය මට්ටමින් සිදු කෙරෙනුයේ අවධිමත් ආකාරයකටය. ගස්ලබු ගැට, අන්නාසි ගැට, ආහාරයට ගැනීම හෝ මයියොක්කා නටු, කෝටු සහ ස්පෝක් කූරු ගර්භාෂයට ඇතුළු කිරීම යනාදී ක්‍රම ඔස්සේ ද කළලය ගැබ් ගෙලින් සිඳලීම සිදු කරන බව පෙනේ. වැදෑමහට හානි සිදු වී කළලය පහළට තල්ලු වීමත් අධික ලෙස රුධිර වහනය වීමත් එහි ප්‍රතිඵලයකි. ආසාදන ඇති වීමෙන් ඇතැම් විට මරණය පවා සිදුවිය හැකි ය.

අනිසි ගබ්සා කිරීම් නිසා ඇති විය හැකි හානිකර තත්වයන් මෙසේය.

1. ගැබ් ගෙල හානි වීම නිසා ලේ වහනය වීමෙන් මවගේ ජීවිතයට හානි සිදුවීම.

2. අනාගතයේ සිදුවන පිළිසිඳ ගැනීම්වලදී ගර්භාෂය විසින් කළලය ප්‍රතික්ෂේප කිරීම.

3. ස්වාභාවික ගබ්සාවලට ඇති ඉඩකඩ වැඩිවීම.

දිනකට නීති විරෝධී ගබ්සා 200 ක් පමණ ශ්‍රී ලංකාවෙහි සිදුවන බවට සාධක ලැබී ඇත. ලිංගික අධ්‍යාපනයක් නොලැබීමේ අඩුපාඩුව මෙහිදී කැපී පෙනේ.

දූෂණයට ලක් වූ තැනැත්තියගේ කුස තුළ සිටින දරුවා හදාවඩා ගැනීම මවට විශාල ගැටලුවකි. තමාට සිදුවූ අපරාධය නිසා සිත උපන් වෛර දරුවා කෙරෙහි යොමු වීම, සමාජ ආකල්ප නිසා ඇතිවන අසහනය යනාදී හේතු මත නීති විරෝධී ගබ්සාවන්ට යොමු වීමේ ඉඩකඩ වැඩි ය. එහිදී නීතිය සහ අවශ්‍යතාව අතර ගැටුමක් ඇති වේ. පවුල් අභ්‍යන්තරයෙහි පවතින අවුල් නිසා අනවශ්‍ය ගැබ් ගැනීම් ඇති වීමේ ප්‍රවනතාවක් ද පවතී. මේ පිළිබඳ ව ත්‍රීරෝද රථ රියැදුරකුගේ අත්දැකීමක් උපුටා දැක්වීම උචිතය .

" දවසක් තරුණ අම්මා කෙනෙක් දියණිය සමග ඇවිත් ලිපිනයක් පෙන්නලා පාර ඇහුවා. මම ඇහුවා ඇයි ඒ වගේ තැනකට යන්නේ කියලා. දියණියට අවුරුදු 15 යි. මව දෙවැනි කසාදයක් කරගෙන. ඔහු අතින් දියණිය දූෂණය වෙලා. දුව පාසල් යන වයසේ. එතැනදී මවත් අසරණයි. එයාට දුවත් පුරුෂයත් දෙන්නම බේරා ගැනීම අවශ්‍ය වුණා. මේ වගේ දේවල් නිතර අපට දකින්න ලැබෙනවා."

ත්‍රීරෝද රථ රියැදුරාගේ ප්‍රකාශය පවුල් සංස්ථාවෙහි පැන නැගී ඇති ගැටලු මෙන්ම සමාජමය වශයෙන් පිළියම් යෙදිය යුතු අවනතීන් පිළිබඳව ද ඉඟියක් සපයයි.

" මට දැන් අවු 32 යි. වසර 3 ක් මැදපෙරදිග රැකියාවක් කළා. පුතා මෙවර ශිෂ්‍යත්වයට ලියනවා. නමුත් අවු 16 දී මට සිදු වූ සිදු වීමක් ගැන අදත් කම්පා වෙනවා. මගේ සොයුරිය ගැබ්ගෙන සිටිය නිසා මම පාසල් නිවාඩු දවස්වල ඇගේ ගෙදර ගියා. අන්තිමේදී මස්සිනාගේ වුවමනා ඉටු කරන්න මට සිද්ද වුණා. මම ගැබ් ගත්තට පස්සේ ඒ පවුලේ ගැටුම් ඇති වුණා. මගේ දෙමව්පියෝ මැදිහත් වෙලා මගේ දරුවා ගබ්සා කළා. ප්‍රශ්න අමතක කරලා අද අක්කල හොඳින් ජීවත් වෙනවා. මුලින් මම විවාහ වෙන්න බය වුණා. අමාරුවෙන් හිත හදා ගත්තා. දැන් වුනත් අතීතය මතක් උනාම නැති වුණු දරුවා ගැන අනුකම්පා හිතෙනවා."

නම හෙළි කිරීමට අකමැති කාන්තාවකගේ උක්ත ප්‍රකාශය ද ගබ්සාවන් සුලබ වීම කෙරෙහි බලපා ඇති විවිධ හේතු පිළිබඳ මනා සාක්ෂියක් සපයයි.

ගබ්සාව නීති විරෝධී කටයුත්තක් හැටියට පැවතීම හා ගබ්සා මධ්‍යස්ථාන තව දුරටත් පැවතීම පිළිබඳව ප්‍රශ්නාවලියක් සෞඛ්‍ය අමාත්‍යංශයේ නිලධාරියකුට යොමු කළ විට ලද පිළිතුර මෙසේ ය.

" තමාගේ ජීවිතය පිළිබඳව තීරණයක් ගැනීමේ හැකියාව නොමැති දරුවකුගේ ජීවිතය හානි කිරීම කුමන අර්ථයෙන් බැලුවත් අපරාධයක්. නමුත් නීතිය පළඳුකොට මේ ප්‍රශ්නවලට විසඳුම් සොයන්න බැහැ. අමාත්‍යංශය හැටියට අපගේ පවුල් උපදේශනාත්මක වැඩසටහන් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වෙනවා. විශේෂයේ ම පවුල් සෞඛ්‍ය නිලධාරිනියන්ගේ දායකත්වය විශාලයි. ඒ උපදෙස් පිළිගන්නවා නම් අත්වැරදීම් සිදුවන්න විදිහක් නැහැ. තරුණ දියණිවරුන්ට පවුල, පාසල හා සමාජයෙන් මීට වඩා රැකවරණයක් අවශ්‍යයි. සමහර දෙමාපියන් මේ ගැන දක්වන සැලකිල්ල කිසිසේත් ප්‍රමාණවත් නැහැ.

කරුණු කෙසේ වුවද ගැටලුවේ සමාජ මූලයන් හදුනා ගෙන ඊට ප්‍රතිකර්ම යෙදීම වඩා උචිත බව කිවයුතුය.

**සමාජාරක්ෂාව මෙන්ම නීතිමය ලිහිල් බවකුත් අවශ්‍යයයි.**

**නීති ආධාර කොමිසන් සභාවේ කුරුණෑගල කොට්ඨාසයේ අධ්‍යක්ෂ නීතිඥ ධර්මවිජය සෙනවිරත්න**

ගබ්සාව කියන එක සලකන්නේ අපරාධයක් හැටියට. මේ සිද්ධීන් වලට සම්බන්ධ අයට නඩු පවරනවා. නූපන් ජීවියෙකුට වුණත් අයිතිවාසිකම් තිබෙනවා කියන පිළිගැනීම මෙහිදී වැදගත් වෙනවා. නීතියෙහි සඳහන් වුණේ අයිතිවාසිකම් ලැබීම හුස්ම ගැනීමේ සිට පටන් ගන්නා බවයි. නමුත් එංගලන්තයේ එක් නඩුවකදී කුසෙහි සිටියදී තමන්ට අවජාතකයයි අපහාස කළ බවට අයෙක් නඩුවක් දමා තිබුණා. මෙහිදී අපහාස කළ අයට නීතියෙන් දඩුවම් තීන්දු වුණා. උපදින්නට පෙරම නීතිමය අයිවාසිකම් ඇති බවට එම නඩු තීන්දුවෙන් සහතික වුණා. එමෙන්ම පෝෂණය ලබා ගැනීමේ අයිතියද ,ආරක්ෂාව ලැබීමේ අයිතියද ඒ සමඟ පිළිගන්නවා. තමන්ගේ ජීවිතය අවදානමකට ලක් වන කළලයක් ඉවත් කිරීම මවකගේ අයිතියක් හැටියට නීතියෙන් පිළිගන්නවා. එමෙන්ම ස්ත්‍රී දූෂණයකින් පසුව තමන් අකමැති ගැබක් ඉවත් කර ගැනීමේ අයිතියද පිළිගන්නවා. රජයේ වෛද්‍යවරයකුගේ නිර්දේශය මත එය සිදු විය යුතුයි. නමුත් බොහෝ විට ගබ්සා කිරීම සිදු වන්නේ නීතියට පිටින්. දූෂණයට ලක් වීම නිසා, අත්වැරදීමකින් අනවශ්‍ය දරු ගැබක් හට ගැනීම නිසා සහ අවිවාහක දැරියන් විවිධ බලපෑම් නිසා යනාදී වශයෙන් ගැබ් ගැනීම් වලදී ගැබ ඉවත් කර ගැනීමේ නීතිමය ලිහිල් බවක් අවශ්‍ය බව පිළිගන්න සිදු වෙනවා. දරුවන් සහ කාන්තාවන් සම්බන්ධයෙන් විවිධ රාජ්‍ය ආයතන පිහිටුවා තිබෙනවා. නමුත් අනවශ්‍ය ගැබ් ගැනීමකදී මවගේත් දරුවාගේත් පෝෂණය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කිසිදු ආයතන ව්‍යුහයක් නැහැ. එම ආයතන වරින් වර විවිධ අණ පනත් රෙගුලාසි සකස් කළත් සමාජයේ අවශ්‍යතා පිළිබඳ කිසිදු සැලකිල්ලක් නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් කටයුතු කළ හැකි අධිකාරියක් හෝ ආයතන ව්‍යුහයක් අවශ්‍යයි.

# වීදියේ මිළින වන මල් කැකුළු

“මම චිත්‍ර අඳින්න ආසයි. පාක් එකේ තියෙන බුදු පිළිමයත් ඇන්දා. මම දැන් ඉස්කෝලේ යන්නේ නෑ. අම්මයි මල්ලියි පාරේ ඉන්නේ. මම ඉන්නේ ආච්චි ළඟ. අම්ම ඉස්සර නං අඹ විකුණුවා. දැන් පොලීසියෙන් අල්ලන හින්දා නිකං ඉන්නේ. අපිට ඉන්න තැනක් තිනෙව නම් හුඟාක් ප්‍රශ්න විසඳගන්න පුළුවන්.”

වීදි දරුවකු වන පියුමාල් (අවු 13) ගේ උක්ත ප්‍රකාශය ඔවුන්ගේ ජීවන පරිසරය පිළිබඳ ව විමසා බැලීමේ හොඳ නිමිත්තක් සපයයි. අගනුවර දැකුම්කලු නගරයක් බවට පත් කිරීමේ ක්‍රියාදාමයෙ දී අභියෝගයට මුහුණ දෙන වීදි දරුවන් ගේ කතාව පහසුවෙන් මකා දැමිය හැක්කක් නොවන බව පෙනී යයි.

තැඹිලි, ස්වීප්, කපුරු බෝල සහ අඹ වෙළදාම ද සපත්තු මැහීම ද කුණු බක්කි තල්ලු කිරීම සහ වැසිකිළි පිරිසිදු කිරීම ද ජීවන වෘත්තීන් වශයෙන් තෝරා ගෙන සිටින ඔවුන්ගේ දිවි පෙවෙත අස්ථාවර ය. නගර අලංකරණයට බාධාවක් වී ඇති වීදි දරුවන් පරිවාස හා ළමා රක්‍ෂණ අධිකාරිය යටතට පත්කිරීම දැනට යොදා ඇති පිළියම බව පෙනේ.

ටවුන්හෝල්, කොටුව, පංචිකාවත්ත, ගුණසිංහපුර, කොල්ලුපිටිය, රාජගිරිය, බත්තරමුල්ල, දෙමටගොඩ සහ කොම්පඤ්ඤවීදිය, දරුවන් බහුල වශයෙන් ජිවත් වන ස්ථාන වෙත්. වීදිවල ජිවත්වන්නන් සඳහා රජයෙන් ලබා දී ඇති බොහෝ නිවාස කුලියට දී සුපුරුදු ලෙස වීදිවල ජීවත්වීම ඔවුන්ගේ සිරිත වී ඇති බව ද පෙනේ.

කඩින් කඩ පාසැල් යෑම ද බොහෝ විට අතරමඟ දී පාසල් අධ්‍යාපනය කඩා කප්පල් වීම ද සමාජ විරෝධී ක්‍රියා සඳහා වැඩිහිටියන් විසින් පොළඹවා ගනු ලැබීම ද වීදි දරුවන් මුහුණ දෙන යථාර්ථයකි.

“මම ගියේ සාරිපුත්ත විද්‍යාලයට. අපි පාරේ ළමයි කියලා දැනගත්තම ළමයි විහිලු කරනවා. එනිසා පාසල් ගමන නැවතුණා. සමහර ගුරුවරුන් අපට නරක වචනයෙන් බනිනවා. අපි රෑට නවතින්නේ පාක් එකේ. පාක් එක බලන්න එන ළමයින් එක්කත්  අපි සෙල්ලම් කරනවා. ඒත් දැන්නම් බයෙන් ජීවත් වෙන්නේ ” ෆාතිමා බෙගම් (අවු 12) පවසයි. වීදියෙහි ඉපදීම නිසා මුහුණ දෙන මෙබඳු ගැටලු නිසා, සමාජයට වැඩදායි පුරවැසියෙකු බවට පත්වීමේ භාග්‍යය බොහෝ විට මේ දරුවන්ට අහිමි වන බව පෙනේ.

“ අපි පන්තියේ ඉස්සරහිං ඉඳ ගත්තම පිටුපසට යවනවා. කකුල් මාට්ටු දාලා වට්ටනවා. ටීචර්ට කිව්වම ගණන් ගන්නේ නැහැ. දැන් අම්මත් එක්ක කපුරු බෝල විකුණනවා.”

චන්දන දිල්ෂාන්  (අවු 11 ) පවසයි. රු 125/- ට මිලදී ගන්නා කපුරු බෝල ලොකු පැකට්ටුවෙන් බෝල 20 පැකට් 10 ක් සකස් කෙරේ. පැකට් එකක් රු 20/- ක් මිලකට අලෙවි කෙරේ.

“සමහර මහත්තරු නෝනලා ඉතුරු  සල්ලි ගන්නේ නැහැ. එහෙම දවසට ලාභයක් තියෙනවා. ඒ උනත් දැන් අපි හැංගිලා තමයි වෙළෙඳාම කරන්නේ. පොලීසියෙන් අල්ලගන යනවා”

නිශාන් ප්‍රියශාන්ත (අවු 15) තම වෙළෙඳාමෙහි ස්වභාවයත් එහි ඇති අනතුරත් පවසන්නේ සෝබර වූ දෑසිනි.

පියුමාල්ගේ මව වන දමයන්ති කුමාරි (අවු 29) ගේ පළමු  දරු උපත සිදු වන විට ඇගේ වයස අවු 14 කි. ඇය මේ වන විට පස්දරු මවකි.  වීදියෙහි ජීවත් වෙමින් වුව දරුවන් පාසල් යැවීම තම අරමුණ වුවද පාසල්ට අයදුම් කළ පසු පිළිතුරක්වත් නොලැබෙන බව ඇය පවසයි.

“ළමයිගේ තාත්තා ගිහිං තියෙන්නේ කොටහේනේ මහාබෝධියට. ඒකටත් ඉල්ලුම් පත්‍ර දැම්මා. තවම උත්තරයක් නැහැ.”

දමයන්ති පවසයි. දමයන්තිගේ මව්පියන්ගේ ද නිජබිම වීදිය යි. වීදියේ ජීවත් වන ගැහැණු දරුවන් වාහනවලින් පැමිණෙන අයගේ ලිංගික ගොදුරු බවට පත්වන අවස්ථා ද තිබෙන බව දමයන්ති පවසයි. ඒ නිසා ඇය තම ලොකු දුවරුන් රඳවා තබා ඇත්තේ ආරක්ෂාව සහිත ස්ථානවල ය. ඇය තම සෑම දරුවකු සඳහාම බැංකු ගිණුම් ආරම්භ කර ඇත. “ඉස්සර මම අච්චාරු වෙරළු වික්කා. මට කරත්ත තුනක් තිබ්බා. නිතර පොලීසියෙන් අල්ලන නිසා කරත්ත තුනම විකුණන්න සිද්ද උනා. ඉස්සරහට මොනවා වෙයිද කියලා බයේ ඉන්නේ. දමයන්ති තම දරුවන්ගේ අනාගතය ගැන බියෙන් පසු වෙයි. වීදියෙහි ජීවත් වුවද දරුවන්ගේ අනාගතය යහපත් එකක් බවට පත් කිරීම ඇගේ අපේක්ෂාව ය.

වීදි දරුවන්ගේ සුබසාධනය , අධ්‍යාපනය සහ සුරක්ෂිතතාව වෙනුවෙන් වගකීම් රැසක් ඉටුකරන සමාජ සාමයික කේන්ද්‍රයෙහි වැඩ සටහන් නිලධාරිනී කාන්ති ශ්‍රියානි මියගේ අදහස වන්නේ මෙම දරුවන් යහ මගට ගැනීම අතිශය දුෂ්කර කටයුත්තක්ව පවතින බවයි.

“ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා වසරකට අවශ්‍ය පාසල් උපකරණ අපි ලබා දෙනවා. තෑගි වව්චර දෙනවා . අවුරුද්දට නත්තලට තෑගි දෙනවා. පෝෂණ වැඩසටහන් යටතේ කිරිපිටි, සමපෝෂ ලබා දෙනවා. මේ විදිහට දරුවන් 102 දෙනෙකුට උදව් කරනවා. නමුත් අවාසනාව වන්නේ හුඟාක් දෙමාපියන්ට දරුවන් ගැන උනන්දුවක් නැති කමයි. සමහරු කිරිපිටි ටිකත් විකුණනවා. දෙමාපියන්ගේ වැරදි නිසා දරුවන් පාසල්වලින් කොන් කරන අවස්ථා තියෙනවා. ”   කාන්ති ශ්‍රියානි මිය පවසයි.

කොළඹ නගරයෙහි ආරක්ෂාව පිළිබඳ ගැටලු පැන නැගීමත්, අධික මගී හා වාහන තදබදයත් හේතු කොට ගෙන වීදි වෙළෙඳාම සම්බන්ධයෙන් තීන්දු ගැනීමට මෑත අවධියෙහි ආණ්ඩුවට සිදු විය. එය විවාදයට ද තුඩු දුන්නේ ය. අනෙක් අතින් නාගරික සංවර්ධනයේ දී බාධාවක් වන දේවල් පිළිබඳව දැඩි තීන්දු ගැනීමට සිදුවන අවස්ථා තිබිය හැකිය. පුංචි බොරැල්ල මංසන්ධියෙහි බාධාකාරී ලෙස පිහිටි බෝධියක් ඉවත් කරන්නට ගිය මොහොතෙහි  හිටපු නාගරික සංවර්ධන ඇමති මංගල සමරවීර ඉදිරියට තැබූ පය ආපස්සට ගත්තේ භික්ෂු ප්‍රමුඛ දේශපාලන කල්ලිවල බලවත් විරෝධය හේතුවෙනි. එමෙන්ම බෝධිය වටා අලංකාර ප්‍රාකාරයක් ද ඉදිකරමින් ‘බාධකය’ වැඩි දියුණු කර භික්ෂූන් සන්තර්පනය කිරීමට ඇමැති මංගලට සිදු විය.

යාචකයන් සහ වීදි දරුවන් වීදිවලින් ඉවත් කිරීම ද ගිනිගන්නා මාතෘකාවකි.

වීදි දරුවන් ළමා රකෂණ අධිකාරිය යටතේ ඇති ළමා නිවාස වලට යොමු කිරීම දැනට අනුගමනය කරන පිළිවෙත බව පෙනේ. එහෙත් ඒ සමඟ ම ඇතිවන ගැටලුව වන්නේ ළමා නිවාසවල දැනට පවතින තත්වය එතරම් සුබදායී නොවීමය. ළමා නිවාසවල ජීවත්වන දරුවන් ද බොහෝ ගැටලුවලට මුහුණ දෙන බව මෑත දී වාර්තා විය. ඔවුන්ගේ පෝෂණය, සුරක්ෂිතතාව සහ අධ්‍යාපනය වෙනුවෙන්

වෙන් කෙරෙන ප්‍රතිපාදන පිළිබඳව සෑහීමකට පත් විය හැකිද? එය එක් දරුවකු වෙනුවෙන් රුපියල් දහයක තරම් අල්පයක් නම් එය ඛේදවාචකයක් නොවන්නේ ද ?

**සමාජයට බරක් වෙලා**

**අරවින්ද සිල්වා - සමාජ සාමයික කේන්ද්‍රයේ වැඩසටහන් නිලධාරී**

නොවිධිමත් අධ්‍යාපනය ඔස්සේ කුසලතා වර්ධනය අපේ අරමුණයි. ළමා ප්‍රඥප්තියේ වගන්ති 48 මත පදනම්වයි අපි කටයුතු කරන්නේ. අධ්‍යාපනය, සංවර්ධනය සහ  ජීවත් වීමට ඇති අයිතියට අප මුල්තැන දෙනවා. වීදි දරුවන්ගෙන් නොයෙක්  අකටයුතු සිද්ධ වෙනවා. සමාජයට මේ අය බරක් . වැඩිහිටියන් වැරදි වැඩවලට යොදා ගන්නවා. දීර්ඝ කාලීන සැලසුම් කිරීම් මත ඔවුන් වෙනුවෙන් කටයුතු කළ යුතුයි.

**ඔවුන් රැකගත යුතුයි**

**ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ සමාජ හා මානව විද්‍යා අධ්‍යනංශයේ ආචාර්යය ප්‍රනීත් අබේසුන්දර**

වීදි දරුවන්, අතහැරදැමූ දරුවන් සහ අනත් දරුවන් වශයෙන් හැඳින්වෙන දරුවන් විශාල සංඛ්‍යාවක් සමාජයේ ජීවත් වෙනවා. ළමා රක්ෂණ අධිකාරිය, ළමා හා කාන්තා කාර්යංශය සහ ස්වේච්ඡා ආයතන මගින් ඔවුන් සඳහා වැඩසටහන්  දියත් කර තිබෙනවා. මීට වසර 12 ට පෙර මහාචාර්යය නන්දසේන රත්නපාල මහතාගේ මැදිහත් වීමෙන් බස්නාහිර පළාත් සභාවේ සහයෝගය ද ඇතිව පිටකොටුව සමූපකාර ගබඩා පරිශ්‍රයේ වීදි දරුවන් වෙනුවෙන් ඉඩක් වෙන් කරනු ලැබුවා. සංහිඳ ළමා නිවාසය යනුවෙන් එය හැඳින්වුනා. නිහාල් බ්‍රිදර්ස්, මැනිං මාර්කට් යනාදී ආයතන සහ විවිධ පුද්ගලයන් මේ දරුවන්ට ආහාර ලබා දීමට මැදිහත් වුනා. දරුවන්ගේ රස වින්දනය සඳහා රූපවාහිනී සහ වෙනත් පහසුකම් ලබා දුන්නා. ඔවුන්ට උප්පැන්න නොමැති නිසා අනුමාන උප්පැන්න ලබා දීමෙන් කොල්ලුපිටිය ජිනරාජ විදුහලට ඇතුළත් කළා. පසුව එය වැසී ගියා. සංහිඳ ළමා නිවාසය දැන් මීගොඩ පිහිටුවා තිබෙනවා. දරුවන්ට පෝෂණය, අධ්‍යාපනය සහ ආරක්ෂාව ලබා දීමත් ඔවුන් පුනරුත්ථාපනය කිරීමත් මෙහි අරමුණ.

නගර සංවර්ධනයේ දී වීදි ළමා ප්‍රජාවට වැඩි යහපතක් වන ආකාරයෙන් ඔවුන් ස්ථාන ගත කිරීම අවශ්‍යය යි. ඒ සඳහා දැනට තිබෙන ආයතන ව්‍යුහයක් ශක්තිමත් කිරීමත් අවශ්‍යතාවය අනුව නව ව්‍යුහයන් ගොඩනැගීමත් කළ යුතුයි. වීදියේ උපන්නත් ඒ අයත් මිනිස් දරුවෝ. වීදි දරුවන් හැටියට හැඳින්වීමම ඔවුන්ට කරන මදි පුංචිකමක්.

**ළමා සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍ය - තිස්ස කරලියැද්ද**

**අපට වැඩ පිළිවෙළක් තියෙනවා.**

ළමා නිවාස බොහොමයක් පුද්ගලික ඒවා. තවත් විශාල ප්‍රමාණයක් පළාත් සභාව යටතේ පාලනය වෙනවා. නගර සංවර්ධනයේ දී ඉවත් කරන වීදි දරුවන්ගේ පෝෂණය, ආරක්ෂාව සහ ඔවුන් වැඩදායී පුරවැසියන් බවට පත් කිරීම පිළිබඳ රජයේ දැඩි අවධානයක් පවතින බව කිව යුතුයි. දැනට බොහෝ ළමා නිවාස වල අඩුපාඩු පවතිනවා.මේ නිසා කාලීන අවශ්‍යතා සලකා බලා ළමා නිවාස ප්‍රතිසංවිධානය කිරීම කෙරෙහි අප අවධානය යොමු කරනවා.

# මැතිවරණවල දී කාන්තා නියෝජනය අඩු ඇයි? (ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙනි)

"ලොව ප්‍රථම අගමැතිවරිය බිහිවුණේ ශ්‍රී ලංකාවෙන්. නමුත් මැතිවරණවලදී ලොව රටවල් අතරින් අඩුම කාන්තා නියෝජනයක් ඇති රටක් වන්නේ ද ශ්‍රී ලංකාවයි."

උක්ත කියමන උපුටා ගනු ලැබුවේ මෙවර පළාත් පාලන මැතිවරණයේ දී කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා උනන්දු වන්නැ යි සමාජ ක්‍රියාකාරිනියන් පිරිසක් විසින් ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ වෙත යවනු ලැබූ ලිපියකිනි.

කාන්තා නියෝජනය අව ම වීම පිළිබඳ ව කතා බහ සෑම මැතිවරණයක් අභිමුව දී ම ඉස්මතු වී පශ්චාත් මැතිවරණ විග්‍රහවලින් ගිලිහී යෑම දිගින් දිගටම දකින්නට ලැබෙන ශෝචනීය තත්වයකි.

පොදුවේ දකිනට ලැබෙන්නේ සමාජ ක්‍රියාකාරිනියන් කුමක් කීව ද දේශපාලන පක්ෂ විසින් කාන්තා නියෝජනය කෙරෙහි දක්වන අඩු සැලකිල්ල යි. එමෙන් ම මැතිවරණය සඳහා ඉදිරිපත්වීමට කාන්තාවන් දක්වන මැලිකම ද කැපී පෙනේ. අවාසනාව වනුයේ ආර්ථිකයේ කොඳු නාරටිය වන් විදේශගත කාන්තා ශ්‍රමයට රටෙහි වගකිවයුත්තන් ගරු සැලකිල්ලක් නොදක්වන තත්වයක ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ව හඬක් නැඟීමේ අවකාශය පාර්ලිමේන්තුවෙහි ද දිගින් දිගට ම විවර වී පවතී.

ජාත්‍යන්තර කාන්තා දිනයේ දී කාන්තා අයිතිවාසිකම් පිළිබඳ නා නා නයින් කරුණු දක්වන මොහොතක මහජන නියෝජිතයින්ගේ ආධිපත්‍යයට පමණක් ඉඩ දී කාන්තා අයිතිවාසිකම් යටපත් වී තිබීම ගැඹුරින් සාකච්ඡාවට ලක්විය යුත්තකි.

සාම්ප්‍රදායික යැපුම් කෘෂිකර්මාන්ත පැවති අවධියෙහි කාන්තාවගේ කාර්යභාරය කුටුම්බයේ කටයුතුවලට සීමා විය. කෘෂිකාර්මික බිම්වල ද ඇයට යම් කාර්යභාරයක් විය.

එහෙත් දැන් පවතින සේවා ආර්ථිකයෙහි කාන්තාවගේ දායකත්වය සුළුවෙන් සැලකිය යුත්තක් නොවේ.

සාම්ප්‍රදායික ආකල්ප උඩු යටිකුරු වෙමින් කාන්තාවන්ට අධ්‍යාපන හා රැකී රක්ෂා අවස්ථා පුළුල්වීම, ග්‍රාමීය කාන්තාවන් බහුල වශයෙන් නගරවලට සංකේන්ද්‍රනය වීම සහ විදෙස් ගත වීම යනාදී හේතු මත ඔවුන් මුහුණ දෙන ගැටලු ද අතිශයින් සංකීර්ණ වී ඇත. මෙසේ හෙයින් ජාතික වශයෙන් බලපාන තීන්දු ගන්න පුටුවල ඇයට ඉඩක් තිබීම අත්‍යාවශ්‍ය ය.

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 52% ක් කාන්තාවන් ය. පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය 2% ක් තරම් පහළ අගයක් ගනී. එහෙත් බංග්ලාදේශය කාන්තා නියෝජනය 25% ක් විය යුතු බවට නීති පනවා ඇත. කාන්තා නියෝජනය පුළුල් කිරීම ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇත.

එහෙත් ගැබිණි මව්වරුන්ට පෝෂණ මල්ලක් ලබා දීම සහ කිරිපිටි සහනය යනා දී වශයෙන් ජනප්‍රිය පොරොන්දුවලින් ඔබ්බට ගිය ක්‍රියාකාරීත්වයක් අපේ රටේ දක්නට නොමැති බව ද කිව යුතු ය.

කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා ලබා දෙන අවස්ථාවෙන් ප්‍රයෝජන ලබා නොගන්නා බවට ඇතැම් දේශපාලන පක්ෂවලින් නගන චෝදනා සත්‍ය නම් එය ද ගැඹුරින් සලකා බැලිය යුත්තකි. එසේ නම් එයට හේතු කවරේ ද? අපේ රටේ මැතිවරණ ව්‍යාපාරය යනු යුද්ධයකි. කුලය, මුදල් බලය, මැර බලය, දූෂණය හා චරිත ඝාතනය මැතිවරණ ජයග්‍රහණ සඳහා බලපාන ප්‍රධාන කරුණු අතර වේ. ස්ත්‍රීන් මැතිවරණවලට ඉදිරිපත්වීමේ දී චරිත ඝාතනය වඩාත් ඉස්මතු වූ බව මෙතෙක් පැවති මැතිවරණවල දී කැපී පෙනේ. මෙවැනි මැතිවරණයක් යටතේ දේශපාලනයේ පළපුරුදු කාන්තාවන් මිස අලුතින් ඉදිරිපත් වීමේ පෙළඹීමක් ඇත්තේ ද යන්න ද සැක සහිත ය. ශීලාචාර දේශපාලනයක් පිළිබඳ සිහිනය යථාර්ථයක් වීම එන්න එන්නම දුරස් වෙයි.

ඒ හෙයින් මැතිවරණ අභියස සහ පශ්චාත් මැතිවරණ අවධිය ඉක්ම වූ කතිකාවතක් ඇති කිරීම අවශ්‍ය වේ. එමෙන් ම සෘජු මැදිහත්වීම් කිරීම හා බලකිරීම වෙනුවෙන් අවශ්‍ය පෙළඹවීම සඳහා ජනමතයක් නිර්මාණය විය යුතු අවධියයි මේ.

**ක්‍රමය වෙනස් කළ යුතු යි**

**ජී. සමන්මලී ගුණසිංහ- දෙහිවල ගල්කිස්ස මහ නගර සභා නාගරික මන්ත්‍රී (ජවිපෙ)**

අපි පක්ෂය විදියට දැනට ප්‍රාදේශීය සභාවලට අනෙක් පක්ෂවලට සාපේක්ෂව 10% ක් පමණ කාන්තා නියෝජනයක් ඉදිරිපත් කරනවා. අප හිතන්නේ නැහැ ඒක ප්‍රමාණවත් කියලා. කාන්තාවන්ට ලංකාවේ දේශපාලනය කරන්න තියෙන වාතාවරණය ඒ තරම් හොඳ නැහැ. ප්‍රචණ්ඩත්වය, පළිගැනීම සහ මුදල් යන කාරණා මත තමයි ජයග්‍රහණ තීරණය වන්නේ. මේ රටේ සමාජ රාමුව තුළ කාන්තාවන්ට ලැබෙන ඉඩ කඩ අඩුයි. මවක්, කාන්තාවක් වශයෙන් කරන්න වැඩ කටයුතු බොහොමයක් තියෙනවා. ඒ නිසා දේශපාලනය කරන්න තරම් නිදහසක් සහ පරිසරය ඒ අයට ලැබෙන්නේ නැහැ. ජේ.වී.පී. ය විධියට කාන්තාවන්, ක්‍රියාකාරී සහෝදරියන්ට දේශපාලනය කරන්න නිදහස සහ පරිසරය ඕනෑ තරම් ලබා දී තිබෙනවා. ක්‍රියාකාරීත්වයේදී, දක්ෂකමේදී ඕන කාන්තාවකට ඕනෑම තලයකට තේරී පත් වෙන්න, නියෝජනය කරන්න ඉඩ අපේ පක්ෂය තුළ තියෙනවා.

අපි අවුරුදු 63 ක් පක්ෂ මාරු කළා. අපි දැක්ක දෙයක් තමයි මේ රටේ ප්‍රශ්න විසඳුණේ නැහැ. මේ වන විට ප්‍රශ්න වැඩි වෙලා තියෙන්නේ. සමාජ ,ආර්ථික ප්‍රශ්න වැඩි වෙලා. මේ කාල පරාසයේදී පක්ෂ මාරු වුණාට පාලනය, ආර්ථික ප්‍රතිපත්ති සියල්ලම එකයි. මේ ක්‍රමය යන්නේ මේ විදියට නම් අවුරුදු 30 ක් ගියත් මේක වෙනස් වෙයි කියලා හිතන්න බැහැ. මේ ක්‍රමයේ වෙනසක් කළ යුතුමයි.

**අපේ ක්‍රියාකාරී කමිටුවේ 10% ක් කාන්තාවෝ**

**තිස්ස අත්තනායක - පක්ෂ ලේකම් - එක්සත් ජාතික පක්ෂය**

පක්ෂවල සංවිධායකවරුන්ගේ බල අධිකාරියක් තියෙනවා කියන එක පිළිගන්න වෙනවා. එජාප ය හැටියට අපි සංවිධායකවරුන්ට දැනුම් දීලා තියෙනවා කාන්තා නියෝජනය වැඩි කරන්න කියලා. ඒ කිව්වට සමහර තැන්වල දී මේ කාරණය ඒ ආකාරයෙන්ම සිදු වන්නේ නැහැ. කාන්තාවන්ට වඩා පිරිමි යම් යම් තැන්වලදී සුදුසුයි කියලා යෝජනා වෙන අවස්ථා තියෙනවා. සාමූහික තීන්දු තීරණ ගැනීම් සිදු

වෙනවා. මම හිතන්නේ කාන්තාවන්ට වැඩි ඉඩක්, හා අවස්ථාවක් ලැබිලා තියෙන්නේ එජාපයෙන් කියලා. එජාප පක්ෂ අභ්‍යන්තර ක්‍රියාකාරීත්වයේ කාන්තාවන් වැඩියි. අපේ working committee එකේ 10% ක් කාන්තා නියෝජනය අනිවාර්ය කරලා තියෙන්නේ. ආණ්ඩුව කාන්තාවන් ඉදිරිපත් කරල තියෙන ප්‍රමාණය අඩුයි.

**ගැහැණියකට ඉන්නේ ගැහැණියක් පමණ යි**

**ආර්.එම්. අනුලා- එක්සත් ජාතික පක්ෂ ඡන්ද අපේක්ෂිකා- අකුරැස්ස ප්‍රාදේශීය සභාව -**

මම මෙවර පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වන්නේ පළමු වතාවට. නමුත් මම එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකාවක් වශයෙන් වසර ගණනක් පුරා සිටිනවා. බොහෝ පිරිස් පක්ෂය හැර දමා යද්දී මම පක්ෂය මාරු කළේවත්, පක්ෂය දමා ගියේවත් නැහැ. මම දේශපාලනයට පැමිණෙන්නේ මගේ පියාගේ ආභාසය නිසා.

දේශපාලනයට පැමිණීම තුළ මගේ බලාපොරොත්තුව විශේෂයෙන්ම කාන්තාවන් වෙනුවෙන් කළ හැකි උපරිම දෙයක් කිරීමයි. ගැහැණියකට ගැහැණියක් තමයි කොතැන ගියත් සිටින්නේ. ඒ නිසා මගේ ප්‍රධාන අරමුණ වන්නේ කාන්තාවන් මෙයට වඩා දිරිමත් කිරීමක් සහ ඉදිරියට ගැනීමයි. බොහෝ ප්‍රශ්න වලදී කාන්තාවන් අසරණ බවට පත් වෙනවා. අකුරැස්ස ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ඉදිරිපත් වී සිටින එකම කාන්තා නියෝජනය මම. ඉතින් මගේ එක් අරමුණක් තමයි තව තවත් කාන්තාවන් උනන්දු කරවීම.

**කෝටා ක්‍රමයක් අවශයි.**

**නීතිඥ තලතා අතුකෝරල (පාර්ලිමේන්තු මන්ත්‍රීනි)**

එජාපය වශයෙන් 2006 දී අපි තීරණය කළා අඩුම තරමින් හැම පළාත් පාලන ආයතනයකටම එක් කාන්තාවක්වත් නියෝජනය කරවන්න. මෙවර අපි එකකට දෙකකට ඇරෙන්න උපරිම නියෝජනයක් ඉදිරිපත් කරන්න උත්සාහ කළා.

දැන් 40% ක් 35 ට අඩු තරුණ නියෝජනයක් තියෙන්න ඕනේ. ප්‍රශ්නය තියෙන්නේ 35 ට අඩු පිරිමි නියෝජනයක් තියෙනවා. නමුත් මෙ වයසේ කාන්තාවන් ඉදිරිපත් වෙනවා හරි අඩුයි. මේ නිසා ප්‍රායෝගිකව අපි මුහුණ දෙන ප්‍රශ්න වැඩියි. අද දේශපානයට ඉදිරිපත් වෙන කාන්තාවන් අඩුයි. මැර බලය, සමාජ පරිසරය එක්ක තමන්ගේ දරුවන් දේශපාලනයට එවන්න දෙමාපියෝ කැමති නැහැ.

රටේ පසුබිම අනුව කෝටා ක්‍රමය සුළු වශයෙන් ක්‍රියාවට නැංවිය යුතුයි කියලා තමයි මගේ අදහස. එය මුලින් 10% න් පටන් ගත්තොත් හරි. රටේ පිරිමින්ටවත් දේශපාලනය කරන්න බැරි තත්වයක් තියෙන්නේ. විරුද්ධ පාක්ෂකයන්ට ඉඩකඩ ඇහිරෙනවා වැඩියි. කෝටා ක්‍රමය ආවත් එය සාර්ථක වෙයි කියලා හිතන්න බැහැ.

**ආසන සංවිධායක වරුන්ගේ වගකීමක්**

**එම් .ආර්. ප්‍රින්සි දේවිකා (එක්සත් ජනතා නිදහස් සංධානය අපේක්ෂිකා -වරකාපොල ප්‍රාදේශීය සභාව)**

මම 2006 පළාත් මැතිවරණයට ඉදිරිපත් වුණා. වරකාපොල ප්‍රාදේශීය සභාවට තරග කළා පිරිමි 27 ක් එක්ක. පිරිමි එක්ක කාන්තාවක් තරග කිරීමේදී ලේසි නැහැ. අපිට ඒ අයට වගේ රෑ වෙනකල් ඡන්ද වැඩ කරන්න අමාරුයි. අපි උදේ පටන් ගත්තොත් හවස් වෙනකොට මේ වැඩ ඉවර කරනවා. ඒ අයට වගේ මැර බලය යොදන්න බැහැ.

පිරිමින්ට වඩා කාන්තාවන්ට ගෙදර දොර වගේම සමාජයේ ගැටලු හඳුනා ගැනීමේ ඉව තියෙනවා. ඒ නිසා නිරන්තරයෙන් ගෙදර සිට සමාජය දක්වා වන ගැටලුවලට පිළිතුරු දීමේ ශක්තිය කාන්තාවට තියෙනවා. කාන්තා ප්‍රශ්න ගෙය තුළම මියැදෙනවා. ඒ නිසා කාන්තාවක් ප්‍රාදේශීය සභාවකට පත් වීමෙන් ඒ ගැටලු හඳුනා ගන්න, කතා කරන්න හැකියාව ලැබෙනවා. කාන්තාවන්ට දේශපාලන වරප්‍රසාද ලැබෙනවා අඩුයි. පක්ෂ විදිහට ගත්තමත් පිරිමි මන්ත්‍රීවරු හුඟාක් වෙලාවට තමන්ගේ හිතවත්කම්, සමීපකම් උඩ විට් එක දෙනවා. කාන්තාවන්ට නාම යෝජනා හම්බවෙන්නේ අඩුවෙන්. කාන්තාවන්ට තියෙන ප්‍රශ්නය තමයි ඒ අයට ලෙහෙසියෙන් මඩ ගහන්න පුළුවන්. පුරුෂයන් තමන්ගේ ආධිපත්‍යය තියාගන්න කැමතියි. ඒ නිසා සමහර අය කාන්තාවන් ඉදිරියට එනවට කැමති නැහැ.

පක්ෂයක් වශයෙන් ජනාධිපතිතුමා වැඩි ඉඩකඩක් කාන්තාවන්ට ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරලා තියෙනවා. ආසන සංවිධායකවරුන් හරහා මේක වැඩි දියුණු කරන්න ඕනේ. මොකද තමන්ගේ ආසනයේ ලිස්ට් එක හදන්නේ ආසන සංවිධායක නිසා.

**චරිත ඝාතනය නිසා කාන්තාවන් ඉදිරිපත් වන්නේ නැහැ**

**ප්‍රවීන නිළි ගීතා කුමාරසිංහ (බෙන්තර ඇල්පිටිය එජනිස සංවිධායිකා)**

කාන්තාවන්ට දේශපාලනයේ යෙදෙන්න තියෙන සදාචාරාත්මක අයිතිය පිළිබඳව ගරු ජනාධිපතිතුමාට අවබෝධයක් තියනවා. නමුත් ප්‍රායෝගිකව මෙය ක්‍රියාවට නැංවීමේදී විවිධ ගැටලු ඇති වෙනවා. බෙන්තර ඇල්පිටිය සංවිධායකවරිය හැටියට මමත් මේ ප්‍රශ්නයට මුහුණ දුන්නා. බෙන්තර ඇල්පිටිය ආසනය සඳහා 35 ට වැඩි දහදෙනෙකුත් 35 ට අඩු 5 දෙනෙකුත් තෝරා ගැනීම අවශ්‍ය උනා.

මෙයින් මූලිකව 35 ට වැඩි පිරිමි අය 8 දෙනකු තේරුවා. ඊළඟට සුළු පක්ෂ සඳහා එක් අයෙක් තෝරා ගත්තා. එජාපයෙන් ආපු අයෙකුටත් අවස්ථාව දුන්නා. ඒ අනුව 35 ට වැඩි දහදෙනා අතරේ කාන්තා නියෝජනයක් ලබාදීම දුෂ්කර වුණා. 35 ට අඩු අය සම්බන්ධයෙනුත් විවිධ ගැටලු ඇතිවුණා. පක්ෂ දේශපාලනයට තමන්ගේ කාලය විශාල වශයෙන් කැප කළ කාන්තාවන් ඉන්නවා. නමුත් ඔවුන් ඉදිරිපත් වන්න අකමැතියි. ඒකට ප්‍රධාන හේතුව තමයි. මැතිවරණවලදී කාන්තාවන්ගේ චරිත ඝාතනය කිරීම. මහමැතිවරණයේ දී මට කොච්චර පහර දුන්නද? නමුත් මම ඒවාට මුහුණ දුන්නා. එහෙම හිතන අය අවශ්‍යයි. චරිත ඝාතකයන් නිසා කාන්තාවන් ඉදිරියට එන්නේ නැහැ.